PR 7098

HARTI

# ශ්‍රී ලංකාවේ ජල පෝෂිත හා සුළු වාරිමාර්ග ආශ්‍රිත ගොවි සංවිධානවල කාර්ය සාධනය

ආර්.එල්.එන්. ජයතිස්ස

ඉන්ද්‍රිකා පතිරණ



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

National Science Foundation
11 NOV 2014
NSLRC
Colombo

# ශ්‍රී ලංකාවේ ජල පෝෂිත හා සුළු වාරිමාර්ග ආශ්‍රිත ගොවි සංවිධානවල කාර්ය සාධනය

ආර්.එල්.එන්. ජයතිස්ස

ඉන්ද්‍රිකා පතිරණ

පර්යේෂණ වාර්තා අංක: 57

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

114, විජේරාම මාවත,

කොළඹ 07

ප්‍රථම මුද්‍රණය : 2014 ජනවාරි

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියලුම හිමිකම් ඇවිරිණි.

ISBN :978-955-612-164-3

පරිගණක ගත කිරීම : ඒ.පී. මනෝජා තුෂාරි

පරිගණක පිටු සැකසුම හා කවර නිර්මාණය : ඒ.පී. උදේනි කරුණාරත්න

# පෙරවදන

සංවිධානාත්මක බව තුළ රැඳී පවතින විශේෂ ලක්ෂණය වන්නේ සාමූහික බවයි. ශ්‍රී ලාංකික අතීත ගොවිජන සමාජයේ එවැනි සාමූහික බවක් දක්නට ලැබුණි. ගොවි කටයුතුවල සියලු කාර්යයන් සිදු කරන ලද්දේ අත්තම, කයිය වැනි සාමූහික ක්‍රම භාවිතයෙනි. කෘෂිකර්මයේ ඉදිරි පියවරක් සේ ආරම්භ වූ මහා වාරිමාර්ග යටතේ ගොවිජනපද ඉදිවීමත් සමග ජලය සැපයීම හා බිම් සැකසීම වැනි කාර්යයන් සීමිත කාල පරාසයක් තුළ සිදුකරගත යුතු වීමත්, කෘෂිකාර්මික යන්ත්‍ර හා නව තාක්ෂණය භාවිතයට පැමිණීමත් සමග එතෙක් පැවති සාමූහික බව ක්‍රමයෙන් පිරිහීයාම සිදු විය. විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීමත් සමග අත්තම් වැනි සාමූහික කාර්යයන් සඳහා ගොවියා විසින් යොදවනු ලබන කාලය පවා මුදලින් මැනීමට ගොවීන් තුළ ද පෙළඹවීමක් ඇතිවීමත් සමග ගොවිතැන යන්න හුදකලාව සිදු කරන කාර්යයක් බවට පත් විය.

කෘෂිකර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව, ජල සම්පාදනය හා කළමනාකරණය, යෙදවුම් සැපයීම, නිෂ්පාදන හා අලෙවිය යන සියලු කාර්යයන් ගොවි ජනතාව විසින් ම සපුරා ගැනීමේ වගකීම ගොවීන් වෙතට ම පවරාදීමේ සහභාගීත්ව සංවර්ධන න්‍යායන් හි වැදගත්කම 1980 දශකය වන විට ශ්‍රී ලංකාව පාලනය කළ රජයයන්ට අවබෝධ වී තිබුණි. මේ සඳහා ගොවීන් සාමූහික අරමුණක් මත සංවිධානගත කිරීම කළ යුතු විය. ලෝකයේ වෙනත් කෘෂිකාර්මික රටවල ගොවීන් සංවිධානගත වීමේ ප්‍රවණතා ද සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන පිහිටුවීමේ කාර්යයට රජය අවතීර්ණ විය. එසේ වුව ද, ඒ වන විට සාමූහිකත්වය බිඳී ගොස් පෞද්ගලික ගොවි ජන ජීවිතයකට හැඩගැසී සිටි ගොවීන් සංවිධානාත්මක රාමුවකට ගෙන ඒම පහසු කාර්යයක් නොවී ය. මෙම පසුබිම යටතේ 1980 දශකයේ දී වාරිමාර්ග කළමනාකරණ ආයතනය විසින් ජල කළමනාකරණ කටයුතු සඳහා ගොවීන්ගේ සහභාගීත්වය ලබාගැනීමේ අරමුණින් ගොවි සංවිධාන බිහි කිරීමේ කාර්යය අරඹන ලදී. මෙය පසුව ක්‍රමයෙන් පුළුල් වූ අතර ජල කළමනාකරණ කාර්යය සඳහා ම ගල්ඔය සුළු ගොවි සංවිධාන පිහිටුවීම, ගල්ගමුව සුළු ගොවි සංවිධාන පිහිටුවීම පර්යේෂණාත්මක පදනමක් මත සිදු විය.

ඒවායින් ලබාගත් සාර්ථක අත්දැකීම් මත ගොවි සංවිධාන පිහිටුවීම මහා වාරි යෝජනාවලට පමණක් සීමා වී සමස්ත ගොවි සමාජය සහභාගී කර ගනිමින් ගොවි සංවිධාන පිහිටුවීම සිදු කරන ලද අතර විටින් විට පාර්ලිමේන්තු පනත් මඟින් ඒවා සඳහා යම් යම් බලතල පවරාදීමක් සිදු කොට තිබුණි. මෙහි සුවිශේෂිත ම පනත වන්නේ වර්ෂ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත වූ අතර එමඟින් ගොවි සංවිධානවලට තම සාමාජිකයන්ගේ ආර්ථික-සාමාජික තත්ත්වය වර්ධනය කරගනිමින් කෘෂිකර්මාන්තය දියුණු කරගැනීම සඳහා බලතල රාශියක් පවරාදීම සිදු විය. මේ අනුව, ගොවි සංවිධාන ගොවීන් වෙනුවෙන් යම් යම් ක්‍රියාමාර්ගවලට එළඹිය හැකි බලගතු සංවිධාන බවට පත්වීමක් ද සිදු විය. වර්තමාන වන විට ග්‍රාම නිලධාරී වසමකට එක බැගින් හෝ ඇතැම් විට එකටත් වඩා ගොවි සංවිධාන පිහිටුවා ඇති අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති ගොවි සංවිධාන 14,000 පමණ පවතින බව සංඛ්‍යාලේඛන මඟින් පෙන්නුම් කරයි. එසේ සංඛ්‍යාත්මකව ගොවි සංවිධාන රාශියක් පිහිටුවා තිබුණ ද, ඒවා පිහිටුවන ලද අරමුණු සපුරා ගනිමින් කෘෂිකාර්මික වශයෙන් වැදගත් සේවාවක් සිදු කරන සංවිධාන අතළොස්සක් පමණක් පවතින බව ද, බහුතර ගොවි සංවිධාන නමට පමණක් සීමා වී පවතින බව ද කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ප්‍රකට කරුණකි.

ශ්‍රී ලංකාවේ ගොවි ජනතාවගේ සුබ සිද්ධිය සහ පොදුවේ කෘෂිකර්මාන්තයේ දියුණුව අරමුණු කරගනිමින් පිහිටුවන ලද ගොවි සංවිධාන ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක වන්නේ ද, ඒවායින් අපේක්ෂිත සේවය ගොවි ජනතාවට ඉටු වන්නේ ද යන්න අධ්‍යයනය කර ඒවායේ පවතින අඩුපාඩු හා ඒවාට තුඩුදුන් හේතු හඳුනාගෙන ශක්තිමත් ගොවි සංවිධාන බිහිකිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම ආයතනයේ ප්‍රමුඛ කාර්ය භාරයකි. එම නිසා, "සුළු වාරිමාර්ග හා වර්ෂාපෝෂිත ප්‍රදේශයන් හි ගොවි සංවිධානයන් හි කාර්යසාධනය ඇගයීම" නම් වූ මෙම අධ්‍යයනය ඉහත කී කාර්යභාරය ඉටුකරගැනීමට යම් කිසි පිටුවහලක් සපයනු ඇතැයි යන්න මගේ අපේක්ෂාවයි.

**ඊ.එම්. අභයරත්න**
**අධ්‍යක්ෂ**

# ස්තුතිය

මෙම අධ්‍යයනය සඳහා විවිධ ආකාරයෙන් සහාය දැක්වූවන් බොහෝ දෙනෙකු වන අතර ඔවුන් සියලු දෙනා වෙත ම අපගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාව කොට ගනිමු. අධ්‍යයනය සිදු කිරීම සඳහා මූල්‍ය හා ආයතනික වශයෙන් ලැබිය යුතු වෙනත් ප්‍රතිපාදන සපයා දී මේ සඳහා අපව දිරි ගැන් වූ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ නීතිඥ ලලිත් කාන්ත ජයසේකර මහතාත්, මෙය ප්‍රකාශනයක් වශයෙන් එළි දැක්වීමට අවශ්‍ය සහයෝගය ලබාදුන් ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ඊ.එම්. අභයරත්න මහතාත්, මෙහි පර්යේෂණ යෝජනාව සැකසීමේ සිට අවසන් කෙටුම්පත් වාර්තාව දක්වා ම තම වටිනා අදහස් හා උපදෙස් ලබාදෙමින් වාර්තාව වැඩි දියුණු කිරීමට අවශ්‍ය සහාය ලබා දුන් අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය එල්.පී.රූපසේන මහතාත් හෘදයාංගම ව සිහිපත් කරමු.

පර්යේෂණ යෝජනාව සැකසීම හා ක්ෂේත්‍ර දත්ත රැස් කිරීමේ දී අවශ්‍ය වූ විවිධ සහායන් නොමසුරුව ඉටුකර දෙමින් හා වාර්තාව වැඩි දියුණු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙමින් මෙම අධ්‍යයනය සාර්ථක කරගැනීම සඳහා ඉමහත් සහයෝගයක් ලබාදුන් කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයේ හිටපු අංශ ප්‍රධාන ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි වර්තමාන අංශ ප්‍රධාන ආචාර්ය ටී.ඒ. ධර්මරත්න යන මහතුන් වෙතත් අපගේ කෘතවේදීත්වය පළ කර සිටිමු.

බාහිර විමර්ශකවරුන් වශයෙන් මෙම අධ්‍යයන වාර්තාව කියවා බලා එහි පැවති අඩුපාඩු පෙන්වා දෙමින් වාර්තාව වැඩි දියුණු කරගැනීම සඳහා අවශ්‍ය අගනා උපදෙස් රාශියක් ලබාදුන් ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය ෆ්‍රෑන්ක් නිරංජන් මහතා සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය කාලිංග ටියුඩර් සිල්වා මහතා වෙතත් අපි අපගේ හදපිරි ස්තුතිය පිරිනමමු.

මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර දත්ත රැස් කිරීමේ කාර්යය මැනවින් ඉටුකර දුන් අනියම් විමර්ශිකා සඳමාලි හේරත් සහ හිරන්‍යා විමුක්ති ද සිල්වා මෙනවියන්ටත් අපගේ ස්තුතිය පුද කෙරේ. එසේ ම, මෙම අධ්‍යයනය සඳහා තම වටිනා කාලය කැප කරමින් දත්ත සහ තොරතුරු සපයා දුන් නාගොල්ලාගම - අරුණ සහ එකමුතු, ඉබ්බාගමුව - නෑෂනල්වැව, නාරම්මල - දහදියමල්, මිහින්තලේ - පාළුවැව, ඇලයාපත්තුව - සෙවන, දෙනියාය - මහසෙන් සහ ජනහිත, කතංකේ - වැල්ලාන, බොරලන්ද-පල්ලේපෑල සහ ණය අරාව, කැප්පෙටිපොළ - සුළං කපොල්ල, සොරණාතොට - සේනානි සහ මොදරවාන-මොදරවාන දකුණ යන ගොවි සංවිධානවල නිලධාරීන් ඇතුළු සාමාජික මහත්ම මහත්මීන්ටත් අපගේ විශේෂ ස්තුතිය හිමි වේ.

මෙම වාර්තාව පරිගණක ගත කර දුන් මනෝජා තුෂාරි මහත්මිය සහ එන්.ඒ. කාංචනා සඳමාලි මෙනවියටත්, පිටු සැකසුම් කටයුතු හා කවර නිර්මාණය ඉටුකර දුන් උදේනි කරුණාරත්න මහත්මියටත්, වාර්තාව ප්‍රකාශයට පත් කිරීම සඳහා ක්‍රියාකළ ප්‍රකාශන ඒකකයේ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී එස්.ඒ.සී.යූ. සේනානායක මහතාටත් වාර්තාව මුද්‍රණය කරදුන් මුද්‍රණ අංශයේ කාර්ය මණ්ඩලයටත් අපි අපගේ ස්තුතිය පුද කර සිටිමු.

**ආර්.එල්.එන්. ජයතිස්ස**
**ඉන්දිකා පතිරණ**

# සාරාංශය


වර්තමානයේ ගොවි සංවිධානවලට බොහෝ සමානකම් ඇති ගොවීන් සම්බන්ධ කොට පිහිටුවා තිබූ ආයතන අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ පැවති බව මූලාශ්‍රවලින් හෙළි වේ.

වර්තමාන ස්වරූපයේ ගොවි සංවිධාන ශ්‍රී ලංකාව තුළ ආරම්භ වී ඇත්තේ 1980 දශකයේ දී ය. ආරම්භක අවධියේ පැවති ගොවි සංවිධානවල ප්‍රධාන අරමුණ වූයේ වී වගාවේ දී වාරි ජලය කළමනාකරණය කිරීම සඳහා ගොවි ජනතාව සහභාගී කර ගැනීමයි. මෙම අරමුණු පෙරදැරිව මහා වාරිමාර්ග ප්‍රදේශවල මෙන් ම සුළු වාරිමාර්ග ප්‍රදේශවල ද විවිධ ව්‍යාපෘති යටතේ ගොවි සංවිධාන පිහිටුවනු ලැබී ය.

1991 අංක 4 දරන ගොවිජන සේවා සංශෝධන පනත මඟින් ගොවි සංවිධාන නීතිමය වශයෙන් පිළිගත් ආයතන බවට පත් වූ අතර ගොවිජන සේවා කොමසාරිස් යටතේ ලියාපදිංචි කිරීම ඇරඹුණි. ජල කළමනාකරණ කටයුතුවලට අමතරව යෙදවුම් බෙදා හැරීම, නවීන වගා ක්‍රම භාවිතය ප්‍රචලිත කිරීම. කෘෂි බෝග අලෙවි වෙළෙඳපොළ සංවර්ධනය කිරීම හා ගොවි ආරවුල් විසඳීම යන කාර්යයන් ගොවි සංවිධාන මඟින් ඉටු කරවා ගැනීමට අපේක්ෂා කරන ලදී. වර්ෂ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත මඟින් ගොවි ජනතාවගේ සහ කෘෂි කර්මාන්තයේ දියුණුව උදෙසා පුළුල් සේවාවක් සැපයීම සඳහා තවත් ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන ආකාරයට සේවා සැපයීමට ගොවි සංවිධානවලට බලතල පවරා තිබේ.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව වර්තමානයේ ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන 13,981ක් ක්‍රියාත්මක වේ. මේ අතරින් ගොවි සංවිධාන 13,732ක් ලියාපදිංචි වී සිටී. ගොවි සංවිධාන 1,390ක් ලියාපදිංචි වී නැති අතර 684ක් අක්‍රීය තත්ත්වයේ පවතී. ගොවි සංවිධානවලින් 80%ක් ම ක්‍රියාත්මක වන්නේ වර්ෂාපෝෂිත හා සුළු වාරිමාර්ග ආශ්‍රිත ප්‍රදේශයේ ය. අසාර්ථක තත්ත්වයේ පවතින ගොවි සංවිධාන පිහිටා ඇත්තේ ද මෙම සුළු වාරි හා වර්ෂාපෝෂිත කලාපයේ ය. බොහෝමයක් ගොවි සංවිධාන අසාර්ථක මට්ටමේ පවතින්නේ යැයි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව තක්සේරු කොට ඇත්තේ ඒවායේ කාර්යයන් කිහිපයක් පමණක් විමර්ශනය කිරීමෙනි. ගොවි සංවිධානවලින් අපේක්ෂිත සේවය අතිශය පුළුල් ය. වර්තමාන ගොවි සංවිධානවලට පැවරී ඇති පුළුල් කාර්යභාරය විමසා බලා එම කාර්යභාරය පදනම් කොටගෙන ගොවි සංවිධාන යම්කිසි තක්සේරුවකට භාජනය කර අක්‍රියව පවතින ගොවි සංවිධාන හඳුනාගෙන එසේ වීමට හේතු විමර්ශනය කොට එම හේතු පදනම් කර ගනිමින් ගොවි සංවිධාන ක්‍රියාකාරීභාවයට පත් කිරීමෙන් ගොවි ජනතාවට පුළුල් සේවයක් සලසන ගොවීන්ගේ ම ආයතන බවට පත් කිරීමට ඒවා තුළ සිදු කළ යුතු යෝජනා ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සුළු වාරි මාර්ග හා වර්ෂා පෝෂිත ප්‍රදේශවල ක්‍රියාත්මක වෙමින් පවතින ගොවි සංවිධාන 14ක් තෝරා ගෙන එක් එක් ගොවි සංවිධාන පිළිබඳ සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය යටතේ අධ්‍යයනය කරන ලදී. ගොවි සංවිධාන නායකයින්, අදාළ බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ ගොවි සංවිධාන සාමාජිකයින් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීමෙන් සිද්ධි අධ්‍යයනය සඳහා දත්ත සපයා ගන්නා ලදී.

අධ්‍යයනයට ලක් කරන ලද ගොවි සංවිධාන 14 වූයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අරුණ ගොවි සංවිධානය, ගලඅඹගස්වැව ගොවි සංවිධානය, තැඹිලිවැව ගොවි සංවිධානය, තාරම්මල දහදියමල් ගොවි සංවිධානය, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇලයාපත්තුව සෙවන කාන්තා ගොවි සංවිධානය, මිහින්තලේ පාළුවැව ගොවි සංවිධානය, බදුල්ල දිස්ත්‍රික්කයේ කැප්පෙටිපොළ ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ සුලංකපොල්ල ගොවි සංවිධානය,

බොරලන්ද ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ණය අරාව ගොවි සංවිධානය හා වංගිය කුඹුර ගොවි සංවිධානය, රිදීපාන ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ සොරණාතොට ගොවි සංවිධානය, මාතර දිස්ත්‍රික්ක යේ දෙනියාය කොටපොල උතුර මහසෙත් ගොවි සංවිධානය, දැරංගල ජනහිත ගොවි සංවිධානය, කතංකේ වැල්ලාන එකමුතු ගොවි සංවිධානය හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ මොදරවාන ගොවි සංවිධානය යන ඒවා වේ.

ජාත්‍යන්තර හෝ රාජ්‍ය හෝ පිටස්තර ආයතන සමඟ සම්බන්ධතා වර්ධනය කරගෙන බල ප්‍රදේශයේ කෘෂි යටිතල පහසුකම් දියුණු කිරීම, ගොවි සංවිධාන බල ප්‍රදේශයේ පදිංචි ගොවි පවුල් සංඛ්‍යාවෙන් බහුතරයක් සංවිධානයේ සාමාජිකත්වයට ඇතුළත් කරගැනීම, සාමාජික මුදල් අයකර නො ගෙන වෙනත් විවිධ ආදායම් මාර්ග හෙළිකර ගනිමින් අරමුදල් රැස්කර ගැනීම, ගොවි සංවිධානය තුළ මුදල් ඉතිරි කිරීමට සාමාජිකයන් පෙළඹවීම, කෘෂිකාර්මික ආයෝජන හා වෙනත් දෛනික අවශ්‍යතා සඳහා සංවිධානය විසින් ණය සපයාදීම, කෘෂිකාර්මික කටයුතු සඳහා වාරි ජලය පිරිමැසුම් දායක ලෙස සැපයීම, අනුකම්ටු පිහිටුවා සංවිධානයේ සේවා විමධ්‍යගත කර සාමාජිකයන් බහුතරයකට වගකීම් පවරාදී තිබීම, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් පදනම යටතේ භාරගෙන ක්ෂේත්‍රයේ අඩුපාඩු සංවිධාන විසින් ම සකස් කරගැනීම, අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් සහභාගී කරගනිමින් කන්න රැස්වීම් පවත්වා සාර්ථක ලෙස කන්නය සැලසුම් කිරීම, වසරක් තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන සැලැස්ම වසර මූල සකස් කිරීම, කෘෂිකාර්මික කාර්යයන් පහසු කිරීම සඳහා අවශ්‍ය කෘෂි උපකරණ සංවිධානය විසින් පහසු අයකිරීම් යටතේ ගොවීන්ට සැපයීම, ගොවීන් සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම සඳහා ආදර්ශන හා ක්ෂේත්‍ර දින සංවිධානය කිරීම, ගොවි සාමාජිකයින් ගෙවතු වගාවට පෙළඹවීම සඳහා අවශ්‍ය උපදෙස්, බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම් සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීම, ගොඩ ඉඩම්වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීම සඳහා ඒවායේ මුදල් බෝග වගාවට ගොවීන් උනන්දු කිරීම, කෘෂිකර්මය සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්ති ගම තුළ ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනය ලෙස සංවිධානය ක්‍රියාත්මක වීම, පරිසර සංරක්ෂණය සඳහා ගොවීන් පෙළඹවීම සඳහා රසායනික පොහොර හා තෙල්වලින් තොර කාබනික වගාවට ගොවීන් යොමු කරවීම, පිදුරු පිච්චීමේ පුරුද්ද නවතා පිදුරු කුඹුරට දැමීමට ගොවීන් උනන්දු කිරීම, ගොවි බැංකු කොටස් මිල දී ගැනීමට ගොවීන් උනන්දු කරවා ඔවුන් ආයතනික පහසු ණය මාර්ගවලට යොමු කිරීම, සුබසාධන අංශයක් පවත්වාගෙන යාම මඟින් ගොවීන්ගේ පවුල් සඳහා සංවිධානයේ උපකාර සිදු කිරීම, අධ්‍යාපන ආධාර හා අසනීප, අවමංගල්‍ය වැනි අවස්ථාවල මූල්‍ය හා මහජන සහාය ලබාදීම, විනෝද හා ආගමික චාරිකා සංවිධානය කිරීම, මුදල් ඉතිරි කිරීමේ විවිධ ක්‍රම වශයෙන් සීට්ටු ක්‍රම හඳුන්වාදීම, සාමාජිකයන්ගේ අධ්‍යාත්මික සුවය සඳහා සාංඝික දාන, පිරිත් පිංකම්, ශාන්ති කර්ම සංවිධානය කිරීම, මී උණ හා ඩෙංගු මර්දනය හා සෞඛ්‍යාරක්ෂිත ක්‍රම සඳහා ගොවීන් යොමුකරවීම, ගොවි ජනතාවගේ දරුවන් පරිගණක තාක්ෂණය හා වෙනත් වෘත්තීය පුහුණු සඳහා යොමු කිරීම, ශ්‍රමදාන සංවිධානය මඟින් ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තු කිරීම, සුළු ගොවි ආරවුල් විසඳීම සඳහා ක්‍රියාකිරීම, ගොවි සංවිධාන සම්බන්ධයෙන් පාර්ලිමේන්තු පනත්වලින් පවරා දී ඇති බලතල පිළිබඳව අවබෝධයෙන් සිට ඒවාට අනුකූලව ගොවීන්ට සේවා සැපයීම යනා දී කාර්යයන් සාර්ථක ගොවි සංවිධාන විසින් සිදු කර තිබේ.

මෙලෙස සාර්ථක ගොවි සංවිධාන යන වර්ගීකරණයට ඇතුළත් කිරීමට ඉහත සඳහන් කාර්යයන් සිදු කිරීම හේතු වූ අතර එවැනි කාර්යයන් සිදු කිරීම සඳහා සාර්ථක ගොවි සංවිධානවලට හැකියාව ලැබී තිබුණේ සංවිධානය වෙනුවෙන් කැප වූ අවංක හා නිර්මාණශීලී හැකියාව සහිත නායකත්වය, පාර්ලිමේන්තු පනත් මඟින් ගොවි සංවිධානවලට පවරා ඇති බලතල පිළිබඳ අවබෝධයෙන් ගොවි සංවිධාන මෙහෙයවීම, බිම් මට්ටමේ ප්‍රජා සංවිධානවල කටයුතු කිරීමෙන් ලබා ඇති අත්දැකීම්, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විවිධ ගැටලු හා අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා අවශ්‍ය මුදල් සපයාගැනීමට විවිධ මාර්ග හෙළිකර ගැනීම, සංස්කෘතිකමය වශයෙන් වැදගත් චාරිත්‍ර ඉටුකිරීමට ගොවි සංවිධානය වෙනුවෙන් කැපවීම හා සහභාගීත්වය සඳහා සාමාජිකත්වය උනන්දු කිරීමේ උපාය මාර්ග අනුගමනය කිරීම, විනිවිද භාවයෙන් යුතුව සංවිධානයේ ආදායම් වියදම් පවත්වා ගැනීම හා පිටස්තර

පරීක්ෂකවරුන් මාර්ගයෙන් විගණන කටයුතු සිදු කිරීම, ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ සහයෝගය ලබාගැනීමේ හැකියාව, සාමාජිකත්වයේ අවශ්‍යතා සඳහා සවන්දීම හා ඒවා ඉටුකරදීමට කැප වී ක්‍රියාකිරීම, පෞද්ගලික ආර්ථික වැඩපිළිවෙළකට වඩා සාමූහික වැඩපිළිවෙළ අගය කිරීමට නායකත්වය හා සාමාජිකයින් පෙළඹී සිටීම හා සංවිධානයේ සාමූහික තීරණ පිළිගැනීමට හා ඒවාට අනුකූලව ක්‍රියා කිරීමට සාමාජිකත්වය හික්මීමක් ඇතිකර තිබීම යන ලක්ෂණ ගොවි සංවිධානය තුළ අන්තර්ගත වීම නිසා ය.

ගොවි සංවිධාන සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් පැවතීම හේතු වශයෙන් අධ්‍යයනයෙන් හඳුනාගත් කරුණු පහත සඳහන් පරිදි දැක්වීමට හැකි ය. ඒවා නම්, පාර්ලිමේන්තු පනත් මඟින් ගොවි සංවිධාන සම්බන්ධයෙන් දක්වා ඇති බලතල පිළිබඳ අඩු අවබෝධයකින් යුක්ත නායකත්වය හා සාමාජිකත්වය, පොදු වැඩවලට කාලය කැප කිරීමට නායකත්වයට හා සාමාජිකත්වයට හැකියාවක් නොමැතිකම හා එසේ කිරීමට තරම් හික්මීමක් හා පළපුරුද්දක් නොමැතිකම, නායකයින් දීර්ඝකාලයක් සිය නිලතලවල රැඳීමේ අරමුණ මිස නිර්මාණශීලී අදහස්වලින් සමන්විත නොවීම, පොහොර සහනාධාරය ලබාදීම හා සම්බන්ධ කාර්යයන් හා කන්න රැස්වීම් පැවැත්වීම පමණක් ගොවි සංවිධානය විසින් ඉටු කළ යුතු කාර්යයන් ලෙස සැලකීම, කාර්යක්ෂම ලෙස හා කැපවීමෙන් සංවිධානයේ කටයුතු ඉටුකිරීමට නායකයින් දක්වන අකැමැත්ත, පෞද්ගලික කටයුතුවලට ඔවුන් ප්‍රමුඛත්වය ලබාදීම හා පොදු කටයුතුවලට දෙවන ස්ථානය ලබා දීම, මුදල් පාලනය සම්බන්ධ විනිවිද භාවයක් රැක ගැනීමට උත්සාහ නො දැරීම, සාමාජිකයන්ගේ අවිශ්වාසයට පාත්‍රවීම හා ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන් සමඟ සම්බන්ධය දුරස්ථවීම යන කරුණු ය.

ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය ඇගයීමේ දී පහත සඳහන් නිර්ණායක භාවිතා කරන ලද අතර එම නිර්ණායකවලින් කොතරම් ප්‍රමාණයක් මෙම ගොවි සංවිධානවල දක්නට ලැබෙන්නේ ද යන්න මත ගොවි සංවිධාන ශ්‍රේණිගත කිරීමක් කළ හැකි විය. එලෙස භාවිතා කළ නිර්ණායක වූයේ ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබාගෙන සිටින ගොවි පවුල් සංඛ්‍යාව නායකත්වය තෝරා ගන්නා ආකාරය, දෙවන පෙළ නායකත්වයක් පුහුණු කිරීම, ඉතිරි කිරීම් හා ණය සැපයීම, අරමුදල් ගොඩ නැංවීම, පොහොර සහනාධාර ලබා ගැනීමේ දී අනුගමනය කරන ක්‍රමය, කුඩා කණ්ඩායම් ගොඩනැංවීම, යෙදවුම් සපයා දීම, යටිතල පහසුකම් හා වෙනත් භෞතික ඉදිකිරීම් සංවිධානය සතු කෘෂි උපකරණ ගොවීන්ට පහසු මිලට සැපයීම, කොන්ත්‍රාත් භාර ගැනීම, ජල කළමනාකරණය, මුදල් පරිපාලනය, ව්‍යාප්ති සේවා ශක්තිමත් කිරීම, ගොඩ ඉඩම්වල බෝග වගාවට ගොවීන් පෙළඹවීම, පාංශු සංරක්ෂණය පිළිබඳ උපදෙස් ලබාදීම, සත්ත්ව පාලනය සඳහා පහසුකම් සැලසීම, මිරිදිය ධීවර කර්මාන්තය සඳහා සේවා සැපයීම, නව තාක්ෂණික ක්‍රමවේද භාවිතයෙන් කෘෂි දැනුම ලබාදීම, සුබ සාධනය පැවැත්වීම, කෘෂි බෝග අලෙවිකරණයේ නියැලීම, රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමට උපදේශන සේවා සැපයීම, ගොවි හඬ ජාතික තලයට ගෙන ඒම, කෘෂිකාර්මික ව්‍යාපාර බවට පත් කිරීමට දායකවීම, නිෂ්පාදන සැකසීමට ක්‍රියාමාර්ග ගැනීම, ස්වශක්තිය පිළිබඳ විශ්වාසයෙන් ක්‍රියා කිරීම, ගොවිජන පනත් පිළිබඳ ඇති අවබෝධය, සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම, සාමාජික ගැටලු හඳුනා ගැනීම, සාමාජිකයින් අතිරේක ආදායම් මාර්ග ඇරඹීමට සහාය සේවා සැපයීම යන ඒවා මෙම ගොවි සංවිධාන විසින් ක්‍රියාත්මක කරනවාද යන්න විමසීම ය.

මෙම නිර්ණායක කොතෙක් දුරට අඩංගු වී තිබේ ද යන්න සලකා බැලූ විට අධ්‍යයනය කරන ලද ගොවි සංවිධාන 14න් 5ක් උසස් ම ක්‍රියාකාරීත්වයක් සහිත ඒවා යයි ද, ඉන් 6ක් අඩු ක්‍රියාකාරීත්වයකින් යුත් ඒවා යැයි ද 3ක් දුර්වල ක්‍රියාකාරීත්වයකින් යුතු බව ද හඳුනා ගන්නා ලදී.

මෙම සිද්ධි අධ්‍යයනවලට අනුව ගොවි සංවිධානවල වර්තමාන ක්‍රියාකාරීත්වය සම්බන්ධ පහත සඳහන් නිගමනවලට පැමිණිය හැකි වූ අතර එම නිගමන අනුව පහත සඳහන් නිර්දේශ යෝජනා කෙරේ.

ගොවි සංවිධාන ජනතාවගේ ම අවශ්‍යතාවය මත නොව වෙනත් ආයතන විසින් පිහිටුවන ලද ඒවා ය. ගොවි සංවිධානවලට පැවරී ඇති බලතල පිළිබඳව ගොවි සංවිධාන බහුතරයක් විසින් අවබෝධයක් ලබා නැත. නායකත්වයේ ක්‍රියාකාරීත්වය මත සංවිධානයේ සාර්ථක අසාර්ථකභාවය තීරණය වේ. නිලධාරී බලපෑම් ගොවි සංවිධානවලට පවතින බව, දේශපාලනමය වෙනස්වීම් ගොවි සංවිධානවල නායකත්වය වෙනස්වීමට බලපාන බව, වර්තමානයේ පොහොර සහනාධාරය, ගොවිජන බැංකුවට කොන්ත්‍රාත් කිරීමට අවස්ථාව ලැබීම යන කරුණු තුන මත ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය රඳා පවතී. ගොවි ජනතාව වර්තමානයේ දී ගොවි සංවිධාන සමඟ වැඩ කිරීමට පුහුණුවක් ලබා තිබේ. ගොවි ප්‍රජාව සමාජ, ආර්ථික වශයෙන් බල ගැන්වීමට ගොවි සංවිධාන යොදා ගත හැකි ය. ගොවිජන කේන්ද්‍ර සම්බන්ධව රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමට ජනතා සහභාගීත්වය ලබා ගැනීමේ ක්‍රමෝපායයක් ලෙස ගොවි සංවිධාන යොදා ගත හැකි ය. ගොවි සංවිධාන බහුතරයක් තවමත් ස්වශක්තියෙන් යැපීම නොව පිටස්තරින් යැපීමේ මානසිකත්වයක පසුවන බව, ස්වාධීන ප්‍රජා සංවිධානයක් ලෙස ගොවි හඬ ජාතික මට්ටම දක්වා ගෙන යාමට ගොවි සංවිධාන භාවිතා කළ හැකි බව, ගොවීන් ව්‍යාපාරිකයින් ලෙසට වටිනාකම එකතු කළ නිෂ්පාදකයන් ලෙසට, සංස්කෘතික දේශපාලන තීරකයන් ලෙසට උප කොන්ත්‍රාත්කරුවන් ලෙසට භාවිතා කිරීමට ගොවි සංවිධාන යොදා ගත හැකි ය.

මේ අනුව, පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි. දේශපාලන හා නිලධාරීන්ගේ බලපෑමෙන් තොරව ගොවි සංවිධාන සඳහා ගොවි නායකයින් පත් කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව සැලසීම, වර්තමානයේ ගොවි සංවිධානවලට බලපාන පනත වන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ ගොවි සංවිධාන පිළිබඳව දක්වා ඇති නීතිමය බලතල පිළිබඳව ගොවි සංවිධාන දැනුවත් කළ යුතු වීමයි. මේ සඳහා ගොවි සාමාජිකයන් හා ගොවි ක්ෂේත්‍රයේ නිලධාරීන් ද ඇතුළත් විය යුතුය. ගොවි සංවිධාන ගොවි ජන කේන්ද්‍රයේ සියලුම පාර්ශවකරුවන් වන ආයතන සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමේ පසුබිමක් ඇති කළ යුතු ය. ග්‍රාමීය මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ඒ සියල්ල ම ගොවි සංවිධාන දැනුවත් ව, ඒ මාර්ගයෙන් කළ යුතු වන්නේ ය. ගොවි සංවිධාන විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු පිළිබඳව අදාළ ආයතන විසින් අවධානය යොමු කොට ඒවා විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. ගොවි සංවිධාන ගොවීන්ට කෘෂි සේවා සැපයීම පමණක් නොව ගොවීන්ට බහු කාර්ය සේවා සපයන හා ආදායම් උපයා දෙන ආයතන බවට පත් කළ යුතු ය. ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය පිළිබඳව තරඟ පවත්වා ජයග්‍රහණය කරන ගොවි සංවිධානවලට කෘෂි උපකරණ හා කෘෂි යන්ත්‍ර සූත්‍ර තෑගි ලෙස ලබාදිය යුතු ය. එසේම කෘෂි ප්‍රතිපත්ති සම්පාදනයේ දී ගොවි සංවිධාන සාමාජිකයින්ගේ අදහස් ලබාගත යුතු වේ.

# අධ්‍යයනයේ පරිච්ඡේද සංවිධානය

මෙම අධ්‍යයනය පරිච්ඡේද 05කින් සමන්විත වේ. පළමුවන පරිච්ඡේදයේ දී ගොවි සංවිධාන පිළිබඳ හැඳින්වීම, ඒවාට ලබා දී තිබූ නීතිමය බලතලවල විකාශනය, පර්යේෂණ ගැටලුව හා එහි වැදගත්කම, අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු, අධ්‍යයන ක්‍රමවේදය, දත්ත විශ්ලේෂණය හා අධ්‍යයන ප්‍රදේශය යන කරුණු ඇතුළත් වේ.

දෙවැනි පරිච්ඡේදය සාහිත්‍ය විමර්ශනයයි. මෙහි දී, ගොවි සංවිධාන ඉතිහාසය, ඒවායේ කාර්යභාරය හා වැදගත්කම යන ඒවා ද, ගොවි සංවිධාන සම්බන්ධයෙන් දේශීය හා විදේශීය විද්වතුන් කරන ලද අධ්‍යයනයන්වලින් දක්වා ඇති අදහස් ද ඇතුළත් කොට තිබේ.

තුන්වැනි පරිච්ඡේදයේ දී, අධ්‍යයනයට ලක් කරන ලද ගොවි සංවිධාන 14, සිද්ධි අධ්‍යයන ඇතුළත් කොට ඇත. ඒ අනුව, කුරුණෑගල දිස්ත්‍රික්කයේ අරණ ගොවි සංවිධානය, ගලඅඹගස්වැව ගොවි සංවිධානය, තැෂනල්වැව ගොවි සංවිධානය, නාරම්මල දහදියමල් ගොවි සංවිධානය, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇලයාපත්තුව සෙවන කාන්තා ගොවි සංවිධානය, මිහින්තලේ පාළුවැව ගොවි සංවිධානය, බදුල්ල දිස්ත්‍රික්කයේ කැප්පෙටිපොළ ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ සුළංකපොල්ල ගොවි සංවිධානය, බොරලන්ද ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ණයඅරාව ගොවි සංවිධානය හා වංගියකුඹුර ගොවි සංවිධානයත්, රිදීපාන ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ සොරණාතොට ගොවි සංවිධානය, මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය කොටපොල උතුර මහසෙන් ගොවි සංවිධානය, දැරංගල ජනහිත ගොවි සංවිධානය, කනංකේ වැල්ලාන එකමුතු ගොවි සංවිධානය ද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ මොදරවාන ගොවි සංවිධානය යන ඒවා අධ්‍යයනයට භාජනය කොට ඇත.

සිව්වැනි පරිච්ඡේදයේ දී, මෙම සිද්ධි අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන විශ්ලේෂණය සිදු කරනු ලබන අතර එමඟින් ගොවි සංවිධාන යම් කිසි වර්ගීකරණයකට ලක් කරයි.

පස්වැනි පරිච්ඡේදයේ දී, සිද්ධි අධ්‍යයනයෙන් බැසගත් වැදගත් නිගමන ද සාර්ථක ගොවි සංවිධානයක් ගොඩනැංවීම සඳහා මෙම අධ්‍යයනය ආශ්‍රයෙන් සිදු කරන නිර්දේශ ද ඇතුළත් කෙරේ.

## පටුන

පිටුව

පෙරවදන ii

ස්තුතිය iv

සාරාංශය v

අධ්‍යයනයේ පරිච්ඡේද සංවිධානය ix

වගු සටහන් xxi

ප්‍රස්තාර සටහන් xx iv

රූප සටහන් xxv

පළමු වැනි පරිච්ඡේදය

ශ්‍රී ලංකාවේ ජල පෝෂිත හා සුළු වාරිමාර්ග ආශ්‍රිත ගොවි සංවිධාන

1.1 ප්‍රවිෂ්ටය 01

1.2 පර්යේෂණ ගැටලු හා එහි වැදගත්කම 02

1.3 අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු 02

1.4 අධ්‍යයන ක්‍රමවේදය 03

1.4.1 ප්‍රාථමික දත්ත 03

1.4.2 ද්විතියික දත්ත 03

1.4.3 දත්ත විශ්ලේෂණය 04

1.1 අධ්‍යයන ප්‍රදේශය 04

1.2 වාර්තාවේ සැකැස්ම 05

දෙවැනි පරිච්ඡේදය

සාහිත්‍ය විමර්ශනය

2 හැඳින්වීම 07

2.1 ගොවි සංවිධාන සහ කාර්යභාරය 07

2.1.1 සංවිධානයක් යනු කුමක් ද? 07

2.1.2 ගොවි සංවිධාන ඉතිහාසය 08

2.1.3 ගොවි සංවිධානවල කාර්යභාරය 08

2.1.4 ගොවි සංවිධානයක වැදගත්කම 09

2.2 සාර්ථක ගොවි සංවිධානයක ලක්ෂණ 11

2.2.1 ගොවි සංවිධානයක සාර්ථකත්වයට බලපාන අභ්‍යන්තර සාධක 13

තෙවැනි පරිච්ඡේදය

සිද්ධි අධ්‍යයනය


3. හැඳින්වීම 17

3.1 සිද්ධි අධ්‍යයන 01: අරුණ ගොවි සංවිධානය – කුරුණෑගල දිස්ත්‍රික්කය 17

3.1.1 ගොවි සංවිධානයේ සැකැස්ම 17

3.1.2 සාමාජිකත්ව වර්ධනය 17

3.1.3 අරමුදල ශක්තිමත් කරගැනීම 19

3.1.4 නායකත්වය හා දෙවනපෙළ නායකත්වයක් පුරුදු කිරීම 19

3.1.5 ලබාගත්තා ලද ලකුණු මත කාණ්ඩගත කිරීම 21

3.1.6 සංවිධානයේ ඉතිරි කිරීම් හා ණය සැපයීම 21

3.1.7 කෘෂිකාර්මික අවශ්‍යතා සපුරාගැනීම 22

3.1.8 වාරිමාර්ග නඩත්තුව 22

3.1.9 කොන්ත්‍රාත් කිරීම 22

3.1.10 කන්න රැස්වීම් සංවිධානය කිරීම 23

3.1.11 කෘෂි තාක්ෂණික දැනුම ලබාදීම 23

3.1.12 වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම 24

3.1.13 අනුකම්පු පිහිටුවීම මඟින් සාමාජිකයන් වෙත බලය පැවරීම 25

3.1.14 සාමාජික සුබසාධනය 25

3.1.15 ආදායම් උත්පාදන ව්‍යාපෘති පවත්වාගෙන යාම 26

3.1.16 අතුරු ව්‍යවස්ථාව 26

3.1.17 සාමාජික සිතුම් පැතුම් හා අදහස්වලට අවස්ථාව ලබාදීම 26

3.1.18 අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම 27

3.1.19 සාරාංශය 28

3.2. සිද්ධි අධ්‍යයන 02: එකමුතු ගොවි සංවිධානය - ගලඅඹගස්වැව,කුරුණෑගල දිස්ත්‍රික්කය 28

3.2.1 හැඳින්වීම 28

3.2.2 වැව සහ ඇළමාර්ග නඩත්තුව 28

3.2.3 අරමුදල ශක්තිමත් කරගැනීම 30

3.2.4 ගොවි සංවිධානයට බාහිරින් ලැබෙන ආධාර සාමාජිකයින්ට ලබාදීම 31

3.2.5 ණය ලබාදීමේ ස්වභාවය 32

3.2.6 සුබසාධන කටයුතු පවත්වාගෙන යාම 33

3.2.7 බෝග වගාවට ගොවීන් යොමු කරවීම 33

3.2.8 නවීන තොරතුරු තාක්ෂණය භාවිතයට ගැනීම 33

3.2.9 කොන්ත්‍රාත් කිරීම 34

3.2.10 නායකත්වය පුහුණු කිරීම හා නව නායකයන් පත්කිරීම 35

3.2.11 වාර්ෂික සංවර්ධන කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම 35

3.2.12 සාමාජික වර්ධනය 35
3.2.13 පවුල් සමඟ සාකච්ඡා කිරීමේ ක්‍රමය 36
3.2.14 ක්ෂණික කරදරවලට මුහුණපාන පවුල්වලට උපකාර කිරීම 36
3.2.15 ශ්‍රමදාන සංවිධානය කිරීම 36
3.2.16 වෙනත් ප්‍රජා සංවිධානවලට පුහුණුව ලබාදීම 37
3.2.17 උසස් අධ්‍යාපනික කටයුතු සඳහා උපකාර කිරීම 37
3.2.18 වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම 37
3.2.19 ප්‍රදේශයේ තරුණයින් විදේශීය පුහුණුව සඳහා යොමු කිරීම 38
3.2.20 බෞද්ධාගමික කටයුතු සඳහා දායකත්වය ලබාදීම 38
3.2.21 ගොවිජන සමාජයේ සමගිය සහ අන්‍යොන්‍ය සුහදත්වය ආරක්ෂා කිරීම 38
3.2.22 නිලධාරීන් සමඟ සමීප සම්බන්ධතාවය 39
3.2.23 ගොවිජන සංවර්ධන ගොඩනැඟිලි ව්‍යවස්ථාව පිළිබඳව අවබෝධය 39
3.2.24 ගොවි සංවිධාන ගොඩනැඟිලි සංකීර්ණය ගොඩනැංවීම 39
3.2.25 වී වගාවට අමතර වෙනත් බෝග වර්ග වගා කිරීමට ගොවීන් යොමු කිරීම 40
3.2.26 සාරාංශය 41
3.3 සිද්ධි අධ්‍යයන 03: දහදියමල් ගොවි සංවිධානය - ගිනිගත්පිටිය, නාරම්මල 41
3.3.1 හැඳින්වීම 41
3.3.2 සාමාජිකත්වය ලබාගැනීම 42
3.3.3 ගොවි සංවිධානයේ කාර්යයන් 43
3.3.3.1 කෘෂි ණය සැපයීම 43
3.3.3.2 ගොවි සංවිධානය සතු කෘෂි උපකරණ 43
3.3.3.3 කොන්ත්‍රාත් කිරීම 43
3.3.4 ගොවි සංවිධානය ආදායම් උපයන මාර්ග 44
3.3.5 වැවේ ජල කළමනාකරණය 45
3.3.6 පොහොර සහනාධාරය සම්බන්ධ කාර්යයන් 46
3.3.7 කන්න රැස්වීම් 46
3.3.8 අරමුදල් වැයකිරීම 47
3.3.9 ගොවි ආරවුල් විසඳීම 47
3.3.10 පළතුරු සහ අපනයන බෝග වගාව 47
3.3.11 ගෙවතු වගාව 48
3.3.12 ගොවි සංවිධාන අරමුදල් නිකුත් කිරීම 48
3.3.13 සාරාංශය 49
3.4 සිද්ධි අධ්‍යයන 04: තැඹතල්වැව ගොවි සංවිධානය, ඉබ්බාගමුව 49
3.4.1 හැඳින්වීම 49
3.4.2 ගොවි සංවිධානයේ ව්‍යුහය 50
3.4.3 ගොවි සංවිධාන නායකත්වය 50

3.4.4 සාමාජිකත්වය ලබාගැනීම 50
3.4.5 ඉතුරුම් හා ණය ලබාගැනීම 52
3.4.6 ජල කළමනාකරණ කටයුතු 53
3.4.7 කොන්ත්‍රාත් කටයුතුවල නිරතවීම 53
3.4.8 සමාජීය, සංස්කෘතික හා ආගමික කටයුතු 53
3.4.9 විවිධ පරිත්‍යාග 54
3.4.10 ගොවි ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීමට ගොවි සංවිධානයේ මැදිහත්වීම 55
3.4.11 සාරාංශය 56
3.5 සිද්ධි අධ්‍යයන 05: ණයඅරාව ගොවි සංවිධානය, බදුල්ල දිස්ත්‍රික්කය 56
3.5.1 හැඳින්වීම 56
3.5.2 නිලධාරීන් තෝරාගැනීම 57
3.5.3 රැස්වීම් පැවැත්වීම 57
3.5.4 ගොවි සංවිධානයේ ආදායම 58
3.5.5 ගොවි සංවිධානයේ ආදායම් යොදවා ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම 58
3.5.6 ගොවි සංවිධානය විසින් ඉටු කරනු ලබන කාර්යයන් 58
3.5.7 සාරාංශය 59
3.6 සිද්ධි අධ්‍යයන 06: සුළංකපොල්ල ගොවි සංවිධානය - සිල්මියාපුර, බදුල්ල දිස්ත්‍රික්කය 60
3.6.1 හැඳින්වීම 60
3.6.2 ගොවි සංවිධානයේ සැකැස්ම 60
3.6.3 ගොවි සංවිධාන බල ප්‍රදේශයේ කෘෂිකාර්මික පසුබිම 60
3.6.4 ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව 60
3.6.5 ගොවි සංවිධානයේ වත්කම් - සාමාජික අරමුදල් 61
3.6.6 ගොවි සංවිධානයේ සේවාවන් 62
3.6.7 ශ්‍රමදාන සංවිධානය 62
3.6.8 ගොවිජන බැංකු ණය 62
3.6.9 ගොවි සංවිධානයේ ක්‍රියාකාරිත්වය අලස වීමට බලපා ඇති හේතු 63
3.6.10 පවතින සමාජ - ආර්ථික පරිසරය අනුව සංවිධානය විසින් ලබාදිය යුතු ප්‍රතිලාභ 66
3.6.11 සාරාංශය 67
3.7 සිද්ධි අධ්‍යයන 07: සේනානි ගොවි සංවිධානය - සොරණාතොට, බදුල්ල දිස්ත්‍රික්කය 67
3.7.1 හැඳින්වීම 67
3.7.2 ගොවි සංවිධානය සතු අරමුදල් 68
3.7.3 ගොවි සංවිධානය වර්තමානයේ ගොවීන් වෙනුවෙන් ඉටුකරනු ලබන සේවාවන් 69
3.7.4 වර්තමානයේ දී ප්‍රදේශයේ ගොවීන් මුහුණ දී සිටින ගැටලු 69

3.75 සාරාංශය 69

3.8 සිද්ධි අධ්‍යයන 08: පල්ලේපැල ගොවි සංවිධානය - වංගියකුඹුර, බදුල්ල දිස්ත්‍රික්කය 70

3.8.1 හැදින්වීම 70

3.8.2 සාමාජිකත්වය වර්ධනය කරගැනීම 70

3.8.3 අරමුදල් වර්ධනය කරගැනීම 71

3.8.4 සාමාජිකයින් සඳහා ණය අරමුදල් සැපයීම 72

3.8.5 සුබසාධන කාර්යයන් 72

3.8.6 ලිපිගොනු විධිමත්ව පවත්වාගෙන යාම හා ගිණුම් තැබීම 72

3.8.7 ගොවි සංවිධානය විසින් ගොවිජනතාවට ඉටුකර ඇති සේවාවන් 73

3.8.8 සාරාංශය 74

3.9 සිද්ධි අධ්‍යයන 09: සෙවන ගොවි සංවිධානය - ඇලයාපත්තුව, අනුරාධපුර 74

3.9.1 හැදින්වීම 74

3.9.2 ගොවි සංවිධානයේ ආරම්භය හා විකාසය 74

3.9.3 ගොවි සංවිධානයේ ව්‍යුහය 75

3.9.4 මහ සභාව සඳහා නිලධාරීන් තෝරා ගැනීම 75

3.9.5 ගොවි සංවිධානයේ සාමාජික වර්ධනය 75

3.9.6 ජනතා විශ්වාසය දිනාගැනීමේ ක්‍රමවේද 76

3.9.7 කුඩා කණ්ඩායම් ක්‍රමය, ඉතුරුම් හා ණය සැපයීම 76

3.9.8 ගොවි ණය සැපයීම 77

3.9.9 අනුකම්ටු පත්කිරීමෙන් වගකීම් බෙදාදීම 78

3.9.10 අරමුදල් වර්ධනය කරගැනීම 79

3.9.11 ගොවි සංවිධානය විසින් ඉටුකරමින් පවතින කාර්යයන් 80

3.9.12 සාරාංශය 82

3.10 සිද්ධි අධ්‍යයන 10: පාළුවැව ගොවි සංවිධානය - මිහින්තලේ, අනුරාධපුර දිස්ත්‍රික්කය 82

3.10.1 හැදින්වීම 82

3.10.2 ගොවි සංවිධානය ආරම්භ කිරීමේ පරමාර්ථ 83

3.10.3 ගොවි සංවිධානයේ සැකැස්ම 83

3.10.4 ප්‍රදේශයේ කෘෂිකාර්මික පසුබිම 83

3.10.5 ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව 83

3.10.6 ගොවි සංවිධානයට අරමුදල් රැස්කිරීම 84

3.10.7 ගොවි සංවිධානයට නායකයන් පත් කිරීම 84

3.10.8 ගොවි සංවිධානයෙන් සාමාජිකයන්ට සිදුවන සේවාව 85

3.10.9 කොන්ත්‍රාත් කිරීම 85

3.10.10 සහනාධාර පොහොර බෙදාහැරීම 85

3.10.11 වැවේ ජලය බෙදාහැරීම 85

3.10.12 ශ්‍රමදාන මාර්ගයෙන් කෘෂි යටිතල පහසුකම් දියුණු කිරීම 86
3.10.13 පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම 86
3.10.14 වැවේ මිරිදිය මත්ස්‍ය වගාව 86
3.10.15 කන්න රැස්වීම් සංවිධානය 87
3.10.16 සංස්කෘතිකමය කාර්යයන් 87
3.10.17 ගමේ සමගිය සාමූහිකත්වය ආරක්ෂා කරදීම 87
3.10.18 සාරාංශය 87

**3.11 සිද්ධි අධ්‍යයන 11:කොටපොල උතුර ගොවි සංවිධානය, මාතර දිස්ත්‍රික්කය 88**
3.11.1 හැඳින්වීම 88
3.11.2 ගොවි සංවිධානයේ ව්‍යුහය 88
3.11.3 නායකත්වය 88
3.11.4 සාමාජිකත්වය 89
3.11.5 සුබසාධන සේවාවන් 90

**3.12 සිද්ධි අධ්‍යයන 12: දැරංගල ගොවි සංවිධානය,මාතර දිස්ත්‍රික්කය 93**
3.12.1 හැඳින්වීම 93
3.12.2 ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ආරම්භක පසුබිම 93
3.12.3 සාමාජික අරමුදල් අයකර ගැනීම 94
3.12.4 නිලධාරීන් තෝරා ගැනීම 94
3.12.5 ගොවි සංවිධානයේ ක්‍රියාකාරිත්වය 94
3.12.6 රැස්වීම් පැවැත්වීම 95
3.12.7 නායකත්වය 96
3.12.8 ඉතිරිකිරීම් හා ණය ලබාදීම 96
3.12.9 යෙදවුම් හා උපකරණ සැපයීම 97
3.12.10 ජල කළමනාකරණය 97
3.12.11 කොන්ත්‍රාත් කටයුතුවලට සහභාගීවීම 97
3.12.12 ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම 97
3.12.13 සාරාංශය 98

**3.13 සිද්ධි අධ්‍යයන 13: වැල්ලාන ගොවි සංවිධානය - කනංකේ, මාතර දිස්ත්‍රික්කය 98**
3.13.1 හැඳින්වීම 98
3.13.2 ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ආර්ථික පසුබිම 99
3.13.3 නායකත්ව තෝරාගැනීම 100
3.13.4 අරමුදල් වර්ධනය කරගැනීම 100
3.13.5 ගොවි සංවිධානයේ කාර්යයන් 101
3.13.6 නිලධාරීන්ගේ සහයෝගය 101

3.13.7 ගොවි සංවිධානය වර්තමානයේ දී මුහුණ දී සිටින ගැටලු 101
3.13.8 සාරාංශය 102

**3.14 සිද්ධි අධ්‍යයන 14: මොදරවාන ගොවි සංවිධානය - හම්බන්තොට දිස්ත්‍රික්කය 103**
3.14.1 හැඳින්වීම 103
3.14.2 ගොවි සංවිධානයේ ව්‍යුහය 104
3.14.3 නායකයින් පත්කිරීම 104
3.14.4 රැස්වීම් පැවැත්වීම 104
3.14.5 ගොවි සංවිධානයෙන් අරමුදල් රැස්කිරීම 104
3.14.6 ප්‍රදේශයට කර ඇති සේවාව 105
3.14.7 ණය මුදල් ලබාදීම 105
3.14.8 ගොවීන් විසින් විකල්ප ක්‍රම භාවිතයෙන් අවශ්‍යතා සපුරා ගැනීම 105
3.14.9 ගොවි සංවිධානයෙන් සිදු කෙරෙන සේවාව 106
3.14.10 ප්‍රදේශයේ ආර්ථිකය තුළ දැකිය හැකි වෙනත් විශේෂිත ලක්ෂණ 107
3.14.11 සාරාංශය 108

සිව්වැනි පරිච්ඡේදය
සිද්ධි අධ්‍යයනය ආශ්‍රයෙන් ගොවි සංවිධාන විමසුම 109
4.1 හැඳින්වීම 109
4.2 ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය ඇගයීමේ දී භාවිතයට ගත් නිර්ණායක 109
4.2.1 සාමාජිකත්වය වර්ධනය කරගැනීම 109
4.2.2 සහනාධාර පොහොර බෙදාහැරීම 110
4.2.3 ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 111
4.2.4 සාමාජිකයන් මුදල් ඉතිරිකිරීමට පෙළඹීම 112
4.2.5 කුඩා කණ්ඩායම් සංවිධානය කිරීම 113
4.2.6 බීජ හා රෝපණ ද්‍රව්‍ය සපයාදීම 114
4.2.7 පොදු දේපළ සුරකීම 115
4.2.8 ජල කළමනාකරණය කිරීම 116
4.2.9 කන්න රැස්වීම් සංවිධානය කිරීම 117
4.2.10 වාර්ෂික සැලසුම් සැකසීම 118
4.2.11 නීතිමය බලතල පිළිබඳ ගොවි සංවිධාන නිලධාරීන්ට ඇති අවබෝධය 119
4.2.12 කෘෂි බෝග අලෙවිය සඳහා මැදිහත්වීම 120
4.2.13 වාර්ෂිකව නව නායකයින් පත් කිරීම 121
4.2.14 දෙවනපෙළ නායකත්වය පුරුදු කිරීම 122
4.2.15 ආදායම් වියදම් පිළිබඳ ලේඛන විධිමත් ලෙස පවත්වාගෙන යාම 123
4.2.16 සංවිධානය සතුව කෘෂි උපකරණ පැවතීම හා පහසු අයකිරීම 124
4.2.17 සංස්කෘතික හා ආගමික කාර්යයන් වාර්ෂිකව නිසි අයුරින් පැවැත්වීම 125

4.2.18 සුබසාධක අංශයක් පවත්වාගෙන යාම 126
4.2.19 කොන්ත්‍රාත් කිරීම 127
4.2.20 ගොවි සංවිධානය පවත්වාගෙනයාම සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකරදීම 128
4.2.21 ගොවි සංවිධානය ව්‍යාපාරික කටයුතුවල නියැලී සිටීම 129
4.2.22 ගෙවතු වගා හා වෙනත් බෝග වගාවන් සඳහා ගොවීන් පෙළඹීම 130
4.2.23 අත්දැකීම් ආශ්‍රයෙන් අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම 131
4.2.24 කාබනික පොහොර සහ පිදුරු කුඹුරට යෙදීම 131
4.2.25 සාමාජිකයන් පිළිබඳ දත්ත රැස් කිරීම 133
4.2.26 අරමුදල් ගොඩනැංවීම 133
4.2.27 ගොවි හඩ ජාතික තලය දක්වා ගෙනයාම 135
4.2.28 කෘෂි බෝග සැකසුම් කර්මාන්තය 135
4.2.29 පාංශු සංරක්ෂණය සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම 136
4.2.30 ප්‍රාදේශීය මට්ටමේ කෘෂිකර්මික කමිටුවලට සහභාගීගිවීම 136
4.2.31 විධිමත් ආකාරයට රැස්වීම පැවැත්වීම 137
4.3. ඇගයීම පදනම් කරගනිමින් ගොවි සංවිධාන ශ්‍රේණිගත කිරීම 141
4.4 උසස් ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන 141
4.4.1 උසස් ක්‍රියාකාරීත්වයක් යුත් ගොවි සංවිධානවල දැකිය හැකි ගුණාංග 144
4.4.1.1 සංවිධානය වෙනුවෙන් කැප වූ අවංක නායකත්වය 144
4.4.1.2 පනතේ විධිවිධාන පිළිබඳ අවබෝධයෙන් යුතුව ගොවි සංවිධාන මෙහෙයවීම 145
4.4.1.3 ප්‍රදේශයේ කෘෂිකාර්මික අවශ්‍යතා ඉටුකරලීමට විවිධ මාර්ගවලින් මුදල් සපයාදීම 145
4.4.1.4 සාමාජිකයින් සඳහා සුබසාධන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරවීම 145
4.4.1.5 සමාජයේ ගෞරවයට පාත්‍ර වී ඇති සංස්කෘතිකමය වශයෙන් වැදගත් චාරිත්‍ර ඉටු කිරීම 146
4.4.1.6 සහභාගීත්වය සඳහා සාමාජිකත්වය උනන්දු කිරීමේ උපාය මාර්ග අනුගමනය කිරීම 146
4.4.1.7 සාමාජිකයන්ගේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා ඍජු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම 147
4.4.1.8 වාර්ෂික සැලසුම් සකස් කිරීම හා අරමුණු සපුරාගැනීම පිළිබඳ පසුවිපරම් කිරීම 147
4.4.2 ගොවි සංවිධාන උසස් ක්‍රියාකාරීත්වයකින් යුක්ත වීමට හේතු 148
4.5 සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන 148
4.5.1 සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධානවල දැකිය හැකි ලක්ෂණ 148
4.5.2 සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධානවල කාර්යයන් 149
4.5.3 සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් පැවතීමට හේතු 150
4.6 දුර්වල ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන 150
4.6.1 දුර්වල ක්‍රියාකාරීත්වයක් සහිත වීමට හේතු 150

4.6.1.1 නායකත්ව ගති ලක්ෂණවලින් තොර කැපවීම නොමැති පුද්ගලයන් නායකත්වය ඉසිලීම 151
4.6.1.2 සාමාජිකත්වයේ අනවබෝධය 151
4.6.1.3 සම්පත් සීමිත බව 151
4.6.1.4 සාමජිකයන් සිය පෞද්ගලික ක්‍රියාකාරීත්වය තුළින් ආර්ථික දියුණුව අපේක්ෂා කිරීම 152
4.6.1.5 ආයතනික සම්බන්ධතා අවම මට්ටමක පැවතීම 152
4.7 අධ්‍යයනය කළ ගොවි සංවිධාන අතුරින් දුර්වල ගොවි සංවිධානවල දැකිය හැකි වූ ලක්ෂණ 153
4.7.1 ගොවි සංවිධාන දුර්වල ක්‍රියාකාරීත්වයෙන් ඉවුකිරීමට හේතු 154
4.8 සාර්ථක ගොවි සංවිධාන පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වෙනත් විද්වතුන් විසින් දක්වා ඇති අදහස් 154
4.8.1 ගොවි සංවිධාන ගොවීන්ට දැනෙන ආර්ථික ප්‍රතිලාභ ලබාදීම 154
4.8.2 ගොවි සංවිධාන නායකත්වය හා කමිටු දිරිමත් කිරීම 155
4.8.3 ගොවීන්ගේ සමීපතම සහායක ආයතනය ගොවි සංවිධානය බවට විශ්වාසයක් ගොවි ප්‍රජාව තුළ ගොඩනැගී පැවතීම 156
4.9 සාර්ථක ගොවි සංවිධාන බිහිකිරීමේ කාර්යයේ දී මෙම ගොවි සංවිධාන තුළ දැකිය හැකි වූ බාධක 157
4.9.1 එකම නායකත්වය වසර ගණනාවක් සංවිධානය පවත්වාගෙන යාම 157
4.9.2 සාමාජික බහුතරය වගකීම් දැරීමට පසුබට වීම 158
4.9.3 විවිධ ආයතන නියෝජනය කරමින් සංවිධාන ගණනාවක් ගම්වල පිහිටුවීම නිසා ගොවි සංවිධාන නො වැදගත් සංවිධාන බවට පත් වීම 159
4.9.4 කොන්ත්‍රාත් කිරීම 159
4.9.5 ගොවි සංවිධානයට ඇති නෛතික බලතල පිළිබඳ දැනුවත්කමක් නොමැතිකම 160
4.10 ගොවි සංවිධාන මුහුණ දී සිටින පොදු ගැටලු 160
4.11 පොහොර සහනාධාරය 25%කින් අඩු කිරීම සම්බන්ධ රජයේ උත්සාහයේ දී ගොවි සංවිධානවල කාර්යභාරය 161
4.12 වර්තමානයට ගැළපෙන පරිදි ගොවි සංවිධාන ප්‍රතිසංවිධානය කිරීමේ දී ඒවායේ අරමුණු කාර්යභාරය සහ සිදුවිය යුතු වෙනස්කම් 162
4.13 ග්‍රාමීය නිෂ්පාදන කළමනාකරණ ඒකකයක් වශයෙන් ගොවි සංවිධාන ක්‍රියාත්මක කරවීමට ඇති නැති හැකියාව 162

පස් වන පරිච්ඡේදය

සොයා ගැනීම් නිගමන හා නිර්දේශ 164
5.1 සොයා ගැනීම් 164
5.2 නිගමන 166

5.3 නිර්දේශ 167

ඇමුණුම 1 171

ගොවි සංවිධානයන් සතු නීතිමය බලතල

ඇමුණුම 2 174

අරුණ ගොවි සංවිධානයේ 2011$12$31 දිනට ආදායම් වියදම් ගිණුම

ආශ්‍රිත ග්‍රන්ථ 175

# වගු සටහන්

පිටු අංකය


**සිද්ධි අධ්‍යයන අංක 01 - අරුණ ගොවි සංවිධානය**

3.1.1 සාමාජික වර්ධනය 18

3.1.2 ප්‍රබුද්ධ ලේඛනය සැකසීමේ දී ලකුණු දීමේ පිළිවෙත 20

3.1.3 මුදල් ඉතිරි කිරීම 21

3.1.4 ණය සැපයීම 22

3.1.5 සංවිධානය විසින් කරන ලද කොන්ත්‍රාත් 23

3.1.6 ගොවි ක්ෂේත්‍ර චාරිකා 24

3.1.7 ගොවි සංවිධානයේ අනුකම්ටු හා කාර්යභාරයන් 25

3.1.8 සහල් සැකසුම් ව්‍යාපෘතිය 26

3.1.9 අධ්‍යාපනික වැඩසටහන් 27

**සිද්ධි අධ්‍යයන අංක 02 - එකමුතු ගොවි සංවිධානය**

3.2.1 ගලඅඹගස්වැව මහවැව ප්‍රතිසංස්කරණය සඳහා වූ මූල්‍ය ආධාර සපයාගැනීමේ මූලයන් 29

3.2.2 විවිධ මාර්ගවලින් ගොවි සංවිධානයට ලැබුණු ආදායම් ප්‍රමාණය 31

3.2.3 ගොවි සංවිධානයට බාහිර ආයතනවලින් ආධාර ලැබීම 32

3.2.4 ගොවි සංවිධානයට බාහිර ආයතනවලින් ලද ආධාර සාමාජිකයන්ට ලබාදීම 32

3.2.5 ක්ෂණික ණය ලබාදීම 32

3.2.6 ගොඩ බෝග වගාකිරීම 33

3.2.7 තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදීම 34

3.2.8 කොන්ත්‍රාත් භාරගැනීම තුළින් ඉපැයූ ආදායම 34

3.2.9 සාමාජිකත්ව වර්ධනය 35

3.2.10 වෙනත් ප්‍රජා සංවිධානවලට අධ්‍යාපන පුහුණුව ලබාදීම 37

3.2.11 උසස් අධ්‍යාපන කටයුතු සඳහා උපකාර කිරීම 37

3.2.12 වෘත්තීය පුහුණුවට යොමු කිරීම 38

3.2.13 සාමාජිකයන් අතර සුහදත්වය වර්ධනය සඳහා වැඩසටහන් සංවිධානය කිරීම 39

3.2.14 ගොවි සංවිධාන ගොඩනැගිල්ල ඉදිකිරීම 40

3.2.15 ගොඩ බෝග වගාවට ගොවීන් යොමු කිරීම සඳහා ඉටුකරන ලද කාර්යයන් 41

**සිද්ධි අධ්‍යයන අංක 03 – දඹදියමල් ගොවි සංවිධානය**

3..3.1 ගොවි සංවිධානයේ සාමාජික වර්ධනය 42

3.3.2 ලබාගෙන ඇති කොන්ත්‍රාත් ප්‍රමාණය 44

3.3.3 කොන්ත්‍රාත් මගින් ආදායම් ඉපැයීම 45

3.3.4 වෙනත් ආදායම් මාර්ග 45

3.3.5 කුඹුරට පිදුරු යෙදීම 46

3.3.6 කොම්පෝස්ට් භාවිතය 46

3.3.7 පිදුරු යෙදීම නිසා වී වගාවේ සාමාන්‍ය අස්වැන්නේ වැඩිවීම 47

3.3.8 ගොවි ආරවුල් විසඳීම 47

3.3.9 පළතුරු සහ අපනයන බෝග වගා අක්කර ප්‍රමාණ 48

**සිද්ධි අධ්‍යයන අංක 04 - නැෂනල්වැව ගොවි සංවිධානය**

3.4.1 ගොවි සංවිධානයේ සාමාජිකත්ව වර්ධනය 51

3.4.2 ගොවි සංවිධානයේ වත්කම් 53

**සිද්ධි අධ්‍යයන අංක 05 – ණියඅරාව ගොවි සංවිධානය**

3.5.1 ගොවි සංවිධාන බල ප්‍රදේශයේ බෝග වගාවේ ව්‍යාප්තිය 56

3.5.2 ගොවි සංවිධානයේ සාමාජික වර්ධනය 57

**සිද්ධි අධ්‍යයන අංක 06 - සුළුංකපොල්ල ගොවි සංවිධානය**

3.6.1 ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව 60

3.6.2 ගොවි සංවිධානයේ අරමුදල්වල තත්ත්වය 61

3.6.3 ඉටුකළ කොන්ත්‍රාත් සංඛ්‍යාව 62

3.6.4 යෙදවුම් සපයා ගැනීම සඳහා ගොවි බැංකු ණය සැපයීම 63

**සිද්ධි අධ්‍යයන අංක 07 – සේනාති ගොවි සංවිධානය**

3.7.1 ගොවි සංවිධානය සතු අරමුදල් 68

**සිද්ධි අධ්‍යයන අංක 08 - පල්ලේ පැල ගොවි සංවිධානය**

3.8.1 සංවිධානයේ සාමාජික වර්ධනය 70

3.8.2 ගොවි සංවිධානයේ අරමුදල් වර්ධනය 71

**සිද්ධි අධ්‍යයන අංක 09 - සෙවන කාන්තා ගොවි සංවිධානය**

3.9.1 ගොවි සංවිධානයේ සාමාජිකත්ව වර්ධනය 75

3.9.2 ගොවි සංවිධානයේ අරමුදල් වර්ධනය 80

**සිද්ධි අධ්‍යයන අංක 10 - පාළුවැව ගොවි සංවිධානය**

3.10.1 පාළුවැව ගොවි සංවිධානයේ සාමාජිකත්වය 83

3.10.2 ගොවි සංවිධානයේ අරමුදල් වර්ධනය 84

**සිද්ධි අධ්‍යයන අංක 11- මහසෙන් ගොවි සංවිධානය**

3.11.1 ගොවි සංවිධානය තුළ අරමුදල් වර්ධනය 92

3.11.2 ගොවි සංවිධානය තුළ සුබසාධන අරමුදල් වර්ධනය 92

**සිද්ධි අධ්‍යයන අංක 13 - වැල්ලාන ගොවි සංවිධානය**

3.13.1 ගොවි සංවිධානය තුළ අරමුදල් වර්ධනය 99

3.13.2 ගොවි සංවිධානය තුළ සාමාජික වර්ධනය 100

**සිව්වැනි පරිච්ඡේදය සිද්ධි අධ්‍යයන ආශ්‍රයෙන් ගොවි සංවිධාන විමසුම**

4.1 ගොවි සංවිධානවල කාර්යසාධනය මත ලකුණු ලබාදීම 140

# ප්‍රස්තාර සටහන්


| | | | පිටු අංකය |
|---|---|---|---|
| ප්‍රස්තාර අංක | 3.1.1 | – සාමාජික වර්ධනය, අරුණ ගොවි සංවිධානය | 18 |
| ප්‍රස්තාර අංක | 3.2.1 | – සාමජික වර්ධනය, එකමුතු ගොවි සංවිධානය | 36 |
| ප්‍රස්තාර අංක | 3.3.1 | – සාමාජික වර්ධනය, දහදියමල් ගොවි සංවිධානය | 43 |
| ප්‍රස්තාර අංක | 3.4.1 | – සාමාජික වර්ධනය, නැෂතල්වැව ගොවි සංවිධානය | 51 |
| ප්‍රස්තාර අංක | 3.5.1 | – සාමාජික වර්ධනය, ණියඅරාව ගොවි සංවිධානය | 57 |
| ප්‍රස්තාර අංක | 3.6.1 | – සාමාජික වර්ධනය, සුළං කපොල්ල ගොවිසංවිධානය | 61 |
| ප්‍රස්තාර අංක | 3.7.1 | – ගොවි සංවිධානය සතු අරමුදල්, සේනානි ගොවි සංවිධානය | 68 |
| ප්‍රස්තාර අංක | 3.8.1 | – සාමාජික වර්ධනය, පල්ලේපැල ගොවි සංවිධානය | 71 |
| ප්‍රස්තාර අංක | 3.9.1 | – සාමාජික වර්ධනය, සෙවන ගොවි සංවිධානය | 76 |
| ප්‍රස්තාර අංක | 3.9.2 | – ගොවි සංවිධානයේ අරමුදල් වර්ධනය, සෙවන ගොවි සංවිධානය | 80 |
| ප්‍රස්තාර අංක | 3.10.1 | – සාමාජික තත්ත්වය, පාළුවැව ගොවි සංවිධානය | 84 |
| ප්‍රස්තාර අංක | 3.11.1 | – ගොවි සංවිධානය සතු අරමුදල් වර්ධනය, මහසෙන් ගොවි සංවිධානය | 92 |
| ප්‍රස්තාර අංක | 3.11.2 | – ගොවි සංවිධානය තුළ සුබසාධක අරමුදල් වර්ධනය | 92 |
| ප්‍රස්තාර අංක | 3.13.1 | – ගොවි සංවිධානයේ සාමාජික වර්ධනය, වැල්ලාන ගොවි සංවිධානය | 99 |
| ප්‍රස්තාර අංක | 3.13.2 | - ගොවි සංවිධානයේ සාමාජික වර්ධනය, වැල්ලාන ගොවි සංවිධානය | 101 |

# රූප සටහන්


| | | | පිටු අංකය |
|---|---|---|---|
| රූප සටහන් අංක 4.2.1 | – | සාමාජිකත්වය වර්ධනය කරගැනීම සඳහා විශේෂ වැඩසටහන් සංවිධානය කිරීම | 110 |
| රූප සටහන් අංක 4.2.2 | – | සහනාධාරපොහොර ගොවීන්ට ලබාදීම | 111 |
| රූප සටහන් අංක 4.2.3 | – | ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 112 |
| රූප සටහන් අංක 4.2.4 | – | ගොවි සංවිධාන සාමාජිකයන්ට සංවිධානය තුළ මුදල් ඉතිරි කිරීමට පහසුකම් සැලසීම | 113 |
| රූප සටහන් අංක 4.2.5 | – | කුඩා කණ්ඩායම් සංවිධානය කිරීම | 114 |
| රූපසටහන් අංක 4.2.6 | - | බීජ හා රෝපණ ද්‍රව්‍ය සපයා දීම | 115 |
| රූප සටහන් අංක 4.2.7 | – | පොදු දේපළ නඩත්තු කිරීම හා සැපයීම | 116 |
| රූප සටහන් අංක 4.2.8 | – | ජල කළමනාකරණය සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම | 117 |
| රූප සටහන් අංක 4.2.9 | – | කන්න රැස්වීම් පැවැත්වීම | 118 |
| රූප සටහන් අංක 4.2.10 | – | වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම | 119 |
| රූප සටහන් අංක 4.2.11 | – | ගොවිජන පනත්වලින් ගොවි සංවිධානවලට පැවරී ඇති නීතිමය බලතල පිළිබඳව ඇති අවබෝධය | 120 |
| රූප සටහන් අංක 4.2.12 | – | වාර්ෂික මහාසභා රැස්වීම්වල දී නව නායකයින් පත් කර ගැනීම | 121 |
| රූප සටහන් අංක 4.2.13 | - | දෙවන පෙළ නායකත්වයක් පුහුණු කිරීම | 123 |
| රූප සටහන් අංක 4.2.14 | - | විධිමත් ලෙස ගිණුම් තැබීම | 124 |
| රූප සටහන් අංක 4.2.15 | – | කෘෂි උපකරණ සාධාරණ අයකිරීම් මත ගොවීන්ට සැපයීම | 125 |
| රූප සටහන් අංක 4.2.16 | – | සංස්කෘතික හා ආගමික කාර්යයන් වාර්ෂිකව සිදු කිරීම | 126 |
| රූප සටහන් අංක 4.2.17 | – | සුබසාධන අංශයක් පවත්වාගෙනයාම | 127 |
| රූප සටහන් අංක 4.2.18 | - | කොන්ත්‍රාත් කිරීම | 128 |
| රූප සටහන් අංක 4.2.19 | – | ගොවි සංවිධානය සතුව ගොඩනැඟිලි පැවතීම | 128 |
| රූපසටහන් අංක 4.2.20 | – | ව්‍යාපාරික කටයුතුවල නියැලීම | 129 |
| රූප සටහන් අංක 4.2.21 | – | ගෙවතු වගා සහ ගොඩ බෝග වගාවට ගොවීන් උනන්දු කරවීම | 131 |
| රූප සටහන් අංක 4.2.22 | – | අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම | 131 |

| | | |
|---|---|---|
| රූප සටහන් අංක 4.2.23 – | කාබනික පොහොර කුඹුරට යෙදීම සඳහා ගොවීන් උනන්දු කරවීම | 132 |
| රූප සටහන් අංක 4.2.24 – | සාමාජිකයන් පිළිබඳ දත්ත රැස්කිරීම | 133 |
| රූප සටහන් අංක 4.2.25 – | අරමුදල් ගොඩනැංවීම | 134 |
| රූප සටහන් අංක 4.2.26 – | ගොවි හඬ ජාතික තලයට ගෙනයාම | 135 |
| රූප සටහන් අංක 4.2.27 - | පාංශු සංරක්ෂණය පිළිබඳ උපදෙස් ලබාදීම | 136 |
| රූප සටහන් අංක 4.2.28 – | කෘෂිකාර්මික කම්ටුවලට සහභාගීවීම | 137 |
| රූප සටහන් අංක 4.2.29 - | විධිමත් ආකාරයට මාසික රැස්වීම් පැවැත්වීම | 139 |

## පළමුවැනි පරිච්ඡේදය

# ශ්‍රී ලංකාවේ ජලපෝෂිත හා සුළු වාරිමාර්ග ආශ්‍රිත ගොවි සංවිධානවල කාර්ය සාධනය

### 1.1 ප්‍රවිෂ්ටය

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ගොවි ජනතාව සක්‍රිය ලෙස සහභාගී කර ගැනීමට ඔවුන් බල ගැන්විය යුතු ය යන්න මෑත කාලීනව සංවර්ධන ක්‍රියාදාමයන් හි පිළිගත් මතයක් බවට පත්ව තිබේ. එසේ ගොවීන් බල ගැන්වීමේ දී ඉවහල් කොටගත හැකි බලගතු උපකරණයක් ලෙස ගොවි සංවිධාන සැලකේ. මේ අනුව, සංවර්ධනය වෙමින් පවතින අනෙකුත් රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද ගොවි සංවිධාන පිහිටුවීම සඳහා පසුගිය දශක කිහිපය තුළ දී මහත් ආයාසයක් ගනු ලැබිණි.

ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන පිහිටුවීමේ ඉතිහාසය 1980 දශකයේ මුල් වකවානුව දක්වා දිවයන අතර එම යුගයේ දී ජල කළමනාකරණය කිරීම සඳහා ගොවීන් සහභාගී කරවා ගැනීමේ අරමුණින් ග්‍රාමීය සුළු වාරිමාර්ග ප්‍රදේශ මෙන් ම මහා වාරිමාර්ග බල ප්‍රදේශයන් ද ආවරණය වන ආකාරයට විවිධ ව්‍යාපෘතීන් යටතේ ගොවි සංවිධාන පිහිටුවනු ලැබිණි. 1991 අංක 04 දරන ගොවිජන සේවා සංශෝධන පනත මගින් ගොවි සංවිධාන නීතිමය වශයෙන් පිළිගත් ආයතන බවට පත් කළ අතර ගොවිජන සේවා කොමසාරිස් යටතේ ඒවා ලියාපදිංචි කිරීම ආරම්භ විය.

ගොවි සංවිධාන මගින් මුල් කාලයේ දී කාර්යක්ෂම ජල කළමනාකරණයට අමතරව ප්‍රධාන වශයෙන් ම සිදු කරන ලද්දේ කෘෂිකාර්මික යෙදවුම් බෙදා හැරීම, ඉහළ ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා නවීන වගා ක්‍රම භාවිතය ප්‍රචලිත කිරීම, ගොවීන් සඳහා ණය හා වෙළෙඳපොළ සංවර්ධනය කිරීම හා ගොවීන් අතර ඇතිවන ආරවුල් සමථයකට පත් කරලීම යන කාරණාවන් ය.

වර්ෂ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත ගොවි සංවිධානවලට ලබා දී තිබූ බලය වැඩි කරමින් ඒවායෙ හි කාර්යභාරය තවත් පුළුල් කෙරිණි. එම පනතට අනුව ගොවි සංවිධානයක කාර්යයන් ලෙසඃ

i ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ඉඩම් හිමි ගොවීන් සහ ඉඩම් භුක්තිකරුවන් මෙම පනතේ විධි විධානවලට අනුව ඔවුන් සතු කෘෂිකාර්මික ඉඩම් වගා කිරීමට පෙළඹවීම, වගා කන්න සඳහා කුඹුරු ඉඩම් වගා කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම මෙන් ම ගොඩ ඉඩම් වගා කිරීම සඳහා වාර්ෂික වැඩසටහන් සකස් කිරීම.

ii පනතේ විධිවිධාන අනුව සතුටුදායක ලෙස වගා නො කරන කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ තොරතුරු එකතු කිරීම හා ඒ පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම.

iii පස සංරක්ෂණය, කාර්යක්ෂම ජල පරිහරණය, කොම්පෝස්ට් පොහොර භාවිතය ධෛර්යමත් කිරීම, ප්‍රදේශය සඳහා නිර්දේශිත කෘෂිකාර්මික බෝග නිර්දේශ කිරීම හා සුදුසු සතුන් වර්ග බෝ කිරීම මෙන් ම මිරිදිය මත්ස්‍යයන් වගා කිරීම සම්බන්ධ තොරතුරු ලබා දීම, එම බෝග හා සතුන් හා මිරිදිය

මත්ස්‍යයින් රෝගවලින් හා වසත්ගතවලින් මිදී ඇති බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම, ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පාරිසර හිතකාමී වගා ක්‍රම සඳහා ඔවුන් ධෛර්යමත් කිරීම යන කාර්යයන් දැක්විය හැකි ය.

## 1.2 පර්යේෂණ ගැටලුව හා එහි වැදගත්කම

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2010 සංඛ්‍යා දත්තවලට අනුව, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගොවි සංවිධාන සංඛ්‍යාව 13,732ක් සහ ලියාපදිංචි නොවූ ගොවි සංවිධාන සංඛ්‍යාව 1,390ක් වේ. ඒ අනුව, දැනට ශ්‍රී ලංකාවේ මුළු ගොවි සංවිධාන සංඛ්‍යාව 15,222කි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුව අක්‍රිය මට්ටමේ පවතින ගොවි සංවිධාන සංඛ්‍යාව 684කි. ක්‍රියාත්මක මට්ටමේ පවතින ගොවි සංවිධාන සංඛ්‍යාව 13,300ක් පමණ වේ. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගොවි සංවිධානවලින් 80%ක් පමණ ක්‍රියාත්මක වන්නේ වර්ෂා පෝෂිත හා සුළු වාරිමාර්ග ක්‍රම ආශ්‍රිතව ය. ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව වඩාත් අසාර්ථක තත්ත්වයේ පවතින්නේ ද මෙම ප්‍රදේශවල ක්‍රියාත්මක ගොවි සංවිධානයන් ය. එසේ වුව ද, මෙම අක්‍රිය යැයි මිනුම් කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව භාවිතා කරන මිනුම් ලෙස ඔවුන් සඳහන් කරන්නේ වාර්ෂික මහා සභා වාර නො පැවැත්වීම, ග්‍රාමීය මට්ටමේ ඉදිකිරීම් කටයුතු (කොන්ත්‍රාත්) සඳහා සක්‍රියව දායක නොවීම යනා දී කරුණු කිහිපයකි. එසේ වුවත් ගොවි සංවිධානයක් තුළින් අපේක්ෂිත අරමුණු ඊට වඩා පුළුල් ය.

එබැවින්, එවැනි ප්‍රදේශවල ගොවි සංවිධානයන් හි කාර්ය සාධනය විමසා බලා බොහොමයක් සංවිධාන අක්‍රියව පවතින්නේ ඇයි ද යන්න විමසා බැලීම එවා ප්‍රතිසංවිධානය කිරීමේ කාර්යයේ දී වඩාත් වැදගත් වන බැවින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ඊට අමතර වශයෙන් මෙම අධ්‍යයනය යටතේ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා අදාළව පවත්නා තවත් ගැටලු කිහිපයකට පිළිතුරු සපයා ගැනීමට අපේක්ෂා කෙරිණි. එවා නම් අනෙකුත් ගොවි සංවිධාන වලට සාපේක්ෂව කුඩා වාරිමාර්ග හා වර්ෂාපෝෂිත ගොවි සංවිධාන වෙනස් විය යුත්තේ කෙසේ ද? ගොවි සංවිධානයන් හි අරමුණු වෙනස් විය යුතු ද? මල් වගාව, විසිතුරු මත්ස්‍ය වගාව වැනි වර්තමානයේ ප්‍රචලිතව පවත්නා කාර්යයන් සඳහා විශේෂිත ගොවි සංවිධාන පිහිටුවිය යුතු ද? ගොවි සංවිධාන කොන්ත්‍රාත් කිරීම් කාර්යයන් හි නියුතු වීම කෙතරම් දුරට ගැළපේ ද? රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ගොවි සංවිධාන කෙතරම් දුරට දායක වන්නේ ද? හා ඒ සඳහා එවා කාර්යක්ෂම අයුරින් දායක කරගත හැකි ද? යන එවා ය.

## 1.3 අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු

ගොවි සංවිධානයන් හි ක්‍රියාකාරී ප්‍රගතිය විමසා බලා එවා වඩාත් ක්‍රියාකාරී බවට පත් කිරීම සඳහාත්, වර්තමාන සමාජ-ආර්ථික අවශ්‍යතාවයන්ට අනුව හැඩගැස්වීම සඳහාත් කළයුතු ප්‍රතිසංවිධාන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම

i. සාමාන්‍ය ක්‍රියාකාරීත්වයේ ස්වභාවය අනුව ගොවි සංවිධාන හඳුනා ගැනීම හා ඒ සම්බන්ධයෙන් එවා විවිධ මට්ටම් හි පැවතීමට හේතු සොයා බැලීම

ii. අපේක්ෂිත අරමුණු ඉටු කිරීමෙහි ලා දක්වන දායකත්වයේ මට්ටම අනුව ගොවි සංවිධාන හඳුනා ගැනීම හා ඒ සම්බන්ධයෙන් විවිධත්වයක් ගැනීමට හේතු විමසා බැලීම

iii. ගොවි සංවිධානවලින් අපේක්ෂිත අරමුණු සපුරා ගැනීම සම්බන්ධව ඒවාට ඇති ගැටලු සොයා බැලීම

iv. වර්තමාන කෘෂිකාර්මික ප්‍රතිපත්තියෙ හි ඇතැම් මූලික අංග වන පොහොර සහනාධාරය ලබාදීම, කාබනික පොහොර ප්‍රවර්ධනය කරමින් රසායනික පොහොර භාවිතය 25%කින් අඩු කිරීම හා වෙළෙඳපළ ඉලක්ක කර ගනිමින් වැඩි වටිනාකමක් සහිත බෝග වගා කිරීම වැනි දෑ ගොවි සංවිධානවල දායකත්වය ඇතිව වර්ධනය කළ යුතු ආකාරය සොයා බැලීම

v. වර්තමානයට ගැළපෙන පරිදි ගොවි සංවිධාන ප්‍රතිසංවිධානය කිරීමේ දී එහි අරමුණු, කාර්ය භාරය හා ව්‍යුහය යනාදියෙ හි සිදු විය යුතු වෙනස්කම් ගවේෂණය කිරීම

## 1.4 අධ්‍යයන ක්‍රමවේදය :

ප්‍රාථමික මෙන් ම ද්විතියික තොරතුරු ආශ්‍රයෙන් අධ්‍යයනය සිදු කෙරේ. විවිධ කෘෂි දේශගුණික කලාප හා නිෂ්පාදන තත්ත්වයන් නියෝජනය වන ආකාරයට තෝරා ගනු ලබන සාර්ථක හා අසාර්ථක ගොවි සංවිධාන 14ක් පිළිබඳව කරනු ලැබූ සිද්ධි අධ්‍යයන ආශ්‍රයෙන් මේ සඳහා ප්‍රාථමික තොරතුරු රැස් කරන ලදී.

ක්‍රියාකාරී ගොවි සංවිධානයක් විසින් සාමාජික ගොවිජනතාව වෙනුවෙන් සිදු කළ යුතු ක්‍රියාකාරකම් ඇතුළත් නිර්ණායක 31ක් ගොඩනගා එම ගුණාංග කොපමණ ප්‍රමාණයක් අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන 14හි අඩංගුව ඇත්තේ ද යන්න විමසා, එම ගොවි සංවිධාන උසස්, අඩු සහ දුර්වල ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන ලෙස ශ්‍රේණිගත කිරීමක් සිදු කොට ඇත. එලෙස ශ්‍රේණිගත කිරීමක් සිදු කළ ගොවි සංවිධාන ඉහළ ක්‍රියාකාරීත්වයක් පෙන්වීමට හේතු විග්‍රහ කර ඇති අතර අඩු ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන, එසේ වීමට හේතු ද විග්‍රහ කොට තිබේ. දුර්වල ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන එලෙස දුර්වල වීමට හේතු ද විග්‍රහ කොට ඇත.

### 1.4.1 ප්‍රාථමික දත්ත

ගොවි සංවිධානවල නිලධාරීන්, සාමාජිකයින් මෙන් ම සාමාජික නො වූවන් අදාළ බල ප්‍රදේශයන් හි ගොවිජන සංවර්ධන නිලධාරීන් සමඟ පවත්වනු ලැබූ සම්මුඛ සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත සපයා ගන්නා ලදී.

### 1.4.2 ද්විතියික දත්ත

ගොවි සංවිධාන සම්බන්ධයෙන් සිදුකර තිබෙන පර්යේෂණ හා අධ්‍යයනයන් හි අඩංගු කරුණු ද, සංවිධාන ක්‍රියාකාරීත්වය (Organizational behavior) පිළිබඳ අදාළ ග්‍රන්ථ, සඟරා, ලිපි ලේඛන හා අන්තර්ජාලයෙන් ලබා ගන්නා තොරතුරු ද ද්විතියික දත්ත වශයෙන් යොදා ගැණුනි.

දත්ත රැස්කිරීමේ දී භාවිතා කරනු ලැබූ නිර්ණායක ඇමුණුම් වගු අංක 01 තුළ ඇතුළත් කෙරේ.

### 1.4.3 දත්ත විශ්ලේෂණය

දත්ත පරිගණක ගත කිරීමෙන් සංඛ්‍යාත්මය වගු ප්‍රස්තාර ආශ්‍රයෙන් දත්ත හා තොරතුරු විශ්ලේෂණය කොට ඇත.

## 1.5 අධ්‍යයන ප්‍රදේශය

මෙම අධ්‍යයනය සඳහා දිස්ත්‍රික්ක 5ක සාර්ථක ගොවි සංවිධාන හා අසාර්ථක මට්ටමේ පවතින ගොවි සංවිධාන 14ක් අධ්‍යයනයට ලක් කරන ලදී. දිස්ත්‍රික්ක තෝරා ගැනීමේ දී විවිධ බෝග වගා හා නිෂ්පාදන තත්ත්වයන් මෙන් ම ජල පෝෂණ තත්ත්වයන් (සුළු වාරිමාර්ග හා වර්ෂා පෝෂක) කෙරෙහි ද අවධානය යොමු කරන ලදී.

මෙම පර්යේෂණ යෝජනාව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර එහි දී ලබා දුන් උපදෙස් වූයේ වර්ෂා පෝෂිත සහ සුළු වාරිමාර්ග ප්‍රදේශයේ සාර්ථක සහ අසාර්ථක ගොවි සංවිධාන තෝරා මෙම අධ්‍යයනය සිදු කරන ලෙස ය. ඒ අනුව, කුරුණෑගල, අනුරාධපුර, මාතර, බදුල්ල හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරුන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසු සාර්ථක සහ අසාර්ථක ගොවි සංවිධාන රාශියක් හඳුනාගන්නා ලද අතර ඒ අතුරින් පහත දැක්වෙන ගොවි සංවිධාන 14 තෝරා ගැණුනි.

අධ්‍යයනය කරන ලද ගොවි සංවිධාන

| | | |
|---|---|---|
| කුරුණෑගල | නාගොල්ලාගම | අරුණ ගොවි සංවිධානය සහ එකමුතු ගොවි සංවිධානය |
| | ඉබ්බාගමුව | නැෂනල් වැව ගොවි සංවිධානය |
| | නාරම්මල | දහදියමල් ගොවි සංවිධානය |
| අනුරාධපුර | මිහින්තලේ | පාළුවැව ගොවි සංවිධානය |
| | ඇලයාපත්තුව | සෙවන කාන්තා ගොවි සංධානය |
| මාතර | දෙනියාය | මහසෙන් හා ජනහිත ගොවි සංවාධානය |
| | කතංකේ | වැල්ලාන ගොවි සංවිධානය |
| බදුල්ල | බොරලන්ද | පල්ලේපැල හා ණියඅරාව ගොවි සංවිධානය |
| | කැප්පෙටිපොල | සුළංකපොල්ල ගොවි සංවිධානය |
| | සොරණාතොට | සේනානි ගොවි සංවිධානය |
| හම්බන්තොට | මොදරවාන | මොදරවාන දකුණ ගොවි සංවිධානය |

## 1.6 වාර්තාවේ සැකැස්ම

ගොවි සංවිධාන හැඳින්වීම, ගොවි සංවිධාන පිහිටුවීමෙන් පසු විවිධ වසරවල රජයයන් විසින් හඳුන්වා දුන් පනත්වලින් ගොවි සංවිධානවලට ලබාදුන් බලතල හා ඒවා වරින් වර පුළුල්වීම 1991 අංක 4 දරන ගොවිජන සේවා සංශෝධන පනත, වර්ෂ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යන පනත්වලින් ගොවි සංවිධාන සම්බන්ධයෙන් දක්වා ඇති විධිවිධාන, පර්යේෂණ ගැටළුව හා එහි වැදගත්කම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු, අධ්‍යයන ක්‍රමවේදය, ප්‍රාථමික දත්ත ලබාගැනීම, ද්විතීයික දත්ත ලබාගැනීම, දත්ත විශ්ලේෂණ ක්‍රමය, අධ්‍යයන ප්‍රදේශ ආදී තොරතුරු පළමුවැනි පරිච්ඡේදයට ඇතුළත් වේ.

සංවිධානයක් යනු කුමක් ද පැහැදිලි කිරීම, ගොවි සංවිධාන ඉතිහාසය, ගොවි සංවිධාන පිහිටුවීමෙන් රජය බලාපොරොත්තු වූ කාර්යභාරය, ඒවා ගොවි ජනතාවට වැදගත්වන ආකාරය පැහැදිලි කිරීමත්, දේශීය හා විදේශීය ව ක්‍රියාත්මක වන ගොවි සංවිධාන පිළිබඳව

සිදු කරන ලද අධ්‍යයනයන් පරිශීලනය කර එකතු කර ගන්නා ලද කරුණු ඇතුළත් සාහිත්‍යමය විමර්ශනය ද දෙවන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරෙයි.

සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය භාවිතා කරමින් අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන 14 පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කිරීමට තුන්වැනි පරිච්ඡේදය වෙන් කෙරේ. මේ යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මීරිගන්පිටිගම අරුණ ගොවි සංවිධානය, ගලඅඹගස්වැව එකමුතු ගොවි සංවිධානය, ඉබ්බාගමුව නැෂනල්වැව ගොවි සංවිධානය, නාරම්මල ගිනිගත්පිටිය දහදියමල් ගොවි සංවිධානය, අනුරාධපුර ඇලයාපත්තුව සෙවන කාන්තා ගොවි සංවිධානය, මිහින්තලේ පාළුවැව ගොවි සංවිධානය, මාතර දෙනියාය දෑරංගල ගොවි සංවිධානය, කොටපොල උතුර මහසෙන් ගොවි සංවිධානය, කතංකේ වැල්ලාන ගොවි සංවිධානය, බදුල්ල බොරලන්ද වංගියකුඹුර ගොවි සංවිධානය, ණයඅරාව ගොවි සංවිධානය, සොරණාතොට සේනානී ගොවි සංවිධානය, සිල්මියාපුර සුළුංකපොල්ල ගොවි සංවිධානය, වලස්මුල්ල මොදරවාන ගොවි සංවිධානය යන ඒවා පිළිබඳව සිද්ධි අධ්‍යයන ඉදිරිපත් කොට තිබේ.

සිද්ධි අධ්‍යයනයට ලක් කරන ලද ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය ඇගයීම සිව්වැනි පරිච්ඡේදයේ දී සිදු කරයි.

සිද්ධි අධ්‍යයනයට ලක් කරන ලද ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය මත ඒ පිළිබඳ බැසගත හැකි නිගමන හා ගොවි සංවිධාන උසස් ක්‍රියාකාරී සංවිධාන බවට පත් කොට ගොවි ජනතාවට පුළුල් සේවාවක් සිදු කිරීම සඳහා ඒවා අවශ්‍ය ආකාරයට සකස් කර ගැනීමට උපයෝගී කර ගත හැකි යෝජනා හා නිගමන පස්වැනි පරිච්ඡේදයේ දී ඉදිරිපත් කෙරේ.

## දෙවැනි පරිච්ඡේදය
## සාහිත්‍ය විමර්ශනය

**හැඳින්වීම**

මෙම පරිච්ඡේදය මඟින් ගොවි සංවිධාන සම්බන්ධයෙන් හඳුන්වා දී ඇති පනත් හා ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ වෙනත් රටවල ගොවි සංවිධානවල සාර්ථක අසාර්ථකභාවය සම්බන්ධ අධ්‍යයන වාර්තා හා ශාස්ත්‍රීය ලිපි ලේඛන විමර්ශනයට ලක් කෙරේ. 1958 අංක 01 දරන කුඹුරු පනත මඟින් වෙල් විදානේ තනතුර අහෝසි කොට එම රාජකාරී කටයුතු ගොවි කාරක සභාවට පැවරීම හා 1968 සංශෝධනයක් මඟින් වාරිමාර්ග කළමනාකරණය සඳහා දිසාපතිවරයාට ඇති බලතලවලට අමතරව ගොවි කාරක සභා සඳහා ද අවශ්‍ය බලතල පවරාදීම 1980 දශකයේ විවිධ ව්‍යාපෘති යටතේ ගොවි සංවිධාන පිහිටුවීම ආරම්භ වීම 1991 අංක 04 දරන ගොවිජන සේවා සංශෝධන පනත මඟින් ගොවි සංවිධාන නීතිමය වශයෙන් පිළිගත් ආයතන බවට පත් කිරීම මත ගොවිජන සේවා කොමසාරිස් යටතේ ලියාපදිංචි කිරීමේ විධිවිධාන සැලැස්වීම, ආදියත් 1994 අංක 13 දරන වාරිමාර්ග සංශෝධන පනත යටතේ ගොවි සංවිධානවලට පවරා දුන් බලතලත් 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ පවරා ඇති බලතලත් පිළිබඳ විස්තර කෙරෙන අතර මේ සම්බන්ධයෙන් සිදු කොට ඇති අධ්‍යයන වාර්තා හා ශාස්ත්‍රීය ලිපි ලේඛන විමර්ශනයට ලක් කිරීමත් සිදු කෙරේ.

### 2.1 ගොවි සංවිධාන සහ කාර්ය භාරය
### 2.1.1 සංවිධානයක් යනු කුමක් ද?

සංවිධානයක් යනු පොදු අරමුණක් හෝ අරමුණු කිහිපයක් ඉෂ්ට කරගැනීම සඳහා ඒකරාශි වූ ජන කණ්ඩායමකි. තනි තනිව ක්‍රියාත්මක වීමට වඩා සාමූහිකව කටයුතු කිරීම තුළින් ප්‍රතිලාභ වැඩිපුර ලබාගැනීමට හැකි වීම සංවිධාන බිහිවීමට මූලික හේතුව වී තිබේ. තනි පුද්ගලයෙකුට යමක් ලබා ගැනීමට කළ හැකි බලපෑමට වඩා වැඩි බලපෑමක් සාමූහිකව කණ්ඩායමක් වශයෙන් ඉදිරිපත් වීමෙන් කළහැකි බවට උදාහරණ රාශියක් පෙන්වාදිය හැකි ය. වෛද්‍යවරු, පෞද්ගලික බස් හිමියන්, විදුලිබල හා වරාය සේවකයන් සංවිධානගත ව බලපෑම් කොට ඉල්ලීම් දිනා ගැනීම ඒවායින් කිහිපයකි. මේ අය තනි තනිව ක්‍රියාත්මක වූවා නම් මෙම ඉල්ලීම් නො ලැබේ.

සංවිධානවල ස්වරූපය මත සංවිධාන ප්‍රධාන වර්ග දෙකකට වෙන්කළ හැකි ය. එනම්,

01 විධිමත් සංවිධාන - නීත්‍යානුකූල ලෙස ලියාපදිංචි වූ ව්‍යවස්ථාවක් යටතේ තම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා ඒකරාශි වූ සංවිධාන උදා: වෘත්තීය සමිති

02 අවිධිමත් සංවිධාන - අවිධිමත් සංවිධානයක් යනු නීතිමය වශයෙන් ලියාපදිංචි නොවූ සංවිධානය යි. මෙම සංවිධාන වල අරමුණු හා ක්‍රියාකාරකම් විධිමත් සංවිධානයකට සමාන වුව ද එහි නිලධාරි මණ්ඩලයක් සිටීම අනිවාර්ය නොවේ.

### 2.1.2 ගොවි සංවිධාන ඉතිහාසය

ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන ඉතිහාසය රජ දවස දක්වා දිව යයි. වාරි ජලය කළමනාකරණය සහ වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වාරි සභා පැරණි රජ කාලයේ පිහිටුවා ඇති බව කොණ්ඩවටුවාන සෙල්ලිපියෙ හි සඳහන් වේ. එහි සඳහන් පරිදි වගා කාල සටහන් සකස් කරගත්තේ ගම්මුන් ගේ සම්මුති තුළිනි. වගා රීති කඩ කිරීමට දඩුවම් නියම කර ගත්තේ ගොවීන්ම ය.

1958 අංක 01 දරන කුඹුරු පනත සම්මත වීමත් සමග වාරි මාර්ග නිති රීති සකස් කිරීම සඳහා ගොවි කාරක සභා පිහිටුවන ලදි. වෙල්විදානේ තනතුර අහෝසි කර ඔහු විසින් ඉටු කරණු ලැබූ රාජකාරි කටයුතු ගොවි කාරක සභාව මඟින් ඉටු කරන ලදි. 1968 සංශෝධනයක් මඟින් වාරිමාර්ග කළමනාකරණය සඳහා දිසාපතිවරයාට ඇති බලතල වලට අමතරව ගොවි කාරක සභා සඳහා ද අවශ්‍ය බලතල පවරා දෙනු ලැබී ය. 1980 දශකයේ විවිධ ව්‍යාපෘති යටතේ ගොවි සංවිධාන පිහිටුවීම ආරම්භ කරන ලදි. එම සංවිධාන වල මූලික පරමාර්ථය වූයේ කාර්යක්ෂම වාරිමාර්ග කළමනාකරණයක් පවත්වාගෙන යාමයි. මෙහි සාර්ථකත්වය මත 1991 අංක 04 දරන ගොවිජන සේවා සංශෝධන පනත මඟින් ගොවි සංවිධාන නීතිමය වශයෙන් පිළිගත් ආයතන බවට පත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන යොදවනු ලැබී ය. එමඟින් ගොවි සංවිධාන ගොවිජන සේවා කොමසාරිස්වරයා යටතේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය විධි විධාන යොදන ලදි. 2010 වර්ෂය වන විට ගොවි සංවිධාන 13,732 පමණ ලියාපදිංචි කොට තිබේ.

### 2.1.3 ගොවි සංවිධානවල කාර්ය භාරය

ගොවි සංවිධානවල කාර්ය භාරයන් විවිධ අණ පණත් මඟින් සහතික කර ඇත. ඒ අනුව, 1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධන) පනත යටතේ 23.1 වගන්තිය අනුව ගොවි සංවිධානයට ස්වකීය බල ප්‍රදේශය තුළ ජල සම්පාදනය සහ ඉඩම් වගා කිරීමට අදාළ සියලු කටයුතු හා ඒවාට සම්බන්ධ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා වාරිමාර්ග නඩත්තු කටයුතු අදාළ වේ. මේ යටතේ ජලය නිකුත් කරන දින නියම කිරීම, ජල කාලසටහන් සැකසීම ජලය ලබා දෙන ප්‍රමාණය තීරණය කිරීම, කන්න රැස්වීම් වල එකඟ වූ ආකාරයට ජලය බෙදීම සහ වගා කළයුතු බෝග තීරණය කිරීම යනා දී කාර්යයන් ගොවි සංවිධානයට පැවරේ.

ජල සම්පාදනය සහ ඉඩම් වගා කිරීම සම්බන්ධ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම යනුවෙන් අදහස් වන්නේ වාරිමාර්ග ව්‍යාපාරයක් යටතේ නීත්‍යානුකූලව වගා කටයුතු කරන ගොවීන් සඳහා එමඟින් ලැබෙන ජලය ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ ලබා ගැනීමට ඇති අයිතිය ආරක්ෂා කිරීමයි. මේ අනුව, කිසියම් නීතියක් හෝ චාරිත්‍රයක් නො පිළිපැදීම හෝ ඒවාට පටහැනිව ක්‍රියා කිරීම නිසා වගාකරුවන්ට විය හැකි හානිවලින් ආරක්ෂා කිරීම සඳහා පනත යටතේ අවශ්‍ය පියවර ගැනීමේ හැකියාව ගොවි සංවිධානය සතුව පවතී. වාරිමාර්ග නඩත්තු කටයුතු යටතේ ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළ පිහිටි වැව් අමුණු, ඇළවල් වේලි, සොරොව් ආදී වාරිමාර්ග ව්‍යාපාරයට අයත් සියලුම ඉදිකිරීම්වල නඩත්තුව ගොවි සංවිධානවලට පැවරී තිබේ. මේ සඳහා වාරිමාර්ග ගාස්තු අයකිරීමට ගොවි සංවිධාන වෙත බලය පවරා ඇත. වාරිමාර්ග ආඥා පනත යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ගොවි සංවිධානයට හෝ ගොවි සංවිධාන නියෝජිතයෙකුට එය ඉටු කිරීමට ඉඩ නොදීමක්, හිංසා කිරීමක් හෝ අවහිර කිරීමක් සිදු කළ ඕනෑම පුද්ගලයෙකු එම වරද සිදුකළ ස්ථානය

අයත් අධිකරණ බල ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයේ දී නඩු පැවරිය හැකි බව වාරිමාර්ග ආඥා පනතේ 95 වගන්තියේ සඳහන් වේ.

ගොවි සංවිධානවල කාර්යභාරයන් පිළිබඳව විමසා බැලීමේ දී ඊළඟට වැදගත් වන්නේ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතයි. එම පනතේ 45 වන වගන්තිය යටතේ ගොවි සංවිධානවලට තම සාමාජිකයින් සඳහා ණය සැපයීමට බලය පවරා තිබේ. මේ සඳහා බැංකු වලින් ණය පහසුකම් ලබා ගැනීම, බදු දීම, විකිණීම හා සාමාජිකයන්ගෙන් තැන්පතු ලබාගැනීමට බලය පවරා ඇත. මෙම පනතේ 48 වන වගන්තිය යටතේ ගොවිජන සංවර්ධන සභාවට ගොවි සංවිධාන විසින් පහත සඳහන් ආකාරයට සහාය දැක්විය යුතු ය.

(අ) ස්වකීය බල ප්‍රදේශය තුළ කුඹුරු සහ ගොඩ ඉඩම් වගා කිරීම සඳහා සැලසුම් සකස් කිරීම

(ආ) හරියාකාරව වගා කරනු නො ලබන කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ තොරතුරු එක්රැස් කර සැපයීම

(ඇ) කෘෂිකාර්මික ඉඩම්, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ කෘෂිකාර්මික සතුන් පිළිබඳ තොරතුරු එක්රැස් කර සැපයීම

(ඉ) එම බෝග හා සතුන් රෝග වලින් හා වසංගත වලින් ආරක්ෂා කරගැනීමට වග බලා ගැනීම

(ඊ) බල ප්‍රදේශ තුළ ඉඩම් හිමි ගොවින් භුක්තිකරුවන් හා කෘෂිකාර්මිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පාරිසරික හිතකර ක්‍රම ක්‍රියාත්මක කිරීම

මෙම පනත මඟින් සාමාජිකත්ව ණය සැපයීම තොරතුරු රැස්කිරීම සහ පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීම යන කාර්යයන් ද ගොවි සංවිධාන වලට පවරා ඇත. ගොවි සංවිධාන සඳහා නීතියෙන් පැවරී ඇති කාර්යභාරය විග්‍රහ කිරීමේ දී පශ්චාත් නිෂ්පාදන කටයුතු එනම් නිෂ්පාදන ගබඩා කිරීම, සැකසීම සහ අලෙවිය කෙරෙහි අවධානය යොමුකර නැති බව පෙනේ.

ශ්‍රී ලංකාවේ මෙන් ම ලෝකයේ වෙනත් රටවල ද ගොවි සංවිධානයන් හි සාර්ථක අසාර්ථක භාවය සම්බන්ධයෙන් සිදුකොට ඇති අධ්‍යයන මෙන් ම ගොවි සංවිධාන හා සම්බන්ධ අත්දැකීම් අළලා සකස් කර ඇති අධ්‍යයන වාර්තා ශාස්ත්‍රීය ලිපි ලේඛන යනාදිය පදනම් කර ගනිමින් පහත සඳහන් විමර්ශනය සිදුකොට ඇති අතර එහි ඇති අදහස් මෙම අධ්‍යයනය මෙහෙයවීම සඳහා වැදගත් වේ.

### 2.1.4 ගොවි සංවිධානයක වැදගත්කම

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී ගොවින් මුහුණ දෙන අභියෝගයන්ට හුදකලාව මුහුණ දිය නො හැකි අතර ඒ සඳහා ගොවීන්ගේ අභාවයට ගිය සාමූහික බව නැවත ඇති කරමින් කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කළ යුත්තේ ඔවුන් සංවිධානය කිරීම තුළිනි. ඒ සඳහා ගොවි සංවිධාන ඔවුන්ට මහඟු අත්වැලක් වේ.

ගොවි සංවිධානයක් මඟින් සුළු ගොවියාට තම නිෂ්පාදන සැලසුම් සකස් කිරීමට මඟපෙන්වීම හා ඒ තුළින් ගම තුළ පවතින ගැටලු මෙන් ම ඒ සඳහා විසඳුම් සැපයිය හැකි මාර්ග මඟින් ගොවි කණ්ඩායම් තමන් විසින් සකස්කර ගන්නා ලද සැලසුම් යාය මට්ටමේ

සිට ප්‍රාදේශීය මට්ටම, දිස්ත්‍රික් මට්ටම මෙන් ම ජාතික මට්ටම දක්වා ඉදිරිපත්වීම හරහා ප්‍රාදේශීය හා ජාතික මට්ටමේ දී නිෂ්පාදන අරමුණු හා ඉලක්ක සකස්කර ගැනීමට හැකි වේ. (පතිරණ, 1986).

ගොවි සංවිධානයකින් මූලික වශයෙන් ම සිදු වන්නේ සමාජ සබඳතාවන්ගේ යම් හුවමාරුවකි. එනම්, සංවිධානයේ සාමාජිකයින්ගෙන් යමක් ගොවි සංවිධානයටත්, ගොවි සංවිධානයෙන් සාමාජිකයින්ට යමක් ද වශයෙනි. එය බොහෝ සාර්ථක ගොවි සංවිධානවල දැකිය හැකි ලක්ෂණයකි. මේ බව සමාජ හුවමාරු න්‍යායේ ද (Social Exchange Theory) දක්වා ඇත. එනම්, පුද්ගලයින් අතර සම්බන්ධතාවයන්ගේ ස්ථාවර බව සහ වෙනස්වීම පැහැදිලි කිරීමට ප්‍රතියත්ත සංකල්පය උපයෝගී කර ගනිමින් මේ න්‍යාය ගොඩනගා ඇත. මිනිසුන් හුවමාරු සබඳතා සඳහා ප්‍රවේශ වන්නේ එසේ කිරීමෙන් ඔවුන්ට යම් ප්‍රතිලාභ ලැබෙන නිසා යැයි මෙම න්‍යායෙන් කියැවෙන මූලික හරයයි. සමාජය තුළින් පුද්ගලයාට ලැබෙන නොයෙකුත් මාදිලියේ ප්‍රතිලාභ පවතී. මුදල්, භාණ්ඩ, සේවා, කීර්තිය, අනුමත කිරීම, ආරක්ෂාව යනාදිය මේ අතර වේ. මෙම න්‍යායට අනුව, පුද්ගලයෙක් සුඛපරම (Hedonistic) බව පිළිගැනේ. ඔවුහු අවම පිරිවැයකට උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට උත්සාහ ගනිති. ඒ නිසා, වැඩි ලාභයක් ලැබෙන ක්‍රියාවලියක නිරතවීමට පුද්ගලයෝ කටයුතු කරති. ලාභ ලැබිය නො හැකි ක්‍රියා නො කිරීමෙන් වැළකී සිටිති (සුබසිංහ, ඒ 2010).

ගොවි සංවිධාන සාමූහික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වන මූලික පදනම සපයා දෙමින් සංරක්ෂණය ප්‍රමුඛ කරගත් නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා දායකත්වය සපයයි. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය කාර්යක්ෂම, ජාතික හා අන්තර්ජාතික වෙළෙඳපොළ ඉලක්ක කරගත් වාණිජමය අංශයක් බවට පත් කිරීම හා ඒ ක්‍රියාවලියේ දී සුළු ගොවියා දුගී හා යැපුම් මට්ටමින් මිදී සමෘද්ධිමත් ව්‍යවසායකයෙක් බවට පත්වීමත්, වැඩිවන ජනගහනය සඳහා අවශ්‍ය වන ආහාර සැපයීම, අන්තර් ජාතික මට්ටමේ තරඟකාරී නිපැයුම් අතිරික්තයක් ඇති කිරීමට ශ්‍රී ලංකාවේ සුළු ගොවි අංශය ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය බවත් තහවුරු වී තිබේ (විජේරත්න, 1997). එම අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා ගොවි සංවිධාන යොදා ගත හැකි වීම ඒවායේ ඇති සුවිශේෂී ලක්ෂණයක් සේ සැලකිය හැකි ය.

ගල්ඔය ව්‍යාපාරය යටතේ හඳුන්වාදුන් ගොවි සංවිධාන මඟින් පැවති ගැටලු රැසකට ම විසඳුම් සපයාගත හැකි විය. මෙම ව්‍යාපාරය යටතේ ඇරඹි ගොවි සංවිධාන මූලිකව ම ආරම්භ වූයේ ගල්ඔය ව්‍යාපාරය යටතේ පැවති ප්‍රදේශවල ජල කළමනාකරණය හා ඒවායේ නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා ය (විදානපතිරණ ඇතුළු වෙනත් අය, 1985). ගොවි සංවිධාන හරහා ගොවීන් හා නිලධාරීන් අතර පැවති සම්බන්ධතාවයන් වර්ධනය වූ අතර ජලය බෙදා හැරීමේ කටයුතු ද නිසියාකාරව සිදුවිය. ඒ යටතේ අමතර භූමි ප්‍රමාණයක් මෙන් ම අමතර බෝග වගා කිරීමට තරම් ජලය ගොවීන් සතුවිය. ඒ අනුව, ක්‍රමයෙන් ගොවීන්ගේ නිෂ්පාදනයන් මෙන් ම ඵලදායිතාවයේ ද වර්ධනයක් දැක ගත හැකි වූ අතර ගොවීන්ගේ ආදායම ද වැඩිවන්නට විය (තිලකරත්න ඩබ්.එම්., 1986).

සංවර්ධනය වෙමින් පවත්නා බොහෝ රටවල ප්‍රාථමික මට්ටමේ පවතින කෘෂිකාර්මික සමූපකාර පැවතියත්, ඉන් බොහොමයක් ආර්ථික මට්ටමින් උදාසීන තත්ත්වයක පවතී. ඒවා ශක්තිමත් කිරීම සඳහා ක්‍රමවේදයන් හඳුනා ගත යුතු ය. මෙවැනි සංවිධාන ආදායම් ඉපැයීම සඳහා යෙදවුම් හා නිමැවුම් අලෙවිය සිදුකළ හැකි අතර එම ආදායම් නැවතත් සංවිධානයේ සුබසිද්ධිය සඳහා යොදාගත හැකි ය. එනම්, ව්‍යාප්ති සේවාවන් සඳහා දත්ත එක්රැස් කිරීම සඳහා ව්‍යාපාර සැලසුම් කිරීම මෙන් ම සංවිධානයේ පරිපාලනමය කටයුතු සඳහා ද යෙදවිය

හැකි වේ. සංවිධානයේ මෙම කාර්යයන් සොයා බැලීම සඳහා වෘත්තීය මට්ටමේ මෙන් ම අවංක පරිපාලන අධිකාරියක් මඟින් නිශ්චිත වශයෙන් කාලයෙන් කාලයට ඇගයීමක් සිදුකළ යුතු ය (ගුප්තා, 1989).

එමෙන් ම, ශ්‍රී ලංකාවේ සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රංජිත් කුමාරසිරි පතිරණ (1986) දී සිදු කරන ලද අධ්‍යයනයෙන් නිගමනය කොට ඇත්තේ එය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට මෙන් ම ගොවීන්ට සාමාජීය ලෙස ද ඉතා වැදගත් වන බවයි. එහි දී දක්වා ඇති ප්‍රධාන කරුණු අතර එසේ ගොවින් සංවිධානය වීම තුළින් ගොවීන්ගේ සාමූහික හැඟීම් ඉහළ නැංවීම, ඔවුන්ට කෘෂිකාර්මික සංවර්ධනය කරා ළඟාවීමට නව මංපෙත් විවර කිරීම, ග්‍රාමීය ප්‍රදේශ වලට ආවේනික දරිද්‍රතාවය මඟහරවා ගැනීමට උපකාර කිරීම වැනි විවිධ වූ ප්‍රතිලාභ වේ.

කෘෂි ද්‍රව්‍ය අලෙවිකරණය සඳහා ගොවි සංවිධානයක ක්‍රියාකාරීත්වය මැයෙන් එම් එස්. සේනානායක (1998) දී, සිදුකළ අධ්‍යයනයක දී ගොවීන් සංවිධාන ගත වීම නිසා ඔවුන්ට කෘෂි ද්‍රව්‍ය අලෙවි කර ගැනීමේ දී සාධාරණ මිලක් ලබා ගැනීමට හැකි වීම, කෘෂි ද්‍රව්‍ය සඳහා ප්‍රවාහන පහසුකම් වැනි සේවාවන් ලබාගත හැකි වීම, ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය හා කෘෂි ව්‍යාපාර සකසා ගැනීමට අත්වැලක් වීම වැනි ප්‍රතිලාභ ද ලැබෙන බව නිරීක්ෂණය කොට ඇත.

ගොවි සංවිධානයක් තුළ ගොවීන්ගේ සහභාගීත්වය පහත සාධක මත පදනම් වේ (Improving agricultural extension : A reference manual, 1997).

1. සංවිධානයේ අවසන් ප්‍රතිඵලය ගොවියාට කෙතරම් අත්‍යාවශ්‍ය ද?
2. සංවිධානයෙන් ප්‍රතිලාභ ලැබෙන බවට ගොවියා තුළ පවතින විශ්වාසනීයත්වය
3. ගොවි සංවිධානයෙන් ලැබෙන ප්‍රතිඵල කෙතරම් දුරට ගොවීන්ගේ සාමූහිකත්වය මත රඳී පවතී ද?
4. ප්‍රතිලාභ නිශ්චිත කාල පරාසයක් තුළ දී ලැබෙන බවට තහවුරු වීම
5. ලැබෙන ප්‍රතිලාභ සාමාජිකයන් අතර සමසේ බෙදී යන බවට තහවුරු වීම

## 2.2 සාර්ථක ගොවි සංවිධානයක ලක්ෂණ

ගොවි සංවිධානයක් ගොවීන්ගේ සාමූහිකත්වය මඟින් පිහිටුවා ගත් පමණින් ම එය සාර්ථක ගොවි සංවිධානයක් බවට පත් වීමේ හැකියාවක් නො පවතී " What makes farmer organizations successful in irrigated agriculture: A socialogical review" (1985) නම් අධ්‍යයනයේ දී රසාක් විසින් සාර්ථක ගොවි සංවිධානයක පැවතිය යුතු ලක්ෂණ කිහිපයක් පෙන්වා දී තිබේ. එනම්,

- අන් සෑම සංවිධානයක මෙන් ම යම් පොදු අරමුණක් ඉටුකර ගැනීමට හෝ පොදු ප්‍රශ්නයක් නිරාකරණය කර ගැනීම සඳහා පිහිටුවා ගැනීම (ජල ප්‍රශ්නය ප්‍රධාන ගැටලුව වූ විට, ඒ සඳහා පිහිටුවා ගන්නා ගොවි සංවිධානවලට සාර්ථකත්වය අන් සංවිධානවලට වඩා වැඩි බව පැහැදිළි වී ඇත)
- සෑම විට ම සාර්ථක ගොවි සංවිධානයකට පොදු ගැටලුවක් හෝ ගැටලු පවතී.

- ගොවි සංවිධානයක සාර්ථක අසාර්ථකභාවය එම සංවිධානය මඟින් ගොවීන්ට ලැබෙන ප්‍රයෝජනවල ඵලදායීතාවයට අනුරූප වේ.
- තනි අරමුණක් සහිත ගොවි සංවිධානයකට වඩා අරමුණු කිහිපයකින් යුත් ගොවි සංවිධානවල සාර්ථකභාවය ඉහළ වේ.
- සාර්ථක නායකත්වය, සාර්ථක ගොවි සංවිධානයක් බිහි කරයි.
- සාර්ථක ගොවි සංවිධානයක් බිහිවීම සඳහා පාරදෘශ්‍ය මූල්‍යමය ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් ද, ශක්තිමත් මූල්‍යමය අත්තිවාරමක් ද අත්‍යාවශ්‍ය වේ. (ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන බොහොමයක අසාර්ථකත්වයට හේතු වී ඇත්තේ සාර්ථක මූල්‍ය කළමනාකරණයක් නොමැති වීමයි).
- සංවිධානයේ සාමාජිකයින් තුළ පවතින සාමූහික හැඟීම, සාමූහික ක්‍රියාකාරීත්වයේ නියැලීමේ හැකියාව හා ප්‍රමාණය, අන්තර සම්බන්ධතාවයන් යහපත් තත්ත්වයක පවතී නම් සංවිධානයක් සාර්ථක වේ.
- එමෙන් ම, සාර්ථක ගොවි සංවිධානයක් පාරිසරික අවශ්‍යතාවයන්ට අනුකූලව බාහිර අවහිරතා හා අභියෝගවලට මුහුණදීමට හැකි ආකාරයට ක්‍රියාත්මක විය යුතු ය.
- පැහැදිලි සන්නිවේදන ක්‍රමෝපායයන් ගොවි සංවිධානය තුළ සිටින සාමාජිකයන් අතර පැවතීම, ඉහළ කාර්යක්ෂමතාවයක් සඳහා උපකාරී වේ.

බොහෝ විට, පර්යේෂණ මඟින් පැහැදිලි වූ කරුණක් වන්නේ බොහෝ ගොවි සංවිධාන ආරම්භක අවස්ථාවේ ඉතා ක්‍රියාකාරීව පවතින අතර කල් යාමේ දී ඒකාකාරී හා අක්‍රිය තත්ත්වයකට පත්වන බවයි (IFAD, 1997). එසේ නොවී සාර්ථක භාවයට ගොවි සංවිධානය පත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවරයන් ගොවි සංවිධානයක් මඟින් ගත යුතු වේ.

සාහිත්‍ය විමර්ශනයේ දී පැහැදිලි වන පරිදි ගොවි සංවිධානයක ශක්තිමත්භාවය හා සාර්ථකත්වය තීරණය වන්නේ පහත ප්‍රධාන කරුණු මත වේ.

| | | |
|---|---|---|
| භෞතික සාධක | - | Physical (Location Specific) |
| සමාජීය සාධක | - | Social (People and Community Specific) |
| සම්පත් ප්‍රමාණය | - | Resources availability (Problem Specific) |
| කාල පරාසය | - | Given time period (Time Specific) |

ගොවි සංවිධානයන් ද කෘෂිකාර්මික සමාජය තුළ බහුලව ම පවතින තවත් එක් ස්වෙච්ඡා සංවිධානයක් වන හෙයින් ම අනෙකුත් ස්වෙච්ඡා සංවිධානවල පවතින ලක්ෂණ ගොවි සංවිධාන තුළ ද නිරීක්ෂණය කළ හැකි ය. මෙවැනි සංවිධානයක ක්‍රියාකාරීත්වය සඳහා බලපාන ප්‍රධාන සාධක 2ක් බන්දුල අත්තනායක සිය "ප්‍රජා නායකත්වය හා ස්වෙච්ඡා සේවය" (1982) නමැති සිය කෘතියේ සඳහන් කොට තිබේ.

1. කණ්ඩායම් අභිමතාර්ථ හා අපේක්ෂාවන් ද, සාමාජිකයන්ගේ අභිප්‍රායයන් ඉටුවීමේ ප්‍රාර්ථනාව ඇතුළු සාමාජිකයන් සංවිධානය කරගන්නා වැඩසටහන් හා ගන්නා ක්‍රියා මාර්ග
2. කණ්ඩායම් සාමාජිකයන් අතර ඇති වන අන්තර් සබඳතා, ස්වෙච්ඡා කණ්ඩායම් මෙහෙයවන පුද්ගලයන් හා කණ්ඩායම අතර ඇති වන අන්තර් සබඳතා

මෙම ප්‍රධාන සාධක 2 හි පවත්නා ස්වභාවය මත යම් කණ්ඩායමක ක්‍රියාකාරිත්වය හා ඊට අවශ්‍ය ශක්තිය රඳා පවතී.

### 2.2.1 ගොවි සංවිධානයක සාර්ථකත්වයට බලපාන අභ්‍යන්තර සාධක (Internal factors)

***නායකත්වය - Leadership***

අභ්‍යන්තර සාධක අතුරෙන් ගොවි සංවිධානයක සාර්ථකත්වයට බලපාන මූලික ලක්ෂණයක් ලෙස නායකත්වය හැඳින්විය හැකි ය. නායකත්ව සංකල්පය පැන නැඟෙන්නේ පිරිසක් ඒකරාශී වීම, පොදු අරමුණු ඉටු කර ගැනීම සඳහා සාමූහික ප්‍රයත්නයන් හි යෙදීමත් සමඟයි. කිසියම් අරමුණක් ඉටු කර ගැනීම පිණිස පුද්ගලයෙකුගේ හෝ සමූහයකගේ චර්යාවන් කෙරෙහි බලපෑම් අති කරලීමේ හැකියාව නායකත්වය ලෙස හැඳින්විය හැකි ය (Robert , 2002).

නායකත්වය යනු පුද්ගලයෙකු සතු ගුණාංගයක් ලෙසින් ද, සංවිධානමය හෝ සාමූහික චර්යාමය ක්‍රියාවලියක් ලෙස ද විග්‍රහ කළ හැකි ය. සිත් ගන්නා සුළු එසේ ම, දියුණුවීමේ ප්‍රවණතාවයක් සහිත ආයතනයේ අරමුණු කරා ගෙන යාමේ නිර්මාණශීලී හැකියාවක් සහිත පුද්ගලයා ද නායකයකු ලෙස සලකනු ලබයි. ඒ නිසා, සංවිධානාත්මක චර්යාවන් සම්බන්ධයෙන් වැදගත් සාධකයක් හැටියට නායකත්වය යන සංකල්පය අවධාරණය කළ හැකි ය (http.//www. Tellboss.com).

නායකයකු තුළ පැවතිය යුතු ගති ලක්ෂණ අතර සන්නිවේදනය, වගකීම, ආත්ම විශ්වාසය, බුද්ධිය හා තීරණ ගැනීමේ හැකියාව ඒ අතරින් වඩාත් හුවා දැක්විය හැකි ය. තව ද නායකයෙක් වීමට අවශ්‍ය කරන ධනාත්මක කරුණු කෙරෙහි ද අවධානය යොමු කිරීම තුළ හොඳ නායකයෙකුගේ ලක්ෂණ හඳුනා ගත හැකි ය. වෙනත් අයට උපකාර කිරීම තම තමන්ට අවශ්‍ය කෙනෙකු යැයි කණ්ඩායමේ අයට හැඟීමක් ඇතිවීම, ඉලක්කයන් අත්පත් කර ගැනීමට තෘප්තිමත්වීම, ස්වයං වර්ධනය හා නිසි අවබෝධය නිසි අයගේ සැලකිල්ලට පාත්‍රවීම ඒ අතර ප්‍රධාන ලක්ෂණ වේ (Bernard, 1981).

ගොවි සංවිධානවල සාර්ථකත්වය සඳහා නායකත්වයේ ඇති වැදගත්කම හුවා දක්වන ඇතැම් විද්වතුන් ගොවි සංවිධානවල නිසි ක්‍රියාකාරිත්වය සඳහා නිවැරදි නායකත්වය අත්‍යාවශ්‍ය මෙන් ම නායකත්වයේ කාර්යය විය යුත්තේ සංවිධානයේ සාමාජිකයින් පාලනය කරනවා වෙනුවට සංවිධානයේ පොදු අරමුණු වෙනුවෙන් ඔවුන් මෙහෙය විය යුතු (කුමාරසිරි ආර්.පී., 1986) බව දක්වා ඇත. ඇතැමුන්ට අනුව නායකත්වය සංවිධානයක ක්‍රියාකාරිත්වය සඳහා වැදගත්වන ප්‍රධාන සාධකයකි.

ගල්ඔය ජනපද ව්‍යාපාරය ආශ්‍රයෙන් රසාක් සහ තවත් අය (1995) විසින් කරනු ලැබූ අධ්‍යයනවලින් පෙන්වා දී ඇත්තේ දක්ෂ, අවංක, කණ්ඩායම ඉදිරියට මෙහෙයවිය හැකි නායකයකු සිටීම සංවිධානයක සාර්ථකත්වය සඳහා බෙහෙවින්ම ඉවහල්වන බව ය.

ඒ අනුව, නායකත්වය සතු දැනුම සහ කුසලතාවයක් සංවිධානයක සාර්ථකත්වය සඳහා ඉතා වැදගත් වේ (විජේරත්න 1994). ගොවි සංවිධානයක සාර්ථකත්වය සඳහා නායකයකු විවිධාකාරයෙන් ක්‍රියා කරයි. නායකයකු ගොවි සංවිධානයේ සියලුම සාමාජිකයින් සාමූහික ක්‍රියාකාරකම් සඳහා පෙළඹ විය යුතු ය (හේතෙගෙදර 1988).

නායකත්වය පිළිබඳව වැඩිදුරටත් අධ්‍යයනය කළ පර්යේෂකයින් නායකත්වය සම්බන්ධ සිද්ධාන්ත රැසක් ඉදිරිපත් කොට තිබේ. ඒ අනුව, 1930 ගණන්වල දී කර්ට් ලෙවින් (Kurt Lewin) නායකත්වයේ තීරණ ගැනීමේ දී එම පුද්ගලයා ක්‍රියාකරනු ලබන ආකාරය පදනම් කරගනිමින් "Behavioral Theorie" නම් න්‍යාය ඉදිරිපත් කොට තිබේ. ඔහුට අනුව නායකයින් වර්ග 3ක් හඳුනාගෙන ඇත. එනම්,

i Autocratic Leaders – මෙවැනි නායකයින් තම කණ්ඩායමේ සෙසු අයගේ උපදෙස්වලින් තොරව තම තීරණ ගනු ලබයි. මෙවැනි නායකත්ව හැසිරීම ක්ෂණික තීරණ ගැනීමේ දී වැදගත් වේ.

ii Democratic Leaders – මෙවැනි නායකත්ව හැසිරීමක දී නායකයා විසින් තීරණයක් ගැනීමට පෙර තම කණ්ඩායමේ සෙසු අයගේ අදහස් විමසා බලයි. මෙහි දී පවතින ගැටලුව වන්නේ එක් කණ්ඩායමක් තුළ වුව ද විවිධ මත දරන්නන් රැසක් සිටීමෙන් ක්ෂණික තීරණයක් ගැනීම අපහසු වීමයි.

iii Leaissez – Faire leaders – මෙවැනි නායකත්ව හැසිරීමක ස්වරූපය වන්නේ කණ්ඩායමේ සාමාජිකයින්ට තීරණ ගැනීමට අවස්ථාව දී නායකත්වය ඊට ඇඟිලි නො ගැසීමයි. මෙවැනි නායකත්වයක් එතරම් සුදුසු නොවුනත් කණ්ඩායමේ ස්වරූපය මත එය වෙනස්විය හැකි ය. එනම්, කණ්ඩායමේ සාමාජිකයින් දක්ෂ හා උද්‍යෝගිමත් පිරිසක් නම් නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ඇතත් මෙවැනි නායකත්ව හැසිරීමක දී නායකත්වය කැපී නො පෙනේ. (http://www.mindtools.com).

ගොවි සංවිධානයක නායකත්වය තෝරා ගැනීමේ දී එම ප්‍රදේශයට ආවේණික වූ සංස්කෘතිකමය හා අනෙකුත් සාමාජීය සාධක සැලකිය යුතු වේ. ඇතැම් අවස්ථාවල එම සාධක පරීක්ෂා කිරීමේ දී, බොහෝ දුරට සමාජීය පිළිගැනීමක් සහිත පවුල්වලින් පැවත එන, කෘෂිකාර්මික පසුබිමක් සහිත, වඩාත් තරුණ හෝ වඩාත් මහලු නොවන වයස් කාණ්ඩවල පවතින නායකත්වයන් සාර්ථක වීමේ හැකියාව වැඩි බැව් තහවුරු වී තිබේ. (Improving agricultural extension: A reference manual, 1997).

එමෙන් ම, ගොවි සංවිධානවල නායකත්වය පිළිබඳව කරනු ලබන සිද්ධි අධ්‍යයනවලින් තහවුරු වී ඇත්තේ නායකත්වයට පත්වන පුද්ගලයන් හෝ ගොවි සංවිධාන පිහිටුවීමට මූලිකවන පුද්ගලයන්ට ඒ වෙනුවෙන් සැලකිය යුතු කැපවීම් සිදු කිරීමට සිදුවන බවත්, මූල්‍යමය පාඩු සිදුවන බවත්, ඒ කටයුතු කැපවීමෙන් යුතුව සිදු කිරීම සඳහා ඔවුන්ගේ පවුල්වලින් පවා යහපත් සහභාගිත්වයක් අවශ්‍ය බවත් ය (Seetharaman and Shingi, 1992).

එමෙන් ම, ගොවි සංවිධානවල කාන්තා නායකත්වය පිළිබඳව විවිධ වූ සමීක්ෂණ සිදුකොට තිබේ. එහි දී තහවුරු වූ කරුණු අතර කාන්තාවන් පමණක් සිටින සංවිධාන සාර්ථකත්වයේ පවතින අතර ඔවුන්ට අවශ්‍ය ප්‍රතිලාභ ද පහසුවෙන් ලබා ගන්නා බැව් සඳහන් වේ. කෙසේ වුව ද, කාන්තාවන් පමණක් සිටින ගොවි සංවිධාන බොහෝවිට ප්‍රාදේශීය මට්ටම තුළ පමණක් ක්‍රියාත්මක බවත්, පුරුෂ සහභාගිත්වය ද පවතින ගොවි සංවිධාන සාර්ථකත්වයත් සමඟම බොහෝවිට ප්‍රාදේශීය මට්ටමෙන් ඔබ්බට ගොස් දිස්ත්‍රික් හා ජාතික මට්ටම වෙත ද ගමන් කරන ආකාරයත් දැකිය හැකි වේ (Promoting women's leadership in farmer and rural organizations, IFAD, 2010).

*විශාලත්වය - Size*

ගොවි සංවිධාන විශාලත්වය වැඩි වනවිට එහි සංකීර්ණභාවය හා විවිධත්වය ඉහළ යයි. එසේ වුව ද, කුඩා ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය වඩාත් කාර්යක්ෂම වේ. සාමාජිකයින් අතර අන්තර් සබඳතා විශාල වේ. සංවිධාන හැකියාව වැඩි ය. බොහෝ විට කුඩා සංවිධාන වඩාත් අරමුණු ඉටු කරලීම සඳහා උපකාරී වේ. ගල්ගමුව කුඩා ගොවි සංවිධාන වැඩ සටහන ආශ්‍රයෙන් හේතේගෙදර (1988) කර ඇති අධ්‍යයනයකට අනුව කණ්ඩායම කුඩා වීම එහි ක්‍රියාකාරීත්වය වැඩිවීමට බලපාන බව පෙන්වා දී ඇත.

කෙසේ වුව ද, සංවිධානයේ ආකෘතියට හා ක්‍රියාකාරීත්වයට ගැළපෙන හා දැරිය හැකි මට්ටමේ, ඉතා අවම නොවූ මෙන් ම ඉතා උපරිම නොවූ ද සාමාජික මට්ටමකින් ගොවි සංවිධානය සමන්විත වීම එහි ක්‍රියාකාරීත්වයට ඉතාමත්ම වැදගත් වන බව පැහැදිලි වන කරුණක් වේ.

*මූල්‍ය ස්ථාවරත්වය - Financial soundness or stability*

වඩා ශක්තිමත් මූල්‍යමය පසුබිමක් පවතින සංවිධානවල කාර්යක්ෂමතාවය හා ගොවීන්ට ලැබෙන ඵලදායීතාවය විශාල වේ. ගොවීන් තුළ එම සංවිධානය කෙරෙහි පවතින විශ්වාසනීයත්වය ද එමගින් වැඩිවන බැව් තහවුරු වන කරුණක් වේ.

*විධිමත්භාවය - Degree of formality*

පැහැදිලිව සංවිධානය තුළ පවත්නා වූ කාර්යභාරය වගකීම් අවශ්‍යතා පිළිබඳව සැලසුම් පවතින සංවිධාන එසේ කිසිදු අභ්‍යන්තර සැලසුම් නැතිව ක්‍රියාත්මක වන සංවිධානවලට වඩා සාර්ථක වේ. මෙයට අමතරව, Themes ආයතනය (1996) කර ඇති අධ්‍යයනයකින් සමාන අරමුණු හා අභිමථාර්ථ නියෝජනය කරන සමජාතීය කණ්ඩායමක් වීම ද සංවිධානයක් වඩා ක්‍රියාකාරී සාර්ථක එකක් වීම සඳහා බලපාන බව පෙන්වා දී තිබේ.

එමෙන් ම, "Development and Strengthening of farmer organizations through farmer conventions" යනුවෙන් 1999 දී, ගිරාගම, ශංකර් හා සමරකෝන් විසින් සිදුකරන ලද අධ්‍යයනයේ දී හෙළි වූ කරුණු අතර ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම සඳහා එහි ක්‍රියාකාරකම් අඛණ්ඩව ඇගයීම හා පර්යේෂණයන් සිදුකිරීම අවශ්‍ය බව දක්වා ඇත. අවශ්‍ය වූ සැනින් නිවැරදි මග පෙන්වීමක් ලබා දීමට පසුබිම සැකසීම හා රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීත්වයන්වල දී රජයේ ප්‍රාදේශීය නිලධාරීන් ද දැනුවත් ව එය සිදු කළ යුතු බව පෙන්වා දෙයි. ඒ අනුව වඩා ප්‍රතිඵලදායී, සම්පත් හා කාලය නිවැරදිව කළමනාකරණය වූ වැඩසටහන් ගොවීන් වෙත ඉදිරිපත් කිරීමට හැකියාව ලැබේ. ඒ මඟින් වඩාත් සාර්ථක ගොවි සංවිධානයක් බිහි කිරීමට හැකියාව ලැබෙන බැව් පෙන්වා දී තිබේ.

1980 දී ගැමි සංවිධාන හා කෘෂි කාර්මික සංවර්ධනය මැයෙන් ගල්ගමුව සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය ගැන සිදුකළ විමර්ශන අධ්‍යයනයක දී රංජිත් කුමාරසිරි පතිරණ ගොවි සංවිධානයක් පිහිටුමේ දී හා පවත්වාගෙන යාමේ දී ඇතිවන ගැටලු කිහිපයක් හඳුනා ගෙන තිබේ. ඒවා නම්.

- ගොවීන් හා නිලධාරීන් අතර පවතින සංස්කෘතිකමය පරතරය (ගොවි සිතුම් පැතුම්, අධ්‍යාපනය, ආකල්ප)
- ගොවීන් ගේ පාරම්පරික අදහස් - උදහස්, දුගී කමේ සංස්කෘතික ලක්ෂණ මගින් උරුම කළ රජයේ ප්‍රතිපත්ති හා ක්‍රියාදාම නිරන්තරයෙන් විවේචනය කිරීම, නිලධාරී පංතිය දෙස ද්වේශයෙන් බැලීම
- පෙර පැවති සංවිධානවලින් ශේෂ වූ අයහපත් අත්දැකීම්
- නිලධාරීන්ගේ අයහපත් පාලනය, පක්ෂග්‍රාහකත්වය
- ගැමි සමාජය තුළ පවතින අනෙකුත් අභ්‍යන්තර සමාජ ලක්ෂණ වන ඊර්ෂ්‍යාව, අන-වින, කොඩි-වින, අසල්වාසීන්ගේ ජයග්‍රහනවලට අකමැති වීම යනාදිය යි.

මෙම ගැටලු සඳහා විසඳුම් සොයා ගැනීම තුළින් වඩාත් සාර්ථක ගොවි සංවිධානයක් බිහි කිරීමට හැකියාව ලැබෙන බැව් ඔහු විසින් දක්වනු ලැබේ.

1977 වර්ෂයේ දී අඹන්පොල ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ගොවි සංවිධානයන් හී ක්‍රියාකාරිත්වය පිළිබඳ තක්සේරු කිරීමේ තාක්ෂණික වාර්තාවක් පිළියෙල කරන ලදී. අඹන්පොල ගොවිජන සංවර්ධන බලප්‍රදේශයේ ගොවි සංවිධානයන් හී ක්‍රියාකාරිත්වය තක්සේරු කිරිම සඳහා වැඩමුළු ගණනාවක් පවත්වන ලද අතර එහි දී අදාළ කොටගත් ගොවි සංවිධාන 38න් 5%ක් ශක්තිමත් සංවිධාන ලෙස ද, 71%ක් සාමාන්‍ය ක්‍රියාකාරිත්වයකින් යුක්ත වූ ලෙස ද, 24%ක් ඉතාම දුර්වල සංවිධාන ලෙස ද, වර්ගීකරණයට ලක් කරන ලදී. මේ අනුව, අඹන්පොල ප්‍රදේශයේ බහුතර ගොවි සංවිධාන සංඛ්‍යාවක් කෘෂි නිෂ්පාදනයේ දියුණුවට කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටු නො කරන බව පෙනී ගොස් තිබේ. ඉහත සලකා බලන ලද පැති තුනෙන් ගොවි සංවිධානවල සමාජ හා ආයතනික හැකියාවන් ඒවායේ නිෂ්පාදනය හා ව්‍යවසායකත්ව පැතිවලට වඩා හොඳ බවට තක්සේරු කිරීමට හැකි විය. සමාජ හා ආයතනික පැත්තෙන් දුර්වල සංවිධාන ලෙස වාර්තා වන්නේ සුළු ප්‍රමාණයකි. අඹන්පොල ප්‍රදේශයේ ගොවි සංවිධාන පිළිබඳව පොදුවේ බැසගත හැකි නිගමනය වූයේ ගොවි සංවිධාන ගණනාවක් ම ආයතනික හා සමාජමය පැත්ත හොඳින් පවත්වාගෙන යාම යහපත් වුව ද නිෂ්පාදන හා ව්‍යවසායකත්ව පැත්ත පවත්වාගෙන යාම දුර්වල බව ය (HARTI, 1997).

ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන යනු , පාර්ලිමේන්තු අනපණත් මගින් ක්‍රමිකව පුළුල් වූ නීතිමය වශයෙන් පිළිගත් ආයතනය කි. ඒ පිළිබඳව අධ්‍යයනයට ලක් කරන ලද විද්වතුන් සොයාගෙන ඇත්තේ ගොවි සංවිධාන සිය සාමාජිකයින්ට අත් කර දෙන පුළුල් ප්‍රතිලාභ, ඒවායේ මූල්‍ය ශක්තිය හා පාරදෘෂ්‍යභාවය යන කරුණු සහ නිර්මාණශීලී නායකත්වය ඒවායේ සාර්ථක හෝ අසාර්ථකභාවය තීන්දු කරන බවයි. එමෙන් ම, ඔවුන් තවදුරටත් පෙන්වා දෙන්නේ වර්තමාන ශ්‍රී ලංකාවේ ගොවි සංවිධානවලින් බහුතරය අති සාර්ථක නො වූ ද අති දුර්වල නො වූ ද ඒවා වන අතර කාර්යයන් කිහිපයකට පමණක් සීමා වූ සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් සහිත ඒවා බවයි.

# තෙවැනි පරිච්ඡේදය
# සිද්ධි අධ්‍යයනය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක පහක තෝරාගත් ගොවි සංවිධාන 14ක් පිළිබඳ සිද්ධි අධ්‍යයන මෙතැන් සිට ඉදිරිපත් කරනු ලබයි.

## 3.1 සිද්ධි අධ්‍යයන 01: අරුණ ගොවි සංවිධානය - කුරුණෑගල දිස්ත්‍රික්කය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සුළු වාරි මාර්ග ප්‍රදේශයේ නාගොල්ලාගම ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ අරුණ ගොවි සංවිධානය ක්‍රියාත්මක වේ. වර්ෂ 1996 දී මෙම ගොවි සංවිධානය ආරම්භ වී තිබේ. ආරම්භක අවධියේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් පැවති අතර 2001 වර්ෂයේ දී ප්‍රතිසංවිධානයට ලක් වී ඇත.

### 3.1.1 ගොවි සංවිධානයේ සැකැස්ම

මෙම ගොවි සංවිධානයේ නිලධාරී මණ්ඩලය සැකසී ඇත්තේ සභාපති, ලේකම්, උප සභාපති, උප ලේකම්, භාණ්ඩාගාරික හා කාරක සභිකයන් 07 දෙනෙකුගෙනි.

ප්‍රදේශයේ වී වගාව සඳහා ජලය සපයා ගන්නා වූ හිරිපිටියාගම "කඩහත වැව" අබලන් වී පැවති අතර එය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 2003-2006 වැඩසටහන යටතේ රුපියල් හාරලක්ෂ පනස්දහසක මුදලක් ගොවි සංවිධානය වෙත ලැබුණි. මෙම මුදලින් උපරිම වැඩ කොටසක් කරගැනීම සඳහා මෙම වැව යටතේ වී වගා කළ සියලු ගොවීන් සංවිධානය කිරීමේ කාර්යය 'අරුණ' ගොවි සංවිධානය මැදිහත් වී සිදු කරන ලදී. එම කාර්යයේ දී ලද ගොවිජන සහභාගීත්වය මත 'අරුණ' ගොවි සංවිධානය පැවති තත්ත්වයට වඩා ක්‍රියාකාරී මට්ටමට පත්විය.

### 3.1.2 සාමාජිකත්ව වර්ධනය


සංවිධානය ආරම්භක වර්ෂය වන 1996දී සාමාජික සංඛ්‍යාව 17 දෙනෙක් විය. 1996 සිට 2001 වර්ෂය දක්වා ගොවි සංවිධානය සාමාන්‍ය මට්ටමක පැවතුණි. 'කඩහත වැව' ප්‍රතිසංස්කරණ කටයුත්තත් සමගම 2001 වර්ෂය වන විට මෙහි සාමාජික සංඛ්‍යාව 77 දෙනෙක් දක්වා වර්ධනය විය. වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලියට නායකත්වයදීම හා ගොවිජන බැංකු වැඩසටහන, රජයේ පොහොර සහනාධාරය යන ප්‍රධාන කරුණු මත ගොවි සංවිධානයේ සාමාජිකත්ව වර්ධනය වර්තමානය දක්වා අඛණ්ඩව සිදු වී ඇති ආකාරය වගු හා ප්‍රස්තාර අංක 3.1.1 යටතේ පෙන්වා දී තිබේ.

වගු අංක 3.1.1: සාමාජික වර්ධනය

| වර්ෂය | සාමාජික සංඛ්‍යාව |
|---|---|
| 2001 | 77 |
| 2002 | 89 |
| 2003 | 110 |
| 2004 | 124 |
| 2005 | 151 |
| 2006 | 193 |
| 2007 | 216 |
| 2008 | 236 |
| 2009 | 251 |
| 2010 | 263 |
| 2011 | 268 |

මූලාශ්‍රය: අරුණ ගොවි සංවිධානයේ වාර්තා

ප්‍රස්තාර අංක 3.1.1: සාමාජික වර්ධනය




මූලාශ්‍රය: අරුණ ගොවි සංවිධානයේ වාර්තා

2001 වර්ෂයේ සාමාජිකත්වය සමඟ සසඳන විට 2011 වර්ෂයේ දී සාමාජික සංඛ්‍යාව 29% කින් වැඩි වී ඇති බව පෙනේ.

### 3.1.3 අරමුදල ශක්තිමත් කරගැනීම

වැව ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත්තුව සිදු කිරීමෙන් සංවිධානය මුදලක් ඉතිරි කරගත් අතර එය පහත සඳහන් පරිදි අරමුදලක් වශයෙන් සංවර්ධනය කර ගන්නා ලදී. ඒ සඳහා ගොවීහු සියලු දෙනා පහත සඳහන් කැප කිරීම් කිරීමට එකඟ වී සිටිති.

01. කුඹුරු අක්කර එකක් හිමි ගොවියෙක් දින හතරක ශ්‍රමය ලබාදීම හෝ ශ්‍රමය සැපයිය නො හැකි නම් ඒ වෙනුවට දිනකට රුපියල් 500 බැගින් දින හතර සඳහා රුපියල් 2000ක් ගොවි සංවිධානයට ලබාදිය යුතු විය.

02. දිනකට වැඩ කරන පැය 08ක ශ්‍රමය වැව ඉදි කිරීම සඳහා ලබාදීම.

03. කොන්ත්‍රාත්තුව මීටර 250ක ප්‍රධාන ඇල කොන්ක්‍රීට් ඇතිරීම වුව ද ද්‍රව්‍ය සඳහා පමණක් මුදල් වැය කළ නිසා මීටර 450ක් කොන්ක්‍රීට් කිරීමට හැකි වී තවත් රුපියල් 39,800ක් මුදලක් ලාභ වශයෙන් ඉතිරි විය. පසුව, එය 'කඩහත වැවේ' නඩත්තු අරමුදල ලෙස අරමුදලක් පිහිටුවී ය. වැව යටතේ වී වගා කළ සෑම ගොවියෙක්ම සෑම කන්නයක්ම අවසානයේ අක්කරයකට වී බුසලක් හෝ එහි පවතින මිලට වටිනාකම මුදලින් ලබා දී මෙම අරමුදල වර්ධනය කළ අතර එය අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි.

### 3.1.4 නායකත්වය හා පසුපෙළ නායකත්වයක් පුරුදු කිරීම

මෙම ගොවි සංවිධානය 2001 වර්ෂයේ දී නව නායකත්වයක් යටතේ ක්‍රියාත්මක වී ඇත. එය ගොවි කණ්ඩායම නිවැරදි මාර්ගයේ හැසිරවිය හැකි නිවැරදි අරමුණු හා දැක්මක් සහිත මඟපෙන්වීමක් කළ හැකි නායකත්වයකි. මෙම ගොවි සංවිධානය පසු පෙළ නායකයන් බිහි කිරීමේ කාර්යයේ ද නියැළී සිටී. වර්ෂය අවසානයේ සෑම සාමාජිකයකු සඳහා ම ප්‍රගති වාර්තාවක් සකස් කරනු ලබයි. සමිති වාරවලට පැමිණීම, සංවිධානයෙන් සිදු කරන කාර්යයන් සඳහා දායකත්වය ලබාදීම, ණය වාරික ගෙවීම, ඉතුරුම් ක්‍රමවත්ව පවත්වා ගැනීම යන නිර්ණායකයන් සඳහා ලකුණු ලබාදීමේ පටිපාටියක් ක්‍රියාත්මක කර, එහි දී වැඩි ම ලකුණු ලබාගන්නා පුද්ගලයින් පළමු පෙළ නායකත්වයටත්, දෙවන පෙළ ලකුණු මට්ටමේ පිහිටවන පිරිස් දෙවන පෙළ නායකත්වයටත් සුදුසුකම් ලබයි. ගොවි සංවිධානය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම කාර්යයන් සඳහා කැප වී ක්‍රියාකරන සාමාජිකයන් මේ ආකාරයට ඇගයීමකට ලක් කරන අතර ඔවුන් සංවිධානයේ ප්‍රබුද්ධ ලේඛනයට ඇතුළත්වීමේ සුදුසුකම් ලබයි. ඔවුන් අතරින් වඩා සුදුසු පුද්ගලයන් සංවිධානයේ නායකත්වයට පත් කරනු ලබයි. ඒ අනුව, කැපවීම හා සංවිධානයට ක්‍රියාකාරීව සම්බන්ධවීම මත නායකයන් පත් කිරීමක් දක්නට ලැබේ. මෙම ප්‍රබුද්ධ ලේඛනයට ඇතුළත්වන පුද්ගලයින් ගොවි සංවිධානයේ සෙසු සාමාජිකයන් අතර යම් පිළිගැනීමක් ද ඇති නිසා මෙම ප්‍රබුද්ධ ලේඛනයට ඇතුළත්වීමට ගොවි සංවිධානයේ සාමාජිකයන් තුළ ද උද්‍යොගිමත් භාවයක් දක්නට ඇත. මේ පිළිවෙත අනුව, ගොවි සංවිධානයේ දෙවන පෙළ නායකත්වයට පුහුණු කිරීමක් සිදු වීම නිසා සංවිධානයේ තිරසාරභාවය ඇති වී තිබේ.

වගු අංක 3.1.2: ප්‍රබුද්ධ ලේඛනය සැකසීමේ දී ලකුණු ලබාදීමේ පිළිවෙත

| 01.පැමිණීම | | 02. වාර මුදල් ගෙවීම | | 03. මුදල් තැන්පත් කිරීම | | 04.ණය ලබාගැනීම (වසරක් තුළ දී) | |
|---|---|---|---|---|---|---|---|
| වාර ගණන | ලකුණු | වාර ගණන | ලකුණු | මුදල් රු. | ලකුණු | වාර ගණන | ලකුණු |
| 12 | 100 | 12 | 100 | 5000 හෝ වැඩි | 100 | 4 වරකට වැඩි | 100 |
| 11-10 | 90 | 11-10 | 90 | 4999-4000 | 75 | 3-2 | 50 |
| 09-08 | 80 | 09-08 | 80 | 3999-2500 | 50 | 1 | 25 |
| 07-06 | 70 | 07-06 | 70 | 2499-1000 | 40 | | |
| 05 | 50 | 05 | 50 | 999-500 | 25 | | |
| 04 | 40 | 04 | 40 | 499 ට අඩු | 0 | | |
| 03 | 0 | 03 | 30 | | | | |
| 02 | 0 | 02 | 20 | | | | |
| 01 | 0 | 01 | 10 | | | | |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 05. සහභාගීත්ව වැඩසටහන්, පුහුණු වැඩසටහන්, කන්න රැස්වීම් සඳහා සහභාගීත්වය

වර්ෂය තුළ පැවති රැස්වීම් ප්‍රමාණය අනුව සියයෙන් ලකුණු ලබා දේ.

### 06. සාමාජිකත්වයේ චර්යාව

ගොවි සංවිධාන ක්‍රියාකාරකම්වල දී සහ සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් විශේෂ වැඩසටහන්වල දී සාමාජිකයන්ගේ විනීත හැසිරීම සඳහා ලකුණු සියයක් ලබා දේ.

### 07. සාමාජිකයන්ගේ අගය කළ යුතු ක්‍රියාකාරකම්

ප්‍රදේශයේ පොදු කටයුතු හා සමාජයට වැඩදායී කටයුත්තක් ඉටු කිරීම සම්බන්ධයෙන් එවැනි සාමාජිකයන් සඳහා ලකුණු 50ක් ලබාදේ.

### 08. උපයා ගන්නා ලද ලකුණු අඩු වීමේ හේතු

පොදු දේපළවලට හානි කිරීම, සංවිධාන දේපළවලට හානි කිරීම, ගොවි සංවිධානයේ කාර්යයන්ට බාධා කිරීම හෝ සංවිධානයේ කීර්තියට හානි වන අයුරින් කටයුතු කර ඇති සාමාජිකයන්ගේ මෙතෙක් උපයා ගත් ලකුණුවලින් ලකුණු 100ක් අඩු කරනු ලැබේ.

### 09. ණය ආපසු ගෙවීම කල් පසුවීම

යම් කිසි සාමාජිකයෙකු පිළිගත හැකි හේතු ඉදිරිපත් කිරීමකින් තොරව තමා ලබාගන්නා ලද ණය මුදල් හා පොලිය කල් පසු වී ආපසු ගෙවීමේ දී එම තැනැත්තා උපයා ගත් ලකුණුවලින් 100ක් අඩු කරනු ලැබේ.

### 3.1.5 ලබා ගන්නා ලද ලකුණු මත කාණ්ඩ ගත කිරීම

ලබා ගන්නා ලද ලකුණු 105-75 - පළමු කාණ්ඩය
ලබා ගන්නා ලද ලකුණු 74-65 - දෙවන කාණ්ඩය
ලබා ගන්නා ලද ලකුණු 64-50 - තුන්වන කාණ්ඩය
ලබා ගන්නා ලද ලකුණු 49ට අඩු – හතරවන කාණ්ඩය

සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන ප්‍රධාන නිලයන් තුන සඳහා පළමු කාණ්ඩයෙන් ප්‍රබුද්ධ ලේඛනයේ ලකුණු ලබා ගත් අය පමණක් තෝරා ගැනේ. එපමණක් ද නොව, එම පුද්ගලයන් ඊට පෙර වර්ෂය තුළ අනු කමිටුවක නිල තලයක් දරා ඇති පුද්ගලයන් විය යුතු ය. ප්‍රබුද්ධ ලේඛනයේ දෙවන කාණ්ඩය නියෝජනය කරන පුද්ගලයන් කාරක සභිකයන් ලෙස පත් කර ගනු ලැබේ. ප්‍රබුද්ධ ලේඛනයේ තුන්වන කාණ්ඩය නියෝජනය කරන පුද්ගලයන් අනුකමිටු සඳහා නිලතලවලට තෝරාපත් කර ගනී. ප්‍රබුද්ධ ලේඛනයේ හතරවන කාණ්ඩයේ පුද්ගලයන් ප්‍රධාන නිල තුන සඳහා හෝ කාරක සභික ධූර සඳහා හෝ අනුකමිටු නිලතල සඳහා හෝ තේරී පත්වීමට අවස්ථාවක් නො ලබයි.

### 3.1.6 සංවිධානයේ ඉතිරි කිරීම හා ණය සැපයීම

ගොවි සංවිධාන සාමාජිකයන් සඳහා සංවිධානය තුළම ඉතිරි කිරීමට පොළඹවා ඇත. ඒ අනුව, සියලුම සාමාජිකයින්ගේ ඉතිරි කිරීම් ණය ලබාගැනීම සඳහා සුදුසුකමක් ද වන්නේ ය. මේ ණය සැපයුම් සේවාව නිසා සාමාජිකයින් සංවිධානය තුළ ඉතිරි කිරීම් සඳහා පෙළඹී ඇති අතර සාපේක්ෂව ලැබෙන ඉහළ පොළී අනුපාතය ඉතිරි කිරීමට තවත් හේතුවක් වී තිබේ.

**වගු අංක 3.1.3 : මුදල් ඉතිරි කිරීම**

| වර්ෂය | ඉතිරි කර ඇති මුදල් ප්‍රමාණය රු. | ඉතිරි කළ සාමාජික සංඛ්‍යාව | වාර්ෂික පොළිය % |
|---|---|---|---|
| 2009 | 2,61,000.00 | 64 | 10% |
| 2010 | 3,03,050.00 | 79 | 10% |
| 2011 | 3,84,000.00 | 103 | 10% |

මූලාශ්‍රයː ගොවි සංවිධාන වාර්තා

ඉතිරි කිරීම් ලෙස තම සාමාජිකයන්ගෙන් ම ලබා ගන්නා මුදල් ප්‍රදේශයේ සාමාජික ගොවි ජනතාවගේ ණය අවශ්‍යතාවන් සපුරාලීමට භාවිතා කරයි. ගොවි සංවිධානය විවිධ අරමුණු ඔස්සේ ණය සපයයි. ඒවා නම්, සත්ත්ව පාලන කටයුතු සඳහා ණය, කෘෂි උපකරණ ණය, ව්‍යාපෘති ණය, කෘෂි ළිං ණය, ගොඩ බෝග ණය, ජලජීවී වගා ණය ආදී වශයෙන් විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ණය සපයා ඇත. සාමාන්‍ය ණය වශයෙන් රු. 50,000ක ණය මුදලක් ලබාදෙන බව හෙළි විය. මෙම ණය සේවාව ගොවි ජනතාවගේ එදිනෙදා ණය අවශ්‍යතාවයන්ට මෙන් ම කෘෂි කාර්මික ණය අවශ්‍යතා සඳහා ද ඉමහත් සහනයක් වී ඇති බව ගොවීන් සමඟ කළ සාකච්ඡාවලින් හෙළි විය. මෙහි වඩාත් ම වැදගත් ලක්ෂණය වන්නේ ඉතුරුම් සහ ණය යෝජනා ක්‍රමය ක්‍රමවත් අයුරින් සංවිධානාත්මකව පවත්වාගෙන යාමයි.

ගොවි ජනතාවගේ කෘෂිකාර්මික ජීවිතය වඩාත් සුරක්ෂිත කිරීම සඳහා ඔවුන්ට විවිධ නිෂ්පාදන ක්ෂේත්‍රයන් හි නියැලීමට අවශ්‍ය ප්‍රාග්ධන පහසුකම් ගොවි සංවිධානය මඟින් සපුරා දෙනු ලබයි. මේ එක් එක් ක්ෂේත්‍රයන් සඳහා අරමුදල් ගොඩනංවා ඇති අතර ඒ අරමුදල් මඟින් ගොවීන්ට ණය සපයයි. ඒවා නම්, සත්ත්ව පාලන කටයුතු සඳහා කැමති ගොවීන්ට ණය සැපයීමේ සත්ත්ව පාලන අරමුදල, ගොඩ බෝග වගාවට ජලය සැපයීමට අවශ්‍ය කෘෂි ළිං ඉදි කිරීම සඳහා ණය සපයන ගොඩ බෝග හා කෘෂි ළිං අරමුදල හා සුළු කෘෂි ණය අරමුදල යන ඒවායි.

වගු අංක 3.1.4: ණය සැපයීම පිළිබඳ තොරතුරු (2011 වර්ෂය සඳහා)

| ණය සපයා ඇති කාර්යය | ලබා දී ඇති ණය මුදල රු. | වාර්ෂික පොළිය % |
|---|---|---|
| ගොඩ බෝග වගා කිරීම | 84,000.00 | 12% |
| සත්ත්ව පාලන කටයුතු | 4,50,000.00 | 12% |
| කෘෂි උපකරණ මිලට ගැනීම | 1,84,000.00 | 12% |
| ව්‍යාපෘති ඇරඹීම | 8,30,500.00 | 12% |
| කෘෂි ළිං තැනීම | 1,40,000.00 | 12% |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.1.7 කෘෂිකාර්මික අවශ්‍යතා සපුරාලීම

බල ප්‍රදේශයේ ගොවි ජනතාවට අවශ්‍ය යෙදවුම් හා උපකරණ සාධාරණ ගාස්තු මත සැපයීමට ගොවි සංවිධානය පියවර ගෙන තිබේ. කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය උපකරණ ගොවි සංවිධානය සතුව පවතී. ඒවා නම් ස්ප්‍රේ යන්ත්‍ර, අත්ට්‍රැක්ටර් සහ බිම් සැකසීමේ තහුල්. ගොයම් කපන සහ පාගන යන්ත්‍ර, වී සුද්ධ කරන මැෂින්, වතුර මැෂින් ආදියයි. මේවා පහසු කුලී ගෙවීම් යටතේ ගොවීන්ට තම කෘෂිකාර්මික අවශ්‍යතා සඳහා යොදා ගැනීමට පුළුවන. එම සේවාවට අමතරව, ගොවීන්ට අවශ්‍ය උපකරණ, බීජ, කෘෂි රසායනික ද්‍රව්‍ය, බීජ පැළ සහ සතුන් ගෙන්වා දීමට ද ගොවි සංවිධානය අවශ්‍ය කටයුතු කරයි.

### 3.1.8 වාරිමාර්ග නඩත්තුව

ගොවි සංවිධානය විසින් ප්‍රදේශයේ වැව් ප්‍රතිසංස්කරණය, වැව් නඩත්තුව හා වාරි පහසුකම් දියුණු කිරීමේ කටයුතුවල නිරතව සිටී. වාරිමාර්ග නඩත්තුව හා ප්‍රතිසංස්කරණය නිසි පරිදි සිදුකරන නිසා ගොවි ජනතාව ගොවි සංවිධානය කෙරෙහි සෑහීමකට පත් වී සිටිති. එසේ ම, ගොවි සංවිධානයේ සාමාජිකයන් ජල පාලකවරුන් ලෙසට පත් කොට වැවේ ජලය සියලුම වී වගා කරන ගොවීන් සඳහා හිඟයකින් තොරව ලබාදීමට වැඩ පිළිවෙළක් සකසා ක්‍රියාත්මක කරයි. එය ජල සැපයුම් කාල සටහනක් මඟින් ගොවි ජනතාවට ප්‍රදර්ශනය කොට තිබේ.

### 3.1.9 කොන්ත්‍රාත් කිරීම

කොන්ත්‍රාත් කිරීම සම්බන්ධයෙන් ගොවි සංවිධානයේ ආරම්භක පිළිවෙත වී පැවතියේ, ගොවි සංවිධානයට ලැබෙන කොන්ත්‍රාත් ඔවුන් විසින් ම කිරීමයි. කඩහත වැව ප්‍රතිසංස්කරණය කරන ලද්දේ ඒ ආකාරයට ය. එයින් ලත් අත්දැකීම් මත මෙම පිළිවෙත

වෙනස් කොට තිබේ. එනම්, බල ප්‍රදේශයේ වැව්, වැව් බැම්, පිටවාන් සොරොවු, කෘෂි පාරවල්, ඇල මාර්ග, පැති බැම්, ප්‍රජාශාලා ඉදි කිරීම් සම්බන්ධ කොන්ත්‍රාත් ලබාගෙන එය ඉදි කිරීම ගමේ ම පුද්ගලයෙකුට පවරා දී 5% කොමිස් මුදල පමණක් ගොවි සංවිධානය ලබා ගනී. කොන්ත්‍රාත් කටයුතුවල ඉදි කිරීම් කාර්යයන්වල දී ගමේ ජනතාවට හා ගොවි සංවිධානයේ සාමාජිකයන්ට ශ්‍රමිකයන් ලෙස කුලියට වැඩ කිරීමට හැකියාව ලැබේ. සංවිධානයේ නායකයන්ට මෙම සංවර්ධන වැඩ පිළිබඳව අධීක්ෂණය කිරීමට හැකියාව පවතී. ගොවි සංවිධානය සතුව කොන්ත්‍රාත් වැඩවල යෙදීමට ප්‍රමාණවත් තරම් තාක්ෂණ ශිල්පීන් හා යන්ත්‍ර නොමැතිකම නිසා ප්‍රදේශයේ කොන්ත්‍රාත්, සංවිධානය විසින් භාරගෙන ගමේම හැකියාව ඇති වෙනත් පුද්ගලයකුට පවරයි. කොන්ත්‍රාත් කටයුතු සම්බන්ධයෙන් ගොවි සංවිධානයේ සෙසු සාමාජිකයන්ගේ අදහස වන්නේ කොන්ත්‍රාත් භාර ගැනීම තම සංවිධානයේ අරමුදල ශක්තිමත්වීමට හේතුවන බවත්, මේ මඟින් කරනු ලබන සංවර්ධන කටයුතු නායකයන්ගේ අධීක්ෂණය යටතේ ඉහළ ප්‍රමිතියකින් යුතුව කරගත හැකි නිසා එය හොඳ දෙයක් බවත් ය.

**වගු අංක 3.1.5: සංවිධානය විසින් කරන ලද කොන්ත්‍රාත්**

| වර්ෂය | කොන්ත්‍රාත් සංඛ්‍යාව | මුළු මුදලරු. | ලාභය රු. |
|---|---|---|---|
| 2006 | 04 | 10,20,000.00 | 4,10,500.00 |
| 2007 | - | - | - |
| 2008 | - | - | - |
| 2009 | 01 | 4,50,000.00 | 96,000.00 |
| 2010 | - | - | - |
| 2011 | 01 | 2,75,000.00 | 61,000.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.1.10 කන්න රැස්වීම සංවිධානය කිරීම

ගොවි සංවිධානය විසින් වගා කන්නයක් ආරම්භයේ දී කන්න රැස්වීම් සංවිධානය කරයි. මෙහි දී, ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරී වැනි කෘෂිකර්මය හා සම්බන්ධ නිලධාරීන් ද සහභාගී කරවා ගැනෙයි. මෙම රැස්වීමේ දී ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය තීන්දු තීරණ ගැනීම හා පොහොර සහනාධාරය ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම, වාරිමාර්ග නඩත්තු කටයුතු ක්‍රමවත් ලෙස පවත්වාගෙන යාම සම්බන්ධව ද සාකච්ඡා කරනු ලබයි. කෘෂිකර්ම උපදේශක මහතා විසින් බෝග වගා තාක්ෂණය හා රෝග පළිබෝධ සම්බන්ධව පසුගිය කන්නයෙන් ලත් අත්දැකීම් පදනම් කරගනිමින් අවම නිෂ්පාදන වියදමකින් වැඩි අස්වැන්නක් ලබාගැනීම සම්බන්ධව උපදෙස් ලබාදීම සිදු කරයි.

### 3.1.11 කෘෂි තාක්ෂණ දැනුම ලබාදීම

ගොඩ ඉඩම් වගා කිරීම සඳහා ද ගොවි සංවිධානය මඟින් වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ගෙවතු වගා උපදේශන වැඩසටහන් ද, ගෙවතු වගා තරඟ පැවැත්වීම ද බීජ හා පොහොර සහන මිලට ලබාදීම ද කරයි. සංවිධානයේ සාමාජිකයන් අතුරින් කෙනෙක් තෝරා ගෙන ඔහුගේ ගෙවත්ත ආදර්ශ ගෙවත්තක් වශයෙන් සංවිධානය කොට වෙනත් ගොවීන්ට ආදර්ශනයක් ලෙස පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇත. ඒ සඳහා එම ගෙවතු හිමියාව

රු. 7500/-ක මුදලක් ද ආධාරයක් වශයෙන් ලබාදෙයි. මේ නිසා ප්‍රදේශයේ ජනතාව ගෙවතු වගා සඳහා වැඩි වැඩියෙන් නැඹුරුතාවයක් දක්වන්නට පටන් ගෙන තිබේ.

මෙයටත් අමතරව, ගොවීන්ගේ කෘෂි තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කොට ගොවි කණ්ඩායම ක්ෂේත්‍ර චාරිකා සඳහා කැඳවාගෙන ගොස් පුහුණුවක් ලබාදීම වැනි කාර්යයන් ද පෙන්වා දිය හැකි ය. එම ක්ෂේත්‍ර චාරිකා පිළිබඳව වගු අංක 05 යටතේ විස්තර දැක් වේ.

**වගු අංක 3.1.6: ගොවි ක්ෂේත්‍ර චාරිකා**

| වර්ෂය | ක්ෂේත්‍ර චාරිකා සංඛ්‍යාව හා ප්‍රදේශය | සහභාගී වූ ගොවීන් සංඛ්‍යාව | ඉගෙන ගත් ක්ෂේත්‍රය |
|---|---|---|---|
| 2006 | 02 – කල්පිටිය | 80 | එළවළු වගාව |
| 2007 | 02 - බතලගොඩ | 26 | පොහොර භාවිතය හා බීජ වී වගාව |
| 2008 | 03 – වත්තිගම | 44 | සත්ත්ව පාලනය |
| 2009 | 01 – මහබේරියතැන්න | 30 | කිරිගව පාලනය |
| 2010 | 03 – අනුරාධපුරය | 22 | කෘෂි උපකරණ නඩත්තුව |
| 2011 | 01 – පේරාදෙනිය | 32 | උද්‍යාන බෝග වගාව |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.1.12 වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම

ගොවි සංවිධානය විසින් වාර්ෂිකව ප්‍රදේශයේ ගොවි ජනතාව හා කෘෂිකර්මය වෙනුවෙන් සිදු කිරීමට බලාපොරොත්තුවන වැඩකටයුතු මනාව සැලසුම් කොට එක් එක් වර්ෂයේ ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්, අපේක්ෂිත අරමුණු, ඉලක්ක සංඛ්‍යාව, එක් එක් මාසය තුළ දී එම ඉලක්ක සපුරා ගැනීමට කළ යුතු කාර්යය සහ ඒවායේ වගකීම දරන්නන් ද ඇතුළත් සංවර්ධන සැලැස්මක් සකස්කොට මහා සභාවට ඉදිරිපත් කොට අනුමැතිය ලබාගැනීමෙන් පසු ක්‍රියාත්මක කරයි. (සංවර්ධන සැලැස්ම ඇමුණුමෙ හි ඇතුළත් කොට ඇත). එලෙස ඉදිරිපත් කරන සංවර්ධන සැලසුම, යම් වර්ෂයක එක් එක් මාසය තුළ දී සිදු කිරීමට බලාපොරොත්තුවන ක්‍රියාවන් එම සැලසුම පරිදි ඒවාට වග කියන්නන් විසින් ඉටු කර ඇත් ද යන්න පසු විපරම් කිරීමක් මාසිකව සිදු කරයි. සෑම මසකම 05 වැනි දින ගොවි සංවිධානයේ කාරක සභාව රැස්වන අතර එහි දී එම සමාලෝචනය සිදු කරයි. ඉටු කර ගත හැකි වූ කාර්යයන් ඉටු කර ගැනීමට නො හැකි වූ කාර්යයන්, ඊට හේතු සමඟ විග්‍රහ කොට ඒවා ඉටු කර ගැනීමට යළි පරිශ්‍රමයක් දැරීමට අවශ්‍ය පියවරයන් එහි දී ගනු ලබයි. මෙලෙස කාරක සභාව ඉතා ශක්තිමත් ලෙස ක්‍රියාත්මක වෙමින්, මාසිකව රැස් වෙමින් තමන්ගේම සැලසුම් පිළිබඳව පසු විපරමක් කිරීම සංවිධානයේ යහපත් ක්‍රියාකාරීත්වය පෙන්වන තවත් ලක්ෂණයකි.

### 3.1.13 අනු කමිටු පිහිටුවීම මගින් සාමාජිකයින් වෙත බලය පැවරීම

ගොවි සංවිධාන තම සේවාවන් වඩාත් පුළුල් අන්දමින් ජනතාවට සැපයීම සඳහා අනු කමිටු 7ක් ගොඩනගා තිබේ. මෙම එක් එක් අනු කමිටු සඳහා විවිධ විෂයයන් බෙදා දක්වා ඇති අතර එම කාර්යයන් ඉටු කිරීම මගින් එක් එක් කණ්ඩායම් විශේෂීකරණයකට ලක් වී තිබීමෙන් අදාළ කාර්යයන් වඩාත් කාර්යක්ෂම අයුරින් උපරිම ඵලදායීතාවයකින් යුක්තව ඉටු කිරීමට හැකියාව ලැබී ඇත. ගොවි මහතෙකුට යම් කිසි කාර්යයක් ඉටු කර ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා අදාළ අනු කමිටුවේ සාමාජිකයින් වෙත යොමු වී එම කාර්යය සඳහා ඉල්ලීම් සිදු කළ හැකි ය. උදාහරණ ලෙස සත්ත්ව පාලනය සඳහා කැමැත්තක් දක්වන ගොවි මහතෙකුට අවශ්‍ය සතුන් ලබා ගැනීම සඳහා සත්ත්ව පාලන අනු කමිටුව සමඟ සාකච්ඡා කර අවශ්‍ය සහාය ලබාගත හැකි වේ.

වගු අංක 3.1.7: ගොවි සංවිධානයේ අනුකමිටු හා කාර්ය භාරයන්

| අනු කමිටු | සිදු කරන කාර්යයන් |
|---|---|
| 01. සත්ත්ව පාලන අනු කමිටුව | කිරිගව පාලනය, කිරි එකතු කිරීම, කුකුළු පාලනය හා සම්බන්ධ සේවා |
| 02. අධ්‍යාපන හා පුහුණු අනු කමිටුව | අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම, අත්දැකීම් හුවමාරුව, අධ්‍යාපන වැඩසටහන් සංවිධානය කිරීම |
| 03. ඉදිකිරීම් හා නඩත්තු අනු කමිටුව | කොන්ත්‍රාත් හා ඉදිකිරීම් කටයුතු සිදු කිරීම, වැව් ඇළ මාර්ග පද්ධති, කෘෂි පාරවල් නඩත්තු කටයුතු, ශ්‍රමදාන සංවිධානය |
| 04. පෝෂණ අනු කමිටුව | පෝෂණ වැඩසටහන් සංවිධානය හා ආහාර සැපයීම |
| 05. සහල් සැකසුම් ව්‍යාපෘති අනු කමිටුව | ගෘහස්ත පෝෂ්‍යදායී සහල් සකස් කිරීම සඳහා සේවා සැපයීම |
| 06. කෘෂිකාර්මික යෙදවුම් සැපයීමේ අනු කමිටුව | කෘෂිකාර්මික යෙදවුම් පහසු මිලට සැපයීම සම්බන්ධීකරණය කිරීම |
| 07. බීජ වී වගා අනු කමිටුව | බීජ වී වගා කිරීම සඳහා අවශ්‍ය සේවා සැපයීම |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.1.14 සාමාජික සුබ සාධනය

ගොවි සංවිධානය විසින් සාමාජිකයින්ගේ සුබ සාධන කටයුතු ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා අවධානය යොමු කොට තිබේ. සුබ සාධන කටයුතු යනු සංවිධානයක සාමාජිකයන්ගේ මානසික තෘප්තිය ඉහළ නැංවීමට හේතුවන ක්‍රියාවන්වල නිරතවීමයි. මේ සඳහා විනෝද චාරිකා සංවිධානය කිරීම, පිරිත් දේශනා, ධර්ම දේශනා සාංඝික දාන වැනි ආගමික වැඩසටහන් සංවිධානය කිරීම මගින් තම සාමාජිකයන්ගේ සිත් සතන් සතුටු කිරීමට පියවර ගෙන ඇත. මෙම ගොවි සංවිධානය තුළ අවමංගල්‍යාධාර අංශයක් ද ක්‍රියාත්මක කරයි. සමාජික මුදල්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් සුබ සාධන කටයුතුවලට ම යොදවයි. සාමාජික අවමංගල්‍යයක දී අවමංගල්‍යාධාර වශයෙන් රු. 1000/-

ලබාදෙන අතර සමිතිය සතු පුටු 50ක් ද අය කිරීමකින් තොරව ලබා දෙයි. ඊට අමතරව, සාමාජික සහභාගීත්වය ද නො අඩුව ලබා දෙයි. මේ නිසා, සාමාජිකයෝ සංවිධානය කෙරෙහි ශක්තිමත් බැඳීමක් ඇති කරගෙන සිටිති. ප්‍රදේශයේ පාසල් ළමුන්ගේ පෝෂණ තත්ත්වය වර්ධනය සඳහා කොළ කැඳ පිරිනැමීම ද මෙම සංවිධානය විසින් සිදු කරන තවත් වැදගත් සේවාවකි. එසේ ම වෙසක්, පොසොන් වැනි ආගමික වශයෙන් වැදගත් දිනවල දන්සැල් ද සංවිධානය කරයි.

### 3.1.15 ආදායම් උත්පාදන ව්‍යාපෘති පවත්වාගෙන යාම

සංවිධානයේ සාමාජිකයන් සඳහා ආදායම් උත්පාදන ව්‍යාපෘති කිහිපයක් හඳුන්වාදීමට පියවර ගෙන ඇත. ඉන් එක් ව්‍යාපෘතියක් වන්නේ සහල් සැකසුම් ව්‍යාපෘතියයි. සහල් සැකසුම් ව්‍යාපෘතිය හා සම්බන්ධ සාමාජිකයන් 40 දෙනෙකු පමණ සිටී. ඔවුන්ට පෝෂ්‍යදායී සහල් සැකසුම පිළිබඳව පුහුණුව ලබා දී ඇති අතර වී තැම්බීමට අවශ්‍ය උපකරණ ද සපයා දී ඇත. සංවිධානය සතු වී මෝලේ කොටා සහල් සකස් කර අලෙවි කරයි. 2010 දෙසැම්බර් 31 දින සංවිධානයේ ශේෂ පත්‍රයට අනුව සහල් සැකසුම් ව්‍යාපෘතියේ නියැළී සිටින්නන් සඳහා යන්ත්‍ර උපකරණ සඳහා ණය මුදල් වශයෙන් රු. 561,895ක් ලබා දී ඇති බව දක්වා තිබේ.

**වගු අංක 3.1.8: සහල් සැකසුම් ව්‍යාපෘතිය**

| වර්ෂය | ලැබූ ආදායම රු. | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 2010 | සහල් කෙටීම – 1,86,000.00 | 02 (මාරුවෙන් මාරුවට) |
| | වී තැම්බීම සහ වියැළීම – 1,600,000.00 | 20 (කාන්තාවන්) |
| 2011 | සහල් කෙටීම – 1,65,000.00 | 02 (මාරුවෙන් මාරුවට) |
| | වී තැම්බීම සහ වියැළීම – 1554000.00 | 22 (කාන්තාවන්) |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

වී වගාව - පැරණි සම්ප්‍රදායික වී වර්ග කාබනික පොහොර පමණක් භාවිතා කොට වගා කිරීම, ගොවීන් 22

අඹ වගාව – ගොවීන් 08 දෙනෙකු විශේෂ අඹ වගා ව්‍යාපෘතියක් පවත්වාගෙන යයි.

කජු වගාව – ගොවීන් 06 දෙනෙකු කජු වගා පවත්වාගෙන යයි.

මෙයට අමතරව, වගා ළිං ඉදිකර ගැනීම සඳහා සහ වගා ළිං යටතේ ගොඩ බෝග වගා කිරීම සඳහා ණය සපයා දී ඇත. සත්ත්ව පාලන කටයුතු පවත්වාගෙන යාම සහ සතුන් මිල දී ගැනීම වැනි කාර්යයන් සඳහා රු. 337,735ක මුදලක් ණය වශයෙන් සපයා දී තිබේ.

### 3.1.16 අතුරු ව්‍යවස්ථාව

ගොවි සංවිධානය තමන්ගේ ප්‍රදේශයටම ආවේණික වූ මෙන් ම තම ගොවීන්ගේ කෘෂි අවශ්‍යතා සැපිරීම හා ආදායම් තත්ත්වය වැඩිදියුණු කිරීමත්, සාමාජික හා සංස්කෘතික ක්ෂේත්‍රයන් වැඩිදියුණු කිරීමත් අරමුණු කොටගත් ගොවි සංවිධාන පොදු ව්‍යවස්ථාවට අමතරව, මෙම ගොවි සංවිධානය සඳහාම විශේෂිත වූ අතුරු ව්‍යවස්ථාවක් ද සම්පාදනය කොටගෙන ඇත. ඒ අනුව, ඔවුන්ට ම ආවේණික වූ ආකාරයෙන් ගොවි සංවිධානය පවත්වාගෙන යාමට හැකියාව ලැබී තිබේ.

### 3.1.17 සාමාජික සිතුම් - පැතුම් හා අදහස්වලට අවස්ථාව ලබාදීම

සංවිධානය නිර්මාණාත්මක හා නව අදහස්වලට ඉඩදීමට සැමවිටම ක්‍රියාමාර්ග ගෙන ඇත. එලෙස, නව අදහස් හා නිර්මාණශීලී අදහස් ගොවි සංවිධානයේ සාමාජිකයින්ට ඉදිරිපත් කිරීම සඳහා වැඩසටහනක් හඳුන්වා දී තිබේ. එනම්, සෑම සාමාජිකයෙකුට ම ගොවි සංවිධානය තුළ වැඩි දියුණුව සඳහා කළ හැකි ක්‍රියාමාර්ග පිළිබඳ දිනකට විනාඩි 5ක පමණ කාලයක් සිතීමට වෙන් කරන ලෙසත්, සෑම නිලධාරියෙකුම දිනකට විනාඩි 15ක් එසේ සිතිය යුතු බවටත් ඔවුන් දැනුවත් කොට ඇත. එම අදහස් සම්තිවාර තුළ දී ඒ ඒ සාමාජිකයින් විසින් ඉදිරිපත් කළ යුතුව තිබේ. එම අදහස් මත, ගොවි සංවිධානය ගනු ලබන විවිධ ක්‍රියාමාර්ග එහි සාමාජිකයන්ගේම අදහස් නිසා ගොවි සංවිධානය තමන්ගේ ය යන හැඟීම සාමාජිකයින් තුළ වර්ධනය වී ඇති බව සාකච්ඡාවල දී හෙළි විය.

### 3.1.18 අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම

මෙම ගොවි සංවිධානය තම බල ප්‍රදේශයේ ගොවීන් සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කිරීමේ දිගුකාලීන අත්දැකීම් මත විශේෂඥතාවයක් ලබා සිටියි. විශේෂයෙන් ම, ක්‍රමවත් පරිදි ප්‍රජා ව්‍යාපෘති සැලසුම් කිරීම, ණය වැඩසටහන් සැලසුම් කිරීම, වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම, ආදායම් උත්පාදන වැඩසටහන් සැලසුම් කිරීම, ආදී සංවර්ධන ක්‍රියාමාර්ග සැලසුම් කොට මනාව පවත්වාගෙන යන ජනතාවගේ ම සංවිධානයක් ලෙස විශේෂඥ ඥානයක් ලබාගෙන ඇත. එනම්, ඔවුන් බලගැන් වී සිටී. එම විශේෂඥ ඥානය සංවිධානයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ කාරක සභාවට ඇත. එම නිසා, මෙම ප්‍රජා සංවිධානය තවත් එවැනි සංවිධානවලට තම දැනුම හා අත්දැකීම් ලබාදීමට තරම් දැනුමෙන් සන්නද්ධව සිටී. එම නිසා, මෙම ගොවි සංවිධානය වෙනත් ගොවි සංවිධානවලට දැනුම හා අත්දැකීම් බෙදා දෙන අධ්‍යාපන ආයතනයක් බවට පත්ව තිබේ. රටේ වෙනත් ගොවි සංවිධාන නිලධාරී මණ්ඩලය හා සාමාජික පිරිස් මෙම ගොවි සංවිධානය වෙත පැමිණ අධ්‍යාපන ගාස්තු ගෙවා එම අත්දැකීම් ලබාගන්නා තත්ත්වයට පත්ව ඇත. එලෙස අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීමට මෙම ගොවි සංවිධානයේ කාර්ය මණ්ඩලය විශේෂඥතාවයක් ලබා සිටින බැවින් වෙනත් ගොවි සංවිධානවලින් මුදල් අයකර පුහුණු වැඩසටහන් වශයෙන් අධ්‍යාපනික වැඩසටහන් පවත්වයි. මෙම අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම මඟින් සංවිධානයට ආදායම් උත්පාදනයක් ද සිදු වේ.

**වගු අංක 3.1.9: අධ්‍යාපනික වැඩසටහන්**

| වර්ෂය | පැවැත් වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ ගොවීන් සංඛ්‍යාව | ඉපැයූ ආදායම (රු.) |
|---|---|---|---|
| 2006 | 24 | 416 | 60,000.00 |
| 2007 | 29 | 430 | 69,000.00 |
| 2008 | 22 | 390 | 61,500.00 |
| 2009 | 34 | 602 | 77,500.00 |
| 2010 | 32 | 576 | 80,700.00 |
| 2011 | 23 | 704 | 88,000.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

එමෙන් ම, ගොවි සංවිධානය සතුව ස්ප්‍රේ යන්ත්‍රයක්, තණකොළ කපන මැෂින් එකක් ඇත. ඒවා සහන මිල ගණන් යටතේ ගොවි සංවිධානයේ සාමාජිකයින්ට ලබාගැනීමේ හැකියාව පවතී. එමෙන් ම, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් ලැබුණු රෝද දෙකේ ට්‍රැක්ටරයක්

චාරික වශයෙන් ගෙවීමේ පදනම මත ගොවි සංවිධානය හරහා එක් ගොවියෙකුට ලබා දී තිබේ. මේ ආකාරයෙන් ගොවි සංවිධානය සිය සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා විවිධ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කොට තිබේ. එපමණක් නොව, ගමේ පොදු කටයුතු රසක් මෙන් ම ආගමික වැඩසටහන් රසක් ද ගොවි සංවිධානයේ මැදිහත්වීමෙන් සිදු කොට ඇත.

ගොවි සංවිධානයේ ලාභ අලාභ ගිණුම පිරික්සීමෙන් ගොවි සංවිධානයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පැහැදිළි අදහසක් ලබාගත හැකි ය (ඇමුණුමෙ හි දක්වා ඇත).

ගොවි සංවිධානය පිහිටුවීම සම්බන්ධ 2000 අංක 46 දරන පනතට අනුව එහි සඳහන් කරුණු අතරින් ක්‍රියාකාරී ගොවි සංවිධානයක පැවතිය යුතු ගුණාංග මෙම ගොවි සංවිධානය තුළ දැකිය හැකි වේ. එමෙන් ම, නායකත්වය පිළිබඳව සාමාජිකයින් තුළ දැඩි විශ්වාසයක් පවතින අතර ඔහුගේ පළපුරුදු නායකත්වය හේතුවෙන් ගොවින් සියලු දෙනාම ඒකරාශී කර ගැනීමේ හැකියාව ලැබී තිබේ. එමෙන් ම, මෙම ගොවි සංවිධානය තුළ දැකිය හැකි වූ සුවිශේෂී අංගයක් ලෙස මනා ලෙස වාර්තා සටහන් පවත්වාගෙන යාම දැකිය හැකි ය. මුදල් පාලනය පිළිබඳ ඉතාමත් ඉහළ මට්ටමක විනිවිදභාවයක් ද දැකගත හැකි විය. ඒ නිසාම, සාමාජිකයින් සියළු දෙනා ගොවි සංවිධානය වටා ඒකරාශී වීමක් දැකිය හැකි වේ.

### 3.1.19 සාරාංශය

ශක්තිමත් නායකත්වය, ගොවි ජනතාව සඳහා සේවාවන් රාශියක් සිදු කිරීම, සාමාජීය සංස්කෘතික සියලු අංශයන් ඊට ඇතුළත්වීම, මූල්‍යමය ශක්තිමත්භාවය, විනිවිදභාවය හා වර්ෂය පුරා ක්‍රියාශීලීව පැවතීම මෙම ගොවි සංවිධානය සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණ වේ.

## 3.2 සිද්ධි අධ්‍යයන 02: එකමුතු ගොවි සංවිධානය – ගලඅඹගස්වැව, කුරුණෑගල දිස්ත්‍රික්කය

### 3.2.1 හැදින්වීම

මෙම ගොවි සංවිධානය ආරම්භ වී ඇත්තේ 1994 වර්ෂයේ දී ය. මෙය කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාගොල්ලාගම ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගලඅඹගස්වැව ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇත. 1994 වසරේ සිට 1996 දක්වා මෙය පැවති ඇත්තේ නාමික වශයෙන් පමණි. ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ මෙම ගොවි සංවිධාන බල ප්‍රදේශයේ පිහිටා ඇති ගලඅඹගස්වැව මහ වැව ප්‍රතිසංස්කරණය සඳහා ලක්ෂ 5ක ආධාර මුදලක් ලැබීම නිසා මහ වැව ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යය සඳහා ප්‍රදේශයේ ගොවි ජනතාව ඒකරාශී කර ගැනීමට වැඩපිළිවෙළක් සකස් කර ගැනීමට ගොවි සංවිධානයට හැකි වී තිබේ.

### 3.2.2 වැව සහ ඇල මාර්ග තඩත්තුව

ගොවි සංවිධාන බල ප්‍රදේශයේ වැව් 3ක් පිහිටා ඇති අතර ඒවා වී වගාවට ජලය සපයයි. ගලඅඹගස්වැව ප්‍රදේශයේ ප්‍රධාන වාරිමාර්ගය වන මහ වැව ඉතා අබලන් තත්ත්වයක පැවති අතර එය ප්‍රදේශයේ සියලුම ගොවීන්ට එකසේ බලපාන ප්‍රශ්නයක් වී තිබුණි. මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහනකට ගොවි සංවිධානය මූලික වී ක්‍රියා කළ අතර එම කාර්යයට අරමුදල් සපයන ලද්දේ ආසියානු සංවර්ධන බැංකුවයි. වැව ප්‍රතිසංස්කරණ

කොන්ත්‍රාත්තුව ගැනීම සඳහා ගොවි සංවිධානය සතුව මූලික අරමුදලක් නො තිබුණි. එම නිසා, වැව යටතේ කුඹුරු හිමියන්ගෙන් අක්කර 1ක් සඳහා රු. 200ක මුදලක් එකතු කොට එම මුදල බැංකු ගිණුමක තැන්පත් කර ගොවි සංවිධානයේ අරමුදල ලෙස ආසියානු සංවර්ධන බැංකුවට පෙන්වා ඇත. මෙම කාර්යයේ දී වැව යටතේ ගොවීතැන් කළ සියලුම ගොවි ජනතාව ගොවි සංවිධානය වටා ඒකරාශී කර ගැනීමට හැකි වී තිබේ. 'එකමුතු' ගොවි සංවිධානය ක්‍රියාකාරිව ගොඩනැගුණු ආරම්භක අවස්ථාව මෙය විය. ඉන් පසුව, ගොවි සංවිධානයේ සාමාජිකයන්ගේ අරමුණ වූයේ ගලඅඹගස්වැව ශක්තිමත් ලෙස ඉදි කර ගැනීම සහ මෙම කොන්ත්‍රාත්තුවෙන් යම් කිසි ලාභයක් උපයා එය ඉතිරි කර ගැනීමයි. මේ සඳහා උපක්‍රමයක් භාවිතා කිරීමට ගොවීන් සාමූහිකව එකඟත්වයකට පැමිණුනි. එනම්, වැව සංවර්ධනයේ එක් එක් වැඩ කිරීමට ඇස්තමේන්තු ගත කර ඇති මුළු මුදලෙන් භාගයක් පමණක් ගෙන ගොවීන් විසින් අදාළ වැඩ කොටස කර එම මුදල ගොවි සංවිධානයට ඉතිරි කර දීමයි. එනම්, රු. 1,500කට ඇස්තමේන්තු කර ඇති වැඩ කොටස රු. 750ක් වැනි මුළු මුදලෙන් භාගයක් පමණක් ගෙන කිරීමෙන් සංවිධානයට රු. 750ක් ඉතිරි කර දීමයි. සාමාන්‍ය කම්කරුවෙකුට දිනකට ගෙවීම සඳහා ඇස්තමේන්තු කොට තිබුණේ රු. 125ක් වුවත් ගෙවන ලද්දේ රු. 100 කි. සංවිධානයට රු. 25ක් ඉතිරි විය. මේ අනුව, ගොවීන්ගේම ශ්‍රමය කැප කිරීම මත ඉදි කොට අවසන් කර ගත හැකි වූ අතර රු. 119,158.00ක මුදලක් ඉතිරි කර ගැනීමට හැකි විය. එය සංවිධානයේ අරමුදල් වර්ධනයට දායක විය. මෙම වැව ප්‍රතිසංස්කරණය කර ගැනීමට ගොවීන් තුළ වූ කැපවීම හා ඒ සඳහා ලබා දුන් නිවැරදි නායකත්වය මත ගොවීන්ගේ එකමුතු බව අන්‍යෝන්‍ය සුහදත්වය සහ නායකත්වය කෙරෙහි ඇති විශ්වාසය හා බැඳීම වර්ධනය වීමක් සිදු විය. මෙම සිදුවීමත් සමඟ සංවිධානයක් වශයෙන් සාමූහිකව වැඩකර ගොවි ජන ජීවිතය වඩාත් ඉහළ මට්ටමකට පත් කර ගැනීමේ අපේක්ෂාව ඔවුන් තුළ ඇති වී වර්ධනය විය. එම ශක්තිමත් ආරම්භය මත සිට සංවිධානයක් වශයෙන් ඉදිරියට යාම ආරම්භ විය. වැව ප්‍රතිසංස්කරණය සඳහා මුදල් සපයාගෙන ඇති ආකාරය වගු අංක 01න් දැක් වේ.

**වගු අංක 3.2.1: ගලඅඹගස්වැව මහ වැව ප්‍රතිසංස්කරණය සඳහා මූල්‍ය ආධාර සපයා ගැනීමේ මූලයන්**

| අරමුදල් ලැබුණු මූලය | රුපියල් |
|---|---|
| ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු මුදල | 740,144.37 |
| ගොවීන්ගෙන් එකතු කළ මුදල | 19,600.00 |
| ගොවීන් සිය කැමැත්තෙන් වැය කළ මුදල | 19,600.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

මෙම මුදල් අතිශය සකසුරුවම් ආකාරයෙන් වැය කරමින් සාර්ථකව වැව ප්‍රතිසංස්කරණය කොටගත් අතර රුපියල් 119,158.07ක් ඉතිරි කර ගැනීමට ද හැකි විය. එය සංවිධානයේ අරමුදලට දායක කර ගන්නා ලදී.

ගොවි සංවිධාන බල ප්‍රදේශයේ වැව් තුන හා ඊට අනුබද්ධ ඇලවේලි සහ පෝෂිත ඇලවල් ගණනාවක් පවතී. මේවා නිසි පරිදි නඩත්තු කරමින් පවත්වාගෙන යා යුතු ය. මෙම පොදු දේපල ආරක්ෂාව හා නඩත්තු භාරකාර මණ්ඩලයක් පත් කොට තිබේ. එමඟින් වැවේ වැකන්ද, පිටවාන, සොරොවු, පෝෂිත ඇලවල්, කෙත් ඇලවල් ආදිය පිළිබඳව පරීක්ෂාවෙන් සිටින අතර ඒවායින් කිසිවක් කැඩී ඇත්නම් ඒ පිළිබඳ වාර්තාවක් මහා සභාවට ඉදිරිපත්

කිරීම නඩත්තු භාරකාර මණ්ඩලය විසින් සිදු කරයි. මහ සභාව සෑම මසකම පළමුවන දින පැවැත්වෙන අතර එහි දී එම කරුණු සාකච්ඡා කර අවශ්‍ය පියවර ගනී. කාරක සභාවේ සාමාජිකයන් අට දෙනෙකු සහ නිලධාරීන් 12 දෙනෙකු සිටී. මේ කිසිවකුට දීමනා ගෙවීමක් නො කරයි. සියල්ල ස්වේච්ඡාවෙන් කෙරේ.

ප්‍රදේශයේ සෑම කුඹුරු ඉඩම් හිමි ගොවි මහතෙකුටම යල මහ කන්න දෙක වී වගාව සඳහා ප්‍රමාණවත් ලෙස ජල සැපයුම අත්‍යාවශ්‍ය ය. එම නිසා, ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළ ඇති වැව් තුන සඳහාම ඉතා හොඳ වාරිමාර්ග පහසුකම් සැලසීම සඳහා ගොවි සංවිධානය ඉතා සැලකිල්ලෙන් යුක්තව සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කරනු ලබයි. වාරිමාර්ග පද්ධතියේ නඩත්තුව සඳහා කමිටුවක් පත් කොට ඇති අතර මේ සඳහා සාමාජිකයන් 16 දෙනෙකු පමණ ඇතුළත් කොට ඇත. මෙම කමිටුවට අමතරව, ජල කළමනාකරුවකු ද පත් කර ගෙන සිටින අතර ඔහු පත් කරගන්නේ කන්න රැස්වීමේ දී ය. වාරි පහසුකම් ක්‍රමවත්ව පවත්වාගෙන යාම වැවේ සහ ඇල මාර්ගවල නඩත්තුව සඳහා අවශ්‍ය පියවර ගැනීම සඳහා මෙම දහසය දෙනෙකුගෙන් සමන්විත කමිටුව ක්‍රියා කරනු ලබයි. කන්නයට අදාලව ඇලවේලි ශුද්ධ පවිත්‍ර කිරීම, වෑ කන්ද සුද්ධ කිරීම හා මනාව පවත්වාගෙන යාම යනාදිය පිළිබඳව කමිටුව නිරන්තර අවධානයෙන් යුතුව කටයුතු කරනු ලබන අතර අළුත්වැඩියා කටයුතුවල දී ගොවි සංවිධානයේ අරමුදල් යොදා ගනී. එම නිසා, පොදු අයිතිය යටතේ පවතින වැව, වැව් බැම්ම, ඇල මාර්ග මනාව නඩත්තු කරමින් ගොවිතැනට අවශ්‍ය ප්‍රධාන සාධකය වන වාරි ජලය සපයාදීමට ගොවි සංවිධානයේ ප්‍රමුඛ අවධානය යොමු කොට කටයුතු කිරීම ගොවීන්ගේ පැසසුමට ලක් වී තිබේ.

### 3.2.3 අරමුදල ශක්තිමත් කර ගැනීම

මෙම ගොවි සංවිධානය ගොවි ජනතාවට සේවය සැපයීමට සමගාමීව ආදායම් උත්පාදන ව්‍යාපාරයන් කිහිපයක් ද පවත්වාගෙන යයි. ගොවි සංවිධානය විසින් තම සාමාජිකයන්ගෙන් අරමුදල් එකතු කර ගැනීමට උත්සාහ නොකොට ගොවි සංවිධානයට අයත් පොදු සම්පත් වන වැව හා වැව් රක්ෂිතය ගොවි සංවිධානයට ආදායම් ලබාදෙන ප්‍රභවයන් බවට පත් කරගෙන සිටී. ඒවා පහත සඳහන් පරිදි වේ.

- වැවෙහි නෙළුම් මල් බදුදීම මගින් ආදායමක් උපයා ගැනීම
- යල කන්නයේ දී වැවේ ජලය සිඳී යන අතර වැවේ මාළු පිටස්තර ධීවරයන්ට බදු දීම මගින් වසරකට රු. 75,000ක් පමණ උපයා ගත හැකි ය.
- වැව් රක්ෂිතයට අයත් සියඹලා, දිවුල් වැනි ගස් බදු දීම මගින් මුදල් ඉපැයීම
- ගොවි සංවිධාන ගොඩනැගිල්ල පිහිටා ඇති බිමේ අලෙවි සැලක් හා කෘමිනාශක අලෙවි සැලක් හා සිල්ලර අලෙවි සැලක් පවත්වාගෙන යාම තුළින් ආදායම් ලැබීම, මෙම අලෙවි සැල බදු දී ඇති අතර කෘමිනාශක කොමිස් තුළින් ආදායම් ඉපැයීම
- ගොවි සංවිධානය සතුව ජල ටැංකියක් ඇති අතර ප්‍රදේශවාසීන්ගේ උත්සව අවස්ථාවල දී ජලය රැස්කර ගැනීමේ අවශ්‍යතාවය සඳහා මෙම ජල ටැංකිය කුලියට දීම මගින් සංවිධානය ආදායම් ඉපැයීම.
- සංවිධානය සතු ගොයම් කැපීමේ යන්ත්‍ර කුලියට දීම මගින් ආදායම් ඉපැයීම.
- වාරි ජලය ක්‍රමවත්ව සැපයීම සඳහා සලාරිස් වශයෙන් සෑම ගොවියෙකුම සෑම කන්නයකටම වී බුසලක් ගොවි සංවිධානයට ලබාදිය යුතු ය. එයින් කොටසක්

ජල පාලකට ගෙවීම් කිරීමට යොදා ගන්නා අතර ඉතිරිය ගොවි සංවිධානයේ අරමුදලට එකතු වේ. මෙම මුදල් වැව සහ ඇල මාර්ගවල නඩත්තු කටයුතු සඳහා යොදා ගැනෙයි.

- සංවිධානය සතු මුදල් ණය වශයෙන් සැපයීමෙන් ලබා ගන්නා පොළිය සංවිධානයේ තවත් ආදායමකි.
- ගොවි සංවිධානය මෙතෙක් ලබා සිටින ප්‍රවීණත්වය මත මෙතෙක් පැමිණි ගමන් මගේ අත්දැකීම් රටේ වෙනත් ගොවි සංවිධානවලට ලබාදීමේ අධ්‍යාපනික වැඩසටහන් පවත්වයි. මේ සඳහා පැමිණෙන පිටස්තර ගොවි සංවිධාන වලින් අය කිරීමක් කරන අතර එය ද සංවිධානයේ ප්‍රධාන ආදායම් මාර්ගයකි.
- ගොවි සංවිධානයේ සාමාජිකයින් වශයෙන් ඇතුළත්වීමට අපේක්ෂා කරන්නවුන්ගෙන් ඇතුළත්වීමේ ගාස්තුවක් ලෙස රු. 100ක් අය කෙරේ. මෙය ද සංවිධානයේ තවත් ආදායම් මාර්ගයකි.
- කොන්ත්‍රාත් කටයුතුවල නිරතවීම මඟින් ද ආදායම් උපයා ගනී.

**වගු අංක 3.2.2: විවිධ මාර්ගවලින් ගොවි සංවිධානයට ලැබුණු ආදායම් ප්‍රමාණය**

| ආදායම් මාර්ග | වර්ෂය | ආදායම (රුපියල්) |
|---|---|---|
| වැවෙ හි නෙළුම් මල් බදු දීම | 1996 -2011 | 19750.00 |
| වැවේ මාළු යල කන්නයේ දී බදු දීම | 1996 -2011 | 176287.50 |
| වැව් රක්ෂිතයට අයත් සියඹලා සහ දිවුල් ගස් බදු දීම | 1996 -2011 | 605.00 |
| කෘමිනාශක අලෙවිසැලේ බදු ආදායම | 1996 -2011 | 186534.54 |
| සිල්ලර අලෙවි සැලේ බදු ආදායම | 1996 -2011 | 27702.00 |
| ණය මුදල් සැපයීමේ පොලී ආදායම | 1996 -2011 | 51862.00 |
| ජල ටැංකිය කුලියට දී උපයන ආදායම | 2005-2011 | 850.00 |
| සලාරිස්වලින් ලබන ආදායම | 1997-2011 | 215010.50 |
| අධ්‍යාපන වැඩසටහන් පවත්වා ලැබුණු ආදායම | 2002-2011 | 93250.00 |
| ගොවි සංවිධානයට ඇතුළත්වීමේ ගාස්තු වශයෙන් ලැබුණු ආදායම | 1996-2011 | 16300.00 |
| කොන්ත්‍රාත් ලබාගැනීමෙන් ඉපැයූ ආදායම | 1996 -2011 | 681129.40 |
| වෙනත් ආදායම් | 1996 -2011 | 223487.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

මේ ආකාරයට ගොවි සංවිධානය ආදායම් මාර්ග රාශියක් පාදාගෙන ඇති අතර එම ආදායම ගොවි සංවිධානයේ සේවාවන් සඳහා වියදම් කරයි. සංවිධානයට විවිධ මාර්ග ඔස්සේ ආදායම් ලැබෙන නිසා සාමාජික ගාස්තුවක් අය නො කෙරේ.

### 3.2.4 ගොවි සංවිධානයට බාහිරින් ලැබෙන ආධාර සාමාජිකයන්ට ලබාදීම

ගොවි සංවිධානයට 2006 සහ 2007 යන වර්ෂවල ලෝක ආහාර සංවිධානය මඟින් මුදල් ආධාර ලබා දී ඇත. එසේ පිටතින් ලැබෙන ආධාර මුදල් හෝ සහනාධාර මුදල් සංවිධානයේ

සාමාජිකයින් අතර බෙදා දීම සිදු කරන්නේ ප්‍රමුඛතා ලේඛනයකට අනුව ය. මෙවැනි දේ බෙදා දීමේ දී ගොවීන්ගේ ආදායම් මට්ටම, වත්කම් යනාදිය හා දරිද්‍රතාවයේ ස්වභාවය සලකා බෙදාදීම සිදු කරයි. ඒ පිළබඳ විස්තර පහත සඳහන් සංඛ්‍යා ලේඛනවලින් හෙළි වේ.

**වගු අංක 3.2.3: ගොවි සංවිධානයට බාහිර ආයතනවලින් ආධාර ලැබීම**

| ආධාර ලැබුණු ආයතන | වර්ෂය | මුදල් ප්‍රමාණය (රු) |
|---|---|---|
| ලෝක ආහාර සංවිධානය | 2006 | 275000.00 |
| ලෝක ආහාර සංවිධානය | 2007 | 50000.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**වගු අංක 3.2.4: ගොවි සංවිධානයට බාහිර ආයතනවලින් ලද ආධාර සාමාජිකයින්ට ලබාදීම**

| වර්ෂය | ලබාදුන් ගොවීන් සංඛ්‍යාව | ලබාදුන් මුදල් ප්‍රමාණය (රු) |
|---|---|---|
| 2006 | 01 | 275000.00 |
| 2007 | 01 | 50000.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.2.5 ණය ලබාදීමේ ස්වභාවය

ණය සැපයීමේ වැඩපිළිවෙළ පිළිබඳව අවධානය යොමු කිරීමේ දී සෑම කන්නයක ම ආරම්භයේ දී අක්කරයකට රු. 5,000/- බැගින් වාර්ෂිකව 1% පොලිය මත ණයදීම සිදු කරයි. මෙම ණය මුදල මාස 4ක කාලයක් තුළ දී ගෙවීම ද අනිවාර්ය ය. ක්‍රියාකාරී සාමාජිකයකුවීම ණය මුදල් ලබා ගැනීමට ප්‍රධාන සුදුසුකම වෙයි. කෘෂි ළිං තනා ගැනීමට අවශ්‍ය පුද්ගලයන් සංවිධානය කර ණය ලබා දෙයි. බිංදු ජල සම්පාදනය සඳහා බිංදු ජල සම්පාදන කට්ටල ගෙවීමේ ක්‍රමයට ලබා දෙයි. සංවිධානය විසින් ක්ෂණික ණය මුදල් අවශ්‍ය පුද්ගලයන්ට ක්ෂණික ණය ලබාදීමේ වැඩසටහනක් ද පවත්වාගෙන යයි. පහතින් දැක්වෙන්නේ 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ක්ෂණික ණය යටතේ ණය මුදල් ලබාදීම පිළිබඳව වේ. ක්ෂණික ණය වශයෙන් අක්කරයක වගාව සඳහා දෙන උපරිම ණය මුදල රු. 5000 කි.

**වගු අංක 3.2.5: ක්ෂණික ණය ලබාදීම**

| වර්ෂය | ක්ෂණික ණය වර්ගය | වාර්ෂික පොලිය | ලබාදුන් මුදල (රු) | ලබාගත් ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2006 - 2011 | ගොවි ණය | 12% | 931825.00 | 53 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.2.6 සුබ සාධන කටයුතු පවත්වාගෙන යාම

ගොවි සංවිධානය විසින් සුබ සාධන සේවාවක් ද පවත්වාගෙන යාම සඳහා සංවිධානය තුළ වෙනම ම සුබ සාධන සමිතියක් පවත්වාගෙන යයි. මේ සඳහා සාමාජික මුදල් අය කිරීමක් නැත. මේ සමිතිය මඟින් සාමාජිකයාගේ දෙමාපියන්ගේ සහ සාමාජිකයෙකුගේ මරණයක දී රු. 3,000/- ක ආධාර මුදලක් පිරිනමයි. පුටු සැපයීම හා සමිතියේ ට්‍රැක්ටරයෙන් ප්‍රවාහනය කරදීම, වතුර අවශ්‍ය නම් බවුසරයෙන් වතුර ප්‍රවාහනය කරදීම සිදු කරන අතර අවසන් කටයුතු සිදු කරන තුරු ම නිවසේ නතිි රැකීම වැනි අවශ්‍යතාවයන් ඉටු කර දෙයි. ඊට අමතරව, මෙම සංවිධානය විසින් කරනු ලබන කාර්යයන් ලෙස වාර්ෂික කිරි ඉතිරවීමේ මංගල්‍යය, පිරිත් පිංකම හා සාංඝික දානය, කුරුණෑගල රෝහලේ තැලසීමියා රෝගීන්ගේ නේවාසික වාට්ටුවට ආධාර කිරීම හා ප්‍රදේශයේ අවශ්‍යතාවයන් අනුව ශ්‍රමදාන කටයුතු සංවිධානය කිරීම ආදිය දැක්විය හැකි ය.

ගොවි සංවිධානය ආගමික කටයුතුවල නියැලීමේ දී ගමේ පාසල හා පන්සල සම්බන්ධ කර ගැනීම දක්නට ලැබෙන්නකි. විවිධ තරඟ පැවැත්වීම, ලේ දන්දීමේ වැඩසටහන්, අක්ෂිදාන වැඩසටහන් පැවැත්වීම වාර්ෂිකව සිදු කරයි. මෙම වැඩසටහන් හරහා සංවිධානය තුළ සාමාජිකයින්ගේ අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය කිරීම, ජනතාවගේ ආගමික සංස්කෘතිකමය හා සාමාජික අංශයන් හි ප්‍රබෝධය සඳහා සංවිධානයේ කැපවීම ප්‍රකට කරයි.

### 3.2.7 බෝග වගාවට ගොවීන් යොමු කරවීම

ගොවි සංවිධානය ගොඩ බෝග වගාවට ගොවීන් වැඩි වැඩියෙන් යොමු කරවීම මඟින් ගොවීන්ගේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා අතුරු සංවිධාන පිහිටුවා තිබේ. එනම්, පැපොල් වගා කරන්නන්ගේ සමිතිය, ගොවි කාන්තා සමිතිය, බෝග වගා සමිතිය යනා දී වශයෙනි. ප්‍රදේශයේ පොල් වගාව, පලතුරු වගාව, එළවළු වගාව, පැළෑන් වගාව, ගස්ලබු සහ කොමඩු වගාව, එළවළු වැනි බෝග වගා කිරීමට ගොවීන් පෙළඹවීමත් ගොවි සංවිධානය විසින් කරනු ලබයි. ප්‍රදේශයේ පාරිසරික වශයෙන් ඇති වියළි දේශගුණික ස්වභාවය ගොවීන් දුර්වල කරන අභියෝගයක් වූවත් ගොවි සංවිධානයේ පෙළඹවීම හා යටිතල පහසුකම් නිසි පරිදි සැපයීමේ තත්ත්වය මත ගොවියා උදාසීන නොවී වගාවට පෙළඹී ඇති අතර එය ඔවුන් ආර්ථික වශයෙන් බල ගැන්වීමට හේතු වී තිබේ. '1996-2011 කාලය තුළ ගොඩ බෝග වගා ගොවීන් සංඛ්‍යාව වගු අංක 05 යටතේ දැක් වේ.

**වගු අංක 3.2.6: ගොඩ බෝග වගා කිරීම**

| කාල පරාසය | ගොඩ බෝගය | ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1996-2011 | පලතුරු වගාව | 20 |
| 1996-2011 | එළවළු වගාව | 50 |
| 1996-2011 | ගස්ලබු වගාව | 12 |
| 1996-2011 | කොමඩු වගාව | 18 |
| 1996-2011 | වෙනත් වගා | 60 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.2.8 නවීන තොරතුරු තාක්ෂණය භාවිතාවට ගැනීම

ගොවි සංවිධාන ගොඩනැගිල්ලේ තොරතුරු තාක්ෂණ නැණසලක් පවත්වාගෙන යයි. මෙමගින් සේවාවන් කිහිපයක් ඉටු කිරීමට ගොවි සංවිධානය කටයුතු කර තිබේ. නැණසලට තොරතුරු තාක්ෂණ උපදේශකවරයෙකු ගමෙන් ම පුහුණු කර බඳවාගෙන ඔහු විසින් ගමේ තරුණ පරපුර සඳහා තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදෙයි. මෙම කාර්යයට අමතරව, ගොවීන් සඳහා කෘෂිකාර්මික නව තාක්ෂණය ලබාදීම හා ආදර්ශන ප්‍රදර්ශනය කිරීම, ගොවීන්ට කෘෂිකර්මය සම්බන්ධයෙන් පැන නගින ගොවි ගැටලුවලට විසඳුම් ලබාදීම ආදිය සඳහා මෙම නැණසල භාවිතා කරයි. මෙම නැණසල සංවිධානයේ කීර්තිය නිසාම ලැබුණු එකකි. මෙමගින් කොළඹ ඇතුළු අනෙකුත් වෙළෙඳපොළවල බෝග මිල තොරතුරු දැන ගැනීම, බෝගවලට වැළඳෙන රෝගවල දී යෙදිය යුතු කෘමිනාශක පිළිබඳව දැන ගැනීමට ද හැකිය. ඒ හැර ඊ-මේල්, විද්‍යුත් ලිපි යැවීමට ද හැකි ය. මෙම පාඨමාලාව ඉගෙන ගන්නා පුද්ගලයන්ට පාඨමාලාව අවසානයේ සහතිකයක් ද පිරිනැමෙන බව සාකච්ඡාවල දී හෙළි විය.

පහත සඳහන් වගුවෙන් 2008 වර්ෂයේ සිට 2011 දක්වා තාක්ෂණ පුහුණුව ලබාගත් සංඛ්‍යාව දැක් වේ.

**වගු අංක 3.2.7: තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදීම (2008 – 2011)**

| කාල පරාසය | තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාගත් සංඛ්‍යාව |
|---|---|
| 2008-2009 | 175 |
| 2010-2011 | 150 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.2.9 කොන්ත්‍රාත් කිරීම

කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙ හි සහ ගම තුළ යටිතල පහසුකම්වල අඩුපාඩු සම්බන්ධයෙන් පැන නගින ඉදි කිරීම් හා අළුත්වැඩියා කටයුතු පිළිබඳ කොන්ත්‍රාත්, ගමේ ප්‍රමුඛ ප්‍රජා සංවිධානය වශයෙන් භාරගෙන ජනතාවගේ ශ්‍රමය යෙදවීම හා ජනතාවට ගෙවීමේ පදනම මත වැඩ කිරීමට අවස්ථාව සලසා දෙයි. ජනතාවගේ අවශ්‍යතාවන් ඉහළ ප්‍රමිතිය සහිතව ජනතාවගේ ශ්‍රමය වැඩියෙන් කැප කිරීමෙන් යම් කිසි ලාභයක් සංවිධානයට උපයා ගැනීමට ද මෙමගින් හැකියාව ලැබී තිබේ.

**වගු අංක 3.2.8: කොන්ත්‍රාත් භාරගැනීම තුළින් ඉපැයූ ආදායම**

| වර්ෂය | කොන්ත්‍රාත් සංඛ්‍යාව | ඉපැයූ ආදායම |
|---|---|---|
| 1996 - 2011 | 11 | 681,129.40 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.2.10 නායකත්වය පුහුණු කිරීම හා නව නායකයන් පත් කිරීම

ගොවි සංවිධානයේ කාරක සභාව සඳහා පුද්ගලයන් තෝරා ගැනීමේ දී සාමාජිකයන් අතර නායකත්ව ගති ලක්ෂණ සහිත පුද්ගලයන් පිළිබඳව අවධානය යොමු කරයි. වර්ෂය තුළ ඉතා ක්‍රියාකාරී ලෙස හා ඉතා උවමනාවෙන් සංවිධානයේ ප්‍රගතියට වැඩ කළ සාමාජිකයන් පිළිබඳව වාර්ෂික මහා සභා රැස්වීමට පෙර කාරක සභාව රැස් වී සාකච්ඡා කොට ඊළඟ සභාපති කවුරුන් ද යන්න පිළිබඳව නිගමනයකට පැමිණෙති. එලෙස ම, භාණ්ඩාගාරික ධූරය සඳහා ද සුදුසු පුද්ගලයෙකු එහි දී නම් කරයි. ඒ අනුව, වඩාත්ම සුදුසු සංවිධානයේ අනාගත දියුණුව උදෙසා ක්‍රියාමාර්ග හා තීරණ ගත හැකි පුද්ගලයෙකු සභාපති ලෙසටත්, ඊට ගැළපෙන කාරක සභාවකුත් පත් කරයි. මේ ක්‍රමය අනුගමනය කිරීමෙන් එකම නායකත්වයක් වසර ගණනාවක් තබා ගත්තේ නැතිව නව නායකයින් පත් කිරීමට ගොවි සංවිධානයට හැකි වී ඇත.

### 3.2.11 වාර්ෂික සංවර්ධන කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම

ගොවි සංවිධානය විසින් පස් අවුරුදු සැලැස්මක් පිළියෙළ කොට එය සාර්ථකව ක්‍රියාවට නංවා ඇත. එක් එක් වර්ෂයක් ආරම්භයේ එම වර්ෂය සඳහා සැලසුම් සම්පාදනය කරයි (වාර්ෂික සැලසුම ඇමුණුමෙ හි දක්වා ඇත). මෙම සැලසුම් නිසා ජනතාවගේ ආර්ථික හා සාමාජික තත්ත්වයේ වර්ධනයක් සිදු වන බව සාමාජිකයන් හට වැටහීමක් ඇතිවීම නිසා සාමාජිකත්වය හා ගොවි සංවිධානය අතර බැඳීම ද ශක්තිමත් වී තිබේ. මේ නිසාම, සාමාජිකත්වය ද වර්ධනය වී තිබේ. ගමේ ගොවි පවුල් 165ක් පමණ සිටින අතර එයින් පවුල් 91ක් සංවිධානයේ සාමාජිකත්වය ලබා සිටී.

### 3.2.12 සාමාජික වර්ධනය

ගොවි සංවිධානයේ ප්‍රතිලාභ ලැබීම දෘශ්‍යමානවීම හා පොදුවේ ගොවිජන ක්ෂේත්‍රයේ සංවර්ධනයක් සිදුවීම නිසා සාමාජිකත්වය ලබා ගැනීමට ගොවීහු පෙළඹී සිටිති. "ගොවි ගෙදරින් අලුත් ගමක්" නමැති වැඩසටහන යටතේ "කළුආරච්චියාගම" නමැති පවුල් 21කින් සමන්විත ගම්මානය මෑතක දී සංවිධානයේ සාමාජිකත්වය ලබා ගත්තේ ය. කළුආරච්චියාගම වැව හාරා ප්‍රතිසංස්කරණය කිරීම, එක ඉඩමකට පැළ 20 බැගින් අඹ පැළ ලබාදීම හා අක්කර 10ක කජු පැළ වගා කිරීම, ගම්මානයට යන මාර්ගය බෝක්කු බැඳ කි.මී. 1ක් දුර ප්‍රාදේශීය සභාව හා IFAD ව්‍යාපෘතියේ ආධාර මත සකස් කරදීම වැනි ගමේ අඩුපාඩු සපුරාලීම ද මේ සමඟ සිදු විය.


සාමාජිකත්වය වර්ධනය වූ ආකාරය පහත සඳහන් සංඛ්‍යා සටහනින් දැක්විය හැකි ය.

**වගු අංක 3.2.9: සාමාජිකත්ව වර්ධනය**

| වර්ෂය | සාමාජික සංඛ්‍යාව |
|---|---|
| 1996-2006 | 25 |
| 2006-2010 | 55 |
| 2010-2011 | 90 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

ප්‍රස්තාර සටහන් අංක 3.2.1




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.2.13 පවුල් සමඟ සාකච්ඡා කිරීමේ ක්‍රමය

ගොවි සංවිධානයේ දිගුකාලීන සාමාජිකයන් නිලධාරී මණ්ඩලය සමඟ ගමේ නිවෙස්වලට ගොස් එම නිවෙස්වල සාමාජිකයන් සමඟ සාකච්ඡා කරයි. සංවිධානයේ ප්‍රතිලාභ පිළිබඳව මෙහි දී දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීම නිසා අදාළ නිවසේ සාමාජිකයන් හට ගොවි සංවිධානයේ ප්‍රතිලාභ පිළිබඳව දැනුවත්වීමක් වන අතර සාමාජිකත්වය ලබා ගැනීමේ අවශ්‍යතාවය ඇති වේ.

### 3.2.14 ක්ෂණික කරදරවලට මුහුණපාන පවුල්වලට උපකාර කිරීම

ක්ෂණික කරදරවලට මුහුණපාන ගොවි සංවිධානයේ සාමාජික පවුල් සඳහා උපකාර කිරීමේ ක්‍රමයක් හඳුන්වා දී ඇත. ඇතැම් අවස්ථාවල දී, ගමේ ගොවි පවුල් ක්ෂණිකව කරදරවලට මුහුණ පායි. එවැනි අවස්ථාවල දී සංවිධානයේ සියලුම දෙනා අදාළ නිවෙස් වෙත ගොස් කළ යුතු අවශ්‍යතා හඳුනාගෙන ඒවා ඉටු කරදීම, සංවිධානයේ ට්‍රැක්ටරය ප්‍රවාහන කටයුතු සඳහා ලබාදීම, අස්වනු නෙළන කාලයක නම් අස්වනු නෙළා නිවසට ගෙනවුත් දීම ආදී කටයුතු සියල්ල සංවිධානයේ සාමාජිකයින් විසින් ඉටු කරනු ලබයි. 1996-2011 කාලය තුළ ක්ෂණික කරදරවලට මුහුණපාන ලද පවුල් 7කට සංවිධානය විසින් උපකාර කොට තිබේ.

### 3.2.15 ශ්‍රමදාන සංවිධානය කිරීම

ග්‍රාම නිලධාරී වසමේ ඇති රාජ්‍ය ආයතන හා ප්‍රජා සංවිධාන සමඟ සම්බන්ධ වී ශ්‍රමදානවලට සහභාගී වෙයි. ඒ මඟින් ප්‍රදේශයේ ජනතා ක්‍රියාකාරී ප්‍රජා සංවිධානයක් යන ආකල්පය මුළු ප්‍රදේශය පුරාම ව්‍යාප්ත කිරීමට ක්‍රියා කරයි. කෘෂි යටිතල පහසුකම් දියුණු කිරීම හා පොදු කටයුතු සම්බන්ධයෙන් ශ්‍රමදාන සංවිධානය කර ඇති අතර 1996-2011 කාලය තුළ ශ්‍රමදාන සංවිධානය කොට තිබුණි

### 3.2.16 වෙනත් ප්‍රජා සංවිධානවලට පුහුණුව ලබාදීම

සංවිධානය අත්දැකීම් හා පළපුරුද්ද අතින් ප්‍රවීණත්වයට පත්ව සිටී. මෙම පරිණතභාවය අනුව ලත් අත්දැකීම් වෙනත් ප්‍රජා සංවිධානවල සාර්ථකත්වය සඳහා යොදා ගැනීමේ අධ්‍යාපනික වැඩසටහන් මෙම ආයතනය විසින් පවත්වයි. එහි දී, අධ්‍යාපනයක් මෙන් ම සංවිධාන අතර අදහස් හුවමාරුවක් ද සිදු කෙරෙන්නේ ය. "ප්ලෑන්" ශ්‍රී ලංකා සංවිධානය ගොවි සංවිධානය ශක්තිමත් කිරීමේ වැඩසටහනේ දී ආදර්ශ ගොවි සංවිධානය ලෙස භාවිතා කරන්නේ මෙම "එකමුතු" ගොවි සංවිධානයයි. "ප්ලෑන්" ශ්‍රී ලංකා ආයතනය විසින් සම්බන්ධ කරවනු ලැබූ කණ්ඩායම් සියයක් පමණ පුහුණු කොට තිබේ. මෙයට අමතරව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ කාන්තා සංවිධානයක් මෙහි දී පුහුණුව ලබා ඇත.

**වගු අංක 3.2.10: වෙනත් ප්‍රජා සංවිධාන සමඟ අත්දැකීම් හුවමාරු කරගැනීම (1996-2011)**

| වර්ෂය | ලබා දුන් පුහුණු වර්ගය | සහභාගී වූ සාමාජික සංඛ්‍යාව | උපයොගත් මුදල රු. |
|---|---|---|---|
| 2003 | ගොවි නායකත්ව පුහුණුව | 1145 | 28,500 |
| 2004 | එම | 1250 | 34,750 |
| 2005 | එම | 700 | 20,000 |
| 2006 | එම | 400 | 10,000 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.2.17 උසස් අධ්‍යාපනික කටයුතු සඳහා උපකාර කිරීම

ගොවි සංවිධානයේ සාමාජිකයෙකුගේ දරුවකු විශ්වවිද්‍යාලයට තේරුණහොත් ඒ සඳහා රු. 5,000/-ක ආධාරයක් ලබාදෙයි. ඒ බැව් සනාථ කිරීම සඳහා අවශ්‍ය සහතික සංවිධානයට ඉදිරිපත් කළ යුතු ය. විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන දරුවන් සිටින මුදල් අවහිරතා ඇති දෙමාපියවරුන්ට සංවිධානය විසින් ණය ලබා දෙයි. හොඳින් ණය ආපසු ගෙවීම් කරන්නේ නම් ඉතා ලිහිල් කොන්දේසි යටතේ ණය ලබාදෙයි.

**වගු අංක 3.2.11: උසස් අධ්‍යාපන කටයුතු සඳහා උපකාර කිරීම**

| වර්ෂය | උපකාර කළ සංඛ්‍යාව |
|---|---|
| 2005 | 2 |
| 2006 | 3 |
| 2008 | 2 |
| 2010 | 1 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.2.18 වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම

"ප්ලෑන්" ශ්‍රී ලංකා ආයතනයේ මූල්‍ය අනුග්‍රහය ගොවි සංවිධානයට ලැබෙන අතර එම අරමුදල් යොදවා පෙර පාසල් ගොඩනැගිල්ලක් ඉදි කර ඇත. ගමේ අඩු ආදායම් ලබන පවුල්වල

දරුවන්ට "ජලෑන" ශ්‍රී ලංකා ආයතනයේ අනුග්‍රහයෙන් වසරකට වරක් අධ්‍යාපන ආධාර ලබාදීමේ වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක කරයි.

### 3.2.19 ප්‍රදේශයේ තරුණයන් වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම

ප්‍රදේශයේ පාසල් හැර යන තරුණ පිරිස්වලට වෘත්තීය පුහුණුව ලබාදීමේ වැඩපිළිවෙළක් සංවිධානය විසින් අරඹා තිබේ. මේ යටතේ ඇලයාපත්තුව වෘත්තීය පුහුණු ආයතනයට තරුණයන් යොමු කිරීම මඟින් වෘත්තීය පුහුණුව ලබාදීම, එම පුහුණුවෙන් ලබාගත් දැනුම මත කෘෂිකාර්මික ව්‍යාපෘති සිදු කිරීමට යොමු වන තරුණයන් සඳහා සිංගර්, ජිනසේන ආයතන සමඟ සම්බන්ධ කරමින් වතුර මැෂින් පහසු ගෙවීමේ ක්‍රමය මත ලබා දී තිබේ.

**වගු අංක 3.2.12: වෘත්තීය පුහුණුවට යොමු කිරීම**

| වර්ෂය | පුහුණුවට යොමු කළ සංඛ්‍යාව |
|---|---|
| 2006 | 3 |
| 2008 | 5 |
| 2010 | 4 |

මූලාශ්‍රයඃ ගොවි සංවිධාන වාර්තා

### 3.2.20 බෞද්ධාගමික වැඩසටහන් සඳහා දායකත්වය ලබාදීම

බෞද්ධාගමික වැඩසටහන් සඳහා සංවිධානය පූර්ණ සහයෝගය ලබාදෙයි. සංවිධානය මුදලින් ආධාර කරන අතර ශ්‍රමදායකත්වය ද ලබා දෙයි. සාමාජිකයන්ගේ ආධ්‍යාත්මික පෝෂණය සඳහා ඉවහල්වන වැඩසටහන් සංවිධානය කරයි. පන්සල සමඟ කිට්ටු ඇසුරක් පවත්වාගෙන යයි.

### 3.2.21 ගොවිජන සමාජයේ සමඟිය සහ අන්‍යෝන්‍ය සුහදතාවය ආරක්ෂා කිරීම

වර්තමානයේ දී ගොවීන් වැඩි වැඩියෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතයට පෙළඹෙමින් සිටී. මේ නිසා ගොවීහු පෙර පැවති කයිය, අත්තම වැනි ශ්‍රම හුවමරු කර ගැනීමේ ක්‍රමවලින් ඈත් වෙමින් හුදකලා ගොවි දිවියක් ගත කිරීමේ අවධියකට අවතීර්ණය වී සිටිති. මෙය ගම්බද ගොවි සමාජයේ සමඟිය අන්‍යෝන්‍ය සුහදත්වය හා බැඳීම අඩාල කරවන කරුණකි. මේ නිසා, ගොවිජන සමාජයේ අන්‍යෝන්‍ය සුහදත්වය හා බැඳීම වැඩි කරවන එකමුතුකම පවත්වාගෙන යන ප්‍රබල සාධකයක් ලෙස ගොවි සංවිධානය කටයුතු කරයි. ගොවි සංවිධානයේ නායකත්වය හා කාරක සභාව මෙන් ම ගොවීන් ද මෙම ප්‍රවණතාවය පිළිබඳව වටහාගෙන සිටින අතර එය වැළැක්වීම සඳහා නිතර පවත්වන ගොවි හමු, පිරිත්, ධර්ම දේශනා, සාංඝික දාන වැනි ආගමික වැඩසටහන් ශ්‍රමදාන වැනි සංවර්ධන වැඩසටහන් ආදිය නිතර නිතර සංවිධානය කිරීමෙන් ගොවීන්ගේ එකමුතුකම හා එකිනෙකා අතර බැඳීම ආරක්ෂා කිරීමට පියවර ගනිමින් සිටී. ගොවියාගේ භෞතික දිවිය සංවර්ධනය කරන අතර ම ආධ්‍යාත්මික සංවර්ධනය කෙරෙහි ද ඍජුව ම බලපාන වැඩසටහන් සංවිධානය කිරීමට මෙම ගොවි සංවිධානය විසින් ක්‍රියා කරනු ලබයි.

වගු අංක 3.2.13: සාමාජිකයන් අතර සුහදතාවය වර්ධනය කිරීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම

| වර්ෂය | කාර්යය | |
|---|---|---|
| 1998-2011 | පිරිත් දේශනා සංඛ්‍යාව | 05 |
| 2011 | සාංඝික දාන සංඛ්‍යාව | 01 |
| 1998-2011 | ධර්ම දේශනා | 10 |
| 1998-2011 | ශ්‍රමදාන හා වෙනත් කාර්යයන් | 50 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.2.22 නිලධාරීන් සමඟ සමීප සම්බන්ධතාවය

ගොවි සංවිධානය, ගොවිජන ක්ෂේත්‍රයේ ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් වන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර, ගොවිජන සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම උපදේශක මට්ටමේ සිට ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් දක්වා නිලධාරීන් සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යයි. ගොවි සංවිධානයේ රැස්වීම්, ආගමික උත්සව, කෘෂි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ආරම්භක අවස්ථා, පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකයින් ලෙස සහභාගී කරවා ගැනීම, සම්මුඛ සාකච්ඡා වැනි වැදගත් අවස්ථාවල දී ඉහත දැක් වූ කෘෂි නිලධාරීන් ගොවි සංවිධාන පරිශ්‍රයට පැමිණීමට අභිරුචියක් දක්වයි. මේ නිලධාරීන් හා ගොවි සංවිධානය අතර සුහදත්වය කෘෂි ව්‍යාපෘති සේවය විධිමත්ව පවත්වාගෙන යාමට මෙන් ම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වෙනත් අවශ්‍යතා ඉටු කර ගැනීමේ දීත් ඉතා පහසුවක් වී තිබේ. මෙම ඉහත දැක් වූ නිලධාරීහු මෙම ගොවි සංවිධානය පවත්වාගෙන යනු ලබන උසස් මට්ටම කෙරෙහි පැහැදීමකින් කටයුතු කරති.

### 3.2.23 ගොවිජන සංවර්ධන ව්‍යවස්ථාව පිළිබඳ අවබෝධය

මෙම ගොවි සංවිධානයේ නිලධාරී මණ්ඩලය හා කාරක සභාව ගොවිජන සංවර්ධන ව්‍යවස්ථාව පිළිබඳව පූර්ණ අවබෝධයකින් යුක්තව ගොවි සංවිධානය මෙහෙයවන අතර ව්‍යවස්ථාවට ද වඩා පුළුල් ලෙස සේවාවක් සපයනු ලබයි. ඒ තුළින් ඉහත නම් කරන ලද ආකාරයට ප්‍රදේශයේ ගොවි ජනතාවගේ සමාජ-ආර්ථික හා ආධ්‍යාත්මික වර්ධනයක් ඇතිවන ආකාරයේ වැඩසටහන් ක්‍රියාවට නඟයි.

### 3.2.24 ගොවි සංවිධාන ගොඩනැඟිලි සංකීර්ණය ගොඩනැංවීම

යම් කිසි ප්‍රජා සංවිධානයක ශක්තිමත් බව අවට සමාජය වෙත ප්‍රදර්ශනය කරන එක් අංගයක් වන්නේ ඒ සතුව ඇති ගොඩනැඟිලි සහ ජන සමාජයේ ප්‍රයෝජනය සඳහා භාවිතා කළ හැකි වෙනත් උපකරණ පද්ධතියයි. එම අවබෝධය ගොවි සාමාජිකයින්ට ලබාදුන් මෙම නායකත්වය ගොවි සංවිධානය සඳහා රැස්වීම් ශාලාවක් සහ අලෙවිසැලක් වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි ආකාරයේ ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට ක්‍රියාත්මක වී ඇත. මේ කාර්යයන් සඳහා ද සාමාජිකයින් දිවා රාත්‍රී ගඩොල් කැපීම සහ වෙනත් ශ්‍රමදානයෙන් කළ හැකි සියළුම කාර්යයන් ඉටු කිරීමට පියවර ගෙන තිබේ. ගලඅඹගස්වැව පිහිටා ඇති භූමියේ වැව් රක්ෂිතය තුළ මාර්ගය ආසන්නයේ වූ භූමිය මේ ගොඩනැඟිලි සංකීර්ණය ඉදි කිරීම සඳහා සුදුසුම ස්ථානය ලෙස තෝරා ගෙන තිබුණි. මෙය ඕනෑම පුද්ගලයෙකුට පහසුවෙන් ළඟාවිය හැකි එසේ ම, ඉතා දර්ශනීය ස්ථානයක් ද වී තිබුණි. මෙම රැස්වීම් ශාලාව ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වී ඇති අතර එක කොටසක් ගොවි සංවිධානයේ රැස්වීම්

පැවැත්වීම සඳහා ප්‍රයෝජනයට ගත හැකි අතර අනෙක් කොටස නැණසලක් පවත්වාගෙන යා හැකි පරිදි අවශ්‍ය තාක්ෂණික පහසුකම් සහිතව ගොඩනගා ඇත. වෙළෙඳසැල මහා මාර්ගය ආසන්නයේ ඉදි කොට ඇති අතර එහි සිල්ලර වෙළෙඳසැලක් හා කෘමිනාශක අලෙවිසැලක් පවත්වාගෙන යයි. ගොවි සංවිධානයේ උපදේශකවරයෙකු, සම සම්බන්ධීකරණ ලේකම්වරයෙකුගේ අධීක්ෂණය යටතේ වැව ප්‍රතිසංස්කරණය කිරීම, අරමුදල් වර්ධනය කිරීම ගොවි සංවිධානය සතු ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදි කිරීම වැනි භෞතික යටිතල පහසුකම් වර්ධනය කිරීම හා ඒවා සැමට දැකිය හැකි දේ නිසා ගොවි ජනතාව සංවිධානය සමඟ බද්ධවීමට උවමනාවක් දැක්විය.

වගු අංක 3.2.16: ගොවි සංවිධාන ගොඩනැඟිල්ල ඉදිකිරීම

| වර්ෂය | අරමුදල් ලබාගත් මූලය | මූල්‍යමය වටිනාකම (රු) |
|---|---|---|
| 2008 | සාමාජික ශ්‍රමය | 350000.00 |
| 2009 | ගොවි සංවිධානයේ පැවති අරමුදල් | 250000.00 |
| 2010 | බාහිරින් ලත් ආධාර හෝ ත්‍යාග | 588540.00 |
| මුළු වියදම | | 118854.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.2.25 වී වගාවට අමතරව වෙනත් බෝග වර්ග වගා කිරීමට ගොවීන් යොමු කිරීම

වී වගාවේ දී කාබනික පොහොර භාවිතය හා පිදුරු පොහොරක් ලෙස කුඹුරට යෙදීමට ගොවීන් උනන්දු කිරීම සඳහා කෘෂි උපදේශක මාර්ගයෙන් දැනුවත් කරයි. කාබනික පොහොර හා පිදුරු කුඹුරුවලට යොදන ගොවීන් 30 දෙනෙකු පමණ මෙම ප්‍රදේශයේ සිටින බව හෙළි විය.

වී වගා කිරීමට ප්‍රමුඛස්ථානයක් ලබාදෙන අතර වැව් පද්ධතියේ ජල ප්‍රමාණය අනුව වෙනත් බෝග වගා කිරීමට ද, ඊටත් අමතරව ගොඩ ඉඩම්වල බෝග වගා කිරීමට ද වැඩසටහන් සකස් කිරීමට ගොවි සංවිධානය පියවර ගෙන තිබේ. යල කන්නයේ දී ප්‍රදේශයේ ජලය අඩුවන අතර පවත්නා ජල පහසුකම් අනුව ගොවීන් කුඹුරේ රටකජු වගාවට යොමු කිරීම, පැණි කොමඩු වගාවට, බඩ ඉරිඟු වගාවට යොමු කිරීමට ක්‍රියා මාර්ග ගෙන ඇත. ඊට අමතරව ගස්ලබු (රෙඩ්ලේඩි) සහ පැෂන් වැනි බෝග ගොඩ ඉඩම්වල වගා, ළිං ආශ්‍රිතව වගා කිරීමට පහසුකම් සලසා දී තිබේ.

වගු අංක 3.2.15: ගොඩ බෝග වගාවට ගොවීන් යොමු කිරීම සඳහා ඉටු කරන ලද කාර්යයන්

| වර්ෂය | බෝග වර්ග | සංවිධානයෙන් කරන ලද කාර්යයන් | ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1996- 2011 | රට කජු<br>බඩඉරිඟු<br>පැණි කොමඩු<br>මුං ඇට<br>කව්පි | • ණය පහසුකම් සැපයීම<br>• සහන මිලට කෘෂි රසායනික ද්‍රව්‍ය සහ බීජ සැපයීම<br>• උපදෙස් සැපයීම | 50 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

පැණි කොමඩු කි. ග්‍රෑ 1ක් රු. 12,13,14 මිල ගණන්වලට ගොවීන්ගෙන් මිලට ගැනීමට පහසුකම් සැලසීම, බීජ සහන මිලට ලබාදීම, කෘෂි උපදේශක මහතා ගෙන්වා අවශ්‍ය කෘෂි තාක්ෂණ දැනුම ලබාදීම සිදු කොට තිබේ. අවශ්‍ය ප්‍රමාණයට ජලය කළමනාකරණය කර ලබා දී ඇත. මේ සියල්ලට අමතරව කිරි ගව පාලනයේ යෙදෙන ගොවීන් සංවිධානය කර කිරි ගොවි සමිතියක් පිහිටුවා, එම සමිතිය 'මිල්කෝ' ආයතනය සමඟ සම්බන්ධ කර හොඳ ජීවනෝපායයක් ලෙස කරගෙන යෑමට අවශ්‍ය පසුබිම සකස් කොට ඇත.

### 3.2.26 සාරාංශය

- දක්ෂ හා කැපවීමෙන් යුත් නිලධාරී මණ්ඩලයක් විසින් ගොවි සංවිධානය මෙහෙයවීම
- ඔවුන් නිර්මාණාත්මක අදහස්වලින් යුක්ත වූ පුද්ගලයන් බැවින් නව අදහස්වලින් ගොවි සංවිධානය පෝෂණය කොට තිබීම
- වී සහ ගොඩ බෝග වගාව දියුණු කිරීම මගින් ගොවි ආර්ථිකය නැංවීමේ උත්සාහයක නිරතවී ම
- ගොවි ණය ඇතුළු ගොවි අවශ්‍යතාවයන් සැපිරීමට කැප වී ක්‍රියාකිරීම
- නිබඳවම රැස්වන හා ක්‍රියාකාරීත්වයකින් යුත් ගොවි සංවිධානයක් ලෙස වසර පුරාම පවත්වාගෙන යාම
- සුබසාධක හා ආගමික සංස්කෘතික යන සෑම අංගයකින් ම යුක්ත ක්‍රියාවලියක් පවත්වාගෙන යාම
- ගොවි සංවිධාන නීති රීති ගැන අවබෝධයකින් යුතුව ගොවීන්ට සේවා සැපයීම ආදී හොඳ ගුණාංග රාශියක් මෙම සංවිධානය තුළ කැපී පෙනේ.

## 3.3 සිද්ධි අධ්‍යයනය 03: දහදියමල් ගොවි සංවිධානය - ගිනිගත්පිටිය - නාරම්මල

### 3.3.1 හැඳින්වීම

නාරම්මල ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ගිනිගත්පිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මෙම දහදියමල් ගොවි සංවිධානය ක්‍රියාත්මක වේ.

ගොවි සංවිධානයේ නිලධාරී මණ්ඩලය වන්නේ සභාපති, ලේකම්, උපසභාපති, උපලේකම්, භාණ්ඩාගාරික හා ගමේ එක් එක් කොටස් නියෝජනය වීමට කාරක සභාවට 13 දෙනෙකි. ගොවි සංවිධානයේ ප්‍රධාන රැස්වීම් වාර 3කි. වාර්ෂික මහා සභා රැස්වීම හා කන්න රැස්වීම් 2 එම රැස්වීම් තුනයි. එසේ වුව ද, අවශ්‍යතාවය මත මහා සභා රැස්වීම් පැවැත්වීමට සිදු

වේ. මෙම ගොවි සංවිධානය 1994 වර්ෂයට පෙර සිට පැවතගෙන එන්නකි. 1994 වර්ෂයේ දී වර්තමාන නිලධාරි මණ්ඩලය, ගොවි සංවිධානය භාරගෙන ඇත. 1994 වර්ෂයේ සිට 2011 දක්වා එකම නිලධාරි මණ්ඩලයක් විසින් ගොවි සංවිධානය මෙහෙයවනු ලබයි.

### 3.3.2 සාමාජිකත්වය ලබාගැනීම

ග්‍රාම නිලධාරි වසමේ කුඹුරු ඉඩම් හිමි ජනතාවට ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමට හැකි ය. ඇතුළත්වීමේ ගාස්තුව රු. 100කි. සාමාජික ගාස්තුව මසකට රු. 10 කි.

ගොවි සංවිධානය ආරම්භවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ මෙම ගොවීන් වී වගාවට ජලය ලබාගන්නා ප්‍රධාන වැව වන ගිනිගත්පිටිය වැව වර්ෂාව හේතුවෙන් දෙවතාවක් කැඩීයාම නිසා ලෝක ආහාර සංවිධානයේ අරමුදල් ලබාගනිමින් ගොවීන්ගේ ශ්‍රමය මත වැව යළි ඉදි කිරීමට හැකිවීම හේතුවෙන් එම කාර්යය වෙනුවෙන් ගොවීන්ගේ එකතුවීමේ වැදගත්කම ගොවීන්ට අවබෝධ වීම නිසා ය.

1998 වර්ෂය වන විට ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව 35ක් විය. ගොවි සංවිධානයේ සාමාජිකත්වය වර්ධනය වීම සිදුවන අවස්ථා දෙකකි. 1998 වර්ෂයේ දී, ගොවිජන බැංකුව හඳුන්වාදීමත් සමඟ ගොවි සංවිධානයේ සාමාජිකත්වය කැපී පෙනෙන ආකාරයෙන් වර්ධනය වීමක් සිදුව තිබේ. ගොවිජන බැංකුවේ කොටස් මිල දී ගැනීම සඳහා ගොවීන් සංවිධානය කර ඇත්තේ ගොවි සංවිධානයයි. ඒ අනුව, ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම ක්ෂණිකව ඉහළ ගොස් ඇත. දෙවන අවස්ථාව පොහොර සහනාධාරය හඳුන්වාදීමයි. පොහොර සහනාධාරය හඳුන්වාදීමත් සමඟ ගොවි සාමාජිකත්වය 74 දෙනෙකුගෙන් වැඩි වී තිබේ.


**වගු අංක 3.3.1: ගොවි සංවිධානයේ සාමාජික වර්ධනය (1994 සිට 2011 )දක්වා**

| | |
|---|---|
| 1994 | 35 |
| 1995 | 35 |
| 1996 | 35 |
| 1997 | 35 |
| 1998 | 50 |
| 1999 | 50 |
| 2000 | 50 |
| 2001 | 50 |
| 2002 | 50 |

| | |
|---|---|
| 2003 | 50 |
| 2004 | 50 |
| 2005 | 50 |
| 2006 | 124 |
| 2007 | 124 |
| 2008 | 124 |
| 2009 | 124 |
| 2010 | 124 |
| 2011 | 124 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

ප්‍රස්තාර සටහන් අංක 3.3.1




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

මෙම සාමාජික සංඛ්‍යාව තුළ ගැහැණු සාමාජිකයින් 11 දෙනෙක් ද පිරිමි සාමාජිකයින් 113 දෙනෙක් ද අන්තර්ගත වේ. 2006 වර්ෂයේ දී පොහොර සහනාධාරය හඳුන්වාදීමෙන් පසුව ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව කැපී පෙනෙන වර්ධනයක් වී ඇති බව ඉහත සංඛ්‍යා සටහන් ආශ්‍රයෙන් පැහැදිළි වේ.

### 3.3.3 ගොවි සංවිධානයේ කාර්යයන්

#### 3.3.3.1 කෘෂි ණය සැපයීම

කෘෂි ණය සැපයීම සිදු කරන්නේ ගොවිජන බැංකුව මාර්ගයෙනි. කුඩා කණ්ඩායම් ලෙස සංවිධානය වී ගොවිජන බැංකුවේ කොටස් මිලට ,ගෙන ඇත. මෙහි දී රු. 100 කොටස් 57 දෙනෙකු විසින් මිල දී ගෙන තිබේ. එක් පුද්ගලයෙකු කොටස් 8 බැගින් රු.11200ක කොටස් මිලට ගෙන ඇත. ඒ අනුව, ණය සැපයීම සිදු කරයි. ගොවි සංවිධානයේ මැදිහත්වීම මත ගොවිජන බැංකු ණය සපයා ගොයම් කපන යන්ත්‍ර 14ක් සංවිධානයේ ගොවීන් 14 දෙනෙකු වෙත ලබා දී ඇත.

#### 3.3.3.2 ගොවි සංවිධානය සතු කෘෂි උපකරණ

ගොවි සංවිධානය සතුව ස්ප්‍රේ යන්ත්‍ර 3ක් පවතී. ඒවා සහන මිලට ගොවීන්හට ලබා දීමෙන් උපයන ආදායම යන්ත්‍ර නඩත්තුව සඳහා වැය කරනු ලබයි.

#### 3.3.3.3 කොන්ත්‍රාත් කිරීම

මෙම ගොවි සංවිධාන කෘෂිකාර්මික මෙන් ම කෘෂිකාර්මික නොවන කාර්යයන් සම්බන්ධ ඉදි කිරීමේ කොන්ත්‍රාත් ගනී. එම කොන්ත්‍රාත් ගොවි සංවිධානයේ නිලධාරීන් මෙන් ම තාක්ෂණික නිලධාරීවරයෙකුගේ සුපරීක්ෂාකාරී ඉදිකිරීම මත අදාළ ආයතන වෙත බාර දෙයි.

ගොවි සංවිධානය 5%ක කොමිස් මුදලක් ලබා ගනී. එය ගොවි සංවිධානයේ අරමුදල් ශක්තිමත් කිරීම සඳහා යොදා ගනී.

වගු අංක 3.3.2 : ලබාගෙන ඇති කොන්ත්‍රාත් ප්‍රමාණය

| වර්ෂය | කොන්ත්‍රාත් සංඛ්‍යාව | වර්ෂය | කොන්ත්‍රාත් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1994 | - | 2003 | 01 |
| 1995 | - | 2004 | - |
| 1996 | 01 | 2005 | 04 |
| 1997 | - | 2006 | 02 |
| 1998 | 02 | 2007 | 04 |
| 1999 | - | 2008 | 02 |
| 2000 | - | 2009 | 02 |
| 2001 | - | 2010 | 08 |
| 2002 | 03 | 2011 | 19 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

ඇලවේලි ශුද්ධ කිරීම, පැති බැම් ඉදි කිරීම, බෝක්කු ඉදි කිරීම, කෘෂි මාර්ගවල බොරළු අතුරා බෝක්කු සාදා පුළුල් කිරීම, ගම තුළ මාර්ග කොන්ක්‍රීට් කිරීම, මාර්ගවල සිමෙන්ති කුට්ටිගල් ඇල්ලීම, වාරිමාර්ග අමුණු ඉදි කිරීම වැනි ඉදි කිරීම් කටයුතු මෙන් ම නාරම්මල රෝහලේ වාට්ටුවක් ඉදි කිරීම, ප්‍රාදේශීය සභාවේ ගේට්ටු ඉදි කිරීම, පන්සලේ බිමට ටයිල් ඇල්ලීම වැනි විවිධ වර්ගයේ ඉදි කිරීම් රාශියක් අවසන් කොට ඇත. කොන්ත්‍රාත් භාර ගැනීම ක්‍රමවත්ව ඉටු කරන අතර 10% රැඳවුම් මුදලක් තබා ගැනීම, දක්ෂ කාර්මිකයින් විසින් ඉදි කිරීම, තාක්ෂණික නිලධාරියෙකුගේ අධීක්ෂණය යන සියලුම කාර්යයන් ඉටු කිරීම තුළින් තත්ත්වයෙන් උසස් ඉදි කිරීමක් සහතික කිරීමට ප්‍රයත්න දරයි.

### 3.3.4 ගොවි සංවිධානයේ ආදායම් උපයන මාර්ග

ගොවි සංවිධානයේ ආදායම් උපයන මාර්ග දෙකකි. එනම්, කොන්ත්‍රාත්වලින් ලබන කොමිස් මුදල සහ සාමාජික අරමුදල් වේ. පහත සංඛ්‍යා සටහන් දෙකෙන් ගොවි සංවිධානයේ වාර්ෂික ආදායම සහ ආදායම උපයන මාර්ග පැහැදිළි කරනු ලබයි.

වගු අංක 3.3.3: කොන්ත්‍රාත් මගින් ආදායම් ඉපැයීම

| වර්ෂය | ආදායම රු. (කොන්ත්‍රාත්) | වර්ෂය | ආදායම රු. (කොන්ත්‍රාත්) |
|---|---|---|---|
| 1994 | - | 2003 | 7000.00 |
| 1995 | - | 2004 | - |
| 1996 | 5813.00 | 2005 | 29391.00 |
| 1997 | - | 2006 | 7000.00 |
| 1998 | 22134.00 | 2007 | 26684.00 |
| 1999 | - | 2008 | 10000.00 |
| 2000 | - | 2009 | 11021.00 |
| 2001 | - | 2010 | 20000.00 |
| 2002 | 15458.00 | 2011 | 60000.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

වගු අංක 3.3.4 : වෙනත් ආදායම් මාර්ග

| වර්ෂය | ආදායම රු. | වර්ෂය | ආදායම රු. |
|---|---|---|---|
| 1994 | 4972.00 | 2003 | 24272.00 |
| 1995 | 4972.00 | 2004 | 22305.00 |
| 1996 | 10785.00 | 2005 | 51696.00 |
| 1997 | 9959.00 | 2006 | 27197.00 |
| 1998 | 32093.00 | 2007 | 73881.00 |
| 1999 | 22534.00 | 2008 | 59330.00 |
| 2000 | 29332.00 | 2009 | 70351.00 |
| 2001 | 9413.00 | 2010 | 42032.00 |
| 2002 | 24871.00 | 2011 | 216540.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.3.5 වැවේ ජල කළමනාකරණය

වැවේ ජල කළමනාකරණය සම්බන්ධයෙන් ජල කළමනාකරුවෙකු පත්කර සිටි ඔහුගේ කාර්යය වන්නේ වැව සොරොව්ව හා ඇලවේලි නිසි පරිදි නඩත්තු කිරීමයි. ඔහු නඩත්තු භාරකරු නමින් හඳුන්වයි. මාස 6කට රු. 2000/-ක මුදලක් ගෙවයි. වැව් බැම්ම, නඩත්තු කිරීම කුඹුරු හිමිකම අනුව ගොවීන්ට බෙදා දී තිබේ. වී ලාස් 1ක් අයිති ගොවියෙකු වැව් බැම්ම අඩි 2ක් ශුද්ධ කළ යුතු ය. සෑම කන්නයකට මෙම ශුද්ධ කිරීමේ කටයුතු කළ යුතු ය. ගොවීන් සියලුම දෙනාට සාධාරණ ලෙස ප්‍රමාණවත් පරිදි ජලය බෙදාහැරීම ඔහු විසින් කළ යුතු අනෙක් ප්‍රධාන කාර්යය වේ.

### 3.3.6 පොහොර සහනාධාරය සම්බන්ධ කාර්යයන්

කන්නය ඇරඹීමට පෙර සිට ම සහනාධාර පොහොර ලබා ගැනීම සම්බන්ධයෙන් මුදල් එකතු කිරීමේ වැඩ පිළිවෙළ ආරම්භ කොට කන්නය ආරම්භයේ දී ම සංවිධානයේ සියලුම ගොවීන් සඳහා පොහොර ගෙනවිත් දෙයි. බිත්තර වී අවශ්‍ය වන්නේ නම් බිත්තර වී ද ගෙනැවිත් දෙයි.

### 3.3.7 කන්න රැස්වීම

කන්න රැස්වීම ගොවිජන සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම උපදේශක යන නිලධාරීන්ගේ ප්‍රමුඛත්වය මත පවත්වනු ලබයි. වගා කන්නය පිළිබඳ සියලුම තීරණ ගැනීම මෙහි දී කරනු ලබන අතර කෘෂිකර්ම උපදේශක විසින් කුඹුරේ පාංශු පෝෂක තත්ත්වය වැඩිදියුණු කිරීම සම්බන්ධ කොම්පෝස්ට් යෙදීම, පිදුරු යෙදීම, කොළ අතු දැමීම සහ යාය ආදර්ශන සම්බන්ධ තාක්ෂණික දැනුවත් කිරීම් සිදු කරයි.

**වගු අංක 3.3.5: කුඹුරට පිදුරු යෙදීම**

| වර්ෂය | පිදුරු යොදන ගොවීන් සංඛ්‍යාව |
|---|---|
| 2008 | 60 |
| 2009 | 85 |
| 2010 | 92 |
| 2011 | 71 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

ගොවීන් කොම්පෝස්ට් භාවිතයට පුහුණු කරවීම සඳහා ගොවි කණ්ඩායම් මාකඳුර හා බතලගොඩ පර්යේෂණායතනය වෙත යවා ඇත. මෙම පුහුණුව නිසා ගොඩ බෝග වගාවේ දී කොම්පෝස්ට් භාවිතා කිරීමට ගොවීන් පෙළඹී සිටිති. පිදුරු ගිනි තැබීම නැවතී පිදුරු කුඹුරට දැමීමට ද ගොවීන් පෙළඹෙමින් සිටිති. කොම්පෝස්ට් භාවිතා කරන ගොවීන් සංඛ්‍යාව තවමත් ඉතා අඩු මට්ටමක පවතී. එයට හේතුව අමුද්‍රව්‍ය හිඟකම සහ ගොවීන්ගේ ආකල්ප වේ.

**වගු අංක 3.3.6: කොම්පෝස්ට් භාවිතය**

| වර්ෂය | භාවිතා කළ ගොවීන් සංඛ්‍යාව |
|---|---|
| 2008 | 01 |
| 2009 | 01 |
| 2010 | 01 |
| 2011 | 02 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

ඉහත පැහැදිලි කිරීම් අනුව පිදුරු කුඹුරට දැමීමට ගොවීන් පෙළඹී සිටීම නිසා ප්‍රදේශයේ සාමාන්‍ය වී අස්වැන්න සුළු වශයෙන් ඉහළ යාමක් දක්නට ලැබේ.

වගු අංක 3.3.7: පිදුරු යෙදීම නිසා වී වගාවේ සාමාන්‍ය අස්වැන්නේ වැඩිවීම

| වර්ෂය | අස්වැන්න අක්කරයකට බුසල් |
|---|---|
| 2008 | 70 |
| 2009 | 75 |
| 2010 | 80 |
| 2011 | 80 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.3.8 අරමුදල් වැය කිරීම

ගොවි සංවිධානය ආදායම් වශයෙන් උපයන මුදල් ලංකා බැංකුවේ ගිණුමක් ආරම්භ කොට පවත්වාගෙන යයි. මෙම මුදල් ගොවි සංවිධානයේ කැමැත්ත පරිදි පන්සලේ වැඩකටයුතුවලට යෙදවීම, නාරම්මල පොසොන් පෙරහැර සඳහා යෙදවීම, සිල් සමාදන් වූවන්ට පිරිකර ලබාදීම, ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පිරිත් පිංකමට යෙදවීම, කිරි අම්මාවරුන්ට පිරිකර ලබාදීම, අළුත් සහල් මංගල්‍යයට වියදම් කිරීම හා දන්සල් පැවැත්වීමට ආධාර කිරීම යන පුණ්‍ය කටයුතුවල යොදවා තිබේ.

### 3.3.9 ගොවි ආරවුල් විසඳීම

ගොවි සමාජයේ පැන නඟින ආරවුල් වන අද ගොවි ආරවුල් කෘෂි මාර්ග වැනි ආරවුල් ගොවි සංවිධානය මැදහත් වී විසඳීමට ක්‍රියා කරයි. අද ගොවි ආරවුල්, ඇල මාර්ග අවහිරවීම්, වනාන්තර එළිපෙහෙළි කිරීම් ආදිය සම්බන්ධ වී ගොවිතැනේ දී ගොවීන් අතර ඇති වන ආරවුල් විසඳීමට ගොවි සංවිධානය මාර්ගයෙන් ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වරයා ක්‍රියාත්මක වී සිටියි.

වගු අංක 3.3.8: ගොවි ආරවුල් විසඳීම

| වර්ෂය | විසඳූ ආරවුල් සංඛ්‍යාව |
|---|---|
| 2008 | 02 |
| 2009 | 03 |
| 2010 | 02 |
| 2011 | 04 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.3.10 පලතුරු සහ අපනයන බෝග වගාව

ගොවි සංවිධානයේ මැදහත්වීම මත ගොවිජන සංවර්ධන නිලධාරී. කෘෂිකර්ම උපදේශක යන කෘෂි නිලධාරීන්ගේ සහයෝගයෙන් කෙසෙල්, අන්නාසි, ගස්ලබු වගා කිරීමේ ලොකු ඉඩම් සංවර්ධන වැඩසටහන ආරම්භ කොට තිබේ. සුළු අපනයන බෝග සංවර්ධන ක්ෂේත්‍ර නිලධාරීන් සම්බන්ධ කරගනිමින් කුරුඳු, ගම්මිරිස්, කෝපි සහනාධාර ක්‍රමය යටතේ වගා කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත. පොල් සංවර්ධන ක්ෂේත්‍ර නිලධාරී සම්බන්ධ

කරගනිමින් යටි වගාව සඳහා පොල් පැළ ලබාදීමේ වැඩපිළිවෙලක් ද සකසා තිබේ. ගොවි සංවිධානයේ මැදිහත්වීමෙන් පලතුරු සහ අපනයනය බෝග වගා කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ විස්තරයක් පහත දැක් වේ.

**වගු අංක 3.3.9 : පලතුරු සහ අපනයන බෝග වගා අක්කර ප්‍රමාණ**

| වර්ෂය | කෙසෙල් අක්කර ගණන | අන්නාසි අක්කර ගණන | ගම්මිරිස් අක්කර ගණන | කෝපි අක්කර ගණන | යටිවගාව ලෙස පොල් අක්කර ගණන |
|---|---|---|---|---|---|
| 1999 | - | - | 0.5 | 01 | 01 |
| 2000 | - | - | 02 | - | 0.5 |
| 2002 | - | - | - | - | 01 |
| 2004 | - | - | 01 | - | - |
| 2008 | 01 | - | - | - | - |
| 2009 | 01 | - | 01 | - | - |
| 2010 | 02 | 01 | 03 | - | 01 |
| 2011 | 01 | - | - | - | 01 |

මූලාශ්‍රයඃ ගොවි සංවිධාන වාර්තා

**3.3.11 ගෙවතු වගාව**

දිවි නැගුම වැඩසටහන සඳහා ගෙවතු වගාකරුවන් සිය දෙනෙකු තෝරාදීම ගොවි සංවිධානය මූලික වී සිදු කොට තිබේ. කාන්තාවන් ගෙවතු වගාවට යොමු කිරීම හා ඔවුන් ඒ සඳහා පෙළඹවීමට ගොවි සංවිධානය මගින් දැනුවත් කිරීම් හා අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදීම සිදු කර ඇත. මෙයට අමතරව, ගොඩ ඉඩම්වල පස සංරක්ෂණය සඳහා ගොවීන් උනන්දු කිරීම සඳහා සමෝච්ඡ රේඛා සලකුණු කොට අඹ පැළ, රඹුටන් පැළ, කජු පැළ, අඹරැල්ලා පැළ සහ මිටි මුරුංගා පැළ ලබා දී තිබේ. ඒ මගින් ගොවීන්ගේ ගෙවතු හා ගොඩ ඉඩම් ක්‍රමවත් නිෂ්පාදන මාර්ගයකට යොමු කර ඇති බව පෙනේ.

**3.3.12 ගොවි සංවිධාන අරමුදල් නිකුත් කිරීම**

ගොවි සංවිධානයේ අරමුදල් ලංකා බැංකුවේ ගිණුමක තැන්පත් කොට ඇත. මුදල් ආපසු ගැනීම ගොවි සංවිධානයේ තීරණය මත, ගොවිජන සංවර්ධන නිලධාරීන්ගේ නිර්දේශය මත සභාපති ලේකම් භාණ්ඩාගාරික යන නිලධාරීන්ගේ අත්සනින් විවිධ අවශ්‍යතා සඳහා මුදල් ලබා ගැනීමේ හැකියාව ඇත.

මෙම ගොවි සංවිධානයේ දක්නට ලැබෙන විශේෂත්වය වන්නේ ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස.) ඉතා වැදගත් කාර්යභාරයක් මෙම ගොවි සංවිධානය සම්බන්ධයෙන් ඉටු කිරීමයි. කෘ.ප.නි.ස. වරයා පදිංචි ගම් ප්‍රදේශය ද මෙය වන අතර ඔහු පත්වීම ලබාගත් දින සිට වර්තමානය දක්වා මෙම ගමේ පදිංචිව සිටී. ඔහු ද මෙම ගොවි සංවිධානයේ සාමාජික ගොවි පවුලකට අයත් පුද්ගලයෙකි. බල ප්‍රදේශයේ කෘ.ප.නි.ස. වරයා මොහු වන බැවින් ගොවි සංවිධානයේ සැබෑ ක්‍රියාකරු ලෙස ක්‍රියාත්මකවීමට මොහුට සිදු වී තිබේ. ගොවි සංවිධානයෙන් ගොවීන් සඳහා ඉටු විය යුතු

කාර්යයත් ඉහත විස්තර කළ ආකාරයට කෘ.ප.නි.ස. වරයාගේ මැදිහත්වීම මත සිදු කෙරෙන නිසා සාමාජික ගොවීන් මෙන් ම ගොවි සංවිධානයේ නායකත්වය ද සෑහීමකට පත් වී සිටී. මෙම හේතුව නිසා නිලවරණ පැවැත්වුව ද වෙනත් නායකයන් පත් කර ගැනීමට සාමාජිකයන් පියවර නො ගනී. එම නිසා, වසර 17ක් තිස්සේ එකම නිලධාරී මණ්ඩලය ගොවි සංවිධානයට නායකත්වය දෙනු ලබයි. මෙහි භාණ්ඩාගාරිකවරයා ගොවි සංවිධානයේ ගනුදෙනු අඩංගු පොත් පත් නිසි පරිදි නඩත්තු කරමින් වාර්ෂික මහා සභා රැස්වීම්වලට ඒවා ඉදිරිපත් කිරීමට ද කටයුතු කරයි. කෙසේ හෝ ගොවි අවශ්‍යතා ගොවි සංවිධානය මඟින් සැපිරීම නිසා ගොවි සංවිධානය සම්බන්ධව ගොවීන් තෘප්තියට පත් වී සිටී.

මෙම තත්ත්වය නිසා දෙවන පෙළ නායකත්වයක් ගොඩනැඟීමක් සිදු නොවන බව පැහැදිළි වන අතර සාකච්ඡාවලින් පෙනී ගියේ සංවිධානයේ ක්‍රියාකාරී සාමාජිකයින් අනාගතයේ දී නායකත්වයට පත්වීමට කැමැත්තෙන් සිටින බවයි.

### 3.3.13 සාරාංශය

සාරාංශය වශයෙන් ගොවි සංවිධානය සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට හැකි ය.

- එකම නිලධාරී මණ්ඩලයක් දීර්ඝ කාලයක් නායක්තවයේ රැඳීම සාමාජිකයින් ඒ සඳහා පූර්ණ අනුමැතිය ලබා දීම, කෘ.ප.නි.ස. වරයා ගොවි සංවිධානය ගොවීන්ට හිතකර අයුරින් මෙහෙයවීම
- කොන්ත්‍රාත් සහ සාමාජික අරමුදල් තුළින් සංවිධානයට විශාල ලෙස ආදායම් ලැබීම, එම ආදායම් ප්‍රදේශයේ සමාජ සංස්කෘතිකමය හා ආගමික කාර්යයන් සඳහා යෙදවීම හා ආදායම් වියදම් නිසි පරිදි ගණන් තැබීම හා ඒවායේ විනිවිදභාවය නිසි ලෙස පවත්වාගෙන යාම
- වී වගා, ගෙවතු වගා, ගොඩ ඉඩම් වගා, ජල කළමනාකරණය, පොහොර සහනාධාරය, ගොවිජන බැංකුව සම්බන්ධයෙන් ගොවි සංවිධානය අවශ්‍ය සේවා සැපයීම
- සාමාන්‍ය ගොවි සංවිධානයක් ලෙස පවත්වාගෙන යාම

## 3.4 සිද්ධි අධ්‍යයනය 04: නැෂතල් වැව ගොවි සංවිධානය – ඉබ්බාගමුව ලියාපදිංචි අංකය - කුරු/536/ගොවි/20

### 3.4.1 හැඳින්වීම

මෙම ගොවි සංවිධානය ඉබ්බාගමුව ගොවිජන සේවා බල ප්‍රදේශයේ 509 උඩතම්මිට ග්‍රාමසේවා වසම ආශ්‍රිතව ගොඩ නංවා ඇත. එහි සිටින පවුල් සංඛ්‍යාව 350ක් පමණ වන අතර ගොවි සංවිධානය හා සක්‍රියව දායක වී සිටින්නේ සාමාජිකයින් 106ක් පමණි. තවත් පිරිසක් නාමිකව ගොවි සංවිධානය හා බැඳී සිටී. ඔවුන්ගෙන් ඇතුළත් වීම් ගාස්තු පමණක් අයකර ගන්නා අතර ඔවුන් ගොවි සංවිධානය හා සම්බන්ධ වන්නේ පොහොර සහනාධාරය ලබාගැනීම සඳහා පමණි. ගොවි සංවිධානය ආරම්භ වී ඇත්තේ 1992 වර්ෂයේ දී ය. සංවිධානය ආරම්භ වී තිබෙන්නේ එම ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ ජාතිය ගොඩනඟන්නන්ගේ සංගමයේ මැදිහත් වීමෙනි. ආරම්භක සාමාජිකත්වය 18ක් වන අතර සාමාජිකයින් එක් කන්නයක වී බුසලක් විකුණා ලබා ගත් මුදල ගොවි සංවිධානයේ තැන්පත් කිරීමෙන් මෙය

ආරම්භ කරන ලදී. වර්තමානය වන විට ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව 106ක් වන අතර මසක සාමාජික මුදල රු.100ක් වේ.

ගොවි සංවිධානය ආරම්භ කිරීම සඳහා ජාතිය ගොඩනැගීමේ සංගමයෙන් රු.25,000/-ක මුදලක් සපයා දී ඇති අතර සාමාජිකයින් වී බුසලක් විකුණා ලැබෙන මුදල් ද මේ සඳහා යොදවා ඇත. ඉන් පසුව, මසකට රු.50 බැගින් ගොවි සංවිධානයේ තැන්පත් කිරීමට සාමාජිකයින්ගේ එකඟතාව පල විය. ඒ අනුව, සාමාජිකයින්ට සුළු ණය ලබාදීම ආරම්භ කරන ලදී.

### 3.4.2 ගොවි සංවිධානයේ ව්‍යුහය

සභාපති
උප සභාපති
ලේකම්
භාණ්ඩාගාරික
කාරක සභාව (සාමාජිකයින් 5)

### 3.4.3 ගොවි සංවිධාන නායකත්වය

සෑම වසරකම සංවත්සරික මහ සභාවේ දී නව නිලධාරී මණ්ඩලයක් තෝරා පත් කරගැනීමට අවස්ථාව ලැබේ. එසේ වුව ද, භාණ්ඩාගාරික හා ලේකම් වැනි නිලතල මෙහි දී වෙනස් කිරීම සිදු වුව ද සභාපතිවරයා ඉවත් කිරීමට සාමාජිකයින් උත්සහා දරා නැති බව පැහැදිලි වේ. එයට හේතුව, ඔහු පළපුරුදු හා කාර්යශූර පුද්ගලයෙකු වීම බව හෙළි විය. නෑෂතල් වැව ගොවි සංවිධානය ආරම්භ වී වසර 2 ට පසු එනම්, 1994 වර්ෂයේ සිට ම එහි සභාපතිත්වය දරන්නේ ඩී.එස්.පියසේන ගොවි මහතා ය. එතුමා සෑම සංවත්සරික සභා වාරයකදී ම නිතරඟයෙන් සභාපතිත්වය සඳහා තේරී පත් වී ඇත. ඔහුට සංවිධානය මෙහෙයවීම පිළිබඳව මනා පලපුරුද්දක් තිබීම මෙයට හේතුවයි. එතුමා ගොවි සංවිධානයට අමතරව විවිධ සමිති සමාගම්වල නිල තල හොබවා ඇති අතර දැනටත් සණස සමිතියේ, සමථ මණ්ඩලයේ නිලතල හොබවන අතර සමූපකාර දිස්ත්‍රික් මණ්ඩලයේ උප සභාපති ධූරය ද දරයි. එතුමා මෙම ගොවි සංවිධානයට නායකත්වය දෙමින් වර්තමානයේ පවතින තත්ත්වය කරා ගොවි සංවිධානය මෙහෙයවා තිබේ. එතුමාගේ මහ පෙන්වීම යටතේ ක්‍රියාත්මක මෙම ගොවි සංවිධානය වර්තමානය වනවිට ශක්තිමත් ගොවි සංවිධානයක් බවට පත් වී තිබේ. ඒ අනුව, වර්තමානය වන විට ලාභ ලබන ආයතනයක් බවට ඉබ්බාගමුව නෑෂතල් වැව ගොවි සංවිධානය පත් වී තිබේ. මෙම ලාභාංශ සාමාජිකයින් අතර බෙදා දීමට ද තීරණය කොට ප්‍රථම වතාවට 2006 වර්ෂයේ සාමාජිකයින් වෙත ලාභාංශ ගෙවා තිබීම මෙම ගොවි සංවිධානයේ සාර්ථකත්වයට සාක්ෂි සපයනු ලබයි.

### 3.4.4 සාමාජිකත්වය ලබා ගැනීම

ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා

- ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළ පදිංචි කරුවකු වීම
- ඇතුලත්වීමේ ගාස්තුව රු.100කි
- රු.500 ක කොටස් මාස 6ක් තුළ මිල දී ගත යුතු වීම
- සාමාජික මුදල මසකට රු.5 ක් වීම

- සුබසාධන අරමුදලට රු.10කි.
- මාසික තැන්පත් මුදල රු.100 ද ගෙවිය යුතු ය.
- ගොවි සංවිධානයේ මූල්‍ය කටයුතුවල වරප්‍රසාද හිමි වන්නේ සාමාජිකත්වය ලැබ මාස 6 ට පසුව ය.


ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමේ දී සාමාජිකයාගෙන් පසුව පසු පැවරුමක් ද ඉදිරිපත් කළ යුතු වේ. යම් හෙයකින් සාමාජිකයා මිය ගියහොත් පසු පැවරුමේ සඳහන් පුද්ගලයාට එම වරප්‍රසාද හිමි වේ.

**වගු අංක 3.4.1: ගොවි සංවිධානයේ සාමාජික වර්ධනය**

| වර්ෂය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|
| සමාජික සංඛ්‍යාව | 88 | 103 | 104 | 112 | 119 | 130 | 130 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ප්‍රස්තාර අංක 3.4.1: සාමාජික වර්ධනය**




මූලාශ්‍රය: ක්ෂේත්‍ර දත්ත - 2011

ගොවි සංවිධානයේ සියලුම මූල්‍ය කටයුතු සාමාජිකයින් 3ක ගෙන් යුතු විගණන කමිටුවක් මඟින් මාස 3ට වරක් විගණනය කරනු ලැබේ. සංවිධානයේ සියලුම පොත් තැබීම් කටයුතු නිලධාරියකු විසින් සිදු කරනු ලබන අතර ඒ සඳහා මසකට රු.1500ක මුදලක් ගෙවනු ලබයි.

### 3.4.5 ඉතුරුම් හා ණය ලබාදීම

ගොවි සංවිධානය තුළ ඉතා ක්‍රමවත් ඉතුරුම් ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර එය ගොවි සංවිධානය ආරම්භයේ සිටම ක්‍රියාත්මක වී තිබේ. එනම්, 1992 වසරේ සිට සාමාජිකයින්ට ණය දීම සිදු කර ඇත. එහි දී, මූලික වශයෙන් ම ඉතිරි කිරීම් ආරම්භ කොට තිබෙන්නේ සාමාජිකයින් රු. 50/-ක මුදලක් තැන්පත් කිරීමෙනි. පසුව එක් කන්නයක දී ලබාගන්නා වීවලින් වී බුසලක් විකුණා ලැබෙන මුදල ගොවි සංවිධානය තුළ තැන්පත් කිරීම මඟින් ඉතුරුම් දිරි ගැන්වීම දිගින් දිගට ම සිදු කොට ඇත. වර්තමානය වන විට ගොවි සංවිධානය මඟින් ආකාර තුනක් යටතේ තැන්පතු භාරගැනීම සිදු කෙරේ. ගොවි සංවිධානයේ සාමාජිකයින්ගෙන් 100%ක් ම ගොවි සංවිධානය තුළ ඉතිරි කිරීම් සිදු කර තිබෙන අතර ඒ සියලු දෙනාම යම් යම් ආකාරයෙන් ණය ලබා ගැනීම ද සිදු කොට ඇත. ණය ආපසු ගෙවීම 90%ක් ම නියමිත කාලයට ගෙවන අතර 10%ක් පමණ නියමිත කාලයට වඩා කාලයක් ගනී. එසේ වුව ද, මේ වන තෙක් කිසිවකු ණය ගෙවීම පැහැර හැර නොමැත.

තැෂතල් වැව ගොවි සංවිධානය සිය සාමාජිකයින්ට ණය ලබාදීම ආරම්භ කරන ලද්දේ 1992 වසරේ සිටයි. එහි දී, මූලිකවම රු.2000ක ණයක් ලබාදීම ආරම්භ කොට ඇති අතර එම ණය ලබාදෙනු ලැබුවේ කෘෂිකාර්මික කටයුතු සඳහා පමණි. සාමාජිකයෙකුට ණය ලබාදීමේ දී ඔවුන් සපුරාලිය යුතු අවශ්‍යතාවයන් ලෙස,

- ගොවි සංවිධානයේ රැස්වීම්වලට සහභාගී වීම
- සාමාජික මුදල් ගෙවීම
- කලින් ගත් සුළු ණය ගෙවා අවසන් කිරීම

යන අවශ්‍යතාවයන් සපුරාලිය යුතුව තිබුණි.

ක්‍රමයෙන් ගොවි සංවිධානයේ තැන්පතු මුදල් ඉහළ යත් ම සාමාජිකයින්ට ලබාගත හැකි ණය ප්‍රමාණය ඉහළ නංවා ඇත. ඒ අනුව, ගොවි සංවිධානයේ තැන්පතු මුදල රුපියල් ලක්ෂ 10 සීමාවේ දී සාමාජිකයෙකුට ලබා ගතහැකි ණය ප්‍රමාණය රු.30,000/-ක් වූ අතර ලක්ෂ 20 සීමාවේ දී රු.50,000/-ක ණය මුදලකට සාමාජිකයින්ට හිමිකම ලැබී තිබේ. වර්තමානය වන විට රු.75,000/-ක් දක්වා සාමාජිකයින්ට ණය ලබාගත හැකි අතර එහි දී ඇපකරුවන් දෙදෙනෙකු හා දේපලක් ඇපය වශයෙන් තබා ගනී. ණය අයකර ගැනීම හීනවන ශේෂයට අනුව සිදු කෙරේ. ණය සඳහා වාර්ෂිකව 18%ක පොලියක් අය කරගනු ලැබේ.

ගොවි සංවිධානය මඟින් ආකාර තුනකට තැන්පතු භාරගැනීම සිදු වේ එනම්,

- සාමාන්‍ය තැන්පතු
- ස්ථාවර තැන්පතු හා
- කොටස් මුදල් වශයෙනි

සාමාන්‍ය තැන්පතු සඳහා 6%ක වාර්ෂික පොලියක් ද ස්ථාවර තැන්පතු සඳහා 8%ක වාර්ෂික පොලියක් ද කොටස් මුදල් සඳහා වාර්ෂිකව 6%ක පොලියක් ද සාමාජිකයින්ට ගොවි සංවිධානය මඟින් ගෙවනු ලැබේ.

### 3.4.6 ජල කළමනාකරණ කටයුතු

ගොවි සංවිධානය අයත් ප්‍රදේශය තුළ අක්කරයක පමණ විශාලත්වයකින් යුත් කුඩා වැවක් පවතී. ඉන් සියලුම ගොවීන්ට ජලය ලබාගත නො හැකි අතර වැවේ සියලු පාලන කටයුතු ගොවි සංවිධානයේ ජල පාලක මඟින් සිදු කෙරේ. වැව මෑතක දී සාමාජික සහභාගීත්වයෙන් ප්‍රතිසංස්කරණය කොට සැල්විනියා ඉවත් කර ඇත. කුඹුරු හිමියෝ බොහොමයක් වී වගාව අහස් දිය මඟින් සිදු කරති. වැව සම්බන්ධව ගොවි සංවිධානයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව සාමාජිකයින් සෑහීමකට පත් වන බව අධ්‍යයනයේ දී පෙනී ගිය කරුණකි. ගොවි සංවිධානය තුළ ජල පාලන කමිටුවක් පවතින අතර එහි සාමාජිකයින් තිදෙනෙකු සිටී. වැව් සොරොව්වේ යතුර ගොවි සංවිධානයේ සභාපතිවරයා සතුව පවතින අතර අවශ්‍ය වේලාවට ජල පාලන කමිටුවට එය ලබා දේ.

### 3.4.7 කොන්ත්‍රාත් කටයුතුවල නිරතවීම

ගොවි සංවිධානය හරහා කොන්ත්‍රාත් කටයුතු කිසිවක් සිදු නොවේ. ඊට ප්‍රධාන හේතුව කොන්ත්‍රාත් ලබා ගැනීම සඳහා ම වෙනත් ගොවි සංවිධානයක් එම ප්‍රදේශය තුළ ම පිහිටුවා තිබීම යි. සාකච්ඡාවට ලක් කළ සාමාජිකයින්ගෙන් 95%කට අධික පිරිසක් තම සංවිධානයට කොන්ත්‍රාත් කටයුතු ලැබේ නම් එය ගමට මෙන් ම ගොවි සංවිධානයේ අරමුදල් තර කර ගැනීමට හැකි බැව් සඳහන් කරයි. එසේ වුව ද, දේශපාලනමය හේතු මත මෙම ගොවි සංවිධානයට කොන්ත්‍රාත් සිදු කිරීමේ අවස්ථාව අහිමි වී ගොස් තිබේ.

**වගු අංක 3.4.2: ගොවි සංවිධානයේ වත්කම්**

| වත්කම් | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|
| විවිධ ණය | 914,618.80 | 1,110,454.52 | 1,193,083.52 | 1,383,835.79 | 1,712,164.64 |
| පොහොර ණය | 9,250.00 | | | | 66,152.50 |
| තෙල් ටැංකි ණය | 9,901.00 | | | | 29,976.00 |
| බැංකු තැන්පතු | 132,583.44 | 48,041.10 | 230,347.58 | 308,243.66 | 306,226.70 |
| ගොවි සමාගම් කොටස් | 5,000.00 | 5,000.00 | 5,000.00 | 5,000.00 | 5,000.00 |
| අත ඉතිරි | 21,860.39 | 71,459.95 | 29,167.27 | 4,018.50 | |
| එකතුව | 1,103,213.63 | 1,244,955.57 | 1,467,598.37 | 1,747,260.95 | 120,969.06 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.4.8 සාමාජික, සංස්කෘතික හා ආගමික කටයුතු

නැෂනල්වැව ගොවි සංවිධානය විසින් පුරුදු පරිදි සිදු කරන ආගමික හා සංස්කෘතික කාර්යයන් කිහිපයක් පිළිබඳව හෙළි වූ අතර ඊට අමතරව, පසුගිය වසරවල සිදුකළ ක්‍රියාකාරකම් පිළිබඳව කෙටි විස්තරයක් පහත දැක් වේ.

- සෑම වසරකම මහ කන්නය අවසානයේ පවත්වනු ලබන කිරි ආහාර පූජාව
- සෑම වසරකම අලුත් සහල් දේව මංගල්‍යය
- පොල්ගොල්ල හිටපු නායක හිමිපාණන්ගේ ගුණසමරු පිංකම සිදු කිරීම
- වාර්ෂිකව වන්දනා විනෝද චාරිකා යෑම
- විවිධ ශ්‍රමදාන - පොල්ගොල්ල විහාරස්ථානය අලුත් වැඩියා කිරීම ශ්‍රමදාන 03

  යාය ශ්‍රමදාන වාර්ෂික 01

  වැව පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන 06
- අවමංගල්‍ය දානමය කටයුතු සිදු කිරීම
- සුබ සාධක අරමුදල හරහා සාමාජික මරණයක දී රු.2000.00 මුදලක් ප්‍රදානය සහ අවසාන දිනයට පෙර දින රාත්‍රී ආහාර වේල ලබාදීම සහ හත් දවසේ දානයට සහල් පොල් පරිත්‍යාග කිරීම
- සාමාජික දූ පුතුන් සඳහා වාර්ෂික පොත් පරිත්‍යාග
- වැඩිම කැට මුදල් එකතු කරන සාමාජිකයන් සඳහා ත්‍යාග ලබා දීම
- වසරක කාලයකට අසරණ සරණ ශිෂ්‍යත්වයක් ලබා දීම
- තැෂතල් වැවෙ හි පිරි පැවති සැල්විනියා සම්පූර්ණයෙන් ම ඉවත් කිරීමට කටයුතු කිරීම, තැෂතල් වැවේ හොරොව්ව පිළිසකර කිරීම
- තෙල් ඉසින යන්ත්‍රය ගොවීන්ට ඉතා අඩු මුදලට සැපයීම
- ගොයම් කපන අත්මැෂිම තුළින් ගොවීන්ට සේවය ලබා දීමට කටයුතු කිරීම
- සුබ සාධක අරමුදල හරහා ආරෝග්‍යා ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම
- තැෂතල් වැවේ හොරොව්වේ රොඩ් එක සහ තහඩුව ගැලවීම හේතුවෙන් දෙවතාවක් මුදල් වැය කර පිළිසකර කිරීම

### 3.4.9 විවිධ පරිත්‍යාග

- ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බුදුමැදුරට මුදල් ලබා දීම
- ඉබ්බාගමුව ගොවිජන සංවර්ධන සභාවට පුටු ලබා දීම
- ඉබ්බාගමුව ගොවිජන සංවර්ධන සභා පුස්තකාලයට පොත් ලබා දීම
- තැෂතල්වත්ත පන්සල ඉදිකිරීමට රු.16000.00 මුදලක් ලබා දීම
- උඩතම්මිට විද්‍යාලයේ සෝදා පාලුව වළකන අලංකාර බැම්ම ඉදිකිරීමට රු.10,000.00 මුදලත් ලබාදීම
- උඩතම්මිට ග්‍රාම සේවා කාර්යාලය ඉදිකිරීමට රු.6500.00 කලු ගල් ලබාදීම
- හිරියාල ගොවි සමාගම් කොටස් රු.5000.00 ක ප්‍රමාණයක මුදලක් ලබා ගැනීම
- සුනාමි ව්‍යසනයට රු.5,000.00 පරිත්‍යාග කිරීම
- ගොවිජන සේවා පුස්තකාලයට පොත් ලබා දීම

ඉහත කාර්යයන්වලට අමතරව සමිතියේ ණය පදනම මත පොහොර සැපයීම සහ ගොවියාගේ යහපත සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලක්ෂ ගණනක් ණය පදනම මත ලබාදීම සිදු කොට තිබේ.

### 3.4.10 ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට ගොවි සංවිධානයේ මැදිහත්වීම

ගොවි සංවිධානය මගින් තම සාමාජිකයින්ට සපයනු ලබන විවිධ සුබ සාධන කටයුතු රැසක්ම මෙම ගොවි සංවිධානය මගින් ඉටු කරනු ලැබේ. මෙම ගොවි සංවිධානය ප්‍රදේශයේ වෙසෙන ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා විශාල දායකත්වයක් සපයා ඇති බැව් ගොවි සංවිධානයේ ක්‍රියාකාරීත්වය අධ්‍යයනයේ දී පැහැදිලි විය.

ගොවි සංවිධාන සාමාජිකයන්ට අවශ්‍ය වගා ණය ඇතුළු විවිධ ණය පහසුකම් පිළිබඳව සිදු කළ සාකච්ඡාවල දී එය අනාවරණය වූ අතර ගොවීන්ගේ හදිසි අවශ්‍යතා සඳහා ඉතා පහසුවෙන් ණය ලබා ගත හැකි වීම සාමාජිකයින්ගේ පැසසුමට ලක් වූ කරුණකි. ඇතැම් අවස්ථාවන් හි දී, රාත්‍රී කාලයේ දී පවා පැමිණ සභාපතිවරයාගෙන් ගොවි සංවිධානය යටතේ සුළු ණය ලබාගැනීමට හැකියාව ඇති බව සාකච්ඡාවල දී හෙළි විය. සෑම මසක ම නියම කරගත් දිනකට ගොවි සංවිධානය රැස් වේ. එහි දී සාමාජික සහභාගීත්වය 80% ක් පමණ එකරැස් වේ. ගොවි සංවිධානය තුළම සුබ සාධක සංගමයක් පිහිටුවා ඇති අතර ඒ සඳහා සාමාජිකයින්ගෙන් මසකට රු. 10/- බැගින් අය කර ගනී. සුබ සාධන අරමුදලෙන් හදිසි අසනීපයක දී සාමාජිකයෙකුට පොළී රහිතව රු. 500/-ක මුදලක් ලබා ගත හැකි අතර එය මසකින් ගෙවිය යුතු ය. එසේ වුව ද, මසකින් ගෙවීමට අපොහොසත් වුවහොත් එය මාස 3 දක්වා දීර්ඝ කරගත හැකි වේ. අවමංගල්‍යක දී රු. 2000/- ගෙවනු ලබන අතර ඊට අමතරව, ගොවි සංවිධානයේ එක් සාමාජිකයෙකුගෙන් පොල් ගෙඩියක්, රු. 10/-ක් හා හාල් කිලෝවක් බැගින් එකතු කොට අවමංගල්‍යයේ අවසාන දිනයේ පැමිණෙන අයට ආහාර ගොවි සංවිධානය මගින් සපයනු ලැබේ.

සංවත්සරික මහ සභා රැස්වීමේ දී ගොවීන් සියලු දෙනාට ම ගෙවතු වගාව සඳහා අඹ, පේර, ජම්බු, රඹුටන් වැනි ගොවීන්ට ප්‍රයෝජනවත් පැළය බැගින් බෙදා දෙනු ලබයි. සෑම සාමාජික නිවසක ම ගෙවත්තක් සෑදීමට කටයුතු කිරීම, ඒ සඳහා සමිතිය විසින් දෙහි පැල/අඹ පැල/කුරුඳු පැල/පුවක් පැල/ගම්මිරිස් පැල/කෝපි පැල/ මැලේසියම් ජම්බු පැල/රඹුටන් පැළ හා ඉසුරු කිරි අල පැළ සහ ගෙවත්තට අවශ්‍ය ඇට වර්ග සහ කොම්පෝස්ට් මල් වගාව යන සියලු පැළ වර්ග සියලු සාමාජිකයින්ට ලබාදීම සිදු කරයි. ගෙවතු වගාව සම්බන්ධ වැඩමුළු පැවැත්වීම, කාබනික පොහොර නිෂ්පාදනය හා විවිධ අධ්‍යාපනික වැඩසටහන් මගින් සාමාජිකයින්ට දැනුම ලබාදීම ගොවි සංවිධානය හරහා විටින් විට සිදු වේ. එමෙන් ම, වගා නො කරන ඉඩම් සම්බන්ධයෙන් වගා කිරීම සඳහා දිරිමත් කිරීම හා පිදුරු පිළිස්සීමට එරෙහිව ගොවි සංවිධානය ක්‍රියාත්මක වේ.

සත්ත්ව පාලන කටයුතු සඳහා ද ගොවි සංවිධානය මගින් සහයෝගය ලබා දී ඇත. ඒ යටතේ ගොවි සංවිධානය මගින් මේ වන විට එළදෙනුන් 15ක් ගොවීන් අතර බෙදා දී තිබේ.

ක්‍රියාකාරී සහ දියුණුව සඳහා කැප වූ නැෂතල්වැව ගොවි සංවිධානය සිය සාමාජිකයින්ගේ මුදල් ඉතිරි කිරීම හා ඔවුන්ට ණය ලබාදීමට ඉහළ ප්‍රමුඛත්වයක් දරයි. විශාල වශයෙන් සිදු කරන මුදල් ගනුදෙනු පිළිබඳව විනිවිදභාවය ආරක්ෂා කර ගැනීමට දැඩි උත්සාහයක් දරයි. වී සහ වෙනත් බෝග වගාවන් සඳහා අවශ්‍ය පහසුකම් සපයා දී ගොවි ජනතාවගේ ජීවන

තත්ත්වය නගා සිටුවීමේ උත්සාහයක මෙම ගොවි සංවිධානය නිරත වේ. ආගමික හා සංස්කෘතික කටයුතු, සුභසාධන සේවා ද ඉටුකරමින් ප්‍රදේශයේ පොදු ජන අවශ්‍යතා සැපිරීමට ක්‍රියාකර ඇති අතර සාමාජිකත්වයේ පැසසුමට ලක් වූ උසස් ක්‍රියාකාරී ගොවි සංවිධානයක් බව අධ්‍යයනයේ දී හෙළි විය.

### 3.4.11 සාරාංශය

- ❖ පළපුරුදු ක්‍රියාකාරී හා ජනප්‍රිය නායකත්වයකින් සමන්විත වීම
- ❖ මුදල් ඉතිරි කිරීම හා ණය සැපයීමට ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදීම
- ❖ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අවශ්‍ය සේවා සපයාදීම
- ❖ ආගමික,සංස්කෘතික හා සුබසාධන කාර්යයන් පවත්වාගෙන යාම
- ❖ සමාජ සේවා කටයුතුවල නිරතවීම
- ❖ ප්‍රදේශයේ ප්‍රමුඛතම ප්‍රජා සංවිධානය වශයෙන් ජනතාව අතර නමක් දිනාගෙන සිටීම

## 3.5 සිද්ධි අධ්‍යයනය 05: ණයඅරාව ගොවි සංවිධානය - බදුල්ල දිස්ත්‍රික්කය

### 3.5.1 හැඳින්වීම

බදුල්ල දිස්ත්‍රික්කයේ බොරලන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ණයඅරාව ගොවි සංවිධානය පිහිටුවා ඇත. මෙම ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළට ගම්මාන 10ක් පමණ අයත් ය. මෙම ගොවි සංවිධානයේ වර්තමාන සාමාජික සංඛ්‍යාව 95 දෙනෙකි. ගොවි සංවිධානය සමන්විත වී ඇත්තේ සභාපති, උපසභාපති, ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික සහ කාරක සභාවේ සාමාජිකයන් 07 දෙනෙකු ගෙනි.

බොරලන්ද ණයඅරාව ගොවි සංවිධාන බලප්‍රදේශයේ වගා ඉඩම් ප්‍රමාණය අක්කර 77කි. එය කුඹුරු ඉඩම් අක්කර 37ක් ද, ගොඩ ඉඩම් අක්කර 40කින් ද සමන්විත වේ. ප්‍රධාන වගාවන් වන්නේ වී, අර්තාපල් සහ එළවළු වගාවයි. මාස් කන්නයේ දී කුඹුරු ඉඩම්වල වී වගාවත් යල කන්නයේ අර්තාපල් වගාවත්, ගොඩ ඉඩම්වල මාස් කන්නයට පමණක් එළවළු වගාව සිදු කිරීමත් සාමාන්‍ය ක්‍රමය වේ.

**වගු අංක 3.5.1: ගොවි සංවිධාන බල ප්‍රදේශයේ බෝග වගාවේ ව්‍යාප්තිය – (ණයඅරාව ගොවි සංවිධානය, බල ප්‍රදේශය) 2011**

| වසම | කුඹුරු | | ගොඩ | |
|---|---|---|---|---|
| | යල | මහ | යල | මහ |
| බොරලන්ද | අර්තාපල්<br>බෝංචි<br>අක්කර 37 | වී<br>අක්කර 37 | -<br>- | අර්තාපල්<br>බෝංචි<br>තක්කාලි<br>අක්කර 40 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර දත්ත - 2011


ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව 2000 වර්ෂයේ දී 40ක් පමණ වූ අතර වර්තමානය වනවිට 95 දක්වා වැඩි වී තිබේ. 2006 වර්ෂයේ පොහොර සහනාධාරය හඳුන්වාදීමත් සමඟම සාමාජිකත්වය කැපී පෙනෙන පරිදි වැඩි වී ඇති බව පැහැදිළි වේ.

වගු අංක 3.5.2 : ගොවි සංවිධානයේ සාමාජික වර්ධනය

| වර්ෂය | සාමාජික සංඛ්‍යාව |
| --- | --- |
| 2000-2005 | 40 |
| 2006-2011 | 95 |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර දත්ත -2011

ප්‍රස්තාර අංක 3.5.1 :සාමාජික වර්ධනය




මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර දත්ත -2011

ඉහත වගුවේ සඳහන් ආකාරයට ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව 95ක් වුව ද සාමාජික මුදල් ගෙවන රැස්වීම්වලට සහභාගීවන සාමාජික සංඛ්‍යාව 65ක් පමණි. ඉතිරි පිරිස පොහොර සහනාධාරය ලබාගැනීමට පමණක් සාමාජිකත්වය ලබා සිටින බව ද හෙළි විය.

### 3.5.2 නිලධාරීන් තෝරාගැනීම

ගොවි සංවිධානය 2002 වර්ෂයේ සිට 2011 දක්වා පැවති නිලවරණවල දී නව නිලධාරී මණ්ඩලයක් තෝරා පත් කරගෙන නොමැති අතර එකම නිලධාරී මණ්ඩලය අඛණ්ඩව ම ගොවි සංවිධානයේ නායකත්වයේ කටයුතු කර ඇත.

### 3.5.3 රැස්වීම් පැවැත්වීම

මෙම ගොවි සංවිධානය විධිමත් ආකාරයේ රැස්වීම් වශයෙන් පවත්වනු ලබන්නේ කන්න රැස්වීම් දෙක හා වාර්ෂික මහා සභා රැස්වීම් පමණි. කන්න රැස්වීමේ දී සාමාජික මුදල් එකතු කරන අතර එය මාස 6ක් සඳහා රු. 30/-කි. ඊළඟ කන්න රැස්වීමේ දී ද යළිත් රු. 30/-ක් එකතු කරනු ලබයි.

2011 වර්ෂයේ දී පැවති තිලවරණයෙන් මෙතෙක් නායකත්වය දරමින් සිටි පුද්ගලයන් ඉවත් වී ඇති අතර නව සභාපතිවරයෙකු පත් වී සිටියි. එම සභාපතිවරයා ද කාර්යභාරය අතින් අසාර්ථක වී ඇති නිසා යළිත් නව නිලධාරී මණ්ඩලයක් තෝරාපත් කර ගැනීමට 2011 වර්ෂයේ දී සාමාජිකයින්ට අවස්ථාව සැලසී තිබේ. එහි දී, නව සභාපතිවරයෙකු සහ ලේකම්වරයෙකු පත් කර ගැනීමට සිදු වී ඇති අතර භාණ්ඩාගාරිකවරයා වෙනස් කර නොමැති බව හෙළි විය.

### 3.5.4 ගොවි සංවිධානයේ ආදායම

එක් සාමාජිකයෙකුගෙන් වර්ෂයකට රුපියල් 60 බැගින් සාමාජිකයන් 65 දෙනෙකුගෙන් එකතු වන වාර්ෂික ආදායම රුපියල් 3,900 වේ. ඊට අමතරව, කොන්ත්‍රාත් භාර ගැනීමෙන් ලැබෙන කොමිස් මුදල හා මෙම මුදල් බැංකුවේ තැන්පත් කිරීමෙන් එකතු වන පොලිය ද සංවිධානයේ ආදායම් මාර්ගයන් බවට පත් වී ඇත. මෙම සියලුම ආදායම් මාර්ගයන්ගෙන් ගොවි සංවිධානයට 2011 වර්ෂය වනවිට ලැබී තිබූ ආදායම රුපියල් 150,000ක් වී තිබුණි.

### 3.5.5 ගොවි සංවිධානයේ ආදායම් යොදවා ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

ඉහත සඳහන් ආකාරයට ගොවි සංවිධානයේ ආදායම් වශයෙන් එකතුවන මුදල් සාමාජික ගොවි ජනතාවගේ කෘෂිකාර්මික අභිවෘද්ධිය වෙනුවෙන් ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ගොවි සංවිධානයේ සාමාජිකයින් විරුද්ධ බව හෙළි විය. එයට හේතුව වශයෙන් ඔවුන් දක්වන්නේ ගොවීන් ණය ආපසු නො ගෙවීමේ තත්ත්වයක් උද්ගත වුවහොත් අපහසුවෙන් උපයාගත් මුදල් විනාශ වී යන බව යි. එම නිසා, සංවිධානය සතු අරමුදල් ණය වැඩසටහන් සඳහා හෝ වෙනත් කාර්යයන් සඳහා යෙදවීමට අපහසු තත්ත්වයක් උදා වී ඇත.

### 3.5.6 ගොවි සංවිධානය විසින් ඉටුකරනු ලබන කාර්යයන්

2010 වර්ෂය වනතුරු මෙම ගොවි සංවිධානය විසින් වාරි ඇල මාර්ග පිරිසිදු කිරීම, ශ්‍රමදාන සංවිධානය කිරීම, ආගමික හා සංස්කෘතිකමය කාර්යයන් ඉටුකිරීම හා කන්න රැස්වීම් පැවැත්වීම වැනි කාර්යයන් කිහිපයකට පමණක් සීමා වී පැවතිණි. එකළ, ගොවි සංවිධානය විසින් අලුත් යමක් සිදු කොට නැති අතර පොහොර සහනාධාරය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, ගොවීන් විසින් බිත්තර වී හෝ එළවළු බීජ ඉල්ලුම් කළහොත් එම ඉල්ලීම ගොවිජන සේවා මධ්‍යස්ථානයට නිර්දේශ කර ඉදිරිපත් කිරීම, ට්‍රැක්ටර්, වතුර පොම්ප, දියර ඉසින යන්ත්‍ර ඉල්ලුම් කළහොත් ඒවා ලබාදෙන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථානයට නිර්දේශ කිරීම, ශ්‍රමදාන පැවැත්වීම සහ වාරිමාර්ග ජල කළමනාකරණ ආදිය සිදු කොට ඇත. 2010 වර්ෂයේ අග භාගය වනවිට නායකත්වයේ පැවති දුර්වලතාවය මත කන්න රැස්වීම් පවා නො පැවැත්වෙන තත්ත්වයට ගොවි සංවිධානය පිරිහී තිබුණි. මෙම නිසා 2011 වර්ෂයේ දී ගොවි සංවිධානයේ නායකත්වය වෙනස් කිරීමට සාමාජිකයින් විසින් පියවර ගෙන තිබුණි. අලුතින් පත් වූ නායකත්වය සමඟ ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරයා එක් වී ඔහුගේ ද කැපවීම මත මෙම ගොවි සංවිධානයේ ගොවීන් වෙනුවෙන් යම් කිසි කාර්ය කොටසක් ඉටුකිරීමට පියවර ගෙන ඇති බව සාකච්ඡාවල දී හෙළි විය. එම කාර්යයන් අතර,

- පොහොර සහනාධාරය ලබාදීමට අවශ්‍ය මූලික කාර්යයන් ඉටුකරදීම
- ශ්‍රමදාන සංවිධානය කොට වාරිමාර්ග හා කෘෂි මාර්ග පිළිසකර කිරීම
- සංවිධානය විසින් අරමුදලක් ගොඩනගා ගැනීම
- ගොවිජන බැංකුවේ සාමාජිකත්වය ලබා ගැනීම
- කුඩා කණ්ඩායම් සංවිධානය කොට ණය ලබාගැනීමට පහසුකම් සැලසීම
- ගොවි ආරවුල් විසඳීම
- ආදායම් වියදම් නිසි පරිදි නඩත්තු කිරීම සහ වාර්ෂික රැස්වීම්වලට ඉදිරිපත් කිරීම
- වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීම යනාදිය පවතී.

මෙම ගොවි සංවිධානයට අයත් සාමාජිකයන් භූගෝලීය වශයෙන් විශාල ප්‍රදේශයක විසිරී පැවතීම නිසා ඔවුන් සංවිධානය තුළට ඒකරාශී කිරීමේ ප්‍රායෝගික ගැටලුවක් ද පෙනෙන්නට තිබේ. එම නිසා, ගොවි සංවිධානයට අයත් සාමාජිකයින් 100 දෙනෙක් පමණක් සිටියත් රැස්වීමක දී මේ අතරින් 10,15ක් වැනි සුළු ප්‍රමාණයක් පමණක් සහභාගී වන තත්ත්වයක් දක්නට ලැබේ. මෙයට එක් ප්‍රධාන හේතුවක් ලෙස මෙම ගොවි සංවිධානයට අයත් බල ප්‍රදේශය තුළ බොහෝ දෙනාගේ ඉඩම් පැවතිය ද ඔවුන් ජීවත් වන නිවාස ගොවි සංවිධාන බල ප්‍රදේශයෙන් පිටත පිහිටා ඇති බව දැනගන්නට ලැබුණි.

අඩු සහභාගීත්වයට තවත් හේතුවක් ලෙස හෙළි වූයේ, පොහොර සහනාධාරය ලබා ගැනීමේ අභිප්‍රාය මත පමණක් ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබාගත් ගොවීන් පිරිසක් ද මේ අතර සිටීමයි. ඔවුන් ගොවි සංවිධානයේ කාර්යයන්වලට කැප වී ක්‍රියා කිරීමක් දක්නට නො ලැබෙන අතර පොහොර සහනාධාරය ලබා ගැනීමට පමණක් තම තම ගොවි සංවිධාන නාම ලේඛනයට ඇතුළත් කොට තිබේ.

තවත් ප්‍රධාන හේතුවක් ලෙස පැහැදිළි වූයේ මෙම ගොවි සංවිධානයෙන් ලැබෙන ප්‍රතිලාභ ඉතා අඩු නිසා මෙයට වඩා ක්‍රියාකාරීත්වයෙන් හා ප්‍රතිලාභ අංශයෙන් ඉහළ මෙම බල ප්‍රදේශයේ ම ක්‍රියාත්මක වන වෙනත් ගොවි සංවිධානයක සාමාජිකත්වය ලබා ගැනීමට ගොවීන් පෙළඹී සිටීමයි. එලෙස හැකි වී ඇත්තේ ගොවීන්ට අයත් කුඹුරු ඉඩම් ගොවි සංවිධාන බල ප්‍රදේශ තුනක පැතිරී තිබීම යි. එම නිසා, ප්‍රතිලාභ අපේක්ෂාවෙන් ණයඅරාව ගොවි සංවිධානයට බැඳීම අර්ථ විරහිත ක්‍රියාවක් බව ප්‍රදේශයේ ගොවීන් අතර විශ්වාසයක් ගොඩනැගෙමින් පැවති බව ද හෙළි විය.

### 3.5.7 සාරාංශය

මෙම ගොවි සංවිධානයේ ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිදි සාරාංශ කිරීමට පුළුවන.

- ගොවීන් සංවිධානය වටා ඒකරාශී නොවීම
- නිලධාරී මණ්ඩලයේ පවතින දුර්වලතා හා අසමගිය
- සාමාජිකයන් ජීවත්වන ප්‍රදේශය විශාල දුර ප්‍රමාණයක විසිරී පැවතීම
- සාමාජිකයින්ට ප්‍රතිලාභ අත් නොවීම
- ප්‍රතිලාභ අත්විඳිය හැකි වෙනත් ගොවි සංවිධාන ආසන්නයේ පැවතීම
- පොත් පත් හොඳින් නඩත්තු නො කිරීම හා විශ්වසනීයත්වයෙන් තොරවීම
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ආධාර උපකාර නියමිත පරිදි ලබා නො ගැනීම වැනි හේතූන් ය.

### 3.6 සිද්ධි අධ්‍යයනය 06: සුළංකපොල්ල ගොවි සංවිධානය - සිල්මියාපුර , බදුල්ල දිස්ත්‍රික්කය

#### 3.6.1 හැඳින්වීම

සුළංකපොල්ල ගොවි සංවිධානය බදුල්ල දිස්ත්‍රික්කයේ කැප්පෙට්පොළ ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ සිල්මියාපුර ග්‍රාම නිලධාරී වසමේ ක්‍රියාත්මක වේ. මෙය මුස්ලිම් පවුල් බහුතරයක් වසන එළවළු වගා කරන ගම්මානයකි. 1991 වර්ෂයේ දී සුළංකපොල්ල ගොවි සංවිධානය නමින් මෙම ගොවි සංවිධානය අරඹා ඇත.

#### 3.6.2 ගොවි සංවිධානයේ සැකැස්ම

මෙම ගොවි සංවිධානය සැකසී ඇත්තේ සභාපති, උපසභාපති, ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික හා කාරක සභිකයින් 07 දෙනෙකු ගෙනි. මෙහි සාමාජික සංඛ්‍යාව 61කි.

#### 3.6.3 ගොවි සංවිධාන බල ප්‍රදේශයේ කෘෂිකාර්මික පසුබිම

මෙම ගොවි සංවිධානය බදුල්ල, නුවරඑළිය දිස්ත්‍රික් මායිම ආසන්නයේ බදුල්ල දිස්ත්‍රික්කයේ ආරම්භක ප්‍රදේශයේ පිහිටා ඇති අතර නුවරඑළිය දිස්ත්‍රික්කයේ දේශගුණයෙන් සමන්විත ය. එම නිසා, මෙහි වගාකරන එළවළු බෝග නුවරඑළියේ මෙන් කැරට්, ලීක්ස් සහ ගෝවා පමණි. පවුල් සංඛ්‍යාවට සාපේක්ෂව ඉඩම් හිඟ බැවින් වගා බිම් සීමිත ය. එක් ගොවියෙකුගේ වගා බිම් ප්‍රමාණය පර්චස් 05 සිට 15 දක්වා වූ කුඩා ඉඩම් වලට සීමා වී පවතී. වී වගාව සිදු නොවේ.

#### 3.6.4 ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව


මෙම ගොවි සංවිධානය පිළිබඳ අධ්‍යයනයේ දී පෙනී ගියේ එහි සාමාජික නාම ලේඛනය ක්‍රමවත් ආකාරයකට පවත්වා ගැනීමක් නොමැති බවයි. අවිධිමත් ලේඛන ආශ්‍රයෙන් 2005 වර්ෂයේ සිට සාමාජික සංඛ්‍යා ලේඛන ගොඩනගාගත් අතර ඒ අනුව, 2005-2011 කාලය තුළ සංවිධානයේ සාමාජික සංඛ්‍යාව වගු අංක 3.6.1 සහ ප්‍රස්තාර අංක 3.6.1 යටතේ දැක් වේ.

**වගු අංක 3.6.1: ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව**

| වර්ෂය | සාමාජික සංඛ්‍යාව |
|---|---|
| 2005 | 42 |
| 2006 | 45 |
| 2007 | 48 |
| 2008 | 52 |
| 2009 | 55 |
| 2010 | 58 |
| 2011 | 61 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා - 2011

ප්‍රස්තාර අංක 3.6.1: සාමාජික වර්ධනය




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා - 2011

ඉහත සංඛ්‍යා ලේඛනය අනුව, 2011 වර්ෂය වනවිට සාමාජිකයන් වශයෙන් 61 දෙනෙකුගේ නම් ඇතුළත් වී පැවතිය ද මොවුන් සියළුදෙනා සංවිධානයේ ක්‍රියාකාරී සාමාජිකයන් නොවන බව හෙළි විය. ඔවුන්ගේ පරමාර්ථය වී පැවතියේ නම පමණක් ගොවි සංවිධාන ලේඛනයට ඇතුළත් කිරීම ය.

### 3.6.5 ගොවි සංවිධානයේ වත්කම් - සාමාජික අරමුදල්

ගොවි සංවිධානයේ වත්කම් ලෙස හඳුනාගැනීමට හැකිවූයේ සංවිධාන අරමුදල පමණි. මෙම අරමුදල සමන්විත වී තිබුනේ සාමාජික මුදල් සහ කොන්ත්‍රාත්වලින් ලබන 5% කොමිස් මුදල් වලිනි. මෙහි විශේෂත්වය වන්නේ සංවිධානය විසින් මාසිකව සාමාජික මුදල් අයකිරීමක් සිදු නොවන අතර ශ්‍රමදාන වැනි පොදු කාර්යයන් ඉටුකිරීම සඳහා මුදල් අවශ්‍ය වූ විට සාමාජිකයන්ගෙන් මුදල් අය කිරීමයි. එවැනි විටෙක දී මාසික සාමාජික ගාස්තු වශයෙන් රුපියල් 15ක මුදලක් අයකරයි. වගු අංක 02 මගින් දක්වන්නේ සාමාජික මුදල් සහ කොන්ත්‍රාත්වලින් උපයන ලද අරමුදල් ප්‍රමාණය යි.

වගු අංක 3.6.2: ගොවි සංවිධානයේ අරමුදල්වල තත්ත්වය

| වර්ෂය | සාමාජික අරමුදල (රු) |
|---|---|
| 2005 | 2520.00 |
| 2006 | 2200.00 |
| 2007 | 2880.00 |
| 2008 | 3120.00 |
| 2009 | 3300.00 |
| 2010 | 3480.00 |
| 2011 | 3660.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා - 2011

ගොවි සංවිධානය සතු තවත් වත්කමක් වන්නේ ගොවිජන බැංකුවේ කොටස් මිල දී ගැනීම සඳහා යොදවා ඇති රුපියල් 25,000ක මුදල යි. 2010 වර්ෂයේ දී මෙම කොටස් මිල දී ගැනීම සිදුකර ඇති අතර එමගින් ගොවි ණය අවශ්‍ය ගොවීන්ට ණය සපයා ගත හැකි ය. ගොවි සංවිධානය සතුව වෙනත් වත්කම් නො පවතී.

### 3.6.6 ගොවි සංවිධානයේ සේවාවන්

එළවළු වගාවට ජලය සපයා ගනු ලබන්නේ කුඩා ප්‍රමාණයේ වාරි ඇළ මාර්ග 10කිනි. මේවා දිගු කාලයක් ප්‍රතිසංස්කරණය නො කිරීම නිසා කාර්යක්ෂමව ගලා බැසීමක් නොමැත. එම නිසා, විශාල වශයෙන් ජලය අපතේ යැමක් සිදු වේ. එබැවින්, මෙම ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට ගොවි සංවිධානය විසින් කොන්ත්‍රාත් අත්සන් කළ අතර 2010 සහ 2011 වර්ෂවල කොන්ත්‍රාත් 03ක් සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ලැබුණි. මෙම ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයෙන් කැඩී බිඳී පැවති වාරිමාර්ගවලින් 50%ක් යළි කොන්ක්‍රීට් කර යථා තත්ත්වයට පත්කිරීමට ගොවි සංවිධානයට හැකි විය. මෙම කාර්යය පිටස්තර කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී 5% කොමිස් මුදල ලබාගැනීමට ගොවි සංවිධානය ක්‍රියාකොට ඇත. 2010 සහ 2011 යන වර්ෂවල ඉටුකරන ලද කොන්ත්‍රාත් සංඛ්‍යාව වගු අංක 03 ඔස්සේ ඉදිරිපත් කෙරේ.

**වගු අංක 3.6.3: ඉටුකළ කොන්ත්‍රාත් සංඛ්‍යාව**

| වර්ෂය | ඉටුකළ කොන්ත්‍රාත් සංඛ්‍යාව |
|---|---|
| 2010 | 01 |
| 2011 | 02 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා - 2011

ගොවි සංවිධානයේ නිත්‍ය මාසික රැස්වීම් නොමැති අතර ශ්‍රමදානයක් හෝ වෙනත් කෘෂිකාර්මික හෝ පොදු කටයුත්තක් සඳහා වන අවශ්‍යතාවයක් පැණ නැගුනහොත් රැස්වීම් කැඳවයි. ගොවි සංවිධානයේ වෙනත් ආදායම් වශයෙන් දැක්විය හැක්කේ කොන්ත්‍රාත් කිරීමෙන් උපයා ගන්නා කොමිස් මුදල පමණි.

### 3.6.7 ශ්‍රමදාන සංවිධානය

ගොවි සංවිධාන බල ප්‍රදේශයට අයත් ඇළ මාර්ග, කෘෂි මාර්ග යනාදිය වල් බිහි වී පවතින අවස්ථාවල දී ගොවි සංවිධානය විසින් සාමාජිකයින් කිහිප දෙනෙකුගේ සහභාගීත්වයෙන් ඒවා ශුද්ධ පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන සංවිධානය කරනු ලැබීම ද ඉඳහිට සිදු කරන බව හෙළි විය.

### 3.6.8 ගොවිජන බැංකු ණය

ගොවි සංවිධානය විසින් 2010 වර්ෂයේ දී ගොවිජන බැංකුවේ කොටස් මිල දී ගෙන ඇත. ලීක්ස්, කැරට් සහ ගෝවා වගා කිරීම සඳහා අවශ්‍ය යෙදවුම් සපයා ගැනීමට අවශ්‍ය ණය ගොවිජන බැංකුව මගින් සපයාගැනීමට හැකි වී තිබේ. මෙහි පවතින වගා ක්‍රමය වන්නේ, හවුලේ වගා කිරීමේ ක්‍රමය යි. එනම් ඉඩම අයිති එක් පුද්ගලයෙක් ද, වගාව කිරීම තවත්

පුද්ගලයෙක් ද වශයෙනි. බීජ, පොහොර කෘෂි රසායනික ද්‍රව්‍ය, යෙදවුම් සපයා ශ්‍රමය යොදා ඉහත බෝග වගා කොට අස්වැන්න දෙදෙනා අතර 50% බැගින් බෙදාගනී. මෙම ක්‍රමය අනුව, කුඩා ඉඩම් කැබැල්ලකින් පුද්ගලයන් දෙදෙනෙකු ආදායම් ලැබීම නිසා දෙදෙනාගේම ආදායම අඩු මට්ටමක පවතී. මෙම ක්‍රමය අනුගමනය කිරීමට ප්‍රධාන හේතුව කුඩා ඉඩම් කැබැල්ලක් වුව ද වගා කිරීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් ඔවුන් සතුව නො පැවතීම යි. ගොවිජන බැංකුව මගින් අරමුදල් සපයා ගැනීමට හැකිවීම නිසා මෙම ගැටලුව සඳහා යම් කිසි සහනයක් ලබාගැනීමට ගොවිජන බැංකු කොටස් මිල දී ගත් ගොවීන් කිහිපදෙනාට හැකියාව ලැබී තිබේ. 2011 වර්ෂයේ දී, ගොවිජන බැංකු ණය ලබාගැනීම පිළිබඳ විස්තර වගු අංක 3.6.4 න් දැක් වේ.

**වගු අංක 3.6.4: යෙදවුම් සපයා ගැනීම සඳහා ගොවි බැංකු ණය සැපයීම - 2011**

| ගොවීන් සංඛ්‍යාව | ණය ලබාගත් කාර්යය | ණය මුදල්වල ප්‍රමාණය(රු) |
|---|---|---|
| 4 | පොහොර මිල දී ගැනීම | 25,000 |
| 4 | එළවළු බීජ මිල දී ගැනීම | 15,000 |
| 5 | කෘෂි රසායනික ද්‍රව්‍ය මිල දී ගැනීම | 20,000 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා - 2011

මෙම ණය ලබාගත් ගොවි කණ්ඩායම ණය ආපසු ගෙවමින් සිටිති. මෙයට අමතරව, බෝග වගා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හතරක් ගොවි සංවිධාන සාමාජිකයන් සඳහා ගොවි සංවිධානයේ මැදිහත්වීම මත කෘෂිකර්ම උපදේශක විසින් 2010 සහ 2011 වර්ෂවල දී සිදු කොට ඇත.

### 3.6.9 ගොවි සංවිධානයේ ක්‍රියාකාරිත්වය අඩාලවීමට බලපා ඇති හේතු

මෙම ගොවි සංවිධානය ක්‍රියාත්මකවීමේ දී සීමාවන් කිහිපයකට මුහුණදීමට සිදු වී ඇති අතර ඒවා සමාජ හා සංස්කෘතිකමය බාධක ලෙස දැක්විය හැකි ය.

ගොවි සංවිධාන විසින් ගොවි ජනතාව වෙනුවෙන් ඉටු කරන කාර්යයන් අතරින් ණය සැපයීමේ කාර්යය පමණක් සිදු කිරීමට මෙම සංස්කෘතිය අනුව හැකියාවක් නැති බව හෙළි විය. එයට හේතුව, ගොවි සංවිධානයේ සාමාජිකයන්ගෙන් 99%ක් ම මුස්ලිම් ජාතිකයන් නිසා මුස්ලිම් ආගම තුළ මුදල් ඉතිරි කිරීමෙන් හා ණය ලබාදීමෙන් පොලිය ලබාගැනීම තහනම් දෙයක් වීම ය. එම නිසා, ගොවි සංවිධානය තුළ මුදල් ඉතිරි කිරීම, ඉතිරි කරන මුදල් පොලියට දීම වැනි දේ ක්‍රියාත්මක කිරීමට මෙම සංස්කෘතිය තුළ ඉඩක් නැත. ජනතාවට කෘෂිකාර්මික කටයුතු කිරීම සඳහා මූල්‍යමය අවශ්‍යතා කොතෙක් පැවතිය ද, ණය ගැනීම හා පොලිය ගෙවීම පිළිබඳ පවතින ආගමික නීතිරීති නිසා එම අවශ්‍යතා ගොවි සංවිධානයේ ණය වැඩපිළිවෙළක් හරහා ඉටු කිරීමට නො හැකි බව මෙම ජනතාවගේ විශ්වාසයයි. බොහෝ පුද්ගලයන් වගාව කරන්නේ හවුල් කාර්යයක් ලෙසට ය. එනම්, ඉඩම අයත් පුද්ගලයා එක් අයෙක් ද, වගා කරන්නා තවත් අයෙක් ද වශයෙනි. බීජ පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය වැනි මුදල්මය අවශ්‍යතා වෙනත් අයෙකුට සපයන අතර ශ්‍රමය යොදා වගා කර අස්වනු 50% බැගින් බෙදා ගනී. මෙම ක්‍රමය නිසා එක් අතකින් භූමිය අයිතිකරුවාටම වගා කිරීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත. හේතුව වන්නේ මුදල් හිඟයයි. ලීක්ස්, කැරට් වැනි උඩරට එළවළු වර්ගවල බීජ හා වෙනත් යෙදවුම් සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවන බැවින් එම හැකියාව නොමැති ඉඩම් හිමියන් මුදල් ඇති

පුද්ගලයෙකුගේ මුදල් යොදා වගා කොට අස්වැන්න බෙදා ගැනීමේ හවුලේ වගා ක්‍රමය භාවිතා කරයි. ගොවි සංවිධානය විසින් වගාවට මුදල් අවශ්‍ය පුද්ගලයන් සඳහා ණය සැපයීම කරන්නේ නම් ඉඩම් හිමි පුද්ගලයාට වගා කිරීමට හැකියාව ලැබේ.

ගොවි සංවිධානයේ සාමාජිකත්වය වර්ධනය නොවීම සඳහා ප්‍රධාන හේතුවක් ලෙස මුස්ලිම් සංස්කෘතියට අනුව ස්ත්‍රීන් නිවෙස් තුළ සිටීම හේතුවෙන් සියළු රැකියා හා වෙනත් කටයුතු පුරුෂ පක්ෂය විසින් පමණක් ම කිරීමට සිදු කෙරේ. එම නිසා, ඔවුන්ට ආර්ථික දුෂ්කරතා මෙන් ම වෙනත් සමාජීය කටයුතු සඳහා යෙදීමට කාලය ප්‍රමාණවත් නොවීමේ ගැටලුවකට මුහුණ පා සිටී. මෙම තත්ත්වය මත කැප වී ගොවි සංවිධානයේ කටයුතු කිරීමට සභාපති, ලේකම් ඇතුලු නිලධාරී මණ්ඩලයට ද, පොදු දේ වෙනුවෙන් කැපවීමට සාමාජිකයන්ට ද නො හැකි වී ඇත. මෙය ද ගොවි සංවිධාන සාමාජිකත්වය වැඩි නොවීමට ද, ක්‍රියාකාරීත්වයෙන් අඩු තත්ත්වයක පැවතීමට ද ප්‍රබල හේතුවක් ලෙස හෙළි කර ගත හැකි විය.

එසේ ම, ඉතා අඩු සාමාජික සංඛ්‍යාවක් සහිත ගොවි සංවිධානවල සාමාජිකත්වය කැපී පෙනෙන අයුරින් වර්ධනය වූයේ පොහොර සහනාධාරයත් සමඟ ය. එසේ වුව ද, එළවළු වගාව උස්බිම්වල සිදු කරනු ලබන ගොවීන්හට පොහොර සහනාධාරය නො ලැබේ. මෙම ගොවි සංවිධානය ද උස්බිම්වල එළවළු වගා කරන ගොවීන්ගෙන් සමන්විත ගොවි සංවිධානයක් බැවින් පොහොර සහනාධාරය ද නො ලබන නිසා ගොවීන් තුළ විශේෂ උනන්දුවක් සිදු වී නැත.

ගොවි සංවිධානවල සාමාජිකත්වය වර්ධනය වී සාමාජිකත්වය නායකත්වය වටා පෙළගැසීමට මුල් වූ ප්‍රධාන හේතුවක් සාර්ථක බොහෝ ගොවි සංවිධානවල දැකිය හැකි විශේෂිත ලක්ෂණයකි. එය ගොවීන් සියල්ලන්ටම එකසේ බලපාන වැව් ප්‍රතිසංස්කරණය, ඇලමාර්ග ප්‍රතිසංස්කරණය හෝ ගොඩනැගිල්ලක් ඉදි කිරීම වැනි කාර්යයකි. එසේ වුවත්, මෙම ගොවි සංවිධානය විසින් එවැනි කිසිම කාර්යයකට පෙළඹී නැත. ඇලමාර්ග ප්‍රතිසංස්කරණය කළ යුතු වුව ද, එය අවසානයක් දක්වා සිදු කර නැත. වර්තමානයේ යම් කිසි සුළු පිරිසක් සාමාජිකත්වයේ රැදී සිටින්නේ ද ගොවි සංවිධානය ඉතාම සුළු වශයෙන් හෝ ඉටු කරන සේවාව මත ය.

ගොවි සංවිධානය මුස්ලිම් ගමක ක්‍රියාත්මක ගොවි සංවිධානයක් වන අතර ඉතා කුඩා ඉඩම් කැබලිවල එළවළු වගාව කරමින් ජීවත් වේ. එසේ වුවත්, මෙම ගම්මානයේ තරුණ පරපුර නියැලී සිටින්නේ කෘෂිකර්මයට පරිබාහිර කෘෂි නොවන රැකියාවල ය. එනම්, ඇතැම් පිරිස් විදේශ රැකියාවල නිරතව සිටින අතර ඇතැම් පිරිස් ව්‍යාපාරික රැකියාවල නිරතව සිටී. පවුල්වල ආර්ථිකයට වැඩි දායකත්වයක් ලැබෙන්නේ එම ජීවන මාර්ගවලිනි. මේ නිසා, කෘෂිකර්මාන්තයේ යෙදී සිටින තරුණ පිරිස ද ඉතා අඩු මට්ටමක සිටී. මේ නිසා ද ගොවි සංවිධානයේ නායකත්වයට අළුතින් එකතුවීම සීමාසහිත වී ඇති අතරම නව ආකාරයට සිතන නිර්මාණශීලී අදහස්වලින් යුක්ත පිරිස් මෙම සමාජය තුළ කෘෂි ක්ෂේත්‍රයේ නියැලීමේ අඩුවක් පෙන්වයි. එම නිසා, ගොවි සංවිධානය සාම්ප්‍රදායික අදහස් මතම එල්බගෙන සිටින, වෙනස්වීමකට භාජනයවීමට තරම් ආකල්පමය වශයෙන් පොහොසත් නැති පිරිසක් මත රැදී සිටින බව පෙනේ.

ගොවි සංවිධානයේ මෙම වාතාවරණය නිසා ගොවි සංවිධානයක් විසින් ඉටු කළ යුතු පහත සඳහන් කාර්යයන් ඉටු නො කිරීමේ තත්ත්වයක් දක්නට ලැබේ. පහත සඳහන් කාර්යයන් එලෙස හඳුනා ගැනීමට පුළුවන.

මුස්ලිම් සමාජ හා සංස්කෘතික පසුබිමක් යටතේ එළවළු වගා ක්ෂේත්‍රයක ක්‍රියාත්මක වන සුළංකපොල්ල ගොවි සංවිධානය සිය සාමාජිකයින් වෙනුවෙන් සීමිත සේවාවන් කිහිපයක් පවත්වාගෙන යයි. එසේ ම, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන සපයා ගැනීම අපහසු නිසා වාරි ඇළවල් සියල්ල පූර්ණ වශයෙන් ප්‍රතිසංස්කරණය කර ගැනීමට නො හැකි වී ඇත. එම නිසා, ගොවීන්ගේ ප්‍රශංසාව ගොවි සංවිධානයට ලබාගැනීමට එය ප්‍රධාන බාධකයක් වී තිබේ. තවත් ප්‍රධාන කරුණක් වන්නේ මුස්ලිම් තරුණයින් කෘෂිකාර්මික ජීවනෝපායයකට වඩා ව්‍යාපාරික කටයුතුවල යෙදීම, විදේශ රකියාවල යෙදීම වැනි වෙනත් ජීවනෝපාය මාර්ගවල නියැලීමට වැඩි ප්‍රවණතාවයක් දක්වන නිසා ගොවි සංවිධානය වෙනුවෙන් කැප වී ක්‍රියාකිරීමට නායකත්වය ලබා ගොවි සංවිධානය මෙහෙයවීමට ඉදිරිපත් නොවීමේ පවතින වාතාවරණය යි. එම නිසා, වසර ගණනාවකට පෙර පත් වූ නිලධාරී මණ්ඩලයක් විසින් ප්‍රදේශයේ කෘ.ප.නි.ස වරයාගේ මැදිහත්වීම ද මත අපහසුතා මධ්‍යයේ ගොවි සංවිධානය පවත්වාගෙන යන බව පැහැදිලි වේ.

මෙම ගොවි සංවිධානයේ සැකැස්ම සංවිධානය වී ඇත්තේ සාමාන්‍ය ආකාරයට ය. සභාපති, ලේකම්, උප ලේකම්, උප සභාපති, භාණ්ඩාගාරික හා කාරක සභිකයින් හත් දෙනෙකි. මෙම ව්‍යුහයට අමතරව කුඩා කණ්ඩායම් හෝ කමිටුවලින් යාය නියෝජිත තනතුරු හෝ ඇති කර නොමැත. එම නිසා, මෙම ගොවි සංවිධානය ඉතාමත් ප්‍රාථමික මට්ටමෙන් පමණක් ක්‍රියාත්මක වන තත්ත්වයක් දැකි ය හැකිය. වර්ෂ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් ගොවි සංවිධානවලට කොන්ත්‍රාත් කිරීමේ බලය පවරා දී ඇති නිසා එම බලය මත කොන්ත්‍රාත් කිහිපයක් පමණක් සිදු කොට ඇත. එමගින් ලද ලාභය ගොවි සංවිධාන අරමුදල වශයෙන් වර්තමානයේ දී රු. 3,698/- ක් පවතී.

එළවළු වගාවට ජලය සපයා ගන්නා වාරිමාර්ග ඇළවල් 10ක් ජලය නිසි ජල මාර්ගවලින් ගලා නොයන මට්ටමකට වර්තමානයේ පත්ව ඇති අතර ගොවි සංවිධානය විසින් මෙම ජල මාර්ගවලින් 50%ක් පමණ ප්‍රමාණයක් ගොවි සංවිධාන මඟින් පිළිසකර කර ඇති බව හෙළි විය. ගොවි සංවිධානය විසින් කොන්ත්‍රාත් අත්සන් කොට වෙනත් පුද්ගලයෙකුට දී පිළිසකර කිරීම සිදු කර 5%ක කොමිස් මුදලක් ගොවි සංවිධානය ලබාගෙන තිබේ. අඩු ඇස්තමේන්තු වටිනාකමක් සහිත කොන්ත්‍රාත් නිසා ගොවි සංවිධානය ලද කොමිස් මුදල ද අඩු එකක් විය. ගොවි සංවිධානය ප්‍රදේශයේ ප්‍රමුඛතම ප්‍රජා සංවිධානයක් ලෙස ක්‍රියාකාරීත්වයට නො පැමිණීමට හේතු වී ඇත්තේ මෙමඟින් සාමාජිකයින්ට, පොදුවේ ප්‍රදේශවාසීන්ට දැනෙන සේවයක් සැලසෙන්නේ නැති බැවිනි.

ගොවි සංවිධානයේ නිලධාරී මණ්ඩලයේ දුර්වලතාවය ගොවි සංවිධානයේ ප්‍රතිලාභ අවමවීමට ප්‍රධාන හේතුව බව පැහැදිලි වේ. මෙහි නායකයින් එළවළු වගා කරන ගොවීන් වුව ද ඔවුන් ගොවීන්ට ප්‍රතිලාභ අත්කර දෙමින් ගොවි සංවිධානය මෙහෙයවීමට උත්සාහයක් නො ගන්නා බව පෙනේ. එසේ වුව ද, නායකයින් ප්‍රකාශ කරන්නේ ගොවීන් එක්රැස් නොවන බවයි. ගොවීන්ට ප්‍රතිලාභ බෙදී යන තත්ත්වයක් නිර්මාණය කළහොත් ගොවීන් ගොවි සංවිධානය වටා පෙළගැසීමක් සිදු වී සංවිධානය ශක්තිමත් වන බව එහි පවතින පරිසරය අනුව ප්‍රකාශ කළ හැකි ය.

### 3.6.10 පවතින සමාජ - ආර්ථික පරිසරය අනුව සංවිධානය මඟින් ලබාදිය යුතු ප්‍රතිලාභ

- ප්‍රදේශයේ ප්‍රමුඛ වගාවන් වන කැරට්, ලීක්ස්, ගෝවා යන බෝගයන් හී උසස් තත්ත්වයේ බීජ නියමිත වේලාවට ගොවීන්ගේ අවශ්‍යතාවය අනුව තොග වශයෙන් තොග මිලට ගෙන එහි වාසිය ගොවීන්ට ලබා දී නිෂ්පාදන වියදම අඩු කිරීමට උපකාරී වීම
- අවශ්‍ය පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය ඉහළ ප්‍රමිතියෙන් යුත් ඒවා තොග මිලට ගොවි සංවිධානයට ලබාගෙන අලෙවිසලක් පවත්වාගෙන යාම තුළින් ගොවීන්ගේ පහසුව සහ නිෂ්පාදන වියදම අඩු කිරීමට උපකාර කිරීම.
- එළවළු නිෂ්පාදිත ඉහළ ප්‍රමිතියෙන් යුක්තව නිෂ්පාදනය කිරීමේ තාක්ෂණ දැනුම ගොවීන්ට ලබාදීමේ වැඩපිළිවෙළක් ගොවි සංවිධානය මැදිහත් වී සැකසීම හා එළවළු නිෂ්පාදනය පෞද්ගලික අංශයේ ආයතනවලට, සංචාරක හෝටල්, සුපිරි වෙළෙඳසැල් සහ තොග සපයන්නන් සම්බන්ධ කරගෙන ඉහළ මිලට අලෙවි කිරීමේ වැඩසටහනක් ගොවි සංවිධානය මැදිහත් වී සම්පාදනය කර එළවළු මිල උච්චාවචනයෙන් වන අවාසි මගහැරීමට උපක්‍රම සැලසීම.
- වර්තමානයේ දී මෙම ප්‍රදේශයේ එළවළු නිෂ්පාදනය යාබද නුවරඑළියට සාපේක්ෂව අඩු මට්ටමක පවතින බව හෙළිවීම නිසා නිෂ්පාදනය ඉහළ නැංවීමේ තාක්ෂණික දැනුම ගොවීන්ට ලබාදීමේ වැඩපිළිවෙළක් ගොවි සංවිධානය විසින් ආරම්භ කිරීම.
- ප්‍රදේශයේ මාර්ග පද්ධතිය ඉතා අබලන් තත්ත්වයක පවතින බව පෙනී යන බැවින් මාර්ග පද්ධතිය පිළිසකර කිරීමේ වැඩසටහනක් පළාත් සභාවට හා ප්‍රාදේශීය සභාවේ සම්බන්ධතාවය මත ආරම්භ කිරීම හා මාර්ග කොන්ක්‍රීට් කිරීම වැනි ඉදි කිරීම් ගොවි සංවිධානය විසින් ම ඉටු කිරීමට භාර ගැනීම. එසේ ම, ජල සම්පාදනය වාරි මාර්ග ඇලවල් 10 කොන්ක්‍රීට් අතුරා නිසි ප්‍රමිතියට ඉදි කිරීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවත් සමඟ සම්බන්ධීකරණයක් ඇති කර ගැනීම.
- මේ සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරී සහ කෘ.ප.නි.ස.වරයා සමඟ මනා සබඳතාවයක් ගොඩනංවාගෙන ක්‍රියාත්මක කිරීම.
- සංස්කෘතියට සහ ආගමට එකඟවන ආකාරයට කෘෂිකාර්මික කටයුතු කිරීම සඳහා අරමුදල් සපයා ගැනීමේ මාර්ගයන් පල්ලියේ අනුග්‍රහය මත ගොවි සංවිධානය මැදිහත් වී ආරම්භ කොට මුදල් අහ හිඟතා සහිත ගොවීන්ට සහනයක් සැලසීම.
- ගොවි සංවිධාන තුළ සුබ සාධන වැඩපිළිවෙළක් හඳුන්වා දී සාමාජිකයන්ගේ අවමඟුල් හා ආගමික කටයුතු සඳහා මුදල් ආධාර හා ජන සහයෝගය මඟින් ආධාර ලබාදීමේ වැඩපිළිවෙළක් මාර්ගයෙන් සාමාජිකයන්ගේ සිත් දිනා ගැනීම.
- ගොවි සංවිධානයේ සියළුම කාර්යයන් විනිවිද පෙනෙන ආකාරයට ගණන් තැබීම, සාමාජික ලේඛන පවත්වාගෙන යාම, මහා සභා හා මාසික රැස්වීම් ක්‍රමානුකූලව පැවැත්වීම හා නිලවරණ පැවැත්වීම මඟින් ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවරක් ගොවි සංවිධානයට ලබාදීම මඟින් සාමාජිකයන් අතර හොඳ නමක් දිනා ගැනීමට උත්සාහ කිරීම.
- වර්තමානයට වඩා වැඩි ප්‍රතිලාභ ගොවි ජනතාවට ලබාදීම තුළින් සාමාජිකත්වය වර්ධනය කර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම.
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ආධාර මෙම ගොවි සංවිධානයට ලබාගැනීමට හැකිවන සේ ගොවි සංවිධානය ශක්තිමත්භාවයට පත් කිරීම.
- මෙම ගොවි සමාජයට ක්‍රියාකාරී ගොවි සංවිධානයක අවශ්‍යතාවය බෙහෙවින්ම පවතින බව පෙනී යන අතර එම අවශ්‍යතාවය සපුරාලීමට වර්තමාන ගොවි සංවිධානයට ඇති නො හැකියාව නිසා එය අකර්මන්‍ය තත්ත්වයේ පවතී. එම

අකර්මන්‍යභාවයේ චක්‍රය කඩා එය ක්‍රියාශීලී තත්ත්වයට පත් කිරීමට ප්‍රදේශයේ කෘ.ප.නි.ස. වරයාට මෙන් ම ප්‍රදේශය භාර ගොවිජන සංවර්ධන නිලධාරීන්ගේ ද මැදිහත්වීම අත්‍යාවශ්‍ය බව පෙනී යයි.

### 3.6.11 සාරාංශය

- ශක්තිමත් සංවිධාන ව්‍යුහයක් නොවීම.
- රැස්වීම් පැවැත්වීම ඉතා අඩු මට්ටමක වීම.
- අරමුදල ඉතා අඩු මට්ටමක පැවතීම.
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සම්පත් සම්පාදනය කරගැනීමට අපහසුවීම.
- ණය සැපයීම, පොලී අයකිරීම වැනි කාර්යයන් සඳහා ඇති සමාජ සංස්කෘතික බාධක නිසා අරමුදල් ගොඩනැඟීමේ සහ ණය සැපයීමේ අපහසුව.
- මුස්ලිම් කාන්තාවන් නිවසටම සීමා වී ජීවත්වීම නිසා පුරුෂ පක්ෂයට ජීවනෝපායයන් හි සහ ප්‍රජා සංවිධාන පවත්වාගෙන යෑමේ අඩු අවකාශය.
- තරුණ පිරිස් කෘෂිකර්මයට බැහැර ජීවනෝපායයන්ට වැඩි කැමැත්තක් දැක්වීම නිසා ගොවි සංවිධානය ශක්තිමත් ලෙස පවත්වාගෙන යෑමට බාධාවීම.
- ගොවි ජනතාවට සිදු කරන සේවාව අල්ප නිසා ගොවි ජනතාවගේ අඩු සහභාගීත්වය.
- පොදු කාර්යයන් හි නියැලීමට වඩා පෞද්ගලික කාර්යයන් හි නියැලීමට මිනිස් සමාජය දක්වන උනන්දුව නිසා ගොවි සංවිධානයේ කටයුතු ශක්තිමත්ව කරගෙනයාමට නො හැකිවීම.
- කෘ.ප.නි.ස වරයාගේ මැදිහත්වීම නිසා අපහසුතා මධ්‍යයේ ගොවි සංවිධානය ඉතා සෙමෙන් ක්‍රියාත්මක වීම.
- ආදායම් වියදම් ගිණුම් සහ සමිතිවාර වාර්තා නිසි පරිදි පවත්වාගෙන නොයාම නිසා සංවිධානය අසංවිධිත බවට පත් වී තිබීම.

## 3.7 සිද්ධි අධ්‍යයන 07: සේනානි ගොවි සංවිධානය - සොරණාතොට, බදුල්ල දිස්ත්‍රික්කය

### 3.7.1 හැඳින්වීම

බදුල්ල දිස්ත්‍රික්කයේ රිදීපාන ගොවිජන සංවර්ධන 'බල ප්‍රදේශයේ 'සේනානි' ගොවි සංවිධානය ක්‍රියාත්මක වේ. බදුල්ල දිස්ත්‍රික්කයේ කඳු පල්ලම්වලින් සමන්විත භූගෝලීය කලාපයක මෙම ගොවි සංවිධාන බල ප්‍රදේශය විහිදී පවතී. මෙම ගොවි සංවිධානයේ ආරම්භය 1990 වර්ෂය වන අතර පැරකුම් ගොවි සංවිධානය නමින් එකල මෙය හඳුන්වා තිබේ.

එසේ වුව ද, පැවති නායකත්වයේ අකාර්යක්ෂමතාවය, වංකභාවය, විනිවිදභාවයකින් තොර පරිපාලනය යන හේතු නිසා මෙම ගොවි සංවිධානය පවත්වාගෙන යා නො හැකි තත්ත්වයට පත් වී බිඳ වැටී තිබේ.

බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට රිදීපාන ප්‍රදේශය කෘෂිකාර්මික ප්‍රදේශයකි. පහත් බිම්වල වී වගාවන්, උස්බිම්වල උඩරට හා පහතරට එළවළු වගාව, ගෙවතු වගාව,තේ වගාව, සුළු අපනයන බෝග ලෙස ගම්මිරිස් වගාව ප්‍රධාන වගාවන් වන්නේ ය. ප්‍රදේශයේ කුඹුරු ඉඩම් අක්කර 73ක් ද, ස්ථිර බෝග වගා බිම් අක්කර 136ක් ද පවතී. වී වගාව පවුලේ පාරිභෝජනයට පමණක් ගන්නා අතර එළවළු, බඩඉරිඟු අලෙවි කරයි. ගොවීන් අතර ද හුවමාරු කොට ගැනේ.

මෙම බෝග වගාවන් හි අවශ්‍යතාවයන් සඳහා ගොවීන්ට තනි තනිව අවශ්‍යතා ඉටු කර ගැනීමට නො හැකි නිසා ගොවි සංවිධානයක අවශ්‍යතාවය බහුතර ගොවීනට දැනෙන තත්ත්වයක් උද්ගත වී තිබේ. එම නිසා, ගොවීන් එකතුව ගොවි සංවිධානය 2010 වර්ෂයේ අග භාගයේ යළිත් ප්‍රතිසංවිධානය කර ක්‍රියාකාරී තත්ත්වයට පත් කොට ඇත. වර්තමාන සාමාජික සංඛ්‍යාව 150ක් පමණ වේ.

වර්තමානයේ මෙම ගොවි සංවිධානයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු නිලධාරී මණ්ඩලයක් පත් වී සිටින අතර මොවුහු ප්‍රධාන ගැටලුවකට මුහුණ පා සිටිති. එනම්, පැවති ගොවි සංවිධානයේ ගිණුම් සහ පොත්පත් නව ගොවි සංවිධානයට තවමත් භාර දී නොමැතිවීම යි.

### 3.7.2 ගොවි සංවිධානය සතු අරමුදල්


ගොවි සංවිධානය සතු අරමුදල් ප්‍රමාණය පිළිබඳව නිවැරදි සංඛ්‍යා ලේඛන නොමැති අතර 2004, 2005 සහ 2006 යන වර්ෂවල අරමුදල් එකතුව පිළිබඳ සංඛ්‍යා ලේඛන පමණක් සොයා ගැනීමට හැකි වී තිබේ. මේ අනුව, එම වර්ෂ තුනේ අරමුදල් සංඛ්‍යාව පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

වගු අංක 3.7.1: ගොවි සංවිධානය සතු අරමුදල් (රු.)

| වර්ෂය | මුදල (රු.) |
|---|---|
| 2004 | 12,730.37 |
| 2005 | 20,054.49 |
| 2006 | 23,194.64 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

ප්‍රස්තාර අංක 3.7.1: ගොවි සංවිධානය සතු අරමුදල්




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

ප්‍රතිසංවිධානයෙන් පසුව වර්තමානයේ දී ගොවි සංවිධානය සඳහා සාමාජිකයෙකු විසින් මසකට රු. 5ක මුදලක් වශයෙන් වර්ෂයකට රු. 60/-ක මුදලක් එකතු කරනු ලබයි.

### 3.7.3 ගොවි සංවිධානය වර්තමානයේ ගොවීන් වෙනුවෙන් ඉටු කරන සේවය

මෙම ගොවි සංවිධානය විසින් වර්තමානයේ දී කන්න රැස්වීම් පැවැත්වීම හා කන්නයට අවශ්‍ය පොහොර සහනාධාරය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලබයි. පසුගිය වසර තුළ දී ගොවීන්ට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට පුහුණුවක් ලබාදීම, මුල්ලු සහ උදලු ගොවීන් තුන්දෙනෙකුට සපයා දීම, එළවළු ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් කුඩ 27ක් එකක් රු. 300/- බැගින් ගොවීන්ට ලබාදීම, ආදර්ශනයක් ලෙස වගා කිරීම සඳහා රතුළුණු බීජ කි.5ක් ගොවීන් දෙදෙනෙකුට ලබාදීම හා මී මැසි පාලනයට ගොවීන් යොමු කිරීමට මී මැසි පෙට්ටි 10ක් ලබාදීම යන කාර්යයන් කෘෂිකර්ම උපදේශකවරයාගේ මූලිකත්වයෙන් ඉටු කොට තිබෙන බව වාර්තා විය.

### 3.7.4 වර්තමානයේ දී ප්‍රදේශයේ ගොවීන් මුහුණ දී සිටින ගැටලු

වී වගා ගොවීන් මුහුණ දී සිටින බිත්තර වී හිඟය ද විශාලතම ගොවි ගැටලුවකි. ප්‍රදේශයේ කුඹුරුවල බිත්තර වී සඳහා භාවිතා කළ හැකි වී වගා කිරීමේ වැඩසටහන් හෝ බිත්තර වී වෙනත් ප්‍රදේශයකින් පහසුවෙන් සපයා දීම හෝ කළ යුතු වුවත්, ඒ සඳහා පවතින ගොවි සංවිධානය ප්‍රමාණවත් කාර්යයක් ඉටු නො කරයි.

මෙම ගොවීහු උඩරට හා පහතරට එළවළු මෙන් ම බඩඉරිඟු යල මහ දෙකන්නයේ ම නිෂ්පාදනය කරන අතර ඒවා සාධාරණ මිලකට අලෙවි කර ගැනීමේ ගැටලුවලට මුහුණ දී සිටිති. මෙම ගැටලු නිසා ගොවීන් වගාවන් අතහැර දැමීමට පවා යොමු වී සිටින බව දැනගන්නට ලැබුණි. මෙම අලෙවි ගැටලු විසඳීම සඳහා ගොවි සංවිධානයේ මැදිහත්වීමක් සිදු නොවන බව හෙළි විය.

වගාවට ජලය සපයා ගන්නා ඇළ-වේළි පද්ධතිය නියම ආකාරයෙන් පිළිසකර කිරීමක් නොමැතිව ජලය ගොවිබිම්වලට බෙදා හැරීමේ දී ගැටලු ඇති වී තිබේ. ඇළ මාර්ග නිසි පරිදි ප්‍රතිසංස්කරණය කිරීම වගා ආරම්භයේ දීම සංවිධානය කළ යුත්තේ ගොවි සංවිධානය වුවත් මෙම ගොවි සංවිධානය එලෙස අවශ්‍ය කටයුතු ඉටු නො කරන බව හෙළි විය.

වර්තමානයේ තාක්ෂණික ක්‍රම භාවිතය හා වෙනත් දැනුම අනුව කෘෂිකර්මාන්තය ඉහළ මට්ටමකට පත්ව ඇති අවධියක මෙම ගොවි ජනතාවට එවැනි අවස්ථාවක් නො ලැබී ගොස් ඇත. එම නිසා, ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන් සමඟ මනා සබඳතාවයක් පවත්වා ගනිමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පත් සහ දැනුම ක්ෂේත්‍රයට ලබාගැනීම සඳහා සම්බන්ධීකාරකයා ලෙස ක්‍රියා කළ යුත්තේ ගොවි සංවිධානය යි. එසේ වුව ද, එම සිදු විය යුතු කාර්යභාරයන් මෙම ගොවි සංවිධානය මඟින් ඉටු වන්නේ නැති බව පෙනී යයි. මෙම ගොවි සංවිධානය සම්බන්ධයෙන් පහත සඳහන් යෝජනා කිහිපයක් ඉදිරිපත් කළ හැකිය.

### 3.7.5 සාරාංශය

දක්ෂ නායකත්වයක් හා නිලධාරී මණ්ඩලයක් නොමැතිවීම නිසා දුර්වලත්වයටපත් වීම.

- සාමාජිකයින්ට ගොවි සංවිධානයේ වැදගත්කම පිළිබඳ පවතින අඩු අවබෝධය.
- ගොවි සංවිධාන නායකයන්ගේ ක්‍රියාකාරිත්වයේ විනිවිදභාවයේ දුර්වලතා පැවතීම.
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට ගොවි සංවිධානය දුර්වලවීම වැළැක්වීමට නො හැකිවීම.
- යළිත් ප්‍රතිසංවිධානය වුව ද, උසස් ක්‍රියාකාරිත්වයක් ඇතිකර ගැනීමට තරම් නායකත්වය ශක්තිමත් නොවීම.

## 3.8 සිද්ධි අධ්‍යයන 08: පල්ලේපැල ගොවි සංවිධානය – වංගියකුඹුර, බදුල්ල දිස්ත්‍රික්කය

### 3.8.1 හැඳින්වීම

බදුල්ල දිස්ත්‍රික්කයේ බොරලන්ද ගොවිජන සේවා බල ප්‍රදේශයේ වංගියකුඹුර ග්‍රාම නිලධාරී වසමේ පල්ලේපැල ගොවි සංවිධානය ක්‍රියාත්මක වේ. මෙම ගොවි සංවිධානය ක්‍රියාකාරී ගොවි සංවිධානයක් බවට පත් වූයේ 1997 වර්ෂයේ දී ය. ක්‍රියාකාරී ගොවි සංවිධානයක් බවට පත්වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ ක්‍රියාශීලී තරුණ නායකත්වයක් සහිත නිලධාරී මණ්ඩලයක් ගොවි සංවිධානය සතුවීම නිසාවෙනි. 1997 වර්ෂය දක්වා ගොවි සංවිධානය ක්‍රියාත්මකව පැවතියේ වුව ද, එතරම් කැපී පෙනෙන ක්‍රියාකාරීත්වයක් දක්නට නොවී ය.

ජාතික තරුණ සේවා සභාවේ කෘෂිකාර්මික අංශයේ තනතුරක් ඉසිලීමත්, ජපන් කෘෂිකාර්මික වැඩසටහනකට සම්බන්ධ වීමෙන් ලත් කෘෂිකාර්මික දැනුමත්, උපයෝගී කර ගැනීම නිසා වංගියකුඹුර ගොවි සංවිධානය සැලැස්මක් සහිතව මෙහෙයවීමට මෙම නායකත්වයට හැකි වී තිබේ. ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු ද ක්‍රියාකාරී පුද්ගලයන් දෙදෙනෙකු ඉසිලීම මෙම ගොවි සංවිධානය ඉහළ ක්‍රියාකාරීත්වයක් ඉසිලීමට හේතු වී ඇත. මෙම නිලධාරී මණ්ඩලය යටතේ ගොවි සංවිධානය වර්ධනය වී ඇති ආකාරය පහත සඳහන් අයුරින් විස්තර කළ හැකි ය.

### 3.8.2 සාමාජිකත්වය වර්ධනය කර ගැනීම


1997 වර්ෂයේ දී ගොවි සංවිධානයේ සාමාජිකත්වය 21 දෙනෙකුගෙන් සමන්විත විය. මෙම සාමාජික සංඛ්‍යාව 2010 වර්ෂය වන විට 243 දක්වා වර්ධනය වී ඇත. වර්ෂ 2005 සිට 2010 දක්වා කාලය තුළ දී සාමාජිකත්වය වර්ධනය වි ඇති ආකාරය පහත සංඛ්‍යා සටහන් අංක 3.8.1 හා ප්‍රස්තාර සටහන් අංක 3.8.1 තුළින් වඩාත් පැහැදිළි වේ.

**වගු අංක 3.8.1: සංවිධානයේ සාමාජික වර්ධනය**

| වර්ෂය | සාමාජික වර්ධනය |
|---|---|
| 2005 | 207 |
| 2006 | 215 |
| 2007 | 226 |
| 2008 | 240 |
| 2009 | 240 |
| 2010 | 243 |

මූලාශ්‍රය: ගොවි සංවිධානයේ වාර්තා

**ප්‍රස්තාර අංක 3.8.1: සාමාජික වර්ධනය**




මූලාශ්‍රය: ගොවි සංවිධානයේ වාර්තා

සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ඇතුළත්වීමේ ගාස්තු වශයෙන් රු. 100/-ක මුදලක් අය කර ගනී.

### 3.8.3 අරමුදල් වර්ධනය කර ගැනීම

ගොවි සංවිධානයේ අරමුදල් රස් කර ගැනීම සඳහා සාමාජිකයින්ගෙන් මාසිකව සාමාජික ගාස්තුවක් අය නො කරන අතර වෙනත් ක්‍රම ඔස්සේ අරමුදල් වර්ධනය කර ගැනීමට උත්සාහ දරා ඇති බව හෙළි විය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සියලු ඉදි කිරීම් ගොවි සංවිධානය විසින් සිදු කරනු ලබන අතර මේ මහින් යම් කිසි ලාභ ප්‍රතිශතයක් සංවිධානය ලබා ගනී. එය සංවිධානයේ අරමුදල් වර්ධනය කර ගැනීමට ප්‍රධාන ඉපැයීම් මාර්ගයක් වී ඇත. ගොවි සංවිධානය සතුව පවතින වත්කම් වන තෙල් ඉසින යන්ත්‍ර, ටකරන් සෙවිලි ගෙය, පුටු වැනි උපකරණ කුළියට දීම මහින් ද අරමුදල් උපයා ගනී. සංවිධානයේ අරමුදල ඉහත ක්‍රම ඔස්සේ වර්ධන කරගෙන ඇති අතර වර්තමානය වන විට මුළු මුදල රු. 102,726ක් වී තිබේ. සංවිධානයේ අරමුදල් වාර්ෂිකව වර්ධනය වී ඇති ආකාරය ද පහත සඳහන් සංඛ්‍යා සටහන මහින් දැක්විය හැකි ය.

**වගු අංක 3.8.2: ගොවි සංවිධානයේ අරමුදල් වර්ධනය**

| කාල පරිච්ඡේදය | මුදල් ප්‍රමාණය (රු.) |
|---|---|
| 2006.11.10 – 2007.03.30 | 46,985.00 |
| 2007.0712 – 2007.11.18 | 50,285.00 |
| 2008.06.10 – 2008.12.08 | 51,838.00 |
| 2008.12.08 – 2009.07.04 | 65,193.00 |
| 2009.07.05 – 2009.12.20 | 94,545.00 |
| 2009.12.20 – 2010.06.17 | 85,814.00 |
| 2010.06.07 – 2010.12.12 | 90,468.00 |
| 2010.12.15 – 2011.07.18 | 102,726.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධානයේ වාර්තා

ගොවි සංවිධානය විසින් බැංකු ගිණුම් විවෘත කර ඉතා ක්‍රමවත් ආකාරයට මෙම ගිණුම් පවත්වාගෙන යයි.

### 3.8.4 සාමාජිකයන් සඳහා ණය අරමුදල් සැපයීම

සංවිධානය විසින් බොරලන්ද ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයේ ගොවිජන බැංකුවේ කොටස් මිල දී ගෙන ඇති අතර පස් දෙනාගේ කුඩා කණ්ඩායම් ලෙස සාමාජිකයන් සංවිධානය කොට ඔවුන්ගේ ණය අවශ්‍යතා ගොවි බැංකුව මඟින් සපුරාලයි. ගොවීන් හා ගොවි බැංකුව අතර කිට්ටු සබඳතාවක් ගොඩනගා ඇති අතර ගොවීන් මුදල් ඉතිරි කිරීම හා ණය මුදල් ලබා ගැනීම ගොවි බැංකුව මඟින් සිදු කිරීමට පුරුදු කොට ඇත. මෙම ගොවි ජනතාව අර්තාපල් හා එළවළු ගොවීන් වන අතර අර්තාපල් වගාවේ නිෂ්පාදන වියදම සඳහා ගොවි බැංකුවෙන් ණය ලබා ගනී. වර්තමානයේ දී, මෙම ගොවීන් විසින් ගොවි බැංකුවෙන් රු. ලක්ෂ 15ක පමණ මුදලක් ණය ලබාගෙන ඇති බව හෙළි වී ඇත.

### 3.8.5 සුබසාධන කාර්යයන්

ගොවි සංවිධානයේ වෙනත් ක්‍රියාකාරීත්වයන් විමසා බලන විට පෙනී යන්නේ සාමාජිකයින්ගේ සුබ සාධන කටයුතු සඳහා ද පුළුල් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කොට ඇති බවයි. සුබ සාධන කාර්යයන් වශයෙන් මෙතෙක් සිදු කර ඇති කාර්යයන් පහත පරිදි විස්තර කළ හැකි ය.

- සංවිධානයේ මූලිකත්වයෙන් ප්‍රදේශයේ ජනතාව සහභාගී කර ගනිමින් ලේ දන්දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රමදාන වැඩසටහන් මඟින් ප්‍රදේශයේ මාර්ග පිළිසකර කිරීමේ වැඩසටහනක් පවත්වාගෙන යාම.
- වන්දනා සහ විනෝද චාරිකා, වසරක් පාසා සංවිධානය කිරීම මඟින් ආගමික භක්තිය වැඩි කිරීම හා විනෝදාස්වාදය ලබාදීම.
- වාර්ෂික කිරි ඉතිරවීමේ මංගල්‍යය පැවැත්වීම මඟින් ගමේ ජනතාවට සෙත් පැතීම.
- අධ්‍යාපනික කටයුතු සඳහා දක්ෂතා පෙන්නුම් කරන ආර්ථික අතින් පහළ පවුල්වල දරුවන් හට අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා මූල්‍යමය උපකාර ලබා දීම ආදිය වේ.

### 3.8.6 ලිපිගොනු විධිමත්ව පවත්වා ගැනීම හා ගිණුම් තැබීම

ගොවි සංවිධානයේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය මෙන් ම පොත්පත් නඩත්තුව සංවිධානයේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ සිදුවන බව අනාවරණය වූ අතර සංවිධානයේ කාර්යයන් ඇතුළත් ලිපි ගොනු සහ ආදායම් වියදම් සටහන් කරන ලද ගිණුම් ඉතා ක්‍රමවත්ව පවත්වාගෙන යන ආකාරයක් දක්නට ලැබේ. ගොවි සංවිධානය විසින් සිදු කරන ලද කාර්යයන් ඒවායේ ඡායාරූප සහ විස්තර සහිතව ලිපි ගොනුව බැඟින් සකස් කර තිබුණි. ඒවායේ විනිවිද භාවය ආරක්ෂා කිරීමට ගොවි සංවිධානය කැප වී ක්‍රියාකරන බව සාමාජිකයින් පෙන්වා දුන් කරුණකි.

### 3.8.7 ගොවි සංවිධානය විසින් ගොවි ජනතාවට ඉටු කොට ඇති සේවාවන්

ගොවි සංවිධානය විසින් ප්‍රදේශයේ ගොවි ජනතාව සම්බන්ධයෙන් සිදු කොට ඇති කාර්යයන් අතර පහත සඳහන් සේවා කැපී පෙනේ.

ප්‍රදේශයේ කෘෂි සම්පත් වන වගා රක්ෂිත, ජල රක්ෂිත සහිත ඉඩම් පෞද්ගලික සමාගම් විසින් මල් වගා ව්‍යාපෘති සඳහා ලබා ගැනීමට උත්සාහ ගෙන ඇති අතර එම සම්පත් පොදු කෘෂි සම්පත් ලෙස ආරක්ෂා කර ගැනීමට ගොවි සංවිධානය ගොවින් සමඟ පෙරමුණ ගෙන එම උත්සාහයන් පරාජය කොට පොදු සම්පත් රැක ගෙන ඇත.

අර්තාපල් වගාව ප්‍රදේශයේ ප්‍රමුඛ වාණිජ ගොවිතැනක් නිසා අර්තාපල් බීජ පහසු මිලට ගොවින් වෙත සැපයීමට අවශ්‍ය පියවර ගෙන ඇත. එය ගොවීන්ට විශාල සහනයක් වී ඇති බව සාකච්ඡාවලින් හෙළි විය.

පරිසර සංරක්ෂණය, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා ඒ පිළිබඳ අවබෝධයක් ගොවි ජනතාව වෙත ලබාදීමට කටයුතු කිරීම මඟින් එම සම්පත් රැක ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සම්බන්ධ අවබෝධය පුළුල් කරන වැඩසටහන් සාමාජිකයන් සඳහා පවත්වා තිබේ. කාබනික පොහොර භාවිතය වැඩි කිරීමටත්, වී වගාවේ දී පිදුරු පොහොරක් ලෙස කුඹුරට දැමීමටත් ගොවින් පෙළඹවීම මඟින් පස සහ ජලය යන සම්පත් සුරකීමට ගොවින් නැඹුරු කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත.

ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති සකස් කිරීම වැනි ජාතික වශයෙන් වැදගත් ප්‍රතිපත්ති සම්පාදන අවස්ථාවල දී ගොවි සංවිධානය ඒ සඳහා තම අදහස් ඉදිරිපත් කරමින් ගොවින්ට හිතකර ආකාරයේ ප්‍රතිපත්ති සකසා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උත්සාහ ගෙන ඇති බව ද හෙළි විය.

ගොවි සංවිධානයේ සාමාජිකයින්ගේ දියුණුව සඳහා ක්‍රියාකාරකම්වල යෙදීමෙන් ගොවින්ට උපරිම සේවයක් සැලසීමට ගොවි සංවිධානය සෑම අවස්ථාවක දීම උත්සාහ ගන්නා අතර ගොවි සංවිධානය ආදර්ශවත් ගොවි සංවිධානයක් ලෙස පවත්වාගෙන යාමට නිලධාරී මණ්ඩලය කැප වී සිටින බව පෙනී යයි.

ඉහත සඳහන් කරන ලද ආකාරයට ප්‍රදේශයේ ප්‍රමුඛතම ප්‍රජා සංවිධානය වශයෙන් පල්ලේපැල වංගියකුඹුර ගොවි සංවිධානය හැඳින්විය හැකි ය.

අවසාන වශයෙන් සඳහන් කළ හැක්කේ දක්ෂ, ක්‍රියාශීලී, අවංක නායකත්වයක් සහිත නිලධාරී මණ්ඩලය, ගොවි සංවිධානයේ සාමාජික යහපත සඳහා කැපවීම හා සංවිධානයේ සියළු කටයුතු සම්බන්ධ විනිවිදභාවය හා කාර්යයන් රාශියක් ගොවි සාමාජිකයින් සඳහා ඉටු කිරීම යන කාර්යයන් මත මෙම ගොවි සංවිධානය උසස් ක්‍රියාකාරීත්වයක් සහිත එකක් බව

### 3.8.8 සාරාංශය

- ගොවි සංවිධාන සංකල්පය වටහාගත් නායකත්වයක් සංවිධානය මෙහෙයවීම
- නායකත්වය මෙන් ම නිලධාරී මණ්ඩලය ද සංවිධානය වෙනුවෙන් කැප වී ගොවි සංවිධාන කාර්යයන් වල නිරතවීම

- ක්‍රමානුකූලව රැස්වීම හා රැස්වීම් පැවැත්වීම
- ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන් සමඟ කමිටු සබඳතාවයන් ගොඩනගාගෙන සිටීම
- ගොවිජන අංශය වෙත පුළුල් සේවයක් ඉටුකරන ගමන් ම සුබසාධක අංශයෙන් ද පුළුල් සේවයක් ඉටු කිරීම
- විධිමත්ව ගිණුම් තැබීම මඟින් සාමාජිකයන්ගේ විශ්වාසය දිනාගෙන සිටීම
- ගොවිජන ප්‍රශ්න සම්බන්ධයෙන් උද්ඝෝෂණ කිරීම, පුවත්පත් සඳහා වාර්තා සැපයීම, පොදු සම්පත් සුරැකීමට කැප වී ක්‍රියා කිරීම, කෘෂිකර්ම කමිටුවල දී ගොවි ජනතාව වෙනුවෙන් ප්‍රතිපත්ති සැකසීමට ක්‍රියාකිරීම වැනි තම ක්ෂේත්‍රය පිළිබඳ අවදියෙන් සිටින සංවිධානයක් වීම

## 3.9 සිද්ධි අධ්‍යයන 09: සෙවන ගොවි සංවිධානය – ඇලයාපත්තුව, අනුරාධපුර දිස්ත්‍රික්කය

### 3.9.1 හැඳින්වීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇලයාපත්තුව ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ඉහළ පුලියන්කුලම ග්‍රාම නිලධාරී වසමේ සෙවන කාන්තා (කාන්තාවන් විසින්) ගොවි සංවිධානය පවත්වාගෙන යයි. කුඩා මානිංගමුව, මානිංගමුව, අටේ කනුව, නවයේ කනුව, ඉහළ පුලියන්කුලම යන කුඩා ගම්මාන මෙම ගොවි සංවිධානයේ බල ප්‍රදේශය වේ.

### 3.9.2 ගොවි සංවිධානයේ ආරම්භය සහ විකාශනය

මෙම ග්‍රාම නිලධාරී බල ප්‍රදේශයේ මුලින් ම ආරම්භ වී ඇත්තේ පිරිමි පාර්ශවය සාමාජිකත්වය දරන ගොවි සංවිධානයකි. ප්‍රදේශයේ පිරිමි වැඩි දෙනා ඇලයාපත්තුව උළු කර්මාන්ත ශාලාවේ රැකියා කිරීම නිසා ගොවි සංවිධානය ක්‍රියාකාරී මට්ටමකින් පවත්වාගෙන යාමට නොහැකි වීම නිසා අඩපන වී ඇත. මෙම ගොවි සංවිධානය 1998 වර්ෂය සඳහා පවත්වන ලද නිලවරණයේ දී එය පවත්වාගෙන යාමේ අසාර්ථකභාවය නිසාම නිලධාරීන් තනතුරුවලින් ඉල්ලා අස් වී තිබේ. මේ අවස්ථාවේ දී සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන තනතුරු සඳහා කාන්තාවන් තේරී පත් විය. මේ අනුව, 1998 වර්ෂයේ දී කාන්තා සංවිධානයක් වශයෙන් යළි ආරම්භ විය. මෙම තත්ත්වය ඇලයාපත්තුව ගොවිජන සංවර්ධන නිලධාරී වෙත දන්වා 1999 වර්ෂයේ දී ගොවි සංවිධානයක් බවට පත් විය. ආරම්භක සාමාජිකත්වය කාන්තාවන් 11 දෙනෙකි. මෙම ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය සමන්විත වී ඇත්තේ ගොඩ ඉඩම්වල කෘෂි බෝග වගා කිරීමත්, සුළු වශයෙන් වී වගාව කිරීමෙනුත් ය.

### 3.9.3 ගොවි සංවිධානයේ ව්‍යුහය

ගොවි සංවිධානයේ ව්‍යුහය සමන්විත වන්නේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති, උප ලේකම් හා කාරකසභිකයින් 4 දෙනෙකුගෙන් යුත් කමිටු 4ක් සහ කුඩා කණ්ඩායම් 14ක් මඟිනි. එය ගොවි සංවිධානයේ යාන්ත්‍රණය වේ.

### 3.9.4 මහා සභාව සඳහා නිලධාරීන් තෝරා පත් කර ගැනීම

මහා සභාව සඳහා නිලධාරීන් තෝරා ගැනීම වාර්ෂිකව සිදු කරනු ලබයි. එසේ තෝරා පත් කර ගැනීමේ දී කුඩා කණ්ඩායම්වල නිලධාරීන් අතුරින් සුදුස්සන් තෝරා ගැනේ. කුඩා කණ්ඩායම්වල සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යනා දී ධූර ඉසිලීම නිසා සාමාජිකයන් හට පළපුරුද්දක් ලැබීම මහා සභාවේ ධූරයන් ඉසිලීමේ දී පහසුවක් වී ඇත. එම නිසා, වසරක් පාසා නව නිලධාරී මණ්ඩලයක් තෝරා පත් කර ගැනීමට පහසුවක් වී තිබේ.

### 3.9.5 ගොවි සංවිධානයේ සාමාජික වර්ධනය


ගොවි සංවිධානයේ සියලුම නිලතලවලට ස්ත්‍රීන් පත් වූ පසුව, ගොවි කාන්තා සංවිධානයක් වශයෙන් ඇරඹුණු අතර සංවිධානයට සියලුම පවුල්වල කාන්තාවන් ඇතුළත් කරන ලෙස පිරිමින්ගෙන් ඉල්ලීමක් කරන ලදී. සංවිධානයේ ක්‍රියාකාරීත්වය හා එම ඉල්ලීම මත ක්‍රමයෙන් කාන්තාවන් සංවිධානයේ සාමාජිකත්වය ලබාගෙන ඇත. 1998 වර්ෂයේ දී සාමාජිකයින් 11 දෙනෙකුගෙන් ආරම්භ වී 2010 වන විට 87 දක්වා වර්ධනය වී තිබේ. සංවිධානයේ සාමාජිකත්වය වර්ධනය සිදු වී ඇති ආකාරය වගු සටහන් අංක 3.9.1න් සහ ප්‍රස්ථාර සටහන් අංක 3.9.1න් දක්වා ඇත.

**වගු අංක 3.9.1: ගොවි සංවිධානයේ සාමාජික වර්ධනය (1998 සිට 2010) දක්වා**

| වර්ෂය | සාමාජික සංඛ්‍යාව |
|---|---|
| 1998 | 11 |
| 1999 | 25 |
| 2000 | 44 |
| 2001 | 58 |
| 2002 | 74 |
| 2003 | 74 |
| 2004 | 75 |
| 2005 | 75 |
| 2006 | 76 |
| 2007 | 77 |
| 2008 | 78 |
| 2009 | 86 |
| 2010 | 87 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

ප්‍රස්තාර අංක 3.9.1: සාමාජික වර්ධනය




මූලාශ්‍රයඃ ගොවි සංවිධාන වාර්තා

### 3.9.6 ජනතා විශ්වාසය දිනා ගැනීමේ ක්‍රමවේද

ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වන හේන් සහ උස් බිම් වගාව සම්බන්ධයෙන් කැලෑව ශුද්ධ කිරීමේ සිට බෝග සිටුවා අස්වනු නෙලා ගැනීම දක්වා විවිධ කාර්යයන් සඳහා ශ්‍රමය අවශ්‍ය වන බැවින් කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය කොට අත්තම් ක්‍රමයට ශ්‍රමය ලබාදීමේ වැඩපිළිවෙළ ඉතා ක්‍රමවත් ලෙස පණ ගැන්වීමට මෙම ගොවි සංවිධානය ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කොට තිබේ. කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය වී කෘෂිකාර්මික කටයුතු කර ගැනීම නිසා ගොවීන්ගේ නිෂ්පාදන වියදම අඩුකර ගැනීමට එය සෘජුව ම හේතු විය. මේ ක්‍රමය අනුගමනය කිරීම නිසා ගොවීන්ට වියදම් දැරීමට සිදුවන්නේ පොහොර, බීජ,කෘෂි රසායනික ද්‍රව්‍ය, බිම් සැකසීමට හා අස්වනු නෙළීමට කරනු ලබන යන්ත්‍ර හා ප්‍රවාහන වියදම් සඳහා පමණි. වී වැපිරීම, ගොඩ බෝග වගාවේ හී පැළ සිටුවීම, වල් මර්දනය, පොහොර යෙදීම, අස්වනු නෙළීම ආදිය කුඩා කණ්ඩායම් වශයෙන් එකතු වී කිරීම අනුගමනය කරයි. එම ක්‍රමයෙන් ජනිත වූ ප්‍රතිලාභ ගොවි පවුල්වල ආර්ථිකයට දැනෙන කාරණයක් වූ නිසා ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා කුඩා කණ්ඩායමකට එක්වීමට ගම්වැසි කාන්තාවන් කැමැත්තක් දක්වා ඇත. මෙම කුඩා කණ්ඩායම් ක්‍රමය තුළ කෘෂිකාර්මික කටයුතු පමණක් නොව, ග්‍රාමීය ජීවිතයේ වෙනත් විවිධ වූ කාර්යයන් ද ශ්‍රමදාන පදනමින් කර ගැනීමට ජනතාව පුරුදුවීම නිසා කුඩා කණ්ඩායම් ක්‍රමය මෙම සමාජයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වී තිබේ. මෙම ක්‍රමය පිළිබඳ හඳුන්වා දුන් ගොවි සංවිධානය වෙත කාන්තාවගේ ප්‍රසාදය හිමි වී ඇත.

### 3.9.7 කුඩා කණ්ඩායම් ක්‍රමය, ඉතුරුම් හා ණය සැපයීම

එක් කුඩා කණ්ඩායමක පස් දෙනා හෝ හය දෙනා බැගින් සම්බන්ධ වී තිබේ. කුඩා කණ්ඩායම තුළ ද සභාපති, ලේකම්, භාණ්ඩාගාරික වශයෙන් නිලධාරී මණ්ඩලයක් ද තෝරා ගැනේ. කණ්ඩායම තුළ මුදල් ඉතිරි කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කොට එම මුදල් ගොවීන්ට ණය වශයෙන් ලබාදීම සඳහා භාවිතා කරනු ලබයි. කණ්ඩායම්වල සාමාජිකයන්

මාසයකට රුපියල් සියය බැගින් කණ්ඩායමේ භාණ්ඩාගාරික වෙත භාරදිය යුතු වෙයි. මෙම ඉතිරි කරන මුදල් කුඩා කණ්ඩායම් සාමාජිකයන්ගේ මුදල් අවශ්‍යතාවයන්වල දී ණය වශයෙන් සපයයි. කුඩා කණ්ඩායමේ සාමාජිකයන් එකිනෙකා ඇප වී ණය ලබා ගැනීමට හැකි ය.

### 3.9.8 ගොවි ණය සැපයීම

ණය වර්ග ගණනාවක් පවතී. සාමාන්‍ය ණය, විශේෂ ණය, දිරිය ණය සහ ව්‍යාපෘති ණය යනා දී වශයෙනි. විශේෂ ණය ලබා ගන්නා පුද්ගලයන් මාස 2ක දී ගෙවා අවසන් කළ යුතු ය. දිරිය ශක්ති ණය වසරකට 6 දෙනෙකුට පමණක් ලබාදෙයි. මෙහි උපරිම ණය මුදල රු. 50,000කි. වසර 2 ක කාලයකින් ආපසු ගෙවිය යුතු වෙයි. සාමාන්‍ය ණය උපරිමය රු. 20,000කි. සාමාජිකයාගේ තැන්පත් මුදලට අනුව ණය මුදල් ලබා දේ. අය කරනු ලබන පොලිය මාසයකට 2%කි. ආදායම් උත්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ව්‍යාපෘති ණය සපයයි. ව්‍යාපෘති ණය සඳහා පොලිය ද මාස 1ට 2%කි. මෙතෙක් ලබාගෙන ඇති ව්‍යාපෘති ණය මුදල් යොදවා ගඩොල් කැපීම, කොන්ක්‍රීට් වැඩ පොළවල් ආරම්භ කිරීම, සිල්ලර කඩ පවත්වාගෙන යාම වැනි ව්‍යාපෘති පවත්වාගෙන යයි.

මුදල් ඉතිරි කිරීම සඳහා ද සාමාජිකයන් පෙළඹවීම ගොවි සංවිධානයේ ප්‍රමුඛ කාර්යයකි. මුදල් ඉතිරි කිරීමේ දී මාසයකට 1.5%ක පොලියක් ගෙවනු ලබයි. මෙයට අමතරව, ගොවි බැංකුව හා ලංකා බැංකුව වැනි බැංකු සම්බන්ධ කරගෙන ද ණය සපයයි. ගොවි බැංකුවේ කොටස් මිල දී ගෙන ඇති අතර ගොවි බැංකුව සමඟ සම්බන්ධව කුඩා කණ්ඩායම් 14ක් පමණ සිටී. එක් එක් කණ්ඩායමේ භාණ්ඩාගාරික කෙනෙක් පත් කරගෙන සිටින අතර කණ්ඩායමේ මුදල් අය කිරීම භාණ්ඩාගාරික විසින් එක් වේලාවක් තුළ දී සිදු කරයි. ගොවි සංවිධානයේ ඉතිරි කිරීම් හා ණය සැපයීම් සම්බන්ධයෙන් පාස් පොතක් සකස් කොට තිබේ. සියලුම මුදල් ඉතිරි කිරීම් හා පොලී මෙම පොතේ සටහන් කෙරේ. ඒ අනුව, සාමාජිකයන්ට තම ඉතිරි කිරීම් හා තැන්පතු සාමාන්‍ය ඉතිරි කිරීම්වල දී ඒවාට ලැබෙන පොලී මුදල් ආදී සියල්ල පැහැදිළිව පාස් පොතෙන් බලා ගැනීමට හැකියාව ලැබී ඇත. ඒ ආකාරයටම මුදල් සම්බන්ධ විනිවිදභාවය උසස් තත්ත්වයකින් පවත්වාගෙන යාමට සංවිධානය ක්‍රියාමාර්ග ගෙන ඇත.

මුදල් ඉතිරි කිරීම හා ණය දීම සම්බන්ධයෙන් කුඩා කණ්ඩායම් අතර තරඟයක් ඇති කර තිබේ. කුඩා කණ්ඩායම්වල ක්‍රියාකාරීත්වය ආශ්‍රයෙන් හොඳම කුඩා කණ්ඩායම තෝරා තෑගි ප්‍රදානය කිරීමේ වැඩපිළිවෙළ තුළින් තරඟය ඇති කර තිබේ. කුඩා කණ්ඩායම් ක්‍රියාකාරීත්වය ඇගයීම සඳහා නිර්ණායක 6ක් හඳුන්වා දී ඇත. ඒවා පහත දැක් වේ.

1. ලබා දී ඇති වේලාවට එක් එක් කණ්ඩායම රැස්වීමට පැමිණීම
2. නිවැරදි ලෙසට පාස් පොත් සකස් කිරීම
3. කණ්ඩායම විසින් පැයක් ඇතුළත නියමිත වේලාවට නිවැරදිව මුදල් පොත කියැවීම
4. කුඩා කණ්ඩායමේ සියලූ දෙනා සියලුම සාකච්ඡාවලට සහභාගී වීම
5. නිවැරදිව සැකසූ ණය ඉල්ලුම්පත් භාර දී පැමිණීම
6. භාණ්ඩාගාරික වෙත මුදල් බැඳ තිබීම.

ඉහත තීරණායක භාවිතා කොට මාසිකව ඇගයීමක් සිදු කර වසර අවසානයේ දී ලකුණු 7ම ලබාගත් තිදෙනෙකු තෝරයි. ලකුණු 7ම ලබාගත් කණ්ඩායම සහ එම කණ්ඩායම්වල භාණ්ඩාගාරිකවරියන්ට තෑගි ලැබේ. මෙම ක්‍රමය හඳුන්වා දී ඇත්තේ කුඩා කණ්ඩායම්වල ණය සහ ඉතිරි කිරීම් ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා ය. වසරක් පාසා තිලවරණය පවත්වා නව භාණ්ඩාගාරික කෙනෙක් පත් කර යි. මේ ආකාරයට කුඩා කණ්ඩායම්වල පුද්ගලයන් සඳහා භාණ්ඩාගාරික ධූරය දැරීමට අවස්ථාව ලබාදීමේ අනෙක් වැදගත් කරුණ වන්නේ මුදල් ඉතිරි කිරීම් හා ණය සැපයීම් ක්‍රමවත් ආකාරයකට සිදු කිරීමට මෙම ක්‍රමය උපයෝගී වීමයි.

කුඩා කණ්ඩායම් ක්‍රමයේ පවත්නා තවත් විශේෂත්වයක් වන්නේ කුඩා කණ්ඩායම් එකතු වී ඔවුන්ගේ අනාගත දියුණුව සම්බන්ධයෙන් කණ්ඩායමට ගත හැකි පියවර සම්බන්ධයෙන් කතා කිරීම හා එහි දී එක් එක් සාමාජිකයාගේ අනාගත සැලසුම් හෙළි කිරීමයි. ඒ අනුව, එම අදහස් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩි දියුණු කිරීම් ද කණ්ඩායම විසින් සාකච්ඡාව මාර්ගයෙන් ම සිදු කෙරේ.

### 3.9.9 අනු කමිටු පත් කිරීමෙන් වගකීම් බෙදාදීම

**අනු කමිටු** - අනු කමිටු 4ක් මගින් සේවා සැපයීම විමධ්‍යගත කර ඇත. එම අනු කමිටු වන්නේ ට්‍රැක්ටර් අනු කමිටුව, සුබ සාධන අනු කමිටුව, ගොඩනැගිලි අනු කමිටුව සහ ණය අනු කමිටුවයි.

**ට්‍රැක්ටර් අනු කමිටුව** – ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් සංවිධානයට ලැබී ඇති ට්‍රැක්ටරය ගොවීන්ගේ අවශ්‍යතාවයට අනුව සේවයේ යෙදවීම, ආදායම් එකතු කිරීම හා එවා ක්‍රමිකව ගණන් තැබීම, අලුත් වැඩියා කටයුතු ආදිය මෙම කමිටුවේ කාර්යභාරය වන අතර ට්‍රැක්ටරය හොඳ තත්ත්වයෙන් පවත්වාගෙන යමින් ගොවීන්ට උපරිම සේවයක් සැලසීම කමිටුව කැප වී කටයුතු කළ යුතු වෙයි.

**සුබ සාධන අනු කමිටුව** – ගොවි සංවිධාන සාමාජිකයන්ගේ සුබ සාධන කටයුතු ඉටු කිරීම කමිටුවේ වගකීම වෙයි. සංවිධානයේ සාමාජිකයකු දින 4කට වඩා බරපතල අන්දමින් රෝගාතුර වුවහොත් එවැනි විටක දී එම සාමාජිකයාට රු. 500/- බැගින් ගෙවයි. දරු ප්‍රසූතියක දී වර්ෂයකට රු. 500/-ක් ගෙවයි. ඇය මාස 3ක කාලයක් රැස්වීම්වලට පැමිණීමෙන් ද නිදහස් කරයි. සාමාජිකයා හෝ ස්වාමියා මියගිය හොත් දානය අවස්ථාවේ දී රු. 6,000/-ක මුදලක් ලැබෙන අතර පවුලේ වෙනත් සාමාජිකයෙකු මිය ගියහොත් දානය අවස්ථාවේ දී රු. 2,000/-ක ප්‍රදානයක් හිමි වෙයි.

**ගොඩනැගිලි අනු කමිටුව** - ප්‍රදේශයේ ජනතාවට එකතුවීමට හැකි සියලු පහසුකම්වලින් සමන්විත ප්‍රජා මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් අලුතින් ඉදි කර ඇති අතර එම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා සහ ගොඩනැගිල්ල ක්‍රමවත් ලෙස නඩත්තු කිරීම හා පිරිසිදුව පවත්වාගෙන යාම යතුරු භාරකරු ලෙස කටයුතු කිරීම, ගොඩනැගිල්ල විවිධ අවශ්‍යතාවලට කුලියට දී මුදල් ඉපැයීම ගොඩනැගිලි අනු කමිටුවේ කාර්යභාරය වේ.

**ණය කමිටුව** – ණය කමිටුවේ කාර්යය වන්නේ ණය ඉල්ලුම් පත්‍ර භාර ගැනීම, ණය ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කිරීම, තැන්පතු භාර ගැනීම, ණය නිකුත් කිරීම, පැමිණීම පරීක්ෂා කිරීම, පොදු වැඩවලට පැමිණීම, පෙර ණය ගෙවීම, ණය ඉල්ලන කාරණය ආදී සියල්ල සොයා

බලා ණය නිකුත් කිරීම පිළිබඳව තීරණ ගැනීමයි. මෙම ණය කමිටුව ගන්නා තීරණය මහා සභා රැස්වීමේ දී සෙසු සාමාජිකයින්ට දැනගැනීම සඳහා කියවයි. කමිටුව විසින් අනුමත කරන ලද ණය සංඛ්‍යාව ප්‍රතික්ෂේප වූයේ නම් එම සංඛ්‍යාව ද මහා සභාවට දන්වයි. ණය කමිටුවේ කාර්යභාරය වන්නේ සාධාරණ ලෙස හා ක්‍රමවත් ලෙස ණය වැඩසටහන පවත්වාගෙන යාමයි.

කෘෂිකාර්මික කටයුතු කරගෙන යාම සඳහා වගා කන්න පදනම් කර ගනිමින් ණය සපයයි. ව්‍යාපාරික කටයුතුවල නියැලී සිටින පුද්ගලයන්ට ද ණය ලබා දෙයි. සුහදත්වය සහ කණ්ඩායමේ එකමුතුකම වර්ධනය වන ආකාරයට කණ්ඩායම සැම විට ම කටයුතු කළ යුතු ය. සැමවිට ම එක පවුලක් ලෙස කටයුතු කිරීමට උත්සාහ දරයි. කිසි විටක දී සමිතියට බොරු නො කළ යුතු ය. කණ්ඩායමේ සැම සාමාජිකයාම මාසිකව රුපියල් සියය බැගින් අනිවාර්ය ඉතිරි කිරීමක් කළ යුතු ය. ණය සැපයීමේ සීමාව රු. 1,500කි. මුදල් පිළිබඳ සියළුම කාර්යයන් විනිවිද පෙනෙන ආකාරයට කළ යුතු වන්නේ ය. උදාහරණ ලෙස තැන්පත් මුදල් භාර ගැනීම, ණය මුදල් පිරිනැමීම ආදිය සමිතිය තුළ ම විසිරී යාමට පෙර මුදල් ලබා දිය යුතු වන්නෙ ය. සියළුම ප්‍රතිලාභ ලබාදීමේ දී එලෙස විනිවිදභාවයක් අනුගමනය කළ යුතු වන්නේ ය. යම් කිසි සාමාජිකයෙකු සංවිධානයෙන් ඉවත්වන දිනකට උපයාගත් ලාභාංශ සහ අනිවාර්ය තැන්පතු ආපසු ලබා ගැනීමේ හැකියාව පවතී.

### 3.9.10 අරමුදල් වර්ධනය කර ගැනීම

වර්තමානය වන විට සංවිධානය තුළ ලක්ෂ 27 ඉක්මවන මුදලක් තැන්පත් කොට තිබේ. මෙම අරමුදල් තර කර ගැනීමේ දී ගොවින් විසින් ඒ සඳහා යොදා ගත් උපක්‍රම පහත ආකාරයෙන් දැක්විය හැකි ය.

- සාමාජික ඉතුරුම් භාවිතා කරමින් ණය සැපයීම මගින් මාසිකව 0.5%ක ලාභයක් ඉපැයීම
- කොන්ත්‍රාත් කිරීම මගින් 5%ක කොමිස් මුදලක් සංවිධානයට ලබා ගැනීම.
- ප්‍රදේශයේ විවිධ වැඩසටහන් සඳහා ගොඩනැගිල්ල කුළියට දීම මගින් ආදායම් ලැබීම
- සංවිධානය සතුව ඇති දියර ඉසින යන්ත්‍රය හා ට්‍රැක්ටරය කුළියට දීම මගින් ආදායම් ලැබීම
- වෙනත් විවිධ කාර්යයන් සඳහා ගොඩනැගිල්ල කුළියට දීම
- මාසිකව පවත්වනු ලබන භාණ්ඩ වෙන්දේසිය මගින් සංවිධානය මුදල් ඉපැයීම.
- ණය සැපයීම මගින් පොලී මුදල් ඉපැයීම
- වෙනත් සංවිධානවලට අත්දැකීම් හා පළපුරුද්ද ඇතුළත් උපදේශක සේවා සැපයීමෙන් ආදායම් ලැබීම


ඉහත උපක්‍රම ආශ්‍රයෙන් ගොවි සංවිධානයේ අරමුදල් වර්ධනය වී ඇති ආකාරය වගු අංක 3.9.2 න් හා ප්‍රස්තාර සටහන් අංක 3.9.2 න් පැහැදිළි වේ.

වගු අංක 3.9.2: ගොවි සංවිධානයේ අරමුදල් වර්ධනය

| වර්ෂය | අරමුදල (රු.) |
|---|---|
| 1998 | 20,000 |
| 1999 | 50,000 |
| 2000 | 100,000 |
| 2001 | 300,000 |
| 2002 | 450,000 |
| 2003 | 600,000 |
| 2004 | 700,000 |
| 2005 | 800,000 |
| 2006 | 1,000,000 |
| 2007 | 1,200,000 |
| 2008 | 1,612,258 |
| 2009 | 2,044,926 |
| 2010 | 2,521,229 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

ප්‍රස්තාර 3.9.2: ගොවි සංවිධානයේ අරමුදල් වර්ධනය




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.9.11 ගොවි සංවිධානය විසින් ඉටු කරමින් පවතින කාර්යයන්

අත්තම් ක්‍රමයට හේන් සහ ගොඩ ඉඩම් වගා කිරීමෙන් නිෂ්පාදන වියදම අඩු කිරීම හා එම පසුබිම මත බෝග වගාවෙන් ලාභ ඉපැයීමේ මාර්ගය හඳුන්වා දීම

- කුඩා කණ්ඩායම් ඇති කිරීම හා එක් එක් කුඩා කණ්ඩයම විසින් තම තමන්ගේ අනාගත ආර්ථිකය ශක්තිමත් කර ගැනීම පිණිස අදහස් ඉදිරිපත් කිරීම හා ඒවා කණ්ඩායමේ සාකච්ඡා කොට සාර්ථක අදහස් බවට පත් කිරීම
- විවිධ ණය වර්ග හඳුන්වාදීම මාර්ගයෙන් ජනතාවගේ අවශ්‍යතා කෙටි කාලයක් තුළ විසදීම හා ආර්ථිකමය වශයෙන් ස්ථාවරත්වයක් ගොඩනැංවීම
- කණ්ඩායමේ සියලුම සාමාජිකයින්ගේ නායකත්ව හැකියාව වර්ධනය වීම අරමුණු කරගත් නායකත්ව පුහුණුව ලබාදීම
- රටේ වෙනත් සංවිධාන මෙම සංවිධානය තුළට කැඳවා අදහස් හුවමාරු කර ගැනීමෙන් සංවිධානය ලබා ඇති සාර්ථකත්වය වෙනත් සංවිධානවල අත්දැකීමක් බවට පත් කිරීම මඟින් වෙනත් සංවිධානවල සේවය පුළුල් කිරීම
- ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය
- වෙනත් සමිති සමාගම් සමඟ සම්බන්ධ වී විවිධ වැඩසටහන් පැවැත්වීම
- රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් පහසුකම් ලබා ගැනීම
- සාමාජිකයන්ගේ සුබ සාධන අර්ථවත් වන ආකාරයට සුබසාධන කටයුතු ඉටු කිරීම
- සංවිධානයේ ආදායම් මාර්ග ඉහළ නැංවීම සඳහා භාණ්ඩ වෙන්දේසි වැනි නව ක්‍රම හඳුන්වාදීම
- සංවිධානයේ ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම ඔස්සේ ආදායම් තත්ත්වය වර්ධනය කර ගැනීම
- ප්‍රදේශයේ ජනතාවගේ කෘෂිකාර්මික දැනුම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු හා මූල්‍ය පහසුකම් සැපයීම
- ප්‍රදේශයේ පොදු අවශ්‍යතා ඉටු කරලීම සඳහා පොදු ශ්‍රමදාන පැවැත්වීම
- ගොවීන්, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක කිරීම මඟින් අනාගතය සුරක්ෂිත කිරීමට උත්සාහ දැරීම
- සිට්ටු ක්‍රම හඳුන්වාදීම මඟින් ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට අවස්ථාව සැලසීම
- නාට්‍ය රංගන, ගීත ගැයීම වැනි අවස්ථා ලබාදීමෙන් සාමාජික කුසලතා වර්ධනය
- පවුල් ඒකක විවිධ විෂයයන් සම්බන්ධයෙන් දැනුවත් කිරීම
- අවුරුදු උත්සව පැවැත්වීම මඟින් සාමාජික හා සංස්කෘතික අංග නො නැසී පවත්වාගෙන යාම
- සාමාජික පවුල්වල විනෝදය හා ආශ්වාදය සඳහා විනෝද චාරිකා වන්දනා චාරිකා සංවිධානය කිරීම
- සංවත්සර හා තිලවරණ ඉතාම ක්‍රමානුකූලව නියමිත ප්‍රමිතියට පැවැත්වීම
- ගම සංවිධානය හා මෙහෙයවීම මඟින් ගමේ පවුල් අතර සුහදත්වය වර්ධනය කිරීම

- කෘෂිකාර්මික බෝග වගා කිරීමේ දී රසායනික පොහොර භාවිතය අඩු කර කාබනික පොහොර භාවිතා කිරීමට ගොවීන් දැනුවත් කිරීම හා එය ක්‍රියාත්මක කරවීම
- ගොවීන් 35ක් පමණ එළවළු වගාව සඳහා කාබනික පොහොර භාවිතා කිරීම

මෙවැනි කාර්යයන් රාශියක් ඉටු කිරීම මඟින් මෙම සංවිධානය ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන අතර ප්‍රමුඛ සංවිධානයක් බවට පත්ව තිබේ.

### 3.9.12 සාරාංශය

- නායකත්වය හා නිලධාරී මණ්ඩලය කැපවීමෙන් සේවය සැලසීම.
- කෘෂිකාර්මික ණය, ඉතිරි කිරීම, සුබසාධනය වැනි සියළු කාර්යයන් සංවිධානය තුළ ක්‍රියාත්මකවීම.
- ප්‍රදේශයේ කෘ.ප.නි.ස. වරයා ද, සංවිධානයේ උපදේශකවරයෙකු වශයෙන් සංවිධානයෙන් උපරිම සේවයක් සලසාදීම සඳහා කැප වී ක්‍රියාකිරීම.
- සංවිධානය තමන් සතුය යන හැඟීම ගොවි සංවිධානයේ සාමාජිකයින් බහුතරයක් තුළ සිය ක්‍රියාකාරීත්වය තුළින් ප්‍රදර්ශනය කිරීම.
- සංවිධානයේ විනිවිදභාවය ඉහළින් පවත්වාගෙන යාම හා කාර්යයන් හා වගකීම් සාමාජිකයින් අතර බෙදා දී ඇති නිසා සාමාජිකයින් අතර විශ්වාසය තහවුරු වී පැවතීම
- ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන් සමඟ සමීප සබඳතාවක් පවත්වාගෙන යාම.
- මුදල් ගනුදෙනුවල විනිවිදභාවය උසස් ආකාරයකින් පවත්වාගෙනයාම.

## 3.10 සිද්ධි අධ්‍යයන 10: පාළුවැව ගොවි සංවිධානය - මිහින්තලේ – අනුරාධපුර දිස්ත්‍රික්කය

### 3.10.1 හැඳින්වීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලේ ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ තම්මැන්නාව තුලානේ පාළුවැව ගොවි සංවිධානය පිහිටුවා ඇත. තම්මැන්නාව තුලානට පාළුවැව හා තම්මැන්නාව යන ගම් දෙකක් අයත් අතර මෙම ගොවි සංවිධාන බල ප්‍රදේශයට මෙම ගම් දෙකම අයත් වේ. මෙම ගම්මාන දෙකෙ හි පවුල් 204ක් ජීවත් වන අතර මෙයින් පවුල් 124ක් ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා සිටී.

මෙම බල ප්‍රදේශයේ මහ වැව සහ කොහොඹගස් වැව යන වැව් දෙකක් යටතේ වී වගාව කරගෙන යන අතර 1986 වර්ෂය වන විට ගොවීන් පෞද්ගලිකව තීරණය කොට ගොවිතැන් කටයුතු ඉටු කරමින් තිබුණි. මෙය වගාවේ අස්වැන්න අඩුවීමටත් ගව හානි, යන්ත්‍ර සහ ශ්‍රමය සපයා ගැනීමේ ගැටලුවලටත් හේතු වී තිබුණි. මෙම තත්ත්වය වළක්වා ගොවීන් සාමූහිකව ගොවිතැන් කටයුතුවල යෙදීමේ අරමුණින් 1986 වර්ෂයේ දී පාළු වැව ගොවි සංවිධානය පිහිටුවන ලදී. ගොවි සංවිධානය පිහිටුවීමේ දී කෘෂිකර්ම උපදේශක හා ගොවිජන සංවර්ධන නිලධාරී මහතා විසින් ගොවීන් දැනුවත් කිරීම් කරන ලදී.

### 3.10.2 ගොවි සංවිධානය ආරම්භ කිරීමේ පරමාර්ථ

ගමේ සියලුම ගොවි මහතුන්ගේ එදිනෙදා අවශ්‍යතාවයන් සැපිරීමට සහාය දීම, ක්‍රමානුකූලව හා සාධාරණ ලෙස ජලය බෙදා දීම, වැඩි අස්වැන්නක් ලබාගැනීමට ගුණාත්මක බීජ සපයා දීම, ගොවීන් අතරේ එකමුතුභාවය ඇති කිරීම හා පොදුවේ ගමේ ජනතාවගේ දිළිඳු ආර්ථිකය නඟා සිටුවීමට සහාය දීම මෙම ගොවි සංවිධානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු කිහිපය අතර වේ.

එසේ වුව ද, මෙම ගොවි සංවිධානය 1986 වර්ෂයේ ආරම්භ කළ ද ලියාපදිංචි කර තිබුණේ 1991 වර්ෂයේ දී ය. එසේ වුවත්, ක්‍රියාත්මකවීමක් නොමැතිව නාමික සංවිධානයක් ලෙස පැවතුණි. ගොවීන් ගොවිතැනේ දී තනි තීරණ ගැනීමෙන් වළකා එකමුතු කිරීමේ වැදගත්කම තේරුම් ගෙන 2000 වර්ෂයේ දී ගොවි සංවිධානයට නව නිලධාරී මණ්ඩලයක් පත්කරන ලද අතර ඉන් පසුව ක්‍රියාත්මක භාවයට පත්විය.

### 3.10.3 ගොවි සංවිධානයේ සැකැස්ම

මෙම ගොවි සංවිධානය සැකසී ඇත්තේ සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ කාරකසභිකයින් හත් දෙනෙකුගෙනි. එයට අමතරව, යාය නියෝජිතයන් හතරදෙනෙකු පත්කර ගන්නා අතර ඔවුන් ද ගොවි සංවිධානයේ කාර්යයන් සඳහා ළඟින් සම්බන්ධ වේ.

### 3.10.4 ප්‍රදේශයේ කෘෂිකාර්මික පසුබිම

තම්මැන්නාව ග්‍රාම නිලධාරී වසමේ ප්‍රධාන වැව් දෙකක් යටතේ යල මහ දෙකන්නයේ වී වගා කිරීම ප්‍රධාන ම ජීවනෝපාය වෙයි. මෙම වැව් දෙක යටතේ කුඹුරු අක්කර 200ක් පමණ ඇත. මෙයට අමතරව, හේන් සහ උස් බිම් වගාව කරන අතර එහි දී ප්‍රධාන වගාව වන්නේ බඩ ඉරිඟු ය. ඊට අමතරව එළවළු, මුං, කව්පි යන බෝග වර්ග ද හේන්වල වගා කරයි.

### 3.10.5 ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව


තම්මැන්නාව ග්‍රාම නිලධාරී වසමේ පවුල් 204ක් ජීවත් වන අතර වර්තමානයේ දී 124 දෙනෙක් ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා සිටිති. මෙම සාමාජික වර්ධනය සිදුවුණු ආකාරය වගු අංක 3.10.1 යටතේ දැක් වේ.

**වගු අංක 3.10.1: පාළුවැව ගොවි සංවිධානයේ සාමාජික තත්ත්වය**

| වර්ෂය | සාමාජික සංඛ්‍යාව |
|---|---|
| 1998 | 90 |
| 1999 | 90 |
| 2000 | 93 |
| 2001 | 93 |
| 2002 | 93 |
| 2003 | 102 |
| 2004 | 104 |
| 2005 | 104 |
| 2006 | 104 |
| 2007 | 105 |
| 2008 | 110 |
| 2009 | 112 |
| 2009 | 124 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

ප්‍රස්තාර 3.10.1: සාමාජික තත්ත්වය




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.10.6 ගොවි සංවිධානයට අරමුදල් රැස්කිරීම

ගොවි සංවිධානයට අරමුදල් ලැබෙන මාර්ග 07කි. සාමාජික ගාස්තු, කොන්ත්‍රාත් කිරීමෙන් ලබන කොමිස් මුදල්, වැවේ නෙළුම් මල් බදු දීමෙන් ලබන ආදායම, වැවේ මාළු බදු දීමෙන් ලබන ආදායම, සලාරිස්වලින් ලබන ආදායම, පොහොර ණය සැපයීමෙන් ලබන ආදයම යන ඒවායි. වාර්ෂික සාමාජික ගාස්තුව රුපියල් 60කි. ගොවි සංවිධානයට ඇතුළත්වීමේ ගාස්තුව රුපියල් 100කි. ගොවි සංවිධානයේ අරමුදල් වර්ධනය වගු අංක 02 යටතේ ඉදිරිපත් කෙරේ.

වගු අංක 3.10.2: ගොවි සංවිධානයේ අරමුදල් වර්ධනය

| වර්ෂය | අරමුදල (රුපියල්) |
|---|---|
| 2007 | 9816.00 |
| 2008 | 19366.00 |
| 2009 | 234748.00 |
| 2010 | 248132.00 |
| 2011 | 228103.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.10.7 ගොවි සංවිධානයට නායකයන් පත්කිරීම

ගොවි සංවිධානයේ වාර්ෂික මහ සභා රැස්වීම් වසරකට වරක් පැවැත් වේ. මෙම මහ සභා රැස්වීමේ දී නව නායකයන් තෝරාපත් කර ගැනීමට සාමාජිකයන්ට අවස්ථාව සැලසේ. මෙම ගොවි සංවිධානයේ උප සභාපතිවරයා, සභාපති බවට පත්කරවීම ද උප ලේකම්වරයා, ලේකම් බවට පත්කිරීම ද සාමාන්‍ය පිළිවෙත වෙයි. එසේ වුවත්, සෑම වසරක ම මේ ආකාරයට සභාපති හා ලේකම් තනතුරු වෙනස් වී නැති බව හෙළි විය. 2000 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා තුන්වතාවක් පමණක් නිලධාරී මණ්ඩලය වෙනස් වී ඇත.

ගොවි ජනතාවට කැප වී සේවය කරන නිලධාරීන් වසර ගණනාවක් එකම තනතුරේ තබා ගැනීමට සාමාජිකයින් කටයුතු කොට තිබේ.

### 3.10.8 ගොවි සංවිධානයෙන් සාමාජිකයන්ට සිදුවන සේවය

**ණය සැපයීම**

බිත්තර වී මිලට ගැනීමට මුදල් හිඟ ගොවීන්ට ගොවි සංවිධානය ණය සපයයි. මෙහි අනෙක් අරමුණ සෑම යායක ම එකම වී වර්ගයක් වගා කිරීමයි. මෙම ණය සැපයීම මාස 06ක කාලයකට බලපාන අතර රුපියල් 100කට මාස 6ට රුපියල් 50ක් පොලී අය කරයි. පොහොර මිල දී ගැනීමේ දී මුදල් හිඟ ගොවීන්ට ණය සපයන අතර රුපියල් 100කට මාස 06කට රුපියල් 50ක් අය කරයි. මෙය ගොවීන්ට මහත් පහසුවක් වී තිබේ.

යාය නිෂ්පාදන සමිතිය යන නමින් සමිතියක් ගොවි සංවිධානයට පිටින් පිහිටා ඇත. මෙම සමිතිය තුළ චක්‍රීය ණය අරමුදලක් ක්‍රියාත්මක වේ. මෙම අරමුදල්වලින් ද බිත්තර වී, පොහොර යනාදිය මිලට ගැනීමට ණය සපයයි. මෙම අරමුදල ක්‍රියාත්මක කරන්නේ ගොවි සංවිධානයේ මැදිහත් වීමෙනි. චක්‍රීය ණය අරමුදල වගා කන්නයෙන් කන්නය පොලිය එකතුවීම නිසා සංවර්ධනය වෙයි.

### 3.10.9 කොන්ත්‍රාත් කිරීම

ගොවි සංවිධානයට ලැබෙන කොන්ත්‍රාත් 5% කොමිස් මුදලක් යටතේ ගමේ කොන්ත්‍රාත් කරනු ලබන වෙනත් පුද්ගලයෙකුට ලබාදෙයි. මෙම කොන්ත්‍රාත් කොමිස් මුදල්වලින් 4% ගොවි සංවිධානයට ලැබෙන අතර 1%ක් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයට ලබාදෙයි. වැව ප්‍රතිසංස්කරණය, ඇල-වේලිවල පැති බැම් ඉදිකිරීම, ගොඩනැඟිලි ඉදිකිරීම, කෘෂි මාර්ග ඉදිකිරීම යන කොන්ත්‍රාත් ඉටුකර ඇත. කොහොඹගස්වැව වසම සඳහා පොහොර ගබඩාවක් ඉදිකොට තිබේ.. කොන්ත්‍රාත් කිරීමේ දී ගොවි සංවිධාන නිලධාරීන් සෘජුව ම මැදිහත් වේ. කොන්ත්‍රාත් කාර්යයේ දී ගොවි සංවිධානය, කෘ.ප.නි.ස., ගොවිජන සංවර්ධන නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් යන නිලධාරීන් සමඟ සමීප සබඳතා පවත්වයි. අඩි 20x40 පොහොර ගබඩාවක් රුපියල් 850,000ක් වැයකොට කොහොඹගස්වැවට ලබා දී ඇත. වැව් බැම්ම ප්‍රතිසංස්කරණය, වැව හෑරීම සහ සොරොව් 02ක් සෑදීම සඳහා රුපියල් 886000ක් වැය වී තිබේ. මෙම කොන්ත්‍රාත් දෙකෙන් පමණක් රුපියල් 86800ක කොමිස් උපයාගෙන ඇත.

### 3.10.10 සහනාධාර පොහොර බෙදාහැරීම

සහනාධාර පොහොර ලබාගැනීමට අවශ්‍ය අනුමත කිරීම් ගොවීන් වෙනුවෙන් ගොවි සංවිධානය ඉටු කොට දෙන අතර ගමේ කුඹුරු ප්‍රමාණයට අවශ්‍ය පොහොර තොගය ගමට ප්‍රවාහනය කර ගමේ පොහොර ගබඩාවේ තැන්පත් කරයි. ඉන් පසු, අවශ්‍ය අවස්ථාවල දී ගොවීන්ට බෙදා දෙයි.

### 3.10.11 වැවේ ජලය බෙදාහැරීම

වැව් දෙක යටතේ යායන් හතරකට බෙදා යාය නියෝජිතවරුන් හතර දෙනෙකු පත් කොට තිබේ. මොවුන්ගේ කාර්යය සාධාරණව ජලය බෙදාහැරීම, වාරිමාර්ග පද්ධතිය රැක බලා ගැනීම වී වැපිරූ පසුව වැටවල් ඉදිකිරීම, පැල් සෑදීම හා පැල් රැකීමට ගොවීන් යොමු කිරීම,

රාත්‍රී පැල් රැකීමේ මුරක්‍රම ක්‍රියාත්මක කිරීම ආදියයි. එක් එක් ගොවියාගේ කුඹුරු අයිතිය මත එම එක් එක් ගොවියා පැලේ ගත කළ යුතු රාත්‍රී ගණන නියම කර, වන සතුන්ගෙන් කුඹුරු යාය ආරක්ෂා කරදීමේ ක්‍රියාමාර්ග මෙම යාය නියෝජිතයාගේ කාර්යය වේ. මෙම කාර්යයන් වෙනුවෙන් එක් එක් යාය නියෝජිතයාගේ ඉඩම් අයිතිය අනුව කුඹුරු අක්කරයකට රුපියල් 200 බැගින් කුඹුරු අක්කර ප්‍රමාණයට මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතු ය. මෙම සලාරිස් වශයෙන් එකතුවන මුදලින් අක්කර එකට රුපියල් 100 බැගින් යාය නියෝජිතයාට ගෙවීමක් කරයි. මෙය ඔහුගේ කාර්යයන් නිසි පරිදි ඉටුකිරීමට යාය නියෝජිතයා දිරිගන්වන දීමනාවකි.

### 3.10.12 ශ්‍රමදාන මාර්ගයෙන් කෘෂි යටිතල පහසුකම් දියුණු කිරීම

ගොවි සංවිධානයේ මූලිකත්වයෙන් ශ්‍රමදාන සංවිධානය කොට ගොවීන්ගේ මුදල් වැය නොකොට ශ්‍රමය මත කෘෂි යටිතල පහසුකම් සංවර්ධනය කරනු ලබයි. සැල්වීනියා ඉවත්කොට වැව් දෙක පිරිසිදු කිරීම, ඇළ වේලි කැඩී බිඳී ගිය ස්ථාන යළිත් පස්දමා ප්‍රතිසංස්කරණය කිරීම, කෘෂි මාර්ග බොරළු දමා ප්‍රතිසංස්කරණය කිරීම හා ශුද්ධ පවිත්‍ර කිරීම, ප්‍රජා ශාලාව අවට පිරිසිදු කිරීම, ගමේ බෝධිය අසල ප්‍රදේශය පිරිසිදු කිරීම ආදිය මේ යටතේ සිදු කරයි. ගමේ ප්‍රජා ශාලාව ගොඩනඟා ඇත්තේ ගොවීන්ගේ ශ්‍රමදානයෙනි.

### 3.10.13 පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

ගොවි සංවිධානය විසින් කෘෂිකර්ම උපදේශක, සත්ත්ව සංවර්ධන නිලධාරී යන තාක්ෂණ නිලධාරීන් සහභාගී කරගනිමින් තාක්ෂණික දැනුම ලබාදෙයි. මේ පුහුණු වැඩසටහන් යටතේ වී වගාව, ජල කළමනාකරණය, බඩ ඉරිඟු වගාව, වී වගාවේ යන්ත්‍ර භාවිතය, කිරි දෙනුන් පාලනය සහ එළවළු ඇති කිරීම යන ක්ෂේත්‍ර සම්බන්ධව තාක්ෂණික දැනුම ලබාදීමේ වැඩසටහන් 2010, 2011 යන වර්ෂවල දී සංවිධානය කරන ලදී. ප්‍රදේශයේ ගොවීන් මෙම ලබාගත්තා තාක්ෂණික දැනුම සිය ගොවිතැන් කටයුතුවල දී භාවිතයට ගන්නා අතර 2011/12 මාස් කන්නයේ කුඹුරු අක්කර එකක සාමාන්‍ය අස්වැන්න බුසල් 100-120 මට්ටමට වැඩි වී තිබේ. පවුල් 20ක් සම්බන්ධ වී, කිරි ගම්මාන වැඩසටහනක් ක්‍රියාත්මක වන අතර මාස දෙකකට වරක් දැනුවත් කිරීම් සිදු කරයි. මාස් කන්නයක දී ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළ බඩ ඉරිඟු අක්කර 400ක් පමණ වගා කරන අතර බඩ ඉරිඟු අක්කරයකින් කිලෝ ග්‍රෑම් 2400-2500ක් වැනි ඉහළ මට්ටමේ අස්වැන්නක් ලබාගනී.

### 3.10.14 වැවේ මිරිදිය මත්ස්‍ය වගාව

සෑම වසරක ම ගමේ මහ වැව ආශ්‍රිතව මිරිදිය මසුන් ඇති කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. මෙය ක්‍රියාත්මක කරන්නේ 75%ක් මිරිදිය ධීවර ආයතනයේ වියදමින් සහ 25%ක් ගොවි සංවිධානයේ මුදල් දායකත්වයෙනි. මාළු පැටවු 20,000ක්, 30,000ක් වැවට මුදාහරිනු ලබන අතර ධීවර සමිතියක් සංවිධානය කොට ඇති අතර එමගින් මාළු ඇල්ලීම සිදු කරනු ලබයි. මෙමගින් ගොවි සංවිධානයට ආදායමක් ද ලැබේ. එසේ වුව ද, මෙම ධීවර සමිතිය ක්‍රමවත් පරිදි ක්‍රියාත්මක නොවන අතර නීතිරීති කඩකරමින් අනවසර පුද්ගලයන් ද මාළු ඇල්ලීමට පැමිණෙන බව හෙළි විය.

### 3.10.15 කන්න රැස්වීම් සංවිධානය

බිම් සැකසීමේ මූලික කටයුතු ආරම්භ කර අස්වනු ගෙට ගැනීම දක්වා සිදු කරන සියළුම කාර්යයන් කන්න රැස්වීමේ දී සාකච්ඡා කොට එකඟතාව කට පැමිණෙයි. මෙම කන්න රැස්වීම් සංවිධානය කරන්නේ ගොවි සංවිධානය විසිනි. වනාන්තර සහ බඩවැටි පෑදීම, ඇලවේලි ශුද්ධ කිරීම, බින්තැඹුම, සීසෑම සිට බිම් සැකසීමේ සියළුම කාර්යයන්, වපුරන වී වර්ගය හා වපුරන දින වකවානු, වැටවල් බැඳීම්, පැල් ඉදිකිරීම් හා පැල් රැකීම් අස්වනු නෙළීම්, ගවයින් කුඹුරුවලින් ඉවත්කර ගැනීම් යනා දී කාර්යයන් සියල්ල මෙහි දී සාකච්ඡා කොට ඒ සම්බන්ධයෙන් නීතිරීති පනවා ගනී. මෙම එකඟතාවයකට පත් වූ නීතිමය රාමුවක් තුළ සිට පසු කාර්යයන් ක්‍රියාවට නැඟෙයි. පැලක රාත්‍රී මුරය පැහැර හැරියහොත් එම ගොවියා විසින් රුපියල් 5000ක් දඩයකට යටත්වීමට සිදුවෙයි. පැලක් ඉදිකිරීමට ගොවීන් හත්දෙනෙකුට පවරා තිබේ. එවැනි සාමූහිකව ඉදිකරන පැල් ගණනාවක් එක කුඹුරු යායක ඉදිකරයි. පැලක වටිනාකම රුපියල් 3500කි.

### 3.10.16 සංස්කෘතිකමය කාර්යයන්

සෑම වගා කන්නයක් අවසානයේ කිරි ඉතිරවීමේ මංගල්‍යය ඉතා උත්කර්ෂවත් ආකාරයට සංවිධානය කිරීම ගොවි සංවිධානයේ කාර්යයකි. මේ සඳහා ග්‍රාම නිලධාරී වසමේ බහුතර ගොවීන් සංඛ්‍යාවක් එකතු වේ. මෙය හැම වසර 7කට වරක් ගම් ආරක්ෂා කිරීමේ මංගල්‍යය නමින් දෙවියන් උදෙසා වූ කටයුත්තක් ගොවි සංවිධානය විසින් සංවිධානය කරයි. මෙය එක දිගට දින 7ක් තිස්සේ සිදු කෙරේ.

### 3.10.17 ගමේ සමගිය හා සාමූහික බව ආරක්ෂා කිරීම

ශ්‍රමදාන සංවිධානය කිරීම, ගොවි සංවිධානයේ නායකත්වයෙන් ස්වේච්ඡාවෙන් ප්‍රදේශයේ දියුණුවට අවශ්‍ය කාර්යයන් ඉටුකිරීම හා කෘෂිකාර්මික කටයුතුවල දී ජනතාව ඒකරාශී කිරීම නිසා ගමේ ජනතාවගේ සාමූහික බව රඳා පවත්වාගෙන යාමට හැකි වී තිබේ.

### 3.10.18 නිගමනය -සාරාංශය

කෘෂිකාර්මික කටයුතුවල පමණක් ම නියැළෙන ගොවි සාමාජිකයින්ගේ අවශ්‍යතා සපුරාලන උසස් ක්‍රියාකාරී ගොවි සංවිධානයක් ලෙස පාළුවැව ගොවි සංවිධානය හැඳින්වීමට පුළුවන. ගොවි සංවිධානයකින් ගොවීන්ට සැළසිය හැකි සේවාවන් අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් සැපිරීමට මෙම ගොවි සංවිධානය උත්සහ දරන බව පෙනේ.

- ගොවි ජනතාවගේ කෘෂිකාර්මික අවශ්‍යතාවයන් සැපිරීමට කැප වී ක්‍රියාකරයි.
- ගොවි සංවිධාන නීති රාමුව තුළ එහි ඇති ප්‍රතිපාදන අනුව ක්‍රියාත්මක වෙයි.
- ගොවි සංවිධානයට පැවරී ඇති නීතිරීති ප්‍රකාරව ක්‍රියාත්මකවීමට උත්සහ දරයි.
- නිලධාරී මණ්ඩලය වෙනස්වීම ද වසර කිහිපයකට වරක් සිදු වේ.
- නායකත්වය මෙන් ම සාමාජිකයන් ද ගොවි සංවිධානය පිළිබඳව කැපවීමකින් ක්‍රියාකරයි.
- ප්‍රදේශයේ පවත්නා සමිති අතුරින් ක්‍රියාකාරීත්වයෙන් ඉහළ සමිතියක් ලෙස ප්‍රසිද්ධියක් ලබා තිබේ.
- ගොවිජන සංවර්ධන නිලධාරී, කෘ.ප.නි.ස, පශු වෛද්‍ය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යන ආයතන සමඟ සමීප සබඳතාවයක් පවත්වාගෙන යයි.

## 3.11 සිද්ධි අධ්‍යයන 11 : කොටපොල උතුර මහසෙන් ගොවි සංවිධානය – කොටපොල , මාතර දිස්ත්‍රික්කය

### 3.11.1 හැඳින්වීම

මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රදේශයේ මෙම ගොවි සංවිධානය පිහිටුවා ඇති අතර මෙම ගොවි සංවිධානය ආරම්භ කොට තිබෙන්නේ 1994 වර්ෂයේ දී ය. ආරම්භක අවධියේ එතරම් ක්‍රියාත්මක ස්වරූපයක නොපැවති මෙම ගොවි සංවිධානය නාමික වශයෙන් පමණක් පැවතිණ. නැවතත් 2004 වර්ෂයේ දී නව සභාපතිවරයෙකු යටතේ ක්‍රියාත්මක වූ මහසෙන් ගොවි සංවිධානය නව සාමාජිකයින් බඳවා ගැනීම විධිමත් ආකාරයකින් සිදු කිරීම ආරම්භ කරන ලදී. මෙම ගොවි සංවිධානය තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් ලෙස කුඹුරු ඉඩම් නොමැති සාමාජිකයින් වැඩි පිරිසක් මෙම ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා ගෙන සිටීම දැක්විය හැකි ය. වර්තමානය වන විට මෙම ගොවි සංවිධානයේ සාමාජික සංඛ්‍යාව 77ක් වන අතර කුඹුරු හිමි සාමාජිකයින් සංඛ්‍යාව 22කි. ගොවි සංවිධානය පිහිටි බල ප්‍රදේශයට අයත් මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 18ක් පමණ වේ.

කොටපොල ප්‍රදේශයේ ජීවත්වන පිරිසෙන් 98%ක් පමණ තම කෘෂිකාර්මික කටයුතු ලෙස සිදු කරනු ලබන්නේ තේ වගාවයි. ඒ අනුව, ගොවි සංවිධානයේ සාමාජිකයින්ගෙන් වී වගාවේ නියැලෙන පිරිස 28%කි. මොවුන් ද තම පරිභෝජනය සඳහා පමණක් වී වගාව සිදු කරන අතර එක් අයෙකුට හිමි උපරිම කුඹුරු ප්‍රමාණය අක්කර 1 1/2ක් පමණ වේ.

### 3.11.2 ගොවි සංවිධානයේ ව්‍යුහය

මෙම ගොවි සංවිධානය තුළ මූලික වශයෙන් සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික හා කාරක සභිකයින් 6 දෙනෙකු නිලධාරී මණ්ඩලය ලෙස කටයුතු කරනු ලැබේ. මෙම නිලධාරී මණ්ඩලය විධිමත් ආකාරයකින් මහා සභා රැස්වීමක දී පත් කර ගනී. එසේ වුව ද, 2004 වර්ෂයේ සිටම සභාපති ධූරයේ වෙනසක් සිදු වී නොමැත. ඊට හේතුව ලෙස එම සභාපතිවරයා තම කාර්ය මැනවින් ඉටු කරනු ලබන බැවින් නැවත නැවතත් එම පුද්ගලයා ම සභාපතිත්වය සඳහා සාමාජිකයින් විසින්ම තෝරා පත් කරනු ලැබීම දැක්විය හැකි ය.

### 3.11.3 නායකත්වය

කොටපොල උතුර මහසෙන් ගොවි සංවිධානයේ වර්තමාන සභාපතිවරයා 2004 සිට මේ දක්වා එහි සභාපතිත්වය දරයි. නියැදියට අයත් සාමාජිකයන්ගෙන් 70%ක් පමණ නායකත්වය පිළිබඳව සෑහීමකට පත්වන අතර ඔහුගේ පත් කිරීම විධිමත් ස්වරූපයකින් මහා සභා රැස්වීමක දී සාමාජික කැමැත්ත මත ප්‍රජාතන්ත්‍රවාදීව සිදු කෙරේ. මෙම ගොවි සංවිධානය වර්තමානයේ පවතින තත්ත්වයට ගෙන ඒම සඳහා සභාපතිවරයාගේ ක්‍රියාකාරීත්වය කැපී පෙනේ. ඕනෑම සංවිධානයක නායකත්වය ක්‍රියාශීලී වන තරමටම එහි දියුණුව සලසා ගත හැකි ය. ඒ ආකාරයෙන් ම, මෙම ගොවි සංවිධානයේ නායකත්වය ද ක්‍රියාකාරීව මෙම කටයුත්තේ නියැලී ඇති ආකාරය ගොවි සංවිධාන සාමාජිකයන් සමඟ කළ සාකච්ඡාවල දී තහවුරු විය. විශේෂයෙන් ම, ගොවි සංවිධාන සභාපතිවරයා හා ලේකම්වරයා යන දෙදෙනාම ප්‍රදේශයේ වෙනත් සංවිධානවල නායකත්වය හොඳවා මනා

පළපුරුද්දක් ඇති අයයි. එමෙන් ම, මොවුන් දේශපාලන වශයෙන් ද ක්‍රියාකාරී අයයි. ඒවායින් ලද අත්දැකීම් තුළින් ගොවි සංවිධානය මෙහෙයවන ආකාරයක් දැකිය හැකි ය. නායකත්වයේ මඟපෙන්වීම යටතේ සාමාන්‍ය සාම්ප්‍රදායික ගොවි සංවිධානයකින් ඔබ්බට ගොස් වඩා නිර්මාණශීලීව තම කාර්යයන් සිදු කරගෙන යන ආකාරයක් මෙම අධ්‍යයනය තුළ දී දැකගත හැකි ය. මෙම ගොවි සංවිධානය අයත් කුඹුරු ප්‍රමාණය ඉතා සීමිත අතර එය අක්කර 18ක් තරම් වෙයි. ඒ අනුව, වී ගොවිතැන මූලික කොට ගත් ගොවි සංවිධානයක් ලෙස මෙම ගොවි සංවිධානය හැඳින්විය නො හැකි ය. මෙම ගොවි සංවිධානයේ සාමාජිකයින්ගෙන් වී ගොවිතැන් කරන ගොවින් පිරිස 28%කි. ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමට නම් කුඹුරු හිමියෙකු හෝ වී ගොවිතැන් කරන අයෙකුවීම අනිවාර්යය නොවේ.

ප්‍රදේශයේ බහුලව තේ වගාව සිදු කරන බැවින් ගොවි සංවිධානයේ බොහෝ සාමාජිකයෝ වී වගාවේ නො යෙදෙන ගොවීහු ය. නායකත්වය විසින් හඳුන්වා දී ඇති සුබසාධන කම්ටුවට හේතුවෙන් එහි ප්‍රතිලාභ අපේක්ෂාවෙන් මෙහි සාමාජිකත්වය ගත් සාමාජික පිරිසක් සිටිති. මෙම ගොවි සංවිධානයේ සාමාජිකයින්ගේ ප්‍රධාන ජීවනෝපායය මාර්ගය තේ වගාවයි. තේ වගාව හා බැඳුණු මහා පරිමාණයේ සමූපකාර සමිතියක් මේ ප්‍රදේශයේ ක්‍රියාත්මක වේ. ගොවි සංවිධානයේ සභාපතිවරයා මෙම සමිතියේ උප සභාපති වශයෙන් ද කටයුතු කරයි. එහි දී, ඔහු ලැබූ අත්දැකීම් හා පළපුරුද්ද මෙම ගොවි සංවිධානයේ දියුණුව සඳහා යොදා ගෙන තිබේ. ඒ අනුව, ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වාදීම, ළමා සමාජයක් පිහිටුවීම වැනි නවාංග සභාපතිවරයා ගොවි සංවිධානයට හඳුන්වා දී ඇත.

### 3.11.4 සාමාජිකත්වය

ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අයදුම්පතක් මඟින් ඊට අයදුම් කළ යුතු අතර ඇතුළත්වීමේ ගාස්තුව වශයෙන් රු. 600ක පමණ මුදලක් අය කෙරේ. ගොවි සංවිධානයේ සාමාජික ගාස්තුව එක් අයෙකුට මසකට රු. 30ක් වේ.

කොටපොළ මහසෙන් ගොවි සංවිධානය තුළ තවත් සංවිධාන 2ක් ක්‍රියාත්මක වීම ද සුවිශේෂී තත්ත්වයකි. එනම්, ගොවි සංවිධාන සාමාජිකයින්ගේ දූ දරුවන් වෙනුවෙන් ළමා සමාජයක් පිහිටුවා ඇති අතර ඒ ළමා සමාජය තුළ ද සභාපති, උප සභාපති, ලේකම්, භාණ්ඩාගාරික හා කාරක සභිකයින් 6 දෙනෙක් යනා දී වශයෙන් නිලධාරී මඩුල්ලක් ළමයින්ගේ කැමැත්තෙන්ම තෝරා ගෙන සිටී. මෙය ඉතා මෑතක දී ආරම්භ කරන ලද වැඩසටහනකි. මෙහි මූලික පරමාර්ථය වන්නේ දෙවන පෙළ නායකත්වය ගොඩනැඟීම මෙන් ම ළමයින්ගේ කුසලතාවයන් වර්ධනය කිරීමයි. ඊට අමතරව, ගොවි සංවිධානය තුළ වෙනම සුබසාධන අනු කම්ටුවක් ද ක්‍රියාත්මක වේ. මේ අනු කම්ටුව මඟින් ගොවි සංවිධානයෙන් අපේක්ෂිත අරමුණු අභිබවා යමින් සිය සමාජිකයින්ට සුබසාධන සේවාවන් සපයයි. ගොවි සංවිධානය තුළ වී ගොවිතැනේ නියැලෙන සාමාජකයින්ට අමතරව වෙනත් අය ද ගොවි සංවිධානයේ සාමාජිකත්වය ගැනීමට මූලිකම හේතුව ලෙස මෙම සුබ සාධන අනු කම්ටුව දැක්විය හැකි ය. එහි සාමාජිකත්වය ලබාගැනීම සඳහා මසකට රු. 50ක මුදලක් සාමාජිකයකු ගෙවිය යුතු ය. ගොවි සංවිධානය යටතේ සාමාජිකයින් වෙනුවෙන් ඉටු කරනු ලබන සියළුම සුබසාධන සේවාවන් සුබ සාධන අනු කම්ටුව යටතේ සිදු කෙරේ. සුබ සාධන අනු කම්ටුවේ සාමාජිකත්වය ලැබීමට නම්,

- කොටපොල ග්‍රාම සේවා වසම තුළ ස්ථිර පදිංචිකරුවන් වීම
- වයස අවුරුදු 18 ට වැඩිවීම
- කොටපොල උතුර මහසෙන් ගොවි සංවිධානයේ සාමාජිකයකු වීම

යන කරුණු සම්පූර්ණ කළ යුතු ය. අනු කමිටුවේ නිලධාරීන් ලෙස ගොවි සංවිධානයේ නිලධාරීන්ම කටයුතු කරන අතර ඊට අමතරව කාර්යයන් පහසුකර ගැනීම සඳහා එම ග්‍රාමසේවා වසමේ විවිධ ප්‍රදේශ නියෝජනය වන පරිදි ක්‍රියාකාරී සාමාජිකයින් දස දෙනෙකු පත්කර ගෙන තිබේ. ඊට අමතරව, මෙම වසමට අයත් පන්සලේ ස්වාමීන් වහන්සේ පැවිදි අනුශාසක වශයෙන් කටයුතු කරනු ලැබේ. අරමුදල් රැස්කර ගැනීමේ දී ඇතුළත්වීමේ ගාස්තු, සාමාජික මුදල්, ආධාර හා පරිත්‍යාග, නාට්‍ය සංදර්ශන පෙන්වීමෙන් ලොතරැයි දිනුම් ඇදීම් මගින් යනා දී වශයෙන් අරමුදල් උපයා ගනී. එමෙන් ම, ගොවි සංවිධානය සතු වත්කම් (එනම් ටෙන්ට්, පුටු) බද්දීමෙන් හා කොන්ත්‍රාත්වලින් උපයා ගන්නා මුදල් ද යොදා ගනී. මෙම සුබ සාධන අනු කමිටුවෙන් ගෙවන රු. 2500ට වඩා වැඩි සෑම ගෙවීමක දී ම කාරක සභාවේ අනුමැතිය ලබාගත යුතු වේ.

ගොවි සංවිධානයේ රැස්වීම් සෑම මසක ම පැවැත්වෙන අතර මාස 3කට වරක් මහා සභා රැස්වීම් පැවැත් වේ. සෑම වසරක ම ජනවාරි මාසයේ දී සාංවත්සරික මහා සභාව රැස් වී නව නිලධාරී මණ්ඩලයක් පත් කර ගනී. යම් කාරණාවක් සම්බන්ධයෙන් මහා සභා වාරයක් පැවැත්විය යුතු ය යන්න කාරක සභාව මගින් යෝජනා කළහොත් එම යෝජනා ඉදිරිපත් වී සති 2ක් ඇතුළත ගොවි සංවිධානයේ ලේකම්තුමා විසින් මහා සභා වාරයක් කැඳවිය යුතු ය. සුබ සාධන අනු කමිටුව ද, සෑම මසක ම රැස්වෙන අතර එහි දී ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කෙරේ. සාංවත්සරික මහා සභා රැස්වීමට කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරයා හා ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරීවරයා ද සහභාගී වේ.

**3.11.5 සුබ සාධන සේවාවන්**

ගොවි සංවිධාන මගින් එහි සාමාජිකයින්ට සුබ සාධන සේවා රැසක් ලබා දේ එනම්,

- සාමාජික අවමංගල්‍යයක දී රු. 5000ක මුදලක් ලබාදෙන අතර සාමාජිකයෙකුගේ යැපෙන්නෙකුගේ මරණයක දී රු. 4000ක මුදලක් ලබා දේ.
- සාමාජිකයින්ගේ දරුවකු 5 වසර ශිෂ්‍යත්වයෙන් සමත් වූවහොත් මසකට රු. 2000ක පමණ මුදලක් උසස් පෙළ දක්වා ලබා දේ. මේ සඳහා ප්‍රදේශයේ දානපතීන්ගේ උදව් උපකාර ද ලබා ගනී.
- සාමාජික අවමංගල්‍යයක දී පුටු, සෙවිලි ගෙය, පිඟන් ලබාදීම හා ශ්‍රමයෙන් දායකවීම ද සිදු කරයි.

දැනට ගොවි සංවිධානය හරහා දිවි නැඟුම වැනි වැඩසටහන් සාර්ථකව සිදු කෙරෙන අතර ගොවීන්ට මේ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම ද සිදු කෙරේ. ඊට අමතරව, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන වැඩසටහන් පැවැත්වීම, වගා නො කරන ඉඩම් පිළිබඳව තොරතුරු එක් රැස් කර ඒ පිළිබඳව ගොවීන් දැනුවත් කර වගා කිරීම සඳහා දිරිමත් කිරීම, එමෙන් ම, තියර වගාවට පුහුණු කිරීම, කන්නයට අවශ්‍ය බිත්තර වී ලබාදීම, ඇලවේලි සුද්ධ කරවීම යනාදිය මෙහි දී ගොවි සංවිධානය මගින් සිදු කෙරෙන කාර්යයන් අතර සුවිශේෂී වේ. ගොවිතැන් කටයුතුවල නියැළීමේ දී ගොවීන්ට ලෙඩ රෝගවලින් ආරක්ෂාවීමට අවශ්‍ය දැනුම ලබාදීම (මී උණ වැනි රෝග සඳහා) යනාදිය ද මෙහි දී කෙරෙන වැඩසටහන් අතර ප්‍රධාන තැනක්

ගන්නා අතර ප්‍රදේශයේ පොදු කටයුතු සඳහා ද ගොවි සංවිධානයේ දායකත්වය නිරන්තරයෙන් ම ලබාදීමට කටයුතු කරයි. මෙහි දී, ශ්‍රමදාන මඟින් අබලන් මාර්ග පිළිසකර කිරීම වසමට අයත් පවුල් සියල්ලම දායක කරගනිමින් ආගමික කටයුතුවල නියැලීම, ප්‍රදේශයේ ජනතාව පීඩා විඳින පොදු ගැටලුවල දී පූර්ණ දායකත්වය ලබාදීම දැනට ගොවි සංවිධානය මඟින් සිදු කෙරන කටයුතුවලට අන්තර්ගත ය.

ගොවි සංවිධානය සතුව පවත්නා මානව සම්පතට අමතරව හඳුනා ගන්නා ලද භෞතික සම්පත් වශයෙන් පෙත්වා දිය හැක්කේ පුටු 50ක්, ටකරන් මඩුවක්, බැනර්, පිඟන්, තෙල් ඉසින යන්ත්‍ර ආදියයි. මෙම සම්පත් ගොවියාගේ ප්‍රයෝජනය සඳහා ගොවීන්ට සහනදායී මිලකට ලබාදෙන අතරම මේවා පිටතට ලබාදීමෙන් නො එසේ නම් සාමාජිකයන් නොවන අයට ලබාදීමෙන් ද සංවිධානය සඳහා අමතර මුදලක් ලබා ගනී. මෙය සංවිධානයෙ හි අරමුදල් වර්ධනය කර ගැනීමේ තවත් ක්‍රමයකි.

සුවිශේෂී වශයෙන් සත්ත්ව පාලනය පිළිබඳ වැඩසටහන් මෙමඟින් දියත් කිරීමක් නො කෙරෙන අතර ගොඩ ඉඩම් වගාවේ දී ගොවියාට ප්‍රදේශය තුළ බහුලව වගා කෙරෙන මෙන් ම වගා කළ හැකි බෝග වගාවන්ට උනන්දු කරවීම පෙන්නුම් කෙරේ. පොල් පැළ, ගම්මිරිස් පැළ යනා දී වශයෙන් සුළු අපනයන බෝගවලට අදාළ පැළ වර්ග ලබාදීම ද වැඩි වශයෙන් සිදු කෙරේ.

මේ වන විට ගොවි සංවිධානය හැරුණු විට ප්‍රදේශය තුළ ක්‍රියාකාරී මට්ටමේ පවතින වෙනත් සංවිධාන වෙත අවධානය යොමු වීමේ දී තේ වගා කරන්නන්ගේ සමිතිය ක්‍රියාකාරී මට්ටමක පවතී. මේ නිසා, ප්‍රජාවේ අවශ්‍යතාවයන් හා ප්‍රජා පාදක කටයුතු විශාල ප්‍රමාණයක් මේ හරහා සිදු කෙරේ. මෙයට අමතරව,

- කොටපොල විවිධ සේවා සමූපකාර සමිතිය
- සණස ණය දෙන සමිතිය
- ජයන්ති සුබ සාධක සමිතිය
- කාන්තා සමිතිය
- ග්‍රාම සංවර්ධන සමිතිය
- ප්‍රජා මූල සංවිධානය

යනාදිය ක්‍රියාත්මක මට්ටමේ පවතින අතර ප්‍රජා මූල සංවිධානය, සණස ණය දෙන සමිතිය මෙහි දී ක්‍රියාකාරී මට්ටමක පවතී.


ප්‍රදේශයේ සමාජ - ආර්ථික පරිසරය අධ්‍යයනය කිරීමේ දී ආර්ථික කටයුතුවල දී වී ගොවිතැන ආශ්‍රිත කටයුතු සඳහා ප්‍රධාන ස්ථානයක් හිමි නොවන අතර වගාවන් අතර ප්‍රමුඛත්වය හිමි වී තිබෙන්නේ තේ වගාව සඳහා ය. මේ අනුව, ගොවීන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය තේ වගාව වී තිබේ. එහි දී, වී වගාව සිදු කෙරෙන්නේ තම පරිභෝජනය සඳහා පමණි.

### වගු අංක 3.11.1: ගොවි සංවිධානය තුළ අරමුදල් වර්ධනය

| වර්ෂය | අරමුදල (රු) |
|---|---|
| 2002 | 2522.12 |
| 2003 | 63226.16 |
| 2004 | 64144.00 |
| 2005 | 110525.86 |
| 2006 | 116741.51 |
| 2007 | 126598.85 |
| 2008 | 171107.49 |
| 2009 | 206874.38 |
| 2010 | 215917.67 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### ප්‍රස්තාර සටහන් අංක 3.11.1: ගොවි සංවිධානය තුළ අරමුදල් වර්ධනය





මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### වගු අංක 3.11.2: ගොවි සංවිධානය තුළ සුභ සාධක අරමුදල් වර්ධනය

| වර්ෂය | අරමුදල (රු) |
|---|---|
| 2008-2009 | 25620.00 |
| 2009-2010 | 65316.00 |
| 2010-2011 | 94871.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

ප්‍රස්තාර සටහන් අංක 3.11.2: ගොවි සංවිධානය තුළ සුභ සාධක අරමුදල් වර්ධනය




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

## 3.12 සිද්ධි අධ්‍යයනය 12: දැරංගල ගොවි සංවිධානය – දැරංගල මාතර දිස්ත්‍රික්කය

### 3.12.1 හැඳින්වීම

දැරංගල ජනහිත ගොවි සංවිධානය, මාතර දිස්ත්‍රික්කයට අයත් ගොවීන් විසින්, ගොවීන් උදෙසා පිහිටුවා ගත් සංවිධානයක් ලෙස හැඳින්විය හැකි ය. මෙම සංවිධානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ලෙස ප්‍රදේශයේ වී වගා කටයුතු සිදු කිරීමේ දී ගොවීන්ට මුහුණපෑමට සිදුවන ප්‍රශ්න හා ගැටලු සාකච්ජා කොට ඒවාට සාමූහික විසඳුම් ලබා ගැනීම බව හෙළි විය. මෙම සංවිධානය 1990 වර්ෂයේ ජූනි මස 21 වන දින ආරම්භ වී ඇති අතර වර්තමානයේ සාමාජිකයන් 212කුගෙන් පමණ සමන්විත ය. එසේ වුව ද, එහි ක්‍රියාකාරී සාමාජිකයන් ලෙස වර්තමානයේ සංවිධානය තුළ රැඳී සිටින්නේ 127ක වූ සාමාජිකයන් පිරිසක් වේ. මෙම සාමාජිකයන්ගෙන් 99%ක් ම පමණ පූර්ණ කාලීන වී ගොවීන් නොවේ. ඔවුන් සිය ප්‍රධාන ආර්ථික බෝගය ලෙස තේ වගාව සිදුකරන අතර සිය ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා මෙන් ම සාම්ප්‍රදායික ලෙස සිදු කරන කාර්යයක් ලෙස පමණක් වී ගොවිතැන සිදු කරන බැව් හඳුනාගත හැකි වූ සුවිශේෂී ලක්ෂණයක් වේ. ප්‍රධාන වශයෙන් ම, වගාව අහස්දිය මත රැඳී පවතින අතර වගාවේ සාර්ථක, අසාර්ථකභාවය ප්‍රදේශයට ලැබෙන්නා වූ වර්ෂාපතන ප්‍රමාණය මත රැඳී පවතී.

### 3.12.2 ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ආර්ථික පසුබිම

මෙම ගොවි සංවිධානයට අයත් බල ප්‍රදේශය සමන්විත වී ඇත්තේ 1956 වර්ෂයේ දී රජයෙන් ලබාදුන් තේ වගා ඉඩම් සහිත ප්‍රදේශයන් ය. මෙහි අක්කර 2ක් ගොඩ ඉඩම් ලෙස තේ වගාවටත්, එයින් 1/4ක භූමි ප්‍රදේශයක් සිය නිවාස සාදා ගැනීමටත් ලබා දී ඇත. මෙම ප්‍රදේශයේ පවතින කුඹුරු සියල්ල ම මෙන් ආරම්භයේ දී අනවසරයෙන් ලබා ගත් කුඹුරු ලෙස සැලකිය හැකි අතර වර්තමානය වන විට ඒවාට නීත්‍යානුකූල හිමිකම් ලැබී ඇති බව සඳහන් විය. ප්‍රදේශයේ ජීවත් වන සියලුම පවුල් පාහේ සිය ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස තේ වගාවට යොමු වී සිටින ආකාරය නිරීක්ෂණය කළ හැකි විය. වෙනත් රජයේ හෝ පෞද්ගලික අංශයේ හෝ තමාගේ ම ශිල්පීය හෝ ස්වයං රැකියාවල යෙදෙන පිරිස් ද ප්‍රදේශය

තුළ දැකිය හැකි ය. වී ගොවිතැන, ආර්ථික බෝගයක් ලෙස නොව බොහෝ විට ආහාර බෝගයක් ලෙස වගා කරන නිසා ඒ සඳහා ගොවීන් තුළ උදාසීනත්වයක් පවතින බව දැකිය හැකි ය. බොහෝ පිරිස් විවේකය මදකම නිසාම ඇතැම් විට කන්නයක් හෝ දෙකක් සිය කුඹුරු අත්හැර දමා තිබී නැවත හැකි වූ විට වගා කරන ආකාරයක් දැකිය හැකි වේ. එමෙන් ම, එසේ ගොවීන් තුළ පවතින මන්දෝත්සාහී ස්වභාවය නිසාම ඔවුන් ලබා ගන්නා අස්වැන්න ඉතා අවම ප්‍රමාණයක පැවතීම දැකිය හැකි ය. සාමාන්‍යයෙන් ඔවුන් සඳහන් කළේ වී කුරුණියක් සඳහා (කි.ග්‍රෑ. 3ක් සඳහා) ලබා ගත හැකි අස්වැන්න වන්නේ කි.ග්‍රෑ. 32ක් පමණ වන බවයි.

### 3.12.3 සාමාජික මුදල් අයකර ගැනීම

ප්‍රදේශය තුළ පවතින මෙම පසුබිම, ස්වභාවය, ගොවි සංවිධානයේ ක්‍රියාකාරීත්වයට ද බලපෑම් සිදු කරන බැව් දැකිය හැකි වේ. බොහෝ දුරට සාමාජිකයින් ගොවි සංවිධානය තුළ ඒකරාශී වී සිටීමේ ප්‍රධාන අරමුණ ලෙස හඳුනාගත හැකි වන්නේ පොහොර සහනාධාරය ලබා ගැනීම යි. ඒ සඳහා ඔවුන් ඒකරාශී වන විට ඔවුන්ගේ සාමාජික මුදල් අයකර ගැනීම ද සිදු කරයි. එසේ නොවුනහොත් එම මුදල් අය කර ගැනීමේ දී අපහසුවක් ඇති වන බැව් දැනගන්නට ලැබුණු කරුණකි වේ. ගොවි සංවිධානයේ සාමාජික මුදල් ලෙස මසකට රු. 10ක් අය කරනු ලබන අතර එය එකවර වාර්ෂික මුදල් ලෙස රු. 120ක් වශයෙන් අයකර ගනු ලැබේ. ගොවි සංවිධානයට ඇතුළත්වීමේ දී ගාස්තුවක් අය කරගනු නො ලැබේ.

### 3.12.4 නිලධාරීන් තෝරාගැනීම

ගොවි සංවිධානයේ නායකත්වය වෙනස්වීමක් 1999 වර්ෂයේ සිට ම දැකිය නො හැකි වී ඇති අතර භාණ්ඩාගාරික පමණක් තෙවරක් පමණ වෙනස් වී ඇත. මෙයට හේතු වශයෙන් මෙම සංවිධානයේ වගකීම් භාර ගැනීම සඳහා වෙනත් කිසිවකු ඉදිරිපත් නොවන ආකාරයක් දැකිය හැකි වේ. ක්‍රම ක්‍රමයෙන් ගොඩ නැඟෙන්නා වූ පසු පෙළ නායකත්වයක් සැකසීමක් ගොවි සංවිධානය තුළ සිදු නොවෙන අතර ඒ සඳහා ඉදිරි සැලසුම් හෝ ඉදිරි වැඩපිළිවෙළක් සකස් කිරීමට ද සූදානමක් ගොවි සංවිධානය තුළ දැකිය නො හැකි වේ. තරුණ පෙළ ඉහත ගොවි සංවිධානය වෙත ඒකරාශී වීම ඉතාමත් අවම මට්ටමක පවතින අතර තරුණ පිරිස වෙනත් රැකියාවන් සඳහා යොමු වී සිටීම ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැකි වේ.

### 3.12.5 ගොවි සංවිධානයේ ක්‍රියාකාරීත්වය

ගොවි සංවිධානයේ ක්‍රියාකාරීත්වය හා කාර්යභාරය පිළිබඳව සලකා බැලීමේ දී ඔවුන් සිය ප්‍රධාන කාර්යයන් ලෙස පොහොර සහනාධාරය ලබා ගැනීමත්, කන්න රැස්වීම් පැවැත්වීමත්, කොන්ත්‍රාත් සිදු කිරීමත් යන කාර්යයන් සඳහා කොටු වී සිටින ආකාරයක් දැකිය හැකි වේ. සහනාධාර පොහොර තොගය ගොවි සංවිධානය විසින් ගම වෙත ගෙනවුත් දීම ගොවීන්ට මහත් සහනයක් වී තිබේ. එයට හේතුව, විශාල දුර ප්‍රමාණයක් හා ප්‍රදේශයේ පවතින මාර්ග අපහසුකම් නිසා ප්‍රවාහන අපහසුකම්වලට ගොවීන් මුහුණ පා සිටින නිසාවෙනි. පොහොර ලබාදීමට පෙර ගොවීන්ගෙන් ඒ සඳහා මුදල් එකතු කර පොහොර තොගයම රැගෙනවිත් ගොවීන් වෙත ලබාදීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ. ගොවි ප්‍රජාව වෙත කෘෂි දැනුම සම්ප්‍රේෂණය කිරීමේ කිසිදු වැඩපිළිවෙළක් මේ වන තෙක් ක්‍රියාත්මක නොවුණු බව දැකිය හැකි ය.

කන්න රැස්වීම් පැවැත්වීම සෑම කන්නයක් ආරම්භයේ දීම සිදු කරන අතර එහි දී කන්නය වගා කිරීම සඳහා අවශ්‍ය වන තීන්දු තීරණ සාකච්ඡා කිරීම සිදු වේ. එහි දී, කාලවකවානු නිර්ණය කිරීම, රෝග බෝවීම අවම වන ආකාරයට වගා කටයුතු සිදු කර ගැනීම වැනි කටයුතු සිදු කෙරේ. එමෙන් ම, බිත්තර වී අවශ්‍ය ගොවීන් වේ නම් ගොවි ජන සේවා මධ්‍යස්ථානය හරහා ඔවුන්ට බිත්තර වී ලබාදීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම ද ගොවි සංවිධානයේ කන්න රැස්වීමේ දී සිදු වේ. එයට අමතරව, වෙනත් ආරක්ෂණ උපදෙස් ලබාදීම හෝ විශේෂ නිලධාරීන් ගම වෙත ගෙනවුත් ඔවුන්ට අවශ්‍ය උපදෙස් සැපයීමක් සිදු නොවේ. කන්න රැස්වීම් සඳහා බොහෝ විට කෘ.ප.නි.ස. නිලධාරි හා ඇතැම්විට ප්‍රාදේශීය නිලධාරී මහතා පමණක් සම්බන්ධ වීම දැකිය හැකි වේ.

ගොවි සංවිධානය බොහෝ විට කොන්ත්‍රාත් සඳහා මැදිහත් වී කටයුතු සිදු කරන ආකාරයක් දැකිය හැකි වේ. එහි දී, පාරවල් කැපීම, බෝක්කු තැනීම. පාරවල් කොන්ක්‍රීට් කිරීම වැනි කටයුතු ප්‍රධාන වේ. මෙහි දී, කොන්ත්‍රාත් අතුරින් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් ගමේ ප්‍රජාවගේ ශ්‍රම දායකත්වය මත සිදු කරන අතර ඉතා වැඩි ප්‍රමාණයක් අනු කොන්ත්‍රාත් ලෙස භාරදීමක් දැකිය හැකි වේ. එසේ ලබාගත් කොන්ත්‍රාත්වලින් ලැබෙන මුදල්, අරමුදල් වර්ධනය සඳහා යොදා ගැනීමක් දැකිය හැකි ය. ගොවි සංවිධානය තුළ සාමාජික මුදල්වලට අමතරව අරමුදල් වර්ධනය වන එකම ආකාරය ලෙස කොන්ත්‍රාත් මුදල් ලැබීම සඳහන් කළ හැකි ය. දැනට ගොවි සංවිධානයේ අරමුදල් ලෙස රු. 159,612.92ක මුදලක් පවතින අතර එය නැවත ආයෝජනයක් ලෙස හෝ ගොවීන්ට ප්‍රතිලාභ ලබාදීමට යෙදවීමේ ක්‍රමවේදයක් හඳුනා ගත නොහැකි වේ. එම මුදල් ඉදිරියේ දී ගොවි සංවිධානය සඳහා පොහොර ගබඩාවක් තැනීම සඳහා යෙදවීමේ බලපොරොත්තුවක් එහි නිලධාරී මණ්ඩලය තුළ පවතී. එසේ වුව ද, කොන්ත්‍රාත් කටයුතු පිළිබඳ සංවිධානයේ සාමාජිකයන් බොහෝ දෙනෙකු තුළ කිසිදු අවබෝධයක් නොමැති බව පැහැදිලි වන කරුණක් වන අතර කොන්ත්‍රාත් ලබා ගැනීමේ දී නිලධාරී පිරිස හැර අනෙකුත් සාමාජිකයන් දැනුවත් කිරීමක් ද කිසිවිටකත් සිදු නොවන බව නිරීක්ෂණය කළ හැකි වූ කරුණකි. එමෙන් ම, ගොවි සංවිධාන අරමුදල් ප්‍රමාණය හෝ ඒ සඳහා පසු විපරමක් හෝ සාමාජිකයන් තුළ ඒවා පිළිබඳව අවබෝධයක් ද නොමැති බව දැකිය හැකි වූ තවත් කරුණක් වේ.

ගොවි සංවිධානය විසින් සිදු කරන අනෙකුත් කටයුතු ලෙස ඇතැම් විට ගොවීන්ට බීජ (එළවළු) ලබාදීම හා ගෙවතු වගා සඳහා උපදෙස් ලබාදීම ද සිදු වේ. එසේ වුව ද, එය ක්‍රියාකාරී මට්ටමින් සිදු නොවන අතර කෘ.ප.නි.ස. නිලධාරී සිය රාජකාරී කටයුතු සිදු කිරීම සඳහා ඇතැම් විට ගොවි සංවිධානයේ මැදිහත්වීම් ද ලබාගන්නා ආකාරය දැකිය හැකි විය.

### 3.12.6 රැස්වීම් පැවැත්වීම

ගොවි සංවිධානය වර්ෂයකට වරක් මහ සභා රැස්වීම් පවත්වනු ලැබේ. කාරක සභාව අවශ්‍ය වූ විට පමණක් රැස්වන ආකාරයක් දැකිය හැකි ය. එයට අමතරව, කන්න රැස්වීම් සංවිධානය කිරීම දැකිය හැකි වේ. ගොවි සංවිධානය මැදිහත් වී සමාජ සුබ සාධන කටයුතු සිදු කිරීමක් සිදු නොවන අතර ඒ සඳහා ප්‍රදේශය තුළ පවතින අනෙකුත් සංවිධාන වෙත ගොවියා යොමු වීමක් දැකිය හැකි ය. ඒ අතර සණස, කුඩා තේ වතු සමිතිය හඳුනාගත හැකි වේ. එසේ වුව ද, ඒවා ද ඉතා ක්‍රියාකාරී මට්ටමේ පවතින සංවිධාන නොවන බව බොහෝ දෙනාගේ පොදු මතය වේ. ජන හිත ගොවි සංවිධානයේ සභාපතිතුමා වෙනත් සංවිධානවල ද නායකත්වය දරන ආකාරයක් දැකිය හැකි වේ. එමෙන් ම, ලේකම්තුමා මෙන් ම භාණ්ඩාගාරික ද වෙනත් සමාජ සේවා කටයුතුවල නියැළෙන ආකාරයක් දැකිය හැකි වේ.

එම අත්දැකීම් හා පළපුරුද්ද ඔවුන් මෙම සංවිධානය වෙත ද යොදවන ආකාරයක් දැකිය හැකි වන අතර නිවැරදිව යොදවන්නේ නම් මෙම සංවිධානය තවදුරටත් සාර්ථකත්වය කරා යොමු කළ හැකි වේ.

අවසාන වශයෙන් සලකා බලන කළ, ඉහත අධ්‍යයනයට ලක් වූ ගොවි සංවිධානය ඉතා සාර්ථක ගොවි සංවිධාන ගණයට හෝ ඉතා අසාර්ථක ගොවි සංවිධාන ගණයෙහි ලා වර්ගීකරණය කළ නොහැකි සාමාන්‍ය ක්‍රියාකාරී ස්වභාවයකින් යුතු ගොවි සංවිධානයක් ලෙස සැලකිය හැකි ය. මෙම ගොවි සංවිධානය වර්තමානයේ සාම්ප්‍රදායික ලෙස ඉටු කරන පොහොර සහනාධාරය ලබාදීම හා කොන්ත්‍රාත් භාර ගැනීම යන ක්‍රියාකාරීත්වයක් සඳහා පමණක් මූලික වශයෙන් පවත්වාගෙන යන ආකාරයක් දැකිය හැකි වේ. කෙසේ වූව ද, නිවැරදි මඟ පෙන්වීමක්, හොඳ අධීක්ෂණයක් හා පැහැදිළි අරමුණු අන්තර්ගත වූයේ නම් දැරංගල ජන හිත ගොවි සංවිධානයට සාර්ථකත්වයේ මාවත කරා ගමන් කිරීමට හැකියාව ලැබේ.

### 3.12.7 නායකත්වය

ඕනෑම රටක ආයතනයක හෝ සංවිධානයක සාර්ථකත්වයට සෘජුව ම බලපාන සාධකයක් ලෙස නායකත්වය හැඳින්විය හැකි ය. ඒ අනුව, ගොවි සංවිධානවල සාර්ථක හා අසාර්ථකභාවයට සෘජුව ම මෙය බලපාන බව දැක්විය හැකි වේ. දැරංගල ජනහිත ගොවි සංවිධානය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී කරන ලද සාකච්ඡාවල දී 96%ක ප්‍රතිශතයක් ප්‍රකාශ කොට තිබෙන්නේ සිය නායකත්වය පිළිබඳව සෑහීමකට පත්වන බවකි. තවත් 4%ක ප්‍රතිශතයක් නායක්තවය පිළිබඳව සෑහීමකට පත් නොවන බව සඳහන් කොට තිබේ. ඊට හේතුව ලෙස එම සාමාජිකයන් සඳහන් කළේ එකම නිලධාරී මණ්ඩලය යළි යළිත් පත්වීම හා ඔවුන්ගේ ක්‍රියා කලාපය පිළිබඳව තමන් පැහැදීමක් නොමැති බවකි. එසේ වුවත්, ගොවි සංවිධානයේ නායකත්වය හා වෙනත් සියළුම පත් කිරීම් මහා සභා රැස්වීම් වාරකය දී ඉතාමත් විධිමත් ආකාරයටම සිදු වේ. මෙහි දී, බොහෝ විට සිදුවන්නේ කලින් සිටි නිලධාරී මඩුල්ලම නැවත වරක් සාමාජිකයින්ගේ කැමැත්තෙන් ම පත්වීමයි. සාකච්ඡා කළ සියලුම සාමාජිකයින් සිය නායකත්වය විධිමත් ආකාරයකට පත්වන බව ප්‍රකාශ කොට ඇත.

### 3.12.8 ඉතිරිකිරීම් හා ණය ලබාදීම

මෙම ගොවි සංවිධානය තුළ ඉතිරි කිරීම් දිරි ගැන්වීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොවේ. එවැනි වැඩපිළිවෙළක් පිළිබඳව ඔවුන් තුළ දැනුවත්භාවයක් ද නො තිබුණි. අනෙක් අතට, මෙම ගොවි සංවිධානය සාම්ප්‍රදායික රාමුව තුළ ක්‍රියාත්මක වන එකම්. පොහොර සහනාධාරය ලබා ගැනීමේ පරමාර්ථයෙන් පමණක් ක්‍රියාත්මක ගොවි සංවිධානයක් බැවින් ඉතුරුම් දිරි ගැන්වීම් හෝ ණය ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක නොවේ. එමෙන් ම, ණය ලබාදීමෙන් අනතුරුව නැවත ඒවා අයකර ගැනීමේ දී ගැටලු සහගත බව නිලධාරීන්ගේ මතය වූ අතර එවැනි භාරධූර වගකීමක් දැරිය හැකි අයකු ද සංවිධානය තුළ දක්නට නොවී ය. එමෙන් ම, මේ ප්‍රදේශයේ වී ගොවිතැන යැපුම් මට්ටමේ පමණක් සිදු වන නිසා කුඹුරු වගාව සඳහා ණය පහසුකම් ලබාගැනීම හෝ කුඹුරු වගාවෙන් ඉතුරු කිරීම් සිදු කිරීමට තරම් පෙළඹීමක් ඔවුන් තුළ දක්නට නොවී ය.

### 3.12.9 යෙදවුම් හා උපකරණ සැපයීම

ගොවි සංවිධානය සතුව ස්ප්‍රේ යන්ත්‍රයක් පවතින අතර එය ද මේ වන විට අක්‍රිය මට්ටමේ පවතී. ඒ අනුව, ගොවි සංවිධානය සතුව එතරම් උපකරණ ද නොවන අතර බිත්තර වී අවශ්‍ය ගොවීන් වේ නම් ගොවිජන සේවා මධ්‍යස්ථානය හරහා ඔවුන්ට බිත්තර වී ලබා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම ගොවි සංවිධානය මඟින් සිදු කෙරේ. මේ සඳහා ගොවි සංවිධානයේ මැදිහත්වීම ලබා ගන්නා පිරිස මුළු සාමාජිකත්වයෙන් 62.1%ක් පමණ වන අතර සෙසු පිරිස පෞද්ගලිකව ම ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් හෝ ප්‍රදේශයේ දන්නා හඳුනන අයකුගෙන් බිත්තර වී ලබා ගැනීම සිදු කරති.

### 3.12.10 ජල කළමනාකරණය

මාතර දිස්ත්‍රික්කයේ දැරංගල ගොවිජන සේවා බල ප්‍රදේශයේ පිහිටි ජනහිත ගොවි සංවිධානය මඟින් කිසිදු ආකාරයක ජල කළමනාකරණ කටයුත්තක් සිදු නො කෙරේ. සියළු කුඹුරු වගා කරන්නේ අහස් දියෙනි.

### 3.12.11 කොන්ත්‍රාත් කටයුතුවලට සහභාගී වීම

කොන්ත්‍රාත් කටයුතුවල නිරතවන අතර ඒවා බොහෝ විට අනු කොන්ත්‍රාත් වශයෙන් සිදු කරනු ලැබේ. අරමුදල් වර්ධනය කිරීමේ එක් ආකාරයක් ලෙස ගොවි සංවිධානය කොන්ත්‍රාත් කටයුතුවල නිරතවීම දැක්විය හැකි ය. නියැදියෙන් 84%ක් ගොවි සංවිධානය කොන්ත්‍රාත් කටයුතුවල නිරත වන බව දැනුවත් වී සිටි අතර 16%ක් ම ඒ පිළිබඳව නො දනී. එනම්, මෙම ගොවි සංවිධානයේ සාමාජිකයින් අවම වශයෙන් ගොවි සංවිධානයේ කටයුතු පිළිබඳවත් එතරම් දැනුවත්භාවයක් නොමැති ආකාරය පුද්ගල සම්මුඛ සාකච්ඡාවල දී තහවුරු විය. කොන්ත්‍රාත් කටයුතුවල දී බොහෝ විට ගොවි සංවිධානයේ සාමාජිකයින් සහභාගී කර ගැනීමක් සිදු නොවේ. ඊට මූලිකම හේතුව වන්නේ ගොවි සංවිධානය සෘජුව ම කොන්ත්‍රාත් කටයුතුවල නිරත නොවන අතර අනු කොන්ත්‍රාත් පමණක් සිදු කිරීමයි. කොන්ත්‍රාත් කටයුතු පිළිබඳව සාමාජිකයින් තුළ ද එතරම් අවබෝධයක් පවතින බවක් දක්නට නොවී ය.

### 3.12.12 ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

වාර්ෂිකව ආදායම් වියදම් වාර්තා සාමාජිකයින් වෙත ඉදිරිපත් කෙරෙන බව සාකච්ඡා කළ පිරිසෙන් 96%ක් සඳහන් කළ ද, 4%ක් සඳහන් කොට තිබෙන්නේ ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් නො කරන බවකි. පුද්ගල සම්මුඛ සාකච්ඡාවලට අනුව, ඇතැම් පිරිස් ගොවි සංවිධානයේ රැස්වීම් සඳහා සහභාගී නොවන බව අනාවරණය වූ අතර ඔවුන් තුළ ගොවි සංවිධානය පිළිබඳව එතරම් උනන්දුවක් හෝ දැනුවත්භාවයක් දක්නට නොවී ය. ඊට ප්‍රධාන හේතුව මෙම ගොවි සංවිධානය මූලිකව ම පොහොර සහනාධාරය ලබා ගැනීමට පමණක් භාවිතා කරන පිරිසක් සිටීම ය. වාර්ෂික මහා සභා රැස්වීම් හා කන්න රැස්වීම් නියමිත කාලයට සිදු කරනු ලැබේ. එහි දී, සියලූ දෙනා එක්ව එම කන්නයේ දී වගා කළ යුතු වී වර්ග හා කුඹුරු වැඩ ආරම්භ කළ යුතු දින පිළිබඳව සාකච්ඡා කෙරේ. එසේ වුව ද, එකඟතාවයකට අනුව නියමිත දිනයන්වලට වැඩ කටයුතු සිදු කරන පිරිස ඉතා අඩු බව සම්මුඛ සාකච්ඡාවල දී තහවුරු විය.

ප්‍රදේශයේ ගොඩ ඉඩම් වගා කිරීම සම්බන්ධයෙන් ගොවි සංවිධානය ක්‍රියාකාරීව දායකත්වය සපයා ඇත. එනම්, ගොවතු වගාව දිරිමත් කිරීම සඳහා අපි වවමු - රට නගමු වැඩසටහන යටතේ කොට්ඨාසය භාර කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරිණියගේ සහභාගීත්වය ද සහිතව බීජ ලබා දීම, පොහොර ලබාදීම, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය ක්‍රියාත්මක වේ. වර්තමානයේ දිවි නැගුම වැඩසටහන යටතේ සුදුසු පවුල් තෝරා ගැනීම ගොවි සංවිධානය හරහා සිදු කරයි.

### 3.12.13 සාරාංශය

සමස්තයක් ලෙස මාතර දිස්ත්‍රික්කයේ දැරංගල ගොවි ජන සේවා කොට්ඨාසයේ පිහිටි ජනහිත ගොවි සංවිධානය ගොවි සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වුව ද, ගොවි සංවිධානය පිහිටුවීමේ පනතේ සඳහන් ආකාරයට එම බලතල භාවිතයට ගැනීමක් පෙන්නුම් නො කරයි. ඊට ප්‍රධාන හේතුන් කිහිපයක් හඳුනා ගත හැකි ය. එනම්,

දැරංගල ප්‍රදේශයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියැලෙන ජනතාවගෙන් 95%කටත් වැඩි ප්‍රමාණයක් තේ වගාවේ නියැලී සිටී. ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වශයෙන් හඳුනාගත හැක්කේ තේ දළුවලින් ලබන ආදායමයි. වී වගාව ඔවුන් පරිභෝජනය සඳහා පමණක් සිදු කරන බැවින් ඔවුන්ට වී ගොවිතැන සඳහා ගොවි සංවිධානයේ විශේෂ මැදිහත්වීමක් අවශ්‍ය වී නොමැත. වී වගාව සඳහා අත්‍යාවශ්‍ය ම පොහොර සහනාධාරය ලබා ගැනීම සඳහා පමණක් ගොවීහු ගොවි සංවිධානය වටා ඒකරාශී වී සිටිති. එමෙන් ම, දැරංගල ප්‍රදේශය ඉතා දුෂ්කර ගමක් වන අතර ජනාවාස පිහිටුවා තිබෙන්නේ ඉතා දුරස්ථවයි. එහි දී, ජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ ගමනා ගමනයයි. කඳු සහිත ප්‍රදේශයක් වීම හේතුවෙන් ප්‍රදේශයේ පිරිස් ගොවි සංවිධාන රැස්වීම් සඳහා සහභාගීත්වය ඉතා අවම මට්ටමක පවතී. වෙනත් රැකියාවල නිරත වී සිටීම නිසා පිරිස ඒකරාශී කර ගැනීම ඉතා අපහසු කාරණයක් බව ගොවි සංවිධාන නිලධාරීන් සමඟ පැවති සම්මුඛ සාකච්ඡාවල දී තහවුරු විය.

එමෙන් ම, ගොවීන්ට ප්‍රජාවක් හෝ සමූහයක් ලෙස එක්ව ගොවි සංවිධානය හරහා දිනාගත හැකි දේවල් නොමැති නිසාත්, ගොවි සංවිධානයකින් ඉටු කර ගත හැකි කාර්යයන් මොනවා ද යන්න පිළිබඳව දැනුවත්භාවයක් නොවීමත් හේතුවෙන් ගොවීන් සංවිධානය තුළ ක්‍රියාකාරී බවක් නො පෙන්වීමට හේතු වී තිබේ.

## 3.13 සිද්ධි අධ්‍යයන අංක 13: වැල්ලාන ගොවි සංවිධානය – කතංකේ මාතර දිස්ත්‍රික්කය

### 3.13.1 හැඳින්වීම

වැල්ලාන ගොවි සංවිධානය, මාතර දිස්ත්‍රික්කයේ, කතංකේ ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් ගොවීන් විසින් ම ගොවීන්ගේ අවශ්‍යතා හා ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා පිහිටුවා ගන්නා ලද්දකි. ගොවිජන සේවා බල ප්‍රදේශය තුළ ගොවි සංවිධාන 15ක් ලියාපදිංචි වී ඇති නමුත් ක්‍රියාත්මක මට්ටමේ පවතින්නේ එයින් ඉතා සුළු ප්‍රමාණයක් පමණි. ඒවා අතුරින් ද ඉහළ ම අරමුදල් ප්‍රමාණයක් පවතින්නේ ඉහත සඳහන් වන වැල්ලාන ගොවි සංවිධානයට වේ. මෙම ගොවි සංවිධානය ආරම්භ වී දැනට වසර ගණනාවක් ගත වී ඇතත්, අක්‍රිය තත්ත්වයේ සිට සක්‍රිය තත්ත්වයට ප්‍රතිසංවිධානය කොට ආරම්භ වී ඇත්තේ 2000 වර්ෂයේ සිටයි. ආරම්භක සාමාජික සංඛ්‍යාව ලෙස සාමාජිකයින් 35ක ප්‍රමාණයක

සිට වර්තමානයේ 75ක සාමාජික සංඛ්‍යාවක් දක්වා ඉහත ගොවි සංවිධානය වර්ධනය වී තිබේ.

### 3.13.2 ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ආර්ථික පසුබිම


වැල්ලාන ගොවි සංවිධානයට අයත් බල ප්‍රදේශය බොහෝ දුරට රබර් වගාව, තේ වගාව හා කුරුඳු වගාව සඳහා වෙන් වූ භූමි ප්‍රදේශයන් පවතින ප්‍රදේශයක් වේ. මෙහි පවතින අර්ධ නාගරික ස්වභාවය නිසා කෘෂිකර්මාන්තයේ නියැලෙනවාට වඩා වෙනත් රැකියාවල නිරතවන පුද්ගලයින් වැඩි පිරිසක් සිටී. ගොවිතැන සිය පූර්ණකාලීන රැකියාව ලෙස සිදු කරන පුද්ගලයන් හඳුනාගත නො හැකි වේ. ප්‍රදේශයේ සියලූ වී ගොවීන් පරිභෝජනය සඳහා පමණක් වී ගොවිතැන සිදු කරන අතර එසේ සිදු කරන බහුතරයක් ද ඒ සඳහා අඳයට ගත් ඉඩම් භාවිතා කරති. තමාට ම නීත්‍යානුකූල ලෙස ඉඩම් අයත් පුද්ගලයන් ගොවි සංවිධානය තුළ ඉතා දුර්ලභ වන අතර බොහෝ පිරිස් අක්කර 1/2 හෝ අක්කරයක පමණ භූමියක වී ගොවිතැන සිදු කරති. ගොවි සංවිධානයට අයත් ප්‍රදේශය තුළ, ගොවි සංවිධාන සාමාජිකයන් වගා කරන මුළු කුඹුරු අක්කර ප්‍රමාණය අක්කර 75ක් පමණ වේ. එමෙන්ම සකච්ඡා මඟින් දැනගත හැකි වූයේ ඔවුන් සාමාන්‍යයෙන් අක්කරයක් සඳහා වී බුසල් 70-80ක් පමණ අස්වැන්න ලබා ගන්නා බවයි.

**වගු අංක 3.13.1: ගොවි සංවිධානය තුළ සාමාජික වර්ධනය**

| වර්ෂය | සාමාජික සංඛ්‍යාව |
|---|---|
| 2005 | 71 |
| 2006 | 74 |
| 2007 | 58 |
| 2008 | 74 |
| 2009 | 72 |
| 2010 | 73 |
| 2011 | 76 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ප්‍රස්තාර සටහන් අංක 3.13.1: සාමාජික වර්ධනය**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.13.3 නායකත්වය තෝරා ගැනීම

සංවිධානය තුළ නායකත්වය සාම්ප්‍රදායික ලෙස වර්ෂයකට වරක් පැවැත්වෙන නිලවරණය මඟින් තෝරා පත් කළ විට සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු වෙනස් නොවන ආකාරයක් දැකිය හැකි වේ. වැල්ලාන ගොවි සංවිධානයේ සභාපතිවරයා මේ වන විට අවුරුදු 5ක පමණ කාලයක් එම ධුරය දරා ඇත. පසු පෙළ නායකත්වයක් සැකසීමේ වැඩපිළිවෙළක් මේ වන තෙක් සිදු වී නොමැත. කෙසේ වුවද, තෝරාගත් ගොවීන් කිහිප දෙනෙකු සඳහා නායකත්වය පුහුණුවක් පැවැත් වූ බැව් සඳහන් වූ නමුත් ඉන් අත් වූ ප්‍රතිලාභ සංවිධානය තුළ කැපී පෙනෙන ලෙස දක්කට නොවී ය.

### 3.13.4 අරමුදල් වර්ධනය

සාමාජික මුදල්, කොන්ත්‍රාත් මුදල් හා වත්කම් ගොවීන්ට සේවා ලෙස ලබාදීමෙන් ලැබෙන මුදල් හරහා සංවිධානයට අරමුදල් රැස් කිරීම සිදු වේ. සාමාජික මුදල් වර්ෂයකට වරක් අය කර ගනී.


එමෙන් ම, ගොවි සංවිධානයට වත්කම් ලෙස ස්ප්‍රේ යන්ත්‍ර 2ක්, බැනර් 1ක්, වල් නෙලන යන්ත්‍ර 1ක්, පුටු හා ටෙන්ට් රෙදි අයත් වේ. මේවා සාමාජිකයන්ට ඉතා අඩු මුදලකටත්, ගමේ ජනතාවට ඊට වඩා වැඩි මුදලකටත් ලබාදීමෙන් අරමුදල් සඳහා මුදල් පසයා ගනී. මේ වන විට, ගොවි සංවිධානය සතු අරමුදල් ප්‍රමාණය රු. 63.000ක් පමණ වන අතර එම අරමුදල් ආයෝජනය කොට වෙනත් වැඩපිළිවෙළක් සඳහා යෙදවීමේ හෝ ණය ලබාදීමේ වැඩසටහන් දැනට සංවිධානය තුළ ක්‍රියාත්මක නොවේ.

වගු අංක 3.13.2: ගොවි සංවිධානය තුළ අරමුදල් වර්ධනය

| වර්ෂය | අරමුදල (රු) |
|---|---|
| 2006 | 48199.00 |
| 2007 | 43335.00 |
| 2008 | 8925.00 |
| 2009 | 537245.00 |
| 2010 | 43440.00 |
| 2011 | 63401.00 |

මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ප්‍රස්තාර අංක 3.13.2: අරමුදල් වර්ධනය (රු)**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

### 3.13.5 ගොවි සංවිධාන කාර්යයන්

ගොවි සංවිධානය සිදු කරන ප්‍රධාන කාර්යයන් ලෙස පොහොර සහනාධාරය සාමාජිකයන් වෙත ගෙනවිත් දීම, හැඳින්විය හැකි ය. ඊට අමතරව, පුහුණු වැඩසටහන් සංවිධානය කොට ගොවීන්ට දැනුම දීමේ වැඩපිළිවෙළක් සාදා තිබේ. එහි දී සඳහන් වූ ආකාරයට කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන් 10ක් පමණ සිදු කොට ඇති බව හෙළි වේ. එමෙන් ම, වී ගොවීන් සඳහා ආදර්ශන ද ගොවිපොළවල් සකස් කොට ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම ද මෙම ගොවි සංවිධානයේ කැපී පෙනෙන ලක්ෂණයක් වේ. එහි දී, පැරශුට් ක්‍රමය සඳහා ආදර්ශන ගොවිපොළක් ද, බිත්තර වී සඳහා වූ යාය ආදර්ශන ද. සුවඳැල් වැනි පැරණි වී වර්ග සඳහා යාය ආදර්ශන පවත්වාගෙන යයි. එමෙන් ම, පර්යේෂණ වී වර්ග ගොවීන්ට හඳුන්වාදීම සඳහා අවශ්‍ය කරන සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම ද, තෝරා ගත් පර්යේෂණ වී වර්ග සඳහා යාය ආදර්ශන පවත්වාගෙන යාම ද දැකිය හැකි ය. කතංකේ ගොවිජන සේවා බල ප්‍රදේශය සලකා බැලූ කළ වැඩිම යාය ආදර්ශන ප්‍රමාණයක් ඇත්තේ වැල්ලාන ගොවි සංවිධානයට බව පැහැදිලි වේ.

### 3.13.6 නිලධාරීන්ගේ සහයෝගය

මෙහි දී දැකිය හැකි වූ ප්‍රධාන ලක්ෂණයක් වූයේ, කතංකේ ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් කෘ.ප.නි.ස. මහතා ඉතා කාර්යක්ෂමව ඔහුගේ සේවය ගොවීන්ට ලබාදීම මගින් ගොවි සංවිධානය මෙහෙයවන ආකාරයයි. ඔහුගේ කැපවීම මත මේ වන විට ගොවි සංවිධානය යම් තරමකට හෝ සාර්ථකත්වයක් ලබා ඇති ආකාරයක් දැකිය හැකි වේ. කෙසේ වුවද, සංවිධානයේ රැස්වීම හෝ වෙනත් ඒකරාශීවීම් සිදු කෙරෙන කටයුතු සඳහා ගොවීන්ගේ සහභාගීත්වය ඉතා අඩු බව කැපී පෙනෙන ලක්ෂණයකි.

### 3.13.7 ගොවි සංවිධානය වර්තමානයේ දී මුහුණ දී සිටින ගැටලු

එමෙන් ම, ගම්මානය තුළ ගොවීන්ගේ අසමගිය හා සංවිධානය සමග ඒකරාශී වීමේ දී ඔවුන්ගේ ඇති පසුගාමී ආකල්පය ද, වෙනත් ගොවි සංවිධානවලට වඩා පැහැදිලි ලෙස පෙනුණ ලක්ෂණයකි. සංවිධානය තුළ සාමාජිකත්වය ලබා සිටිය ද, සංවිධානය විසින් සිදු

කරන ඉදිරි වැඩපිළිවෙළවල්වල දී නිරන්තරයෙන් ම දෝෂාරෝපණය කරන පිරිසක් සිටින ආකාරය පැහැදිළිව නිරීක්ෂණය කළ හැකි වූ කරුණකි. මේ නිසාම, සංවිධානයක් ලෙස ඉදිරියට යාමේ දී ඉතා විශාල ගැටලු ප්‍රමාණයකට මුහුණදීමට සිදුව තිබේ. එමෙන් ම, එම ගැටලු මගහරවා ගෙන සාමාජිකයින් සංවිධානය වෙත ආකර්ෂණය කර ගත හැකි පැහැදිළි වැඩපිළිවෙළක් සඳහා යොමු කිරීමට නිශ්චිත අරමුණක් ගොවි සංවිධානය තුළ දැනට සිටින නායකත්වයට ද නොමැති බැව් පැහැදිළි වූ කරුණකි. මේ හේතුව නිසාම, යම් කිසි වැඩපිළිවෙළක ආරම්භක අවස්ථාවේ පටන් ම අවසානය දක්වා ගැටලුකාරී තත්ත්වයක් ඇතිවීම සිදු වේ. මෙය සංවිධානයක් වශයෙන් සාර්ථකවීමේ දී ඔවුන් මුහුණ දෙන්නා වූ ප්‍රධාන ගැටලුවක් ලෙස සැලකිය හැකි වේ.

කෙසේ වූව ද, ගොවි සංවිධානය මේ වන විට එම බාධක යම්තාක් දුරකට මැඩගෙන ඩෙංගු මර්දන වැඩසටහන්, බටඅත ක්ෂේත්‍ර පුහුණු චාරිකා සඳහා ගොවීන් සහභාගී කරවීම්, මෙන් ම යම් යම් ආගමික වැඩසටහන් සඳහා ද ගොවීන් සහභාගී කරවීම වැනි ක්‍රියාවන් සිදු කරන බව ද, ඉදිරියටත් එවැනි වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක වන බැව් ද දැකිය හැකි විය. එමෙන් ම, ඔවුන්ගේ ඉදිරි සංවර්ධන සැලසුම් ලෙස, යාය ආදර්ශන ගොවිපොළ තවදුරටත් ක්‍රියාත්මක කරවීමත්, ගොවීන්ගේ අලෙවි ගැටලු සඳහා ඉදිරිපත්වීමත්, කෘෂි රසායන අලෙවි කිරීම සඳහා වෙළෙඳසැලක් ආරම්භ කිරීමත් සැලකිය හැකි වේ.

### 3.13.8 සාරාංශය

මාතර දිස්ත්‍රික්කය තුළ අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන තුනේ ම සාමාජිකයින් වී ගොවිතැන සිදු කරනු ලබන්නේ අහස් දිය උපයෝගී කර ගනිමිනි. ඒ නිසාම, වෙනත් දිස්ත්‍රික්කවල දී මෙන් ජල කළමනාකරණ කටයුතු කිසිවක් මෙම ගොවි සංවිධානය හරහා සිදු නොවේ. ගොවි සංවිධාන තුන ම සුළු වශයෙන් කොන්ත්‍රාත් කටයුතුවල නිරතවන අතර එය ගොවි සංවිධාන හරහා සෘජුවම සිදු නොවේ. කොන්ත්‍රාත් කටයුත්ත සඳහා වෙන් කර ඇති මුදලින් 5%ක කොමිස් මුදලක් පමණක් ලබාගෙන කොන්ත්‍රාත්තුව වෙනත් පාර්ශවයකට පැවරීම සිදු කෙරේ. එමෙන් ම, මෙම ගොවි සංවිධාන තුනේ ම අධ්‍යයනයට ලක් කළ නියැදියේ සාමාජිකයින්ගෙන් 50%ක පමණ පිරිසක් ගොවි සංවිධානය මඟින් කොන්ත්‍රාත් කටයුතුවල නිරතවීම පිළිබඳව දැනුවත්භාවයක් නොවී ය. පොත් පත් නඩත්තුව පිළිබඳව සලකා බැලීමේ දී ගොවි සංවිධාන තුනෙන් දෙකක් එම කටයුතු කොට්ඨාසය හා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරියාගේ මඟපෙන්වීම යටතේ සිදු කර තිබූ අතර දැරංගල ජනහිත ගොවි සංවිධානයේ පොත් පත් නඩත්තු කිරීම ක්‍රමානුකූලව සිදු කෙරී නො තිබුණි. මාතර දිස්ත්‍රික්කයේ ගොවි සංවිධාන පිළිබඳ අධ්‍යයනයේ දී හඳුනාගත හැකි වූ සුවිශේෂී කාරණය වශයෙන් පෙනී ගියේ මෙම ගොවි සංවිධාන කිසිවක් සාමාජිකයින්ගේ ඉතිරි කිරීම් දිරි ගැන්වීමට හෝ ණය ලබාදීම වැනි මූල්‍ය සේවාවන් සැපයීම, අලෙවි සේවාවන්, ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදේශන සේවාවන් හෝ තාක්ෂණික සේවාවන් සැපයීමක් දක්නට නොවීමයි. ඒ අනුව, 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් ඉතා පුළුල් බලතල ප්‍රමාණයක් පවරා තිබුණ ද, මෙම ගොවි සංවිධානවල ඒවා ක්‍රියාත්මක ස්වරූපයේ දක්නට නොවී ය. බොහෝ විට, මෙම ගොවි සංවිධාන පොහොර සහනාධාරය මත පමණක් ක්‍රියාත්මකවීම දක්නට ලැබුණි. යම්තාක් දුරට හෝ මෙම ගොවි සංවිධාන මේ තත්ත්වයේ පැවතීමට ප්‍රධාන හේතුව වශයෙන් හඳුනාගත හැක්කේ මෙම ගොවි සංවිධානවල පවතින නායකත්වය හා ගොවිජන සේවා නිලධාරීන්ගේ කැපවීමයි. මෙම ගොවි සංවිධානවල වර්තමාන නායකත්වය ඉන් ඉවත් වූවහොත් එම ගොවි සංවිධානවල පවතින වර්තමාන ක්‍රියාකාරීත්වය පවා අඩපණ වන තත්ත්වයක් ඇතිවිය හැකි ය.

අධ්‍යයනයට ලක් කළ මෙම ගොවි සංවිධාන තුනෙන් දෙකක ම දෙවන පෙළ නායකත්වය පුහුණු කිරීමක් දක්නට නොවී ය. කොටපොල මහසෙන් ගොවි සංවිධානය සාම්ප්‍රදායික රාමුවෙන් බැහැරව නිර්මාණශීලීව ක්‍රියාත්මක වන ගොවි සංවිධානයක් ලෙස හඳුනාගත හැකි ය. ඒ තුළ ළමා සමාජයක් ක්‍රියාත්මක වේ. එමෙන් ම, කුඹුරු ඉඩම් හිමි සාමාජිකයින් ඉතා සුළු පිරිසක් පමණක් සිටින මෙම ගොවි සංවිධානය සුබසාධක කමිටුවක් පිහිටුවා ගනිමින් තේ වගා ක්ෂේත්‍රයේ සිටින ගොවීන් ද සම්බන්ධ කර ගනිමින් වඩා ක්‍රියාශීලී සිටිමින් ක්‍රියාත්මක වේ. මේ සියල්ල පිටුපස අත්දැකීම් සහිත නායකත්වයක් සිටීම, මෙම ගොවි සංවිධානය මේ තත්ත්වයෙන් පැවතීමට ප්‍රධාන හේතුව වශයෙන් අධ්‍යයනය තුළ දී හඳුනාගත හැකි ය.

මාතර දිස්ත්‍රික්කයේ පවතින ගොවි සංවිධාන මේ ආකාරයෙන් පැවතීමට බලපාන ප්‍රධාන සාධක කිහිපයක් අධ්‍යයනය තුළ දී අපට හඳුනාගත හැකි විය. එනම්,

- මාතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන කෘෂි බෝගය වී නොවීම
- වී නිෂ්පාදනය මාතර දිස්ත්‍රික්කයේ යැපුම් මට්ටමේ පැවතීම
- වී ගොවිතැන යනු එම ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන රැකියාව නොවීම (ද්විතියික හෝ තෘතීයික තත්ත්වයේ පැවතීම)
- එක් ගොවියෙකුට අක්කර 2 ට වඩා අඩු ඉතා සුළු කුඹුරු ප්‍රමාණයක් හිමි වී තිබීම

එමෙන් ම, මාතර දිස්ත්‍රික්කයේ අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන තුනෙන් දෙකක්ම (කොටපොල මහසෙන් ගොවි සංවිධානය හැර) වර්තමානයේ පවතින මට්ටමට හෝ පවත්වාගෙන යාමට හේතු වී ඇති ප්‍රධාන කරුණ වන්නේ ප්‍රදේශයේ කෘ.ප.නි.ස. වරයාගේ මැදිහත්වීමයි. එම නිලධාරියාගේ මැදිහත්වීම නොවෙන්නට ගොවි සංවිධානයක පැවැත්ම නාමික ස්වරූපයක් ගනී. අනෙක් අතට, පොත් පත් පවත්වාගෙන යාම මාතර දිස්ත්‍රික් ගොවි සංවිධාන තුනේ ම එතරම් සාර්ථක මට්ටමකින් සිදු නොවේ.

## 3.14 සිද්ධි අධ්‍යයනය 14: මොදරවාන දකුණ ගොවි සංවිධානය - හම්බන්තොට දිස්ත්‍රික්කය

### 3.14.1 හැඳින්වීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මොදරවාන ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ මොදරවාන දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මෙම ගොවි සංවිධානය ක්‍රියාත්මක වේ. මෙම ගොවි සංවිධානය ආරම්භ වී ඇත්තේ 1992 වර්ෂයේ දී ය. මෙහි අභිලාෂය වන්නේ ගොවීන් වෙනුවෙන් ගොවීන්ම කැප වී කටයුතු කර ගැනීමෙන් ගොවිජන අවශ්‍යතා ඉටු කිරීම ය. ආරම්භක අවදියේ දී මෙම ගොවි සංවිධානය අක්‍රමවත් සංවිධානයක් ලෙස පැවතුණි. පසුකාලීන ව ක්‍රම ක්‍රමයෙන් අරමුදල් ගොඩනගා ගනිමින් ක්‍රියාකාරී සංවිධානයක් බවට පත් වී ඇත. මෙම ප්‍රදේශයේ ආර්ථිකය සමන්විත වී ඇත්තේ කුඩා වැව් හා සුළු වාරිමාර්ග ආශ්‍රිත ජල සැපයුමෙන් වී වගා කිරීමත්, ගොඩ ඉඩම්වල පොල් වගාවත්, පොල් ඉඩම්වල අතුරු බෝගයක් ලෙස සුළු අපනයන බෝග වගාවත්, සත්ත්ව පාලනයත් යන ක්ෂේත්‍ර වලිනි.

### 3.14.2 ගොවි සංවිධානයේ ව්‍යුහය

මෙහි ව්‍යුහය සැකසී ඇත්තේ ඉතා සරල ආකාරයටය. එනම් සභාපති, ලේකම්, භාණ්ඩාගාරික හා උප සභාපති, උප ලේකම් හා කාරක සභිකයින් ගෙනි. මෙම සංවිධානයේ කමිටු හෝ කුඩා කණ්ඩායම් ක්‍රියාත්මක නොවේ.

### 3.14.3 නායකයින් පත් කිරීම

ගොවි සංවිධානයට නායකයින් පත් කිරීම මහා සභා රැස්වීමක දී සිදු කරයි. මෙහි දක්නට ඇති විශේෂත්වයක් වන්නේ වසර ගණනාවක් ම එකම පිරිසක් සංවිධානයේ සභාපති, ලේකම් තනතුරු දැරීමයි. 1994, 1995 වර්ෂ දෙක හැර ගොවි සංවිධානය පිහිටුවා ගත වූ වසර 19ක කාලය තුළ වසර 17ක් ම සභාපතිත්වය දරා ඇත්තේ එකම පුද්ගලයෙකි. ලේකම් හා භාණ්ඩාගාරික ධූරයන් සඳහා පමණක් ආරම්භයේ දී එම තනතුරු දැරූ පුද්ගලයන් හැර නව පුද්ගලයන් දෙදෙනෙකු පත්ව සිටී. මොවුන් සියළු දෙනා වයස අවුරුදු 60 ඉක්ම වූ ගොවීන් ය.

### 3.14.4 රැස්වීම් පැවැත්වීම

මෙහි සාමාජිකයින් රැස්වන ප්‍රධාන ආකාර 3ක් පවතී. එනම්: මාස තුනකට වරක් පැවැත්වෙන මහා සභා රැස්වීම, වසරකට වරක් පැවැත්වෙන සංවත්සර මහා සභා රැස්වීම, මසකට වරක් පැවැත්වෙන කාරක සභා රැස්වීම වේ.

මාස 3කට වරක් පැවැත්වෙන මහා සභා රැස්වීම සඳහා මුළු ගොවි සාමාජිකයින්ගෙන් 50% - 60% අතර ප්‍රමාණයක් සහභාගී වන බව දැනගන්නට ලැබුණි. මෙම රැස්වීමේ දී ගොවියාගේ අවශ්‍යතාවයන් හා ඔවුන් මුහුණපාන අඩුපාඩු පිළිබඳව අදහස් මෙන් ම ඉල්ලීම් පිළිබඳව විමසා බැලීම හා ගොවීන් සමඟ සාකච්ඡා කිරීම යනාදිය සිදු කෙරේ. මාසිකව පවත්වන කාරක සභා රැස්වීමේ දී ගොවීනගේ ජීවන තත්ත්වය දියුණු කිරීමට නම් ගොවි සංවිධානය විසින් ගත යුතු පියවර පිළිබඳව සාකච්ඡා කරයි. අවුරුද්දකට වරක් පැවැත්වෙන සංවත්සර මහා සභා රැස්වීමේ දී 80%ක් පමණ ගොවි සහභාගීත්වයක් සිදුවන බව හෙළි වන අතර මෙහි දී නව නිලධාරී මණ්ඩලයක් පත්කර ගැනීම හා වාර්ෂික අයවැය ඉදිරිපත් කිරීම නව යෝජනා හා සාකච්ඡා කිරීමත් සාමාන්‍ය පිළිවෙත වේ.

### 3.14.5 ගොවි සංවිධානයේ අරමුදල් රැස් කිරීම

සාමාජිකයින්ගෙන් සාමාජික ගාස්තු අය කර ගොවි සංවිධානයේ අරමුදල් වර්ධනය කිරීමේ වැඩපිළිවෙළක් මෙම සංවිධානය තුළ ක්‍රියාත්මක වේ. ගොවි සංවිධානයට අරමුදල් අවශ්‍ය අතර එම අරමුදල් සාමාජික මුදල් පමණක් නොව, වෙනත් විවිධ ක්‍රම අනුගමනය කරමින් ඒකරාශී කිරීමේ ක්‍රියාමාර්ගයක් වර්තමානයේ දී අනුගමනය කරයි. අරමුදල් රැස් කිරීමේ ප්‍රධාන ක්‍රමය වන්නේ කොන්ත්‍රාත් කිරීමෙන් 5%ක කොමිස් මුදලක් උපයා ගැනීම යි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නොවන අමාත්‍යාංශයක් වන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සිදු කෙරෙන කොන්ත්‍රාත් මඟින් 1%ක ආදායමක් උපයා ගනී. කොන්ත්‍රාත් ගැනීමේ පිළිවෙත වන්නේ ගොවි සංවිධානය විසින් කොන්ත්‍රාත්තුව අත්සන් කර කොන්ත්‍රාත් කිරීමේ හැකියාව ඇති පුද්ගලයෙකුට පවරා දී කොන්ත්‍රාත්තුව කරවීමයි. ප්‍රමිතියට අනුව සිදු කරනවා ද යන්න තාක්ෂණ නිලධාරීවරයෙකු විසින් පරීක්ෂා කර බලා

නිර්දේශ ලබා ගැනීම කරයි. ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් නොවන ප්‍රදේශවල කොන්ත්‍රාත් ද මෙම සංවිධානය මඟින් සිදු කරයි.

### 3.14.6 ප්‍රදේශයට කර ඇති සේවාව

ප්‍රදේශයේ ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් සැළකිය යුතු වැඩ කොටසක් ඉටු කර ඇති බව හෙළි විය. ඒවා පහත සඳහන් පරිදි වේ.

- ග්‍රාමීය අතුරු පාරවල් කොන්ක්‍රීට් අතුරා සකස් කිරීම
- මෙම ගොවිජන බල ප්‍රදේශයේ පවතින ගල්වානදෙණිය වැව, කෝන්ගහවෙල වැව, මොදරවාන දකුණ වැව, යන වැව්වල බැම්ම සොරොව්ව, පිටවාන හා වැව් හැරීම යනා දී කටුයුතු කිරීම
- ඇල මාර්ගයන් හි පැති බැම් ඉදි කිරීම
- ඇල මාර්ග ශුද්ධ කිරීම
- මාර්ග තාර දැමීම, බෝක්කු සෑදීම
- ප්‍රජා ශාලාවක් ඉදි කිරීම
- රාජගොඩ ගල්වලේ වැවේ පිටවාන ඉදි කිරීම
- පුරත් කුඹුරු අස්වැද්දීමේ ව්‍යාපෘතියෙ හි ඇල මාර්ග සකස් කිරීම ගොවි සංවිධානයේ වියදමින් හා ගොවීන්ගේ ශ්‍රමදානයෙන් සිදු කිරීම යන ඒවා වේ.

### 3.14.7 ණය මුදල් ලබා දීම

ණය මුදල් ලබාදීමේ වැඩසටහනක් මෙම ගොවි සංවිධානය විසින් ක්‍රියාත්මක කොට නැත. මෙවැනි කර්තව්‍යයක් සිදු කිරීම සම්බන්ධයෙන් ගොවි සංවිධානයට හැකියාවක් නොමැති බව තේරුම් ගැනීම නිසා ණය හා ඉතුරුම් වැඩසටහනක් ක්‍රියාත්මක කොට නොමැත. ගොවීන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් ණය ලබා ගැනීමේ දී සමෘද්ධි බැංකුව හා ස.ණ.ස. වැනි වෙනත් මූලාශ්‍ර මඟින් ණය ලබා ගැනීමට පෙළඹී සිටී. මෙම ප්‍රදේශයේ ස්වයං බැංකු සමාජය නමින් කුඩා කණ්ඩායම් වශයෙන් එකරාශී වී ණය ගනුදෙනු කිරීමේ වැඩ පිළිවෙළක් ද ක්‍රියාත්මක වන බැවින් ඒ මඟින් ද ණය අවශ්‍යතා සපුරා ගනී. ඒ නිසා, ගොවි සංවිධානය විසින් ණය සැපයීමේ වැඩසටහනක් ක්‍රියාත්මක නො කිරීම හා ගොවිජන බැංකුව මඟින් ණය සපයා දීමක් ද සිදු නොවේ.

### 3.14.8 ගොවීන් විසින් විකල්ප භාවිතයෙන් අවශ්‍යතා සපුරා ගැනීම

ණය සැපයීමේ වැඩසටහන් ගොවි සංවිධානය විසින් ම සිදු කරන්නේ නම් ගොවීන් ණය ලබා ගැනීමේ සංස්කෘතියකට හුරු වේ. එවැනි ක්‍රමයක් නොමැති නිසා ගොවීන් බිම් සකස් කර ගැනීම, යෙදවුම් සපයා ගැනීම වැනි කෘෂි අවශ්‍යතාවන්වල දී විකල්ප ක්‍රම අනුගමනය කිරීමට පුරුදු වී සිටී. එනම්, බිත්තර වී අසල්වැසි ගොවීන් සමඟ හුවමාරු කර ගැනීම, කෘෂි රසායනික ද්‍රව්‍ය පෞද්ගලික වෙළෙඳසැල්වලින් ණයට ලබාගැනීම, ට්‍රැක්ටර් හිමියන් ලවා ණය පදනම මත බිම් සකස් කර ගැනීම, ද්‍රව්‍යමය ගෙවීම් පදනම මත අස්වනු නෙළීම ආදියයි. මෙවැනි ණය පදනම මත ගොවිජන ජීවිතයේ බොහෝ කාර්යයන් සිදු කර ගැනීම නිසා අස්වනු නෙලූ සැනින් අලෙවි කිරීමට සිදුවීම වැනි ගොවියාගේ ස්වාධීනත්වයට හානිවන ආකාරයේ සිදුවීම් ඇතිවීමට ඉඩ තිබේ. සමෘද්ධි බැංකු වෙතින් ලබා ගන්නා ණය මුදල් සඳහා

මාසික පොළිය 12%කි. ප්‍රදේශයේ සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින ගිණුම් ක්‍රමයන්ට අනුව වී අමුණකින් වී කුරුණි 48ක් පමණ අස්වැන්නක් ලබාගැනීමට හැකියාව පවතින අතර එම වී කුරුණි 48 ලබා ගැනීම සඳහා තම වියදම විවලින් ලබා දෙන්නේ නම් අද ගොවියෙකු සම්බන්ධයෙන් ගත් කළ ඉඩම් හිමියා වෙත වී කුරුණි 6ක් ද, ට්‍රැක්ටරයෙන් ලබාගත් සේවය සඳහා වී කුරුණි 6ක් ද, ගොයම් පැගීමේ දී වී කුරුණි 12 ක් හා ඊට අමතරව සහයෝගය ලබාගත් පිරිසගේ සිත් සතුටු කිරීම සඳහා වී කුරුණි 6ක් ද, බිත්තර වී කුරුණි 3ක් යනා දී වශයෙන් කුරුණි 33ක් ඉවත් කිරීමට සිදුවන අතර ඉතිරි වන්නේ වී කුරුණි 15ක් පමණි. මෙම ක්‍රමය ගොවියාට පාඩු සිදුවන ක්‍රමයකි. මෙමගින් පෙනී යන්නේ ගොවිජන ජීවිතය මුදලාලිවරුන්ට හා පොලිකරුවන් වෙත බැඳී සිටින බවයි. මෙම තත්ත්වයෙන් ගොවීන් මුදවා ස්වාධීනත්වයට පත් කරවීම සඳහා ගොවි සංවිධානය විසින් මූල්‍ය පහසුකම් සලසාදෙන්නේ නම් සහනයක් බව ගොවීන්ගේ අදහසයි. එසේ වුව ද, මෙම ගොවි සංවිධානයේ එවැන්නක් දක්නට නො ලැබේ.

### 3.14.9 ගොවි සංවිධානයෙන් සිදු කෙරෙන සේවා

පොහොර සහනාධාරය ගොවීන්ට ලබාදීමට අවශ්‍ය කාර්යයන් සම්පූර්ණ කිරීම හා ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය ආසන්නයේ ම පිහිටා තිබීම නිසා අවශ්‍ය පොහොර තොගය වෙන් කර ගොවි ජනතාවට රැගෙන යාමට උදව් කිරීම ගොවි සංවිධානයේ ප්‍රධාන කාර්යයකි. ගෙවතු වගාවලට අවශ්‍ය බීජ හා පැළ ලබාදීම ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය හා සම්බන්ධ වෙමින් අවශ්‍ය ගොවීන් සඳහා ලබාදීමේ සම්බන්ධීකරණ කටයුතු ඉටු කරයි. ගොවි සංවිධානය සතුව ස්ප්‍රේ යන්ත්‍ර දෙකක් ඇත. මෙම කෘෂි රසායනික ද්‍රව්‍ය ඉසින යන්ත්‍ර ගොවීන්ට පහසු මිලට ලබාදෙයි. දිනකට රු. 60ක් ගෙවීමේ පදනම මත මෙම යන්ත්‍ර ගොවීන්ට ලබා ගැනීමට පුළුවන. වරුවකට ලබා ගන්නේ නම් රු. 25ක් ගෙවීමට සිදු වේ. මෙය ගොවි ජනතාවට යම් කිසි සහනයකි. වාර්ෂික මහා සභා රැස්වීමේ දී ප්‍රදේශයේ කෘ.ප.නි.ස. වරුන් සහ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් විසින් වී සහ ගොඩ බෝග වගාවේ දී පැන නගින රෝග හා එම රෝග වළක්වා ගැනීමේ හා අවම වියදමකින් පාලනය කර ගැනීමේ ක්‍රමෝපායයන් ද, ගොවිතැන් කටයුතුවල දී ගොවීන්ට වැළඳෙන මී උණ වැනි ලෙඩ රෝගවලින් ආරක්ෂාවීමේ ක්‍රම පිළිබඳව ද ගොවීන් දැනුවත් කරයි. ගොඩ බෝග වගාවේ දී ප්‍රධාන වශයෙන් ගෙවතු වගාව සඳහා ගොවීනට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම, බීජ ලබාදීම වැනි වැඩසටහන් ගම තුළ සංවිධානය කරන්නේ ගොවි සංවිධානය විසිනි. වී වගාව සඳහා වැව්වලින් ජලය ඇළ මාර්ග ඔස්සේ වගා කන්නය අවසන් වනතුරුම නිකුත් කළ යුතු ය. එලෙස ජලය නිකුත් කරන දින වකවානු දැන්වීම් මගින් ප්‍රදේශයේ ජනතාවට දැනුම් දිය යුතු ය. එලෙස ජලය නිකුත් කරන දින වකවානු දැන්වීම් මගින් ප්‍රචාරය කරන අතර මෙම කාර්යයේ දී ජල පාලක වශයෙන් ක්‍රියාත්මක වන්නේ සංවිධානයේ සභාපතිවරයායි. ඔහු එම සේවය සිදු කරන්නේ දීමනාවක් ලබා නො ගෙන ස්වේච්ඡාවෙනි. වගා නො කරන ඉඩම් යළිත් වගාවට යොදා ගැනීම සම්බන්ධව ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම ද ගොවි සංවිධානය සිදු කරයි. වන සතුන්ගෙන් වගාවන්ට වන හානි වළක්වා ගන්නා ක්‍රම පිළිබඳව ද උපදෙස් ලබාදීමේ වැඩසටහනක් සංවිධානය කළ ද, එම උපදෙස්වලින් ද වගා හානි වළක්වා ගැනීමට ගොවීන්ට හැකියාව ලැබී නැත. අතුරු කන්නයක් වශයෙන් මුං ඇට වගා කිරීමට ගොවීන් හුරු කිරීමේ වැඩසටහනක් ද පසෙ හි සාරවත්භාවය සංරක්ෂණය කර ගැනීමේ ඇති වැදගත්කම පිළිබඳව ද ගොවි සංවිධානය ගොවීන්ව දැනුවත් කොට තිබේ.

දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව නියෝජනය කිරීම සඳහා මෙම ගොවි සංවිධානය ඊට සහභාගී වෙයි. මෙම කමිටුවේ දී කෘෂිකාර්මික හා ගොවිජන ක්ෂේත්‍රයේ උසස් නිලධාරීන්ට යම් යම් යෝජනා හෝ අදහස් ලබාදීමට ගොවි සංවිධාන නියෝජිතයන් ක්‍රියාකර තිබෙන අතර ඒවා ප්‍රදේශය සම්බන්ධ තීරණ ගැනීමේ දී සැලකිල්ලට භාජනය කරයි.

### 3.14.10 ප්‍රදේශයේ ආර්ථිකය තුළ දැකිය හැකි වෙනත් විශේෂිත ලක්ෂණ

ප්‍රදේශයේ කෘෂිකර්මය සඳහා සම්පත් බහුල වශයෙන් පැවතුන ද කෘෂි නිෂ්පාදනය සීමා වී ඇත්තේ පරිභෝජනයට පමණි. ගම ආර්ථික ඒකකයක් ලෙස සලකා කෘෂි සම්පත් නිසි කළමනාකරණයට ලක් කිරීමක් දක්නට නැත. එම නිසා, ගම තුළ පැවති සාම්ප්‍රදායික ආකාරයේ වගා රටාව තවදුරටත් එලෙස පවතී. අක්කරයකින් ලබන වී අස්වැන්න බුසල් 80 -85 අතර මට්ටමකි. පොල් වගාව වසර 70ක තරම් පරණ වන අතර අස්වැන්න අඩු ය. නව වගාවක් ආරම්භ වීමක් සිදු වී නොමැත. පලතුරු, හා සුළු අපනයන බෝග වගාව ද ව්‍යාප්ත වී ඇත්තේ සුළු වශයෙනි.

කිරි ගව පාලනය හා වෙනත් සත්ත්ව පාලන කටයුතු ඉතාම පහළ මට්ටමක පවතී. ගමෙහි සත්ත්ව නිෂ්පාදනය අතිශයින් දුර්වල මට්ටමක වේ. එම නිසා, ගමේ ආර්ථිකය විවිධාංගීකරණයට භාජනය වීම හා පවතින කෘෂිකාර්මික රටාව පරිභෝජන මට්ටමේ සිට ව්‍යාපාරික මට්ටමට ඔසවා තැබීමේ ප්‍රයත්නයක් දක්නට නොලැබේ.

ප්‍රදේශයේ අත්තම් ක්‍රමය ආශ්‍රයෙන් ශ්‍රම හුවමාරුව අවම තත්ත්වයකට පත්ව ඇති අතර පෙර දී ශ්‍රමයෙන් කරන ලද කෘෂිකාර්මික කටයුතුවලට යන්ත්‍ර භාවිතය ආදේශ වී තිබේ. එම නිසා, ගමේ පිරිමි මෙන් ම කාන්තා ශ්‍රමය නිෂ්පාදන කාර්යයේ දී භාවිතයට ගැනීමක් දක්නට නොමැති අතර ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියේ මූලිකත්වයෙන් කාන්තාවන් කොහු ලණු ඇඹරීම, ඉදල් සෑදීම හා මැහුම් කටයුතු සඳහා යොමු කරවා සිටිය ද ඒ සුළු පිරිසකි. විශාල කාන්තා ශ්‍රමය නිෂ්පාදන කාර්යයක යෙදීමේ අවස්ථාව පවතී.

මොදරවාන දකුණ ගොවි සංවිධානය සම්බන්ධයෙන් හෙළි වූ ඉහත කරුණු ආශ්‍රයෙන් පෙනී යන්නේ මෙම ගොවි සංවිධානය ප්‍රදේශයේ පවතින කෘෂිකාර්මක පසුබිම සඳහා සිය සේවාව සැපයීම පමණක් සිදු කරන බවයි. එසේ වුව ද, නව සිතුම් පැතුම් නව අදහස් හා නිර්මාණශීලී අදහස් මත ක්‍රියා කරමින් ගොවි සංවිධාන සාමාජිකයින්ගේ ජීවන මාර්ග විවිධාංගීකරණය හා පවතින ජීවන මාර්ග ඉහළ නිෂ්පාදන තත්ත්වයකට යොමු කිරීම මඟින් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට කරනු ලබන මෙහෙය අල්ප බව පැහැදිළි වේ.

ගොවි සංවිධානය වර්තමාන සමාජය පිළිබඳව හා එහි ඇති නව තාක්ෂණ හැකියාවන් පිළිබඳව හා ප්‍රජා සංවිධානයකට නිසි නායකත්වයක් ලබාදීමෙන් ඉටු කර ගත හැකි විවිධ ප්‍රතිලාභ පිළිබඳව පුළුල්ව නො සිතන බවක් පෙනී යයි. එකම නායකත්වයක් වසර ගණනාවක් තබා ගැනීමෙන් සංවිධානයට අලුත් අදහස් එක් නොවන අතර සංවිධානය සාම්ප්‍රදායික ගමන් මඟක පමණක් යෙදේ. දෙවන පෙළ නායකත්වයක් පුරුදු නො කිරීමෙන් සංවිධානයේ අනාගත පැවැත්ම පිළිබඳව ගැටලුවකට මුහුණ පෑමට ද සිදු වන බව පෙනේ.

### 3.14.11 සාරාංශය

- එක ම නායකයෙකු විසින් දීර්ඝ කාලයක් තිස්සේ ගොවි සංවිධානය මෙහෙයවීම.
- දේශපාලන සබඳතා මත සංවිධානය විසින් කොන්ත්‍රාත් කිරීම
- සංවිධානය ජලපාලනය, ශ්‍රමදාන, පොහොර සඳහා කටයුතු කිරීම වැනි කාර්යයන් කිහිපයකට සීමා වීම
- ගොවි සංවිධානයෙන් කළ යුතු කාර්යයන් කිරීම සඳහා ගම තුළ වෙනත් සංවිධාන ගොඩනැඟී තිබීම
- වී වගාවේ ඵලදායීතාවය හා නිෂ්පාදන වියදම අඩු කිරීම සම්බන්ධයෙන් ගොවි සංවිධානයේ මැදිහත්වීම දුර්වල මට්ටමක පැවතීම
- ප්‍රදේශයේ ගොවීන්, කඩ හිමියන්, ට්‍රැක්ටර් හිමියන් වැනි පුද්ගලයන්ගේ ණයකරුවන් බවට පත් වී තිබීම

# සිව්වැනි පරිච්ඡේදය

# සිද්ධි අධ්‍යයන ආශ්‍රයෙන් ගොවි සංවිධාන විමසුම

## 4.1 හැඳින්වීම

ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය ඇගයීමට ලක්කිරීම සඳහා ඒවායින් සිය සාමාජිකයාට, පොදුවේ ගොවි ප්‍රජාවට හා කෘෂිකර්ම ක්ෂේත්‍රයට සිදුවන සේවය පිළිබඳව විශ්ලේෂණයක යෙදිය යුතු ය. ඒ අනුව, ගොවි සංවිධාන විසින් ගොවිජන ක්ෂේත්‍රයට සිදුකළ යුතු සේවාවන් හඳුනාගෙන ඒවා අධ්‍යයනයට ලක් කරන ලද ගොවි සංවිධානවල අඩංගු වී ඇද්දැයි විමසීමට ලක්කිරීම මෙම පරිච්ඡේදයේ අභිමතාර්ථය වෙයි.

සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය හරහා ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය ඇගයීමේ ක්‍රියාවලියේ දී නිර්ණායක ගණනාවක් භාවිතා කරන ලදී. එම නිර්ණායක ඔස්සේ විමසුමට ලක් කරන ගුණාංග කොපමණ ප්‍රමාණයක් අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධානවල අඩංගු වී ඇද්ද යන්න මත ගොවි සංවිධාන ශ්‍රේණිගත කිරීමක් කරන ලදී.

## 4.2 ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය ඇගයීමේ දී භාවිතයට ගත් නිර්ණායක

වර්ෂ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ ගොවි සංවිධාන විසින් සිදු කළ යුතු යැයි දක්වා ඇති බලතල හා 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ හොඳ ම ගොවි සංවිධානය තෝරා ගැනීමේ තරඟයේ දී භාවිතයට ගැනීම සඳහා සකස් කරන ලද නිර්ණායක පරිශීලනය කිරීම තුළින් උසස් ක්‍රියාකාරීත්වයක් පැවති ගොවි සංවිධානවල දක්නට ලැබුණු ලක්ෂණ පදනම් කරගෙන ගොඩනගා ගන්නා ලද නිර්ණායක සිද්ධි අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධානවල කාර්යසාධනය ඇගයීමේ දී භාවිතයට ගන්නා ලදී.


එසේ සකස් කර ගන්නා ලද නිර්ණායක සහ එම එක් එක් නිර්ණායක ගොවි සංවිධානය සඳහා අදාළ වූ ආකාරය පහත සඳහන් පරිදි දැක් වේ.

### 4.2.1 සාමාජිකත්වය වර්ධනය කරගැනීම

සාමාජිකත්වය වර්ධනය කර ගැනීම සඳහා විශේෂ වැඩසටහන් සංවිධානය කරන ගොවි සංවිධාන පහක් පමණක් හමුවිය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අධ්‍යයනයට භාජනය කරන ලද සංවිධාන අතුරින් මීරිහත්පිටිගම අරුණ ගොවි සංවිධානය සාමාජිකත්වය වර්ධනය කරගැනීම සඳහා සභාපති, ලේකම් හා කාරකසභාව ඇතුළත් සංවිධානය වූ පිරිසක් ගමේ නිවෙස්වලට ගොස් ගොවි සංවිධානය පිළිබඳ පැහැදිළි කිරීමක් මඟින් නව සාමාජිකයන් බඳවා ගැනීමට ක්‍රියාකර තිබුණි. නාගොල්ලාගම "එකමුතු" ගොවි සංවිධානය **"ගොවි ගෙදරින් අලුත් ගමක්"** නැමැති වැඩසටහන ක්‍රියාත්මක කරමින් නව සාමාජිකයින් බඳවා ගනී. මැල්සිරිපුර "නෑෂතල්වැව" ගොවි සංවිධානය වර්ෂයකට වරක් නව සාමාජිකයින් බඳවා ගැනීමේ විශේෂ වැඩසටහනක් පවත්වන අතර මාසයයක කාලයක් ඒ වෙනුවෙන් යොදවන බව හෙළි විය. බදුල්ල දිස්ත්‍රික්කයේ "පල්ලේපැල" ගොවි සංවිධානය ද වර්ෂයකට වරක් නව සාමාජිකයින් බඳවා ගැනීම සඳහා දැන්වීම් මඟින් ගමේ ගොවි පවුල් දැනුවත් කරයි. අනුරාධපුර ඇලයාපත්තුව "පෙවන" ගොවි සංවිධානය ද සෑම වසරකම නව

සාමාජිකයින් බඳවා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කොට ගමේ එක් එක් කොටස්වලින් සාමාජිකයින් බඳවා ගනී. අධ්‍යයනයට ලක්කරන ලද සෙසු ගොවි සංවිධානවල නව සාමාජිකයින් බඳවාගැනීමේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක නොවේ. රූප සටහන් අංක 4.2.1 මගින් අධ්‍යයනයට ලක් කළ මුළු ගොවි සංවිධානවල ප්‍රතිශතයක් ලෙස දක්වයි.

**ප්‍රස්තාර සටහන් අංක 4. 2.1: සාමාජිකත්වය වර්ධනය කරගැනීම සඳහා විශේෂ වැඩසටහන් සංවිධානය කර තිබූ ගොවි සංවිධාන**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා


**සංවිධානයේ සාමාජිකත්වය වර්ධනය කරගැනීම සඳහා විශේෂ වැඩසටහන් සංවිධානය කර තිබුනේ ද යන්න පිළිබඳ තත්ත්වය**

විශේෂ වැඩසටහන් සංවිධානය කර සාමාජිකයන් බඳවා ගැනීම - 5/14 (35%)

### 4.2.2 වී වගාව සඳහා සහනාධාර පොහොර බෙදාහැරීම

ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබා ගැනීම සඳහා අවශ්‍ය මූලික කාර්යයන් ඉටු කිරීම මෙම ගොවි සංවිධාන සියල්ල විසින් සිදු කරයි. මේ අතරින් බදුල්ල දිස්ත්‍රික්කයේ ණිය අරාව, සේනාති යන ගොවි සංවිධාන පොහොර තොගය ගමට ගෙනවුත් දීමේ කාර්යයන් පමණක් සිදු නො කරන අතර ඒ සම්බන්ධ සෙසු කාර්යභාරය ද ඉටු කරයි. සුළංකපොල්ල ගොවි සංවිධාන බල ප්‍රදේශයේ වී වගාව සිදු නො කරන නිසා සහනාධාර පොහොර නො ලැබේ. මිහින්තලේ පාළුවැව ගොවි සංවිධානය පොහොර ගබඩාවක් පවා ඉදිකර ඇති අතර ගෙන එන පොහොර තොග ගබඩා කර තබා අවශ්‍ය අවස්ථාවේ දී බෙදා දීමට එය භාවිතා කරයි. පොහොර සහනාධාරය හා සම්බන්ධ විශේෂ වැඩ කොටසක් ඉටු කරන ගොවි සංවිධාන සංඛ්‍යාව අධ්‍යයනයට ලක් කළ මුළු ගොවි සංවිධානවලින් 93%කි. එය ප්‍රස්තාර සටහන් අංක 4.2.2න් දක්වා තිබේ.

ප්‍රස්තාර සටහන් අංක 4.2.2: සහනාධාර පොහොර ගොවීන්ට ලබාදීම




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**සහනාධාර පොහොර ගොවීන්ට ලබාදීම සම්බන්ධයෙන් ගොවි සංවිධාන ගෙන ඇති ක්‍රියාමාර්ග**

**සහනාධාර පොහොර ගොවීන්ට ලබාදීම**


- අදාළ මූලික කටයුතු පමණක් කිරීම - 1/14 (7%)
- පොහොර ගමට ගෙනවුත් දීම - 12/14 (93%)

**4.2.3 ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ගොවි සංවිධානයේ අරමුදල් ස්ථාපිත කර එය භාවිතා කොට ගොවි සාමාජිකයින් සඳහා ණය සැපයීම හෝ ගොවි සංවිධානය ගොවිජන බැංකුවේ කොටස් මිලට ගෙන ඒ මගින් සාමාජිකයින් සඳහා ණය සපයා දීම සිදු කරන්නේ නම් එය ගොවීන්ට මහත් පහසුවකි. මෙම කාර්යයේ දී ණයඅරාව ගොවි සංවිධානය හා සේනාති යන ගොවි සංවිධාන දෙක පමණක් ඉහත ක්‍රම දෙක ඔස්සේ ණය සපයාදීමක් නො කරන බව අනාවරණය විය. අරුණ ගොවි සංවිධානය සිය සාමාජිකයන් ගොවි සංවිධානය තුළ කරන ඉතිරි කිරීම් භාවිතා කොට ණය සපයයි. එකමුතු ගොවි සංවිධානය තම සංවිධානය සතු අරමුදලින් ණය සපයයි. දහදියමල් ගොවි සංවිධානය ගොවිජන බැංකුවේ කොටස් මිල දී ගෙන ඇති අතර ඒමගින් ණය සපයයි. නැෂතල්වැව ගොවි සංවිධානය සිය ඉතිරි කිරීම් යොදාගෙන ණය සපයයි. ණයඅරාව ගොවි සංවිධානය ණය සැපයීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නො කරන්නේ එහි අරමුදල් යොදවා සාමාජිකයන්ට ණය ලබාදීමට අකමැත්තක් දැක්වීමේ ආකල්පය හේතුවෙනි. සේනාති ගොවි සංවිධානය ප්‍රමාණවත් අරමුදලක් නොමැතිකම හා සංවිධාන ශක්තිය දුර්වල නිසා ණය සැපයීම් සිදු නො කරයි. පල්ලේපැල ගොවි සංවිධානයේ ගොවි බැංකුවේ කොටස් මිල දී ගෙන ඇති නිසා ගොවිජන බැංකුව හරහා ණය සපයයි. සෙවන ගොවි සංවිධානය සිය අරමුදල් යොදවා ණය සපයයි. පාළුවැව ගොවි සංවිධානය ද සිය අරමුදල් යොදවා ණය සපයයි. මාතර දිස්ත්‍රික්කයේ කොටපොළ උතුර ගොවි සංවිධානය ණය මුදල් සැපයීමක් නැත.

එයට හේතුව, එහි අරමුදල් යොදවා සුබසාධක කටයුතු සිදු කිරීමයි. ණය සැපයීම සඳහා කුඩා තේ වතු සමිතිය හා ස.ණ.ස. සමිතිය ක්‍රියාකරයි. දැරංගල ගොවි සංවිධානය විසින් ද ණය පහසුකම් සපයන්නේ නැත. හේතුව, එවැනි ක්ෂේත්‍ර කරා ගොවි සංවිධානය මෙහෙයවීමට ශක්තියක් නොවීමයි. කතංකේ වැල්ලාන ගොවි සංවිධානය ද ණය සැපයීමක් සිදු නො කරයි. එයට හේතුව ණය සැපයීම වැනි භාරදූර කාර්යයක් සිදු කිරීමට හැකියාවක් ගොවි සංවිධානයේ නිලධාරී මණ්ඩලයටම නොමැතිවීමයි. මොදරවාන දකුණ ගොවි සංවිධානය ද ණය සැපයීමක් සිදු නො කරයි. හේතුව මෙම ගොවි සංවිධානය එවැනි ක්ෂේත්‍රයක් පිළිබඳව අවධානය යොමු නො කිරීමත්, ප්‍රදේශයේ ස්වයං බැංකු සමාජය නමින් බැංකු ව්‍යාපාරයක් ක්‍රියාත්මක වීමත් ය. ප්‍රදේශයේ ගොවීන් සිය ණය අවශ්‍යතා විකල්ප මාර්ග මගින් සපුරා ගනී. අධ්‍යයනයට ලක් කරන ලද ගොවි සංවිධාන අතුරින් ණය වැඩසටහන් ක්‍රියාත්මක කරන ගොවි සංවිධාන සංඛ්‍යාව 8කි. එය අධ්‍යයනයට ලක් කළ මුළු ගොවි සංවිධාන සංඛ්‍යාවෙන් 59%කි. එය ප්‍රස්තාර සටහන් අංක 4.2.3 යටතේ දක්වා ඇත.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.3: ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ණය සැපයීම සම්බන්ධයෙන් අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන 14 යම් කිසි ක්‍රියාමාර්ගයක් අනුගමනය කර තිබුනේ ද යන ස්වභාවය**

**ණය සැපයීම**


- සංවිධානයේ අරමුදල් ණය ලෙස සැපයීම - 5/14 (37%)
- ගොවි බැංකුවේ අරමුදල් ණය ලෙස සැපයීම - 3/14 (22%)

**4.2.4 ගොවි සංවිධාන සාමාජිකයින් මුදල් ඉතිරි කිරීමට පෙළඹවීම.**

අරුණ ගොවි සංවිධානය සාමාජිකයන්ට මුදල් ඉතිරි කිරීමට පහසුකම් සලසා දී ඇත. ඉතිරි කරන මුදල් වඩා වැඩි පොලියකට විවිධ ණය සැපයීමට භාවිතා කරයි. මැල්සිරිපුර නැඹනල්වැව ගොවි සංවිධානය තම සාමාජිකයින්ට මුදල් ඉතිරි කිරීම සඳහා සංවිධානය තුළ ඉඩකඩ සලසා දී තිබේ. ඒ අනුව, සාමාජිකයින් සාමාන්‍ය තැන්පතු, ස්ථාවර තැන්පතු හා කොටස් මුදල් වශයෙන් ඉතිරි කරයි. බදුල්ල පල්ලේපැල හා සුළුංකපොල්ල ගොවි සංවිධානය ද තම සාමාජිකයින් සඳහා මුදල් ඉතිරි කිරීමට ඉඩකඩ සලසා ඇති අතර එසේ කරන්නේ

ගොවි බැංකුවේ කොටස් ලබාගැනීමට සැලස්වීමෙනි. ඇලයාපත්තුව සෙවන කාන්තා ගොවි සංවිධානය ද තම සාමාජිකයන්ට මුදල් ඉතිරි කිරීමට වැඩි පෙළඹවීමක් ඇති කර ඇත. එහි දී, කුඩා කණ්ඩායම් ඇති කර, එක් එක් කණ්ඩායම්වල සාමාජිකයින් මාසයකට රුපියල් 100ක් මුදලක් ඉතිරි කළ යුතු වේ. මේ හැර සෙසු ගොවි සංවිධාන තම සාමාජිකයින්ට මුදල් ඉතිරි කිරීමට පුරුදු කොට නැත. සංවිධානය තුළ මුදල් ඉතිරි කිරීමට පහසුකම් සලසා ඇති ගොවි සංවිධාන සංඛ්‍යාව පහකි. එය අධ්‍යයනයට ලක් කළ මුළු ගොවි සංවිධාන සංඛ්‍යාවෙන් 51%කි. එය ප්‍රස්තාර සටහන් අංක 4.2.4 මඟින් දැක් වේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.4: ගොවි සංවිධාන සාමාජිකයන්ට සංවිධානය තුළ මුදල් ඉතිරි කිරීමට පහසුකම් සැලසීම.**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**සාමාජිකයන්ට මුදල් ඉතිරි කිරීමට පහසුකම් සලසා දී තිබුනේ ද යන්න පිළිබඳව පැවති තත්ත්වය පිළිබඳ විමසුම**

මුදල් ඉතිරි කිරීම

සංවිධානය තුළ මුදල් ඉතිරිකිරීම – 4/14 (29%)


ගොවිජන බැංකුවේ මුදල් ඉතිරි කිරීම – 1/14 (22%)

**4.2.5 කුඩා කණ්ඩායම් සංවිධානය කිරීම**

අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන අතරින් අරුණ ගොවි සංවිධානය, එකමුතු ගොවි සංවිධානය, නැෂනල්වැව ගොවි සංවිධානය යන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවි සංවිධාන විසින් සිදු කොට ඇත. මේ සියල්ලම මෙලෙස කුඩා කණ්ඩායම් සංවිධානය කොට ඇත්තේ ගොවිජන බැංකු ණය සැපයීම හා ශ්‍රමදාන මඟින් කෘෂිකාර්මික කටයුතු සිදු කර ගැනීම සඳහා ය. බදුල්ල දිස්ත්‍රික්කයේ පල්ලේපැල ගොවි සංවිධානය ද ගොවි බැංකු ණය සඳහා කුඩා කණ්ඩායම් සංවිධානය කොට තිබේ. අනුරාධපුර සෙවන කාන්තා ගොවි සංවිධානය කුඩා කණ්ඩායම් මාර්ගයෙන් එම සංවිධානයේ කාර්යයන් රාශියක් සිදු කරන නිසා කුඩා කණ්ඩායම් සංවිධානය කොට ඇත. ප්‍රස්තාර සටහන් අංක 4.2.5 මඟින්

දක්වා ඇත්තේ කුඩා කණ්ඩායම් සංවිධානය කොට ඇති ගොවි සංවිධාන පහයි. එය මුළු ගොවි සංවිධාන සංඛ්‍යාවෙන් 36%කි.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.5: කුඩා කණ්ඩායම් සංවිධානය කිරීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ගොවි සංවිධානවල සාමාජිකයන් කුඩා කණ්ඩායම් වශයෙන් ගොනු කිරීම සම්බන්ධයෙන් ගොවි සංවිධාන 14 ක්‍රියාමාර්ග ගෙන තිබේ ද යන්න පිළිබඳ විමසුම**

**කුඩා කණ්ඩායම් ගොඩනැංවීම**


- ඉතිරි කිරීම් හා ණය දීම - 3/14 (22%)
- ශ්‍රමදාන හා අත්තම්වලට වැඩ කිරීම - 2/14 (15%)

**4.2.6 බීජ හා රෝපණ ද්‍රව්‍ය සපයාදීම**

අරුණ ගොවි සංවිධානය, එකමුතු ගොවි සංවිධානය එළවළු බීජ හා බීජ වී, පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය, පැළ වර්ග ගොවීන්ට සපයයි. දහදියමල් ගොවි සංවිධානය පොහොර, පැළවර්ග, බීජ වී සපයා දෙයි. නැෂතල්වැව ගොවි සංවිධානය පැළවර්ග සැපයීම, තාක්ෂණය සපයාදීම, කාබනික පොහොර නිෂ්පාදනය වැනි ගෙවතු වගා වැඩමුළු පැවැත්වීම සිදු කරනු ලබයි. පල්ලේපැල ගොවි සංවිධානය ගොවීන්ට අවශ්‍ය අර්තාපල් බීජ හා පොහොර සපයා දෙයි. පාළුවැව හා සෙවන යන ගොවි සංවිධාන ද සාමාජිකයින්ට බීජ හා පැළ වර්ග සපයා දී තිබේ.

සේනානි ගොවි සංවිධානය ප්ලාස්ටික් කුඩා සැපයීම, රතුළුණු බීජ සපයාදීම හා මී මැසි පෙට්ටි සපයා දී ඇති බව හෙළි විය. කොටපොල උතුර ගොවි සංවිධානය ගොවීන්ට සුළු අපනයන බෝග වගා පැළ ලබාදීම සිදු කොට ඇත. දැරංගල ගොවි සංවිධානය බිත්තර වී සැපයීම හා එළවළු බීජ සැපයීම සිදු කොට තිබේ. කනංකේ ගොවි සංවිධානය සුවඳැල් වැනි පැරණි වී වර්ග හඳුන්වා දී ඇත. මොදරවාන ගොවි සංවිධානය ගෙවතු වගාකරුවන්ට අවශ්‍ය බීජ හා පැළ ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් ලබා දී ඇත. එලෙස යෙදවුම් සපයා දෙනු ලබන ගොවි සංවිධාන සංඛ්‍යාව දොළහකි. එය ප්‍රතිශතයක් ලෙස 86%කි. ප්‍රස්තාර සටහන් අංක 4.2.6 මගින් දැක් වේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.6: බීජ හා රෝපණ ද්‍රව්‍ය සපයා දීම.**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**කෘෂිකාර්මික යෙදවුම් තම සාමාජිකයන්ට සපයාදීම සම්බන්ධයෙන් ගොවි සංවිධාන 14 හි තත්ත්වය විමසා බැලීම**

**යෙදවුම් සපයා දීම**


- බීජ, පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය සංවිධානය විසින් සපයාදීම - 12/14 (86%)

**4.2.7 පොදු දේපළ (වැව, ජලමූලාශ්‍ර, ඇළ පද්ධති, කෘෂි මාර්ග) සුරැකීම**

කෘෂිකාර්මික සමාජයේ පොදු දේපළ වන වැව, ජල මූලාශ්‍ර, වාරි ඇල පද්ධති, කෘෂි මාර්ග යනාදිය නඩත්තු කිරීම, ශ්‍රමදාන මගින් ප්‍රතිසංස්කරණය කිරීම ආදී කාර්යයන් අරුණ, එකමුතු, දහදියමල්, නැෂනල්වැව, පල්ලේපැල සහ පාළුවැව යන ගොවි සංවිධානයන් විසින් සිදු කරනු ලබයි. කොටපොල උතුර මහසෙන් ගොවි සංවිධානය විසින් ශ්‍රමදානයෙන් ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණය කරයි. මොදරවාන ගොවි සංවිධාන බල ප්‍රදේශයට අයත් වැව් නඩත්තුව ඇල මාර්ග නඩත්තුව, පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා ඇල මාර්ග ශ්‍රමදානයෙන් සකස් කරදීම යනා දී වශයෙන් කෘෂිකාර්මික පොදු දේපළ නඩත්තු කරන බව හෙළි විය. පල්ලේපැල ගොවි සංවිධානය ඇල මාර්ග ප්‍රතිසංස්කරණය, ජල මූලාශ්‍ර සුරැකීම යනාදිය සිදු කරයි.

මෙම කාර්යයන් ඉටු කරනු ලබන ගොවි සංවිධාන හත ප්‍රස්තාර සටහන් අංක 4.2.7 යටතේ දැක් වේ. පොදු දේපළ නඩත්තුව හා සුරැකීම අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන සංඛ්‍යාවෙන් 50%කි.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.7: පොදු දේපළ නඩත්තු කිරීම හා සුරැකීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**පොදු දේපළ සුරැකීම සම්බන්ධයෙන් ගොවි සංවිධාන ක්‍රියාත්මක වී ඇති ආකාරය**


පොදු දේපළ සුරැකීම

වැව්,ඇළ පද්ධති, ජල මූලාශ්‍ර, කෘෂි මාර්ග සුරැකීම හා නඩත්තුව – 7/14(50%)

**4.2.8 ජල කළමනාකරණය කිරීම**

වැවේ ජලය, වාරි ඇලවල්වල ජලය කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කිරීමේ දී එවා කළමනාකරණයකින් යුතුව සාධාරණව බෙදාදීමේ කාර්ය ගොවි සංවිධානවල වගකීමකි. අරුණ ගොවි සංවිධානය, එකමුතු ගොවි සංවිධානය, දහදියමල් ගොවි සංවිධානය, පල්ලේපැල ගොවි සංවිධානය, පාළුවැව ගොවි සංවිධානය සහ මොදරවාන ගොවි සංවිධානය ජලපාලකවරුන් පත් කොට කාර්ය සිදු කර යායේ සියලුම ගොවීන්ට ජලය සපයයි. මෙම කාර්යය සඳහා ගොවීන් විසින් සලාරිස් ගෙවීමක් කරයි. වාරි ජලය කළමනාකරණය කිරීමේ කාර්යය සිදු කරන ගොවි සංවිධාන හය ප්‍රස්තාර සටහන් අංක 4.2.8 යටතේ එය විශේෂිත කර දක්වා ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 44%කි.

**රූප සටහන් අංක 4.2.8: ජල කළමනාකරණය සම්බන්ධ කාර්යයන් ඉටුකිරීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ගොවි සංවිධාන විසින් ජල කළමනාකරණය මගින් සෑම ගොවියෙකුට ම සාධාරණ ලෙස ජලය සපයාදීමට යම් කිසි ක්‍රියාමාර්ගයක් ගෙන තිබේ ද යන්න විමසා බැලීම**

**ජල කළමනාකරණය**


- ජල පාලකවරුන් පත් කිරීමෙන් (ගෙවීම් යටතේ) - 6/14 (44%)

මාතර දිස්ත්‍රික්කයේ අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන තෙත් කලාපයේ පිහිටි බැවින් ජල කළමනාකරණය කිරීමක් අවශ්‍ය නොවේ.

## 4.2.9 කන්න රැස්වීම් සංවිධානය කිරීම

අධ්‍යයනය කරන ලද සියලුම ගොවි සංවිධාන කන්න රැස්වීම් සංවිධානය කරන බව හෙළි විය. අරුණ ගොවි සංවිධානය වගා කන්න දෙක සඳහා කන්න රැස්වීම් සංවිධානය කරයි. මේ සඳහා ගොවිජන සේවා සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් ද සම්බන්ධ කර ගැනේ. ගොවිතැන පිළිබඳ තීරණ ගැනීම, සහනාධාර පොහොර ලබාගැනීම හා බීජ වී ලබාගැනීම මෙහි දී සාකච්ඡා කරයි. මෙම රැස්වීම ගොවීන්ට නව තාක්ෂණය හා කෘෂි දැනුම බෙදා දෙන අවස්ථාවක් ද වේ. එකමුතු ගොවි සංවිධානය ද කන්න රැස්වීම සංවිධානය කරයි. එදිනට, ගොවිජන සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම උපදේශක වැනි නිලධාරී මහතෙකුට ආරාධනා කර ගොවීන්ට උපදෙස් දීමට ද ක්‍රියාකරයි. දහදියමල් ගොවි සංවිධානයේ කන්න රැස්වීම පවත්වන අතර මෙම රැස්වීමේ දී කෘෂිකර්ම උපදේශක මහතා ද පැමිණ කුඹුරුවල පාංශු පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමට සම්බන්ධ කාර්යයන් වන කොම්පෝස්ට් පොහොර, පිදුරු යෙදීම, කොළ අතු දැමීම යනා දී කාර්යයන් පිළිබඳව ගොවීන් දැනුවත් කරයි. නැඹතල් වැව ගොවි සංවිධානය ද කන්න රැස්වීම් සංවිධානය කරයි. අධ්‍යයනය කළ ඉතිරි සියලු ගොවි සංවිධානයන් ද කන්න රැස්වීම සංවිධානය කරන අතර කෘෂිකර්මය පිළිබඳව ප්‍රායෝගිකක දැනුමක් ලබාදීමට ද මෙම අවස්ථාව භාවිතා කොට තිබුණි. ඒ අනුව, ගොවි සංවිධාන 100%ක් කන්න රැස්වීම් සංවිධානය කොට තිබුණි. එය රූප සටහන් අංක 4.2.9 මගින් දැක් වේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.9: කන්න රැස්වීම් සංවිධානය කිරීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**සංවිධානයේ සාමාජිකයින් එක්රැස් කර රැස්වීම් සාකච්ඡා පැවැත්වීම සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාමාර්ග අනුගමනය කරන්නේ ද යන වග විමසීම**


**රැස්වීම් පැවැත්වීම**

- කාරක සභා රැස්වීම්, වාර්ෂික මහා සභා රැස්වීම් හා කන්න රැස්වීම් නියමිත පරිදි පැවැත්වීම - 10/14 (71%)
- වාර්ෂික මහා සභා රැස්වීම හා කන්න රැස්වීම් පමණක් පැවැත්වීම - 4/14 (29%)

**4.2.10 වාර්ෂික සැලසුම් සැකසීම**

අරුණ ගොවි සංවිධානය සෑම වසරක ම ජනවාරි මැද සිට දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා වූ සංවර්ධන සැලැස්මක් සකස් කරනු ලබයි. මෙහි සැලසුම් සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට කළ යුතු කාර්යයන් ද සඳහන් කර ඇත. එකමුතු ගොවි සංවිධානය ද එක් එක් වර්ෂයේ ක්‍රියාවට නැංවීම සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කරනු ලබයි. අනුරාධපුර, ඇලයාපත්තුව සෙවන කාන්තා ගොවි සංවිධානය විසින් ද වාර්ෂික සැලැස්මක් සකස් කරනු ලබයි. එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සංවිධානය බැඳී සිටී. පල්ලේපැල ගොවි සංවිධානය ද සෑම වර්ෂයක ම ක්‍රියාත්මක වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාවට නංවයි. වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් සංවිධානය කරන ගොවි සංවිධාන හතරකි. එය මුළු ගොවි සංවිධාන සංඛ්‍යාවෙන් 29%ක් වන අතර ප්‍රස්තාර සටහන් අංක 4.2.10 යටතේ එය දැක් වේ.

**රූප සටහන් අංක 4.2.10: වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සිදු කරන ගොවි සංවිධාන**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**තම බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධනය සඳහා සැලසුම් සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට ගොවි සංවිධාන ක්‍රියාමාර්ග ගනු ලැබුවේ ද යන විමසුම**


**සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම**

- වාර්ෂික සැලසුම් - 4/14 (29%)

### 4.2.11 නීතිමය බලතල පිළිබඳ ගොවි සංවිධාන නිලධාරීන් හට ඇති අවබෝධය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විවිධ කාලවකවානුවල දී ගොවි සංවිධානවල නීතිමය බලතල ලබාදෙමින් පනත් සම්මත කොට තිබේ. ගොවි සංවිධාන විසින් තම කාර්යයන් කිරීමේ දී එම පනත් පිළිබඳව ඇති අවබෝධය ඉතා වැදගත් වේ. අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන බහුතරයකට එම පනත්වලින් ගොවි සංවිධානවලට හිමි වී ඇති නීතිමය බලතල පිළිබඳ අවබෝධය ඉතාම පහළ මට්ටමක පැවතිණි. මෙම ගොවි සංවිධාන අතුරින් අරුණ ගොවි සංවිධානය හා එකමුතු ගොවි සංවිධානය නැෂනල්වැව සහ පල්ලේපැල හා සෙවන යන ගොවි සංවිධාන පහ පමණක් ගොවි සංවිධානවලට හිමි වී ඇති නීතිමය බලතල පිළිබඳ යම් කිසි අවබෝධයක් ලබා තිබුණි. සෙසු ගොවි සංවිධාන, සංවිධාන ලෙස ක්‍රියාත්මක වුව ද, ගොවිජන පනත් හා නීතිමය බලතල පිළිබඳ අවබෝධයක් නැති බව පැහැදිළි විය. ප්‍රස්තාර සටහන් අංක 4.2.11 මඟින් ගොවිජන පනත් හා එමඟින් ගොවි සංවිධානවලට පැවරී ඇති නීතිමය බලතල පිළිබඳව අවබෝධයක් ඇතිව ක්‍රියාත්මක වන ගොවි සංවිධාන පහ (36%)විශේෂිත කර දක්වා ඇත.

ප්‍රස්තාර සටහන් අංක 4.2.11: නීතිමය බලතල පිළිබඳව ඇති අවබෝධය




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**නීතිමය බලතල පිළිබඳව අවබෝධයක් සහිත ගොවි සංවිධාන**

නීතිමය බලතල පිළිබඳ අවබෝධය 5/14 (36%)

**4.2.12 කෘෂි බෝග අලෙවිය සඳහා මැදිහත්වීම**


එක් එක් ගොවි සංවිධාන බල ප්‍රදේශ තුළ නිෂ්පාදිත කෘෂි බෝග අලෙවි කිරීමේ ගැටලු පැන නගින අවස්ථාවල දී ඒවා අලෙවි කිරීම සඳහා ගොවි සංවිධානවල මැදිහත් වී එම අලෙවි ගැටලු විසඳා දෙන්නේ නම් ප්‍රදේශයේ ගොවීන්ට එය පහසු එමෙන් ම උපකාරයකි. අරුණ, එකමුතු සහ පාළුවැව යන ගොවි සංවිධාන වී අලෙවි මණ්ඩලය වී මිලදී ගැනීමට ඉදිරිපත් වන අවස්ථාවල දී ඒ සඳහා පොදු ස්ථාන සකස් කොට දී ප්‍රදේශයේ වී අලෙවි කරන ගොවීන්ට පහසුකම් සලසා දෙයි. පල්ලේපැල ගොවි සංවිධානය තම බල ප්‍රදේශයේ ප්‍රධාන මුදල් බෝගය අර්තාපල් වන බැවින් අර්තාපල් මිල පහළ ගිය අවස්ථාවල දී සහ අර්තාපල් මිල පහළ යාමට හේතු වන ආකාරයේ තීරු බදු ප්‍රතිපත්ති සකසන විට, ඊට එරෙහිව පුවත්පත් ලිපි ලිවීම, උද්ඝෝෂණ සංවිධානය කිරීම යන කාර්යයන් උපයෝගී කර ගනිමින් අර්තාපල් මිල ඉහළ නංවා ගැනීමට ක්‍රියා කොට තිබේ. එසේ වුවත්, කෘෂි බෝග අලෙවිය සඳහා මෙම ගොවි සංවිධාන කිසිවක් සෘජුව මැදිහත් වී නොමැති බව හෙළි විය.

කෘෂි බෝග අලෙවිය සඳහා ගොවි සංවිධානය මැදිහත්වීම 0/14

### 4.2.13 වාර්ෂික නව නායකයන් පත්කර ගැනීම

අධ්‍යයනයට ලක් කරන ලද සියලුම ගොවි සංවිධාන වාර්ෂික මහ සභා රැස්වීම් පවත්වන අතර නව නිලධාරී මණ්ඩලයක් පත්කර ගැනීමට එහි දී අවස්ථාව සැලසෙයි. එසේ වුව ද, එක් එක් ගොවි සංවිධානයේ වර්තමාන නායකයන් ගොවි සංවිධාන සාමාජිකත්වයට සිදු කරන සේවාව හා කැපවීම වැනි හේතුන් කිහිපයක් මත එකම නායකත්වය වසර ගණනාවක් තිස්සේ පවත්වා ගැනීමට සාමාජිකත්වය ක්‍රියාකර ඇති බව පෙනේ. පල්ලේපැල හා තැෂනල්වැව ගොවි සංවිධාන එවැනි ඒවා ය. අරුණ, එකමුතු, සෙවන, පාළුවැව යන ගොවි සංවිධානවල නායකයන් එකදිගට තබා ගැනීමක් නොවන අතර වසර 02ක් හෝ 03කින් නව නායකයින් පත්කර ගනී. ගොවි සංවිධානවල වර්තමාන නායකයන් ගොවි සංවිධානය ගොඩනංවා දියුණු කිරීමට ගත් උත්සාහය, වර්තමාන කැපකිරීම යන කරුණු මත එකම නායකත්වය සාමාජිකයන්ගේ ඉල්ලීම මත තවදුරටත් තබාගෙන සිටින බව හෙළි විය. එසේ වුව ද, වසර 2,3කින් ඔවුන් වෙනස් කරන බව හෙළි විය. දහදියමල් හා වැල්ලාන ගොවි සංවිධාන පවත්වාගෙන යාම ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ගේ කැපවීම මත සිදු කරන නිසා පවතින නායකත්වය ම දිගටු ම පවත්වාගෙන යාමට සාමාජිකයින් ක්‍රියාකරයි. දහදියමල් ගොවි සංවිධානය වසර 17ක් එක ම සභාපතිවරයෙකු නායකත්වයේ තබාගෙන සිටී. සූලං කපොල්ල, සේනාති, ණය අරාව, දැරංගල, මොදරවාන යන ගොවි සංවිධානවල සාමාජිකයන්ට නායකත්වය වෙනස් කිරීමට අවශ්‍යතාවයක් නොමැති බව පෙනී යයි. ඒවායේ සාමාජිකයින් ලැබෙන සුළු හෝ ප්‍රතිලාභ ලබාගෙන එයින් තෘප්තියට පත්වෙන බව පෙනේ. කොටපොල උතුර ගොවි සංවිධානය කෘෂිකාර්මික කටයුතුවලට අමතරව තේ වගාව ආශ්‍රිතව කාර්යයන් රාශියක් කිරීමත්, සුබසාධන කටයුතුත් නිසා නායකත්වය දිගන් දිගට ම තබාගැනීමට සාමාජිකත්වය ක්‍රියාකරන බව පැහැදිලි වේ. ප්‍රස්තාර සටහන් අංක 4.2.13 මඟින් පෙන්වා දී ඇත්තේ වසර 2,3 ක් වැනි කෙටි කාලයක් තුළ දී වාර්ෂික මහා සභා රැස්වීම්වල දී සභාපති, ලේකම් වැනි නායකත්වයන් වෙනස් කිරීමට පියවර ගනු ලබන ගොවි සංවිධාන හතර වේ. එය ප්‍රතිශතයක් ලෙස 29කි.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.12: වාර්ෂිකව නව නායකයන් පත්කර ගැනීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**වාර්ෂික මහ සභා රැස්වීම්වල දී නව නායකයින් තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් ගොවි සංවිධානවල පැවති ස්වභාවය**


**නායකත්වය තෝරාගැනීම**

- නිලවරණය පැවැත්වීම - 14/14 (100%)
- නිලවරණවල දී නව නායකයින් පත්වීම - 4/14 (29%)
- දූරවල නායකත්වයක් පවත්නා නමුත් වෙනත් පුද්ගලයින් නිලතල සඳහා ඉදිරිපත් නොවීම - 10/14 (71%)

**4.2.14 දෙවන පෙළ නායකත්වය පුරුදු කිරීම**

අරුණ ගොවි සංවිධානය ප්‍රබුද්ධ ලේඛනය නමින් වැඩපිළිවෙළක් පවත්වාගෙන යන අතර කැප වී සංවිධානයට ක්‍රියාකාරීත්වය දක්වන පිරිස මෙයට ඇතුළත් කෙරේ. මෙම ප්‍රබුද්ධ ලේඛනය ඇසුරින් ඊළග නායකයින් තෝරා ගන්නා බව හෙළි විය. එකමුතු ගොවි සංවිධානය ක්‍රියාකාරී සාමාජිකයින් කාරක සභාවට පත් කොට එහි වැඩ කිරීම තුළින් ලබන පුහුණුව ලබා දී කාරක සභාවෙන් නායකත්වය සඳහා තෝරාගනී. දහදියමල් ගොවි සංවිධානය දෙවන පෙළ නායකත්වයක් පුරුදු නො කරයි. වසර 17ක් තිස්සේ ම කෘ.ප.නි.ස. වරයා විසින් ගොවි සංවිධානය ක්‍රියාකත්මක කිරීම ඊට හේතුවයි. තැෂතල්වැව ගොවි සංවිධානය ද වර්තමාන නායකත්වය ගැන බලාපොරොත්තු තබා සිටින අතර දෙවන පෙළ නායකයන් පුරුදු කිරීම කාරක සභාව තුළින් සිදු කරන බව පැහැදිළි විය. පල්ලේපැල ගොවි සංවිධානය දෙවන පෙළ නායකත්වයක් පුරුදු කරනු ලබයි. ඒ සඳහා ඔවුන් භාවිතා කරන නිර්නායකය ගොවි සංවිධානයේ කාර්ය සඳහා සාමාජිකයන් සිදු කරන කැප කිරීමයි. සෙවන ගොවි සංවිධානය පසු පෙළ නායකත්වයක් පුරුදු කරන අතර එය කුඩා කණ්ඩායම්වල කැප වී ක්‍රියාකාරී වීමෙන් ලබන පුහුණුව මාර්ගයෙන් සිදු කෙරෙයි. පාළු වැව ගොවි සංවිධානය නායකත්වය සඳහා පුද්ගලයන් පුහුණු කරනු ලබන්නේ ජලපාලනය නිසි ලෙස ඉටුකිරීම සම්බන්ධයෙන් එම පුද්ගලයා දරන කැප කිරීම මත ය. කොටපොල උතුර ගොවි සංවිධානය වර්තමාන නායකත්වය දිගට ම පවත්වාගෙන යනු ලබන අතර අනාගත නායකයන් බිහි කිරීම සඳහා ළමා සමිතියක් ආරම්භ කොට ඇත. එසේ වුව ද, එය තුළින් සාමාජිකයින් බිහිවීමට නව වසර ගණනාවක් ගත වේ. සෙසු ගොවි සංවිධානවල දෙවන පෙළ නායකයන් පුහුණු කිරීමේ විශේෂ ක්‍රමයක් දක්නට නොලැබේ. ප්‍රස්තාර සටහන් අංක 4.2.13 මඟින් විශේෂිත කර දක්වා ඇත්තේ දෙවන පෙළ නායකත්වයක් පුහුණු කිරීමේ කාර්යයයේ යෙදී සිටින බව හඳුනාගත් ගොවි සංවිධාන 6යි. එය අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස ගත් කළ 44කි.

රූප සටහන් අංක 4.2.13: දෙවන පෙළ නායකත්වයක් පුහුණු කිරීම




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**දෙවන පෙළ නායකයින් බිහි කිරීම සම්බන්ධයෙන් ගොවි සංවිධාන 14 අනුගමනය කර තිබූ පිළිවෙත**


**දෙවන පෙළ නායකත්වය සඳහා පුහුණු කිරීම**

- විවිධ ක්‍රමෝපායයන් තුළින් දෙවන පෙළ නායකත්වයක් පුරුදු කිරීම - 6/14 (44%)

**4.2.15 ආදායම් වියදම් පිළිබඳව ලේඛන විධිමත් ලෙස පවත්වාගෙන යාම**

අරුණ, එකමුතු, දහදියමල්, නැෂනල්වැව, පල්ලේපැල, සෙවන, කොටපොල උතුර, කතංකේ. දැරංගල හා මොදරවාත ගොවි සංවිධානවල ගිණුම් පරීක්ෂා කිරීම පිටස්තර ආයතන ලවා කර ගනී. එම ගොවි සංවිධාන විධිමත් අයුරින් ආදායම් වියදම් වාර්තා පොත් නඩත්තු කරයි. ණය අරාව, සුළුංකපොල්ල, සේනානි යන ගොවි සංවිධාන ආදායම් වියදම් වාර්තා තැබීම දුර්වල මට්ටමක පවතී. විධිමත් අයුරින් ගිණුම් තැබීම නිසා ආකාරයෙන් ඉටු කොට ඇත්නම් වාර්ෂික මහා සභා රැස්වීම්වල දී ගිණුම් පිළිබඳව ගැටලු සහගත තත්ත්වයක් පැන නැඟෙන්නේ නැත. සාමාජිකත්වයේ විශ්වාසය එමඟින් තහවුරු වෙයි. ප්‍රස්තාර සටහන් අංක 4.2.14 මඟින් විශේෂිත කර පෙන්වා දී ඇත්තේ විධිමත් අයුරින් ගිණුම් පවත්වාගෙන යමින් සංවිධානයේ විනිවිදභාවය ආරක්ෂා කර ගැනීමට උත්සාහ දරා ඇති ගොවි සංවිධාන 11 වේ. මෙය අධ්‍යයනයට ලක් කළ මුළු ගොවි සංවිධාන සංඛ්‍යාවෙන් 78%කි.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.14: විධිමත් ලෙස ගිණුම් තැබීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ගොවි සංවිධානවල ආදායම් වියදම් නිසි පරිදි ගණන් තැබීමෙන් විනිවිදභාවය උසස් අයුරින් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ගොවි සංවිධානවල තත්ත්වය**


මූල්‍ය පරිපාලනය

- විගණනයක් සිදු කිරීම හා ආදායම් වියදම් ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යාම - 11/14 (78%)

## 4.2.16 සංවිධානය සතුව කෘෂි උපකරණ පැවතීම හා පහසු අය කිරීම මත ගොවීන්ට සැපයීම

අරුණ ගොවි සංවිධානය සතුව කෘෂි රසායනික ද්‍රව්‍ය ඉසින ස්ප්‍රේ යන්ත්‍ර ඇති අතර පහසු අයකිරීම් යටතේ ගොවීන්ට සපයයි. එකමුතු ගොවි සංවිධානය සතුව ස්ප්‍රේ යන්ත්‍ර, ගොයම් කපන යන්ත්‍ර හා ට්‍රැක්ටර් පවතින අතර ගොවීන්ට ඒවා පහසු ගෙවීම් යටතේ ලබාගෙන ඔවුන්ගේ කෘෂි අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හැකි ය. නැෂනල්වැව ගොවි සංවිධානය සතුව ද ස්ප්‍රේ යන්ත්‍ර හා ගොයම් කපන යන්ත්‍ර පවතී. දහදියමල් ගොවි සංවිධානය සතුව ගොයම් කපන යන්ත්‍ර, අත්ට්‍රැක්ටර් හා තෙල් ඉසින යන්ත්‍ර ඇත. මේ ආකාරයට පල්ලේපැල, සෙවන, පාළුවැව, කොටපොල උතුර, කතංකේ හා මොදරවාන ගොවි සංවිධානවල ද කෘෂි උපකරණ පවතින අතර ගොවීන්ට පහසු ගෙවීමේ ක්‍රමය යටතේ තමන්ගේ අවශ්‍යතාවයන්ට යොදා ගැනීමට පහසුකම් සලසා තිබේ. ප්‍රස්තාර සටහන් අංක 4.2.15 යටතේ එම ගොවි සංවිධාන දහය (71%) දැක් වේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.15: කෘෂි උපකරණ සතුව සාධාරණ අයකිරීම් මත ගොවීන්ට සැපයීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ගොවි සංවිධාන කෘෂිකාර්මික හා වෙනත් සමාජීය අවශ්‍යතා සඳහා අවශ්‍ය උපකරණ රැස් කිරීම හා ඒවා සංවිධාන සාමාජිකයන්ට සපයාදීම සම්බන්ධ තත්ත්වය**


**සංවිධානය සතු කෘෂි උපකරණ සාධාරණ අයකිරීම මත ගොවීන්ට සැපයීම**

- ගොයම් කපන යන්ත්‍ර, ට්‍රැක්ටර්, තෙල් ඉසින යන්ත්‍ර සැපයීම - 10/14 (71%)

**4.2.17 සංස්කෘතික හා ආගමික කාර්යයන් වාර්ෂිකව නිසි අයුරින් පැවැත්වීම**

අරුණ ගොවි සංවිධානය වාර්ෂික දේව දානය, කිරි ඉතිරවීමේ මංගල්‍යය සිදුකරන අතර එකමුතු හා සෙවන ගොවි සංවිධාන වාර්ෂිකව පිරිත් පිත්කම් හා අලුත් සහල් මංගල්‍යය සංවිධානය කරයි. දහදියමල් ගොවි සංවිධානය නාරම්මල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ වාර්ෂික පිරිත් පිංකමට ආධාර කිරීම, කිරි අම්මාවරුන්ට පිරිකර ලබාදීම, අලුත් සහල් මංගල්‍යයට වියදම් කිරීම හා දන්සැල් සංවිධානය කිරීම කරයි. පල්ලේපැල ගොවි සංවිධානය විසින් වාර්ෂිකව කිරි ආහාර පූජාව පැවැත්වීම හා අලුත් සහල් මංගල්‍යය පවත්වනු ලබයි. පාළුවැව ගොවි සංවිධානය විසින් වාර්ෂික දේව දානය පිළියෙල කරනු ලබයි. කොටපොල උතුර ගොවි සංවිධානය විසින් වසමේ පවුල් සියල්ලම සහභාගී කරවා ගනිමින් වාර්ෂිකව දේව පූජා හා කිරි ආහාර පූජා පවත්වනු ලබයි. මොදරවාන ගොවි සංවිධානය ද වාර්ෂික කිරි ඉතිරවීමේ මංගල්‍යයක් සංවිධානය කරනු ලබයි. සංස්කෘතික හා ආගමික කාර්යයන් නිසි අයුරින් සිදු කරනු ලබන ගොවි සංවිධාන 9(64%) ප්‍රස්තාර සටහන් අංක 4.2.16 යටතේ විශේෂිත කර දැක් වේ.

රූප සටහන් අංක 4.2.16: සංස්කෘතික හා ආගමික කාර්යයන් වාර්ෂිකව සිදු කිරීම




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**සංස්කෘතික හා ආගමික කාර්යයන් වාර්ෂිකව සිදු කිරීම සම්බන්ධයෙන් ගොවි සංවිධාන ක්‍රියාත්මකවීමේ තත්ත්වය**


සංස්කෘතික හා ආගමික කාර්යයන් වාර්ෂිකව සිදු කිරීම 9/14 (64%)

### 4.2.18 සුබසාධක අංශයක් පවත්වාගෙන යාම

අරුණ ගොවි සංවිධානය සාමාජිකයෙකුගේ අවමංගල්‍යයක දී ආධාර මුදලක් පිරිනමයි. ඊට අමතරව, වන්දනා විනෝද චාරිකා සංවිධානය කරයි. සාමාජික අවශ්‍යතාවයන්වල දී සැපයීම සඳහා පුටු, සාස්පාන් වැනි භාණ්ඩ ද සංවිධානය සතුව පවතී. එකමුතු ගොවි සංවිධානය සාමාජික මරණයක දී රුපියල් 3000ක ආධාර මුදලක් සැපයීම, හට්, පුටු, සාස්පාන්, ආහාර වැනි දේ සැපයීමත්, වාර්ෂිකව වන්දනා හා විනෝද චාරිකාත් සංවිධානය කරයි. දහදියමල් ගොවි සංවිධානය මරණාධාර අරමුදලක් පවත්වන්නේ නැති අතර සුබසාධක කාර්යයන් සිදු නො කරයි. නැෂනල්වැව ගොවි සංවිධානය සිය සාමාජික මරණයක දී රුපියල් 3000ක මුදලක් පිරිනැමීම, සාමාජික අවමංගල්‍යය , දානමය කටයුතු කිරීම, සාමාජික දූ පුතුන් සඳහා පාසැල් පොත් ලබාදීම, ශිෂ්‍යත්ව ලබාදීම, වන්දනා හා විනෝද චාරිකා සංවිධානය කිරීම ආදී සුබසාධක කටයුතු සිදු කරයි. ණය අරාව ගොවි සංවිධානය, සුළංකපොල්ල හා සේනානි ගොවි සංවිධාන ද සුබසාධක කාර්යයන් සිදු නොකරයි. පල්ලේපැල ගොවි සංවිධානය සුබසාධක කාර්යයක් වශයෙන් ලේ දන්දීමේ වැඩසටහන් සංවිධානය කිරීම, වන්දනා හා විනෝද චාරිකා සංවිධානය කිරීම හා ආර්ථික ප්‍රශ්න ඇති පවුල්වල දරුවන්ට අධ්‍යාපන කටයුතු සඳහා මූල්‍යාධාර ලබාදීම සිදු කරයි. සෙවන ගොවි සංවිධානය සාමාජිකයෙකු අසනීප වූ විටක දී රුපියල් 500ක ආධාර මුදලක් ගෙවීම, දරු ප්‍රසූතියකට රුපියල් 500ක ආධාර ගෙවීම, සාමාජික අවමංගල්‍යයක දී දානය සඳහා රුපියල් 6000ක් ගෙවීම, වන්දනා හා විනෝද චාරිකා සංවිධානය කිරීම වැනි කාර්යයන් සිදු කරයි. පාළුවැව ගොවි සංවිධානය සුබසාධක කාර්යයන් සිදු නො කරයි. කොටපොල උතුර ගොවි සංවිධානය

සුබසාධක අංශයක් ක්‍රියාත්මක කරයි. සමාජික අවමංගල්‍යයක දී රුපියල් 5000ක් පිරිනමන අතර සාමාජික යැපෙන්නෙකුගේ මරණයක දී රුපියල් 4000ක ආධාරයක් ලබා දෙයි. සාමාජිකයෙකුගේ දරුවෙකු ශිෂ්‍යත්වය සමත් වුවහොත් අධ්‍යාපන ආධාර ලෙස රුපියල් 2000ක් ගෙවයි. සංවිධානය සතුව පුටු, හට් ආදී භාණ්ඩ ඇති අතර අවශ්‍ය අවස්ථාවල දී ලබා දේ. කනංකේ හා දැරංගල ගොවි සංවිධාන ද මොදරවාන ගොවි සංවිධානය සුබසාධක කාර්යයන් ඉටු නො කරයි. සුබසාධක කාර්යයන් සිදුකරන්නේ යැයි හඳුනාගත් ගොවි සංවිධාන හය (44%) ප්‍රස්තාර සටහන් අංක 4.2.17 යටතේ විශේෂිත කර දැක් වේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.17: සුබ සාධන අංශයක් පවත්වාගෙන යාම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ගොවි සංවිධාන සිය සාමාජිකයින් සඳහා කෘෂි සේවා සැපයීමට අමතරව සුබ සාධන වැඩපිළිවෙළක් පවත්වාගෙන යාමට ක්‍රියාමාර්ග ගෙන ඇත් ද යන බව විමසා බැලීම**


**සුබසාධන සේවාවන් පවත්වාගෙන යාම**

- විවිධ සුබ සාධන සේවාවන් සිදුකිරීම - 6/14 (44%)

**4.2.19 කොන්ත්‍රාත් කිරීම**

අධ්‍යයන කරන ලද ගොවි සංවිධාන අතුරින් බහුතරයක් කොන්ත්‍රාත් බාර ගැනීමක් සිදු කරයි. නැෂනල්වැව, ණය අරාව, සේනාති යන ගොවි සංවිධාන කොන්ත්‍රාත් බාර නො ගත්තා බව හෙළි විය. සෙසු ගොවි සංවිධාන කොන්ත්‍රාත් අත්සන් කොට 5% ක කොමිස් මත වෙනත් පුද්ගලයෙකුට ලබා දීම සිදු කරයි. එය එම ගොවි සංවිධානවල ආදායම් තත්ත්වය වර්ධනය වීමට හේතු වී ඇත. ප්‍රස්තාර සටහන් අංක 4.2.18 මගින් කොන්ත්‍රාත් කරනු ලබන ගොවි සංවිධාන 11 (72%) විශේෂිත කොට දැක් වේ.

ප්‍රස්තාර සටහන් අංක 4.2.18: කොන්ත්‍රාත් කිරීම




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ගොවි සංවිධානවලට ලැබී ඇති බලතල යටතේ කොන්ත්‍රාත් භාර ගැනීම හා එවා ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකර තිබුණේ ද යන වග විමසා බැලීම**


**කොන්ත්‍රාත් භාර ගැනීම**

- කොන්ත්‍රාත් කිරීම - 11/14 (72%)

**4.2.20 ගොවි සංවිධානය පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ලක් ඉදි කරගෙන තිබීම**

ණයඅරාව, සුලංකපොල්ල, සේනානි, දැරංගල, වැල්ලාන, කොටපොල උතුර, මොදරවාන, දහදියමල්, පාළුවැව, පල්ලේපැල යන ගොවි සංවිධාන සඳහා තමන්ගේ ම ගොඩනැගිලි නොමැත. ඔවුන් රැස්වීම් සඳහා භාවිතා කරන්නේ ගමේ පොදු ප්‍රජා ශාලාවයි. අරුණ, එකමුතු, සෙවන, නැෂනල්වැව යන ගොවි සංවිධාන සඳහා ඔවුනගේ ම ගොඩනැගිලි ඉදිකරගෙන තිබේ. ප්‍රස්තාර සටහන් අංක 4.2.19 මගින් තමන්ගේ ම ගොඩනැගිලි සහිත ගොවි සංවිධාන හතර (28%) දැක් වේ.

රූපසටහන් අංක 4.2.19: ගොවි සංවිධානය සතුව ගොඩනැගිලි පැවතීම




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ගොවි සංවිධානයට තමන්ගේ ම ගොඩනැගිල්ලක් පැවතීම**


ගොඩනැගිලි හිමි ගොවි සංවිධාන 4/14 (28%)

### 4.2.21 ගොවි සංවිධානය ව්‍යාපාරික කටයුතුවල නියැලී සිටීම

අරුණ ගොවි සංවිධානය ක්‍රියාත්මක වන්නේ ව්‍යාපාරික ආයතනයක් ලෙසිණි. විවිධ ණය වර්ග සැපයීමෙන් පොලී ඉපැයීම හා සහනාධාර පොහොර ගෙනවුත් මෙහෙයුම් ආදායම් උපයයි. අධ්‍යාපන වැඩසටහන් පවත්වා මුදල් උපයයි. එකමුතු ගොවි සංවිධානය ද ගොවි සංවිධාන ගොඩනැගිල්ල අවට පරිශ්‍රය තුළින් ආදායම් ඉපැයීම, ණය සැපයීමෙන් පොලිය ඉපැයීම මගින් ආදායම් උපයයි. දහදියමල් ගොවි සංවිධානය කරනු ලබන එකම ව්‍යාපාරික කාර්ය කොන්ත්‍රාත් කිරීමයි. නැෂනල්වැව ගොවි සංවිධානය හා සෙවන ගොවි සංවිධානය ණය මුදල් සැපයීමෙන් පොලී ආදායම් උපයයි. කොටපොල උතුර ගොවි සංවිධානය, සංවිධානය සතු කෘෂි රසායන ඉසින යන්ත්‍ර, පිගන්, ටෙන්ට්, හට්, පුටු, සාස්පාන් ආදී උපකරණ පහසු මිලට සැපයීමෙන් මුදල් උපයයි. පල්ලේපැල ගොවි සංවිධානය තෙල් ඉසින යන්ත්‍ර, පුටු, හට්, සාස්පාන් ආදිය කුලියට සැපයීමෙන් හා කොන්ත්‍රාත් මගින් ආදායම් උපයයි. පාළුවැව ගොවි සංවිධානය වැවේ නෙළුම් මල් බදු දීම, සලාරිස් එකතුකිරීම, ණය සැපයීම හා කොන්ත්‍රාත් මගින් ආදායම් උපයයි. දැරංගල හා වැල්ලාන ගොවි සංවිධාන තෙල් ඉසින යන්ත්‍ර කුලියට දීම, හට්, පුටු, පිගන් කුලියට දීම හා කොන්ත්‍රාත් මගින් ආදායම් උපයයි. මොදරවාන ගොවි සංවිධානය ද තෙල් ඉසින යන්ත්‍ර කුලියට දීමෙන් හා කොන්ත්‍රාත් කිරීමෙන් ආදායම් උපයයි.

ප්‍රස්තාර සටහන් අංක 4.2.20 මගින් දක්වා ඇත්තේ ව්‍යාපාරික කටයුතු කිහිපයක් සිදු කරන ගොවි සංවිධාන 11 (79%) වේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.20: ව්‍යාපාරික කටයුතුවල නියැලීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා


**ගොවි සංවිධාන සේවා සැපයීමේ ව්‍යාපාරික කාර්යයන් හි නියැලීම පිළිබඳ තත්ත්වය**

ව්‍යාපාරික කාර්යයන් සිදුකරන ගොවි සංවිධාන - 11/14(79%)

**4.2.22 ගෙවතු වගා හා වෙනත් මුදල් බෝග වගාවන් සඳහා ගොවීන් පෙළඹවීම**

ණයඅරාව, සුළංකපොල්ල හා සේනානි යන ගොවි සංවිධාන හැරුණු විට සෙසු ගොවි සංවිධාන තම සාමාජිකයන් ගෙවතු වගා මෙන් ම ගොඩ බෝග වගාව සඳහා යොමු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව හෙළි විය. අරුණ ගොවි සංවිධානය විසින් විශේෂ ව්‍යාපෘති ණය පහසුකම්, බීජ රෝපණ ද්‍රව්‍ය ගොඩ බෝග වගා කරුවන් සඳහා හඳුන්වා දී ඇත. එකමුතු ගොවි සංවිධානය ගොඩ බෝග වගා කිරීම සම්බන්ධව සංවිධානයක් ගොඩ නගා ඇත. දහදියමල් ගොවි සංවිධානය ලොකු ඉඩම් සංවර්ධන වැඩසටහන නමින් පොල්, අපනයන බෝග වගාව යනා දී වගාවන් ඇරඹීමට ක්‍රියාකොට තිබේ. නැෂනල්වැව ගොවි සංවිධානය ගෙවතු වගාව සඳහා රෝපණ ද්‍රව්‍ය සපයාදීම, කොම්පෝස්ට් මල් වගාව සඳහා පහසුකම් සැපයීම සිදු කොට ඇත. පල්ලේපැල ගොවි සංවිධානය ගෙවතු වගාවට ගොවීන් උනන්දු කරවයි. සෙවන ගොවි සංවිධානය ගෙවතු හා ගොඩ බෝග වගාවට අවශ්‍ය තාක්ෂණ සහාය සැපයීමට සම්බන්ධීකරණය කරයි. පාළුවැව ගොවි සංවිධානය ගොඩ බෝග වගාව සඳහා ගොවීන් දැනුවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. කොටපොල උතුර හා දැරංගල ගොවි සංවිධාන එළවළු බීජ සැපයීම හා ගෙවතු වගාව සඳහා උපදෙස් සැපයීමේ සම්බන්ධීකාරකයා ලෙස ක්‍රියාකොට ඇත. ප්‍රස්තාර සටහන් අංක 4.2.21 මඟින් ගොඩ බෝග වගාව සඳහා ගොවීන් උනන්දු කරන ගොවි සංවිධාන 11 (79%) විශේෂිත කර දැක් වේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.21: ගෙවතු වගා සහ ගොඩ බෝග වගාවට ගොවීන් උනන්දු කරවීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

තම බල ප්‍රදේශයන් හි ගෙවතු හා ගොඩ ඉඩම්වල බෝග වගාව ව්‍යාප්ත කිරීම සඳහා ගොවි සංවිධාන 14 හි යම් කිසි ක්‍රියාමාර්ගයන් අනුගමනය කර තිබුනේ ද යන බව විමසීම


**ගොඩ ඉඩම්වල බෝග වගාවට ගොවීන් පෙළඹවීම**

- අතුරු බෝග වගාවට යොමු කිරීම - 11/14 (79%)
  වගා ණය ලබාදීම හා සුදුසු බෝග හඳුන්වාදීම

### 4.2.23 අත්දැකීම් ආශ්‍රයෙන් අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම

තම ගොවි සංවිධානය මෙතෙක් පැමිණි ගමන් මග හා එහි සාර්ථකභාවය සම්බන්ධයෙන් ලබාගත් අත්දැකීම් ගොවි සංවිධානයේ අධ්‍යාපනික අංශයක් පිහිටුවා එමගින් ගොවි සංවිධානවලට බෙදාදීමේ හා අත්දැකීම් හුවමාරු කරගැනීමේ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කරන ගොවි සංවිධාන හතරක් හමුවිය. අරුණ ගොවි සංවිධානය, එකමුතු ගොවි සංවිධානය, සෙවන ගොවි සංවිධානය හා පල්ලේපැල එම ගොවි සංවිධාන හතර වේ. මෙම ගොවි සංවිධාන අත්දැකීම් හුවමාරු කර ගැනීමේ අධ්‍යාපනික වැඩසටහන මගින් මුදල් උපයයි. වෙනත් ආයතන විසින් සිදු කරනු ලබන ගොවි සංවිධාන සවිබල ගැන්වීමේ වැඩසටහන් සඳහා ආරාධිත දේශකයින් ලෙස ද මෙහි නිලධාරීන් සහභාගී වේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.22: අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

රූප සටහන් අංක 4.2.22 මගින් පෙන්වා දී ඇත්තේ සාර්ථක ලෙස ක්‍රියාත්මක කරනු ලබන ගොවි සංවිධාන තම සාර්ථකත්වය ළඟා කරගැනීමේ දී අනුගමනය කළ ක්‍රමවේදය හා සිය අත්දැකීම් වෙනත් ගොවි සංවිධානවලට අධ්‍යාපනික වැඩසටහන් ලෙස ලබාදෙන ගොවි සංවිධාන 04 (29%) ය.


**සංවිධාන සාර්ථක ලෙස පැවැත්වීමේ දී ලබාගත් අත්දැකීම් අධ්‍යාපන වැඩසටහන් ලෙස වෙනත් ගොවි සංවිධාන සමඟ හුවමාරු කර ගන්නේ ද යන වග විමසීම**

අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම 4/14(29%)

### 4.2.24 කාබනික පොහොර සහ පිදුරු කුඹුරට යෙදීමට ගොවීන් උනන්දු කරවීම

නිෂ්පාදන වියදම අඩුකර ගැනීමත්, පස සංරක්ෂණය කිරීම හා පරිසර හිතකාමී වගා ක්‍රමයකට ගොවීන් නැඹුරු කිරීමත් සඳහා කාබනික පොහොර සහ පිදුරු වී මෙත් ම වෙනත් වගාවලට යෙදීමේ හුරුව ගොවීන්ට ඇති කරවීමට ගොවි සංවිධාන කිහිපයක් ක්‍රියාත්මක වී ඇති බව හෙළි විය. අරුණ ගොවි සංවිධානය කාබනික පොහොර භාවිතයෙන් පැරණි වී වර්ග වගා කිරීමේ වැඩසටහනක් අරඹා තිබේ. ගොවීන් විසිදෙදෙනෙකු මෙම වැඩසටහන හා එක් වී සිටී. එකමුතු ගොවි සංවිධානය ගොඩ බෝග හා වී වගාවේ දී කාබනික පොහොර භාවිතය හා පිදුරු යෙදීමට හුරු වී ඇති අතර ගොවීන් 30ක් පමණ ඊට එක් වී සිටී. දහදියමල් ගොවි සංවිධානය කාබනික වගාව හා පිදුරු යෙදීම සම්බන්ධව දැනුවත් කිරීම සඳහා ගොවීන් කණ්ඩායමක් මාකඳුර පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයට යවා දැනුවත් කොට ඇති අතර ක්‍රම ක්‍රමයෙන් ගොවීන් මෙම කාර්යය අරඹා ඇත. නැෂනල්වැව ගොවි සංවිධානය තම ගොවීන්ට කාබනික පොහොර නිපදවීමේ පුහුණුව හා පිදුරු ගිනිතැබීම වළක්වා කුඹුරට යෙදීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කොට තිබේ. පිදුරු කුඹුරට යෙදීමේ ප්‍රගතියක් පෙන්වන අතර ගෙවතු හා ගොඩ බෝග සඳහා කාබනික පොහොර යෙදීම සුළු වශයෙන් ආරම්භ කොට ඇත. පල්ලේපැල ගොවි සංවිධානය කාබනික පොහොර එළවළු වගාවන් සඳහා යෙදීමෙන් පරිසරය සුරකෙන ආකාරය පිළිබඳ ගොවීන් දැනුවත් කොට ඇති අතර ගොවීහු එම ක්‍රමය අනුගමනය කරමින් සිටිති. සෙවන ගොවි සංවිධානය කාබනික පොහොර නිපදවීම පිළිබඳ ගොවීන් දැනුවත් කොට ඇති අතර ගොඩ බෝග හා එළවළු වගා ගොවීන් 30ක් පමණ කාබනික පොහොර යෙදීම ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධානවලින් හයක් (44%ක්) කාබනික පොහොර කුඹුරුවලට යෙදීම සඳහා ගොවීන් උනන්දු කර තිබුණි. ප්‍රස්තාර සටහන් අංක 4.2.23 මඟින් එය දැක් වේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.23: කාබනික පොහොර කුඹුරට යෙදීම සඳහා ගොවීන් උනන්දු කිරීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා


**කාබනික පොහොර නිපදවීම, වගාවලට යෙදීම හා වී වගාවට පිදුරු යෙදීමට ගොවීන් උනන්දු කරවීම පිළිබඳ ගොවි සංවිධානවල පැවති තත්ත්වය**

කාබනික පොහොර යෙදීම - 6/14 (44%)

**4.2.25 සාමාජිකයන් පිළිබඳ දත්ත රැස් කිරීම**

ගොවි සංවිධානයේ සාමාජිකයින්ගේ පවුල්වල සම්පත් අයිතිය, පවුලේ සාමාජික සංඛ්‍යාව ඇතුළත් ජීව දත්ත ගොවි සංවිධානය එකතු කිරීම මගින් එක් එක් පවුලේ ආර්ථික ශක්තිය පිළිබඳව යම් කිසි තක්සේරුවක් ලබාගත හැකි ය. එම ආර්ථික ශක්තිය අනුව එම පවුල්වලට විවිධ ව්‍යාපෘති හා ආර්ථික කටයුතු සඳහා යෙදීමට යම් කිසි සහයෝගයක් සංවිධානයට ලබාදිය හැකි ය. මෙම ගොවි සංවිධාන අතුරින් අරුණ, එකමුතු, නැෂනල්වැව, පල්ලේපැල, සෙවන යන ගොවි සංවිධාන එවැනි දත්ත එකතු කිරීමක් සිදු කොට තිබුණි. ප්‍රස්තාර සටහන් අංක 4.2.24 මගින් සාමාජික දත්ත රැස්කර තිබෙන ගොවි සංවිධාන පහ (36%) දක්වා තිබේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.24: සාමාජිකයන් පිළිබඳ දත්ත රැස් කිරීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ගොවි සංවිධානවල සාමාජිකයන්ගේ සම්පත් අයිතිය හා පවුල්වල තොරතුරු රැස්කර තිබුණේ ද යන බව විමසා බැලීම**

**සාමාජික පවුල්වල දත්ත රැස් කිරීම**


දත්ත රැස් කිරීම 5/14(36%)

**4.2.26 අරමුදල් ගොඩනැංවීම**

ගොවි සංවිධානයක් විසින් පුළුල් සේවාවක් සාමාජිකයින්ට ඉටු කිරීම සඳහා අරමුදල් ගොඩනැංවීම අවශ්‍ය ය. සාමාජික මුදල් එකතු කිරීම නිසා සෑම ගොවි සංවිධානයක ම යම්

කිසි අරමුදලක් පැවතිය ද එය ප්‍රමාණවත් නොවේ. එම නිසා, වෙනත් නීත්‍යානුකූල මාර්ග ඔස්සේ ගොවි සංවිධාන අරමුදල් ගොඩනංවා ගැනීමට ක්‍රියාකරයි. අධ්‍යයනය කළ ගොවි සංවිධාන අතුරින් අරුණ ගොවි සංවිධානය ණය සැපයීමෙන් පොලිය ඉපැයීම, කොන්ත්‍රාත් කිරීමෙන් කොමිස් ඉපැයීම, අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම මඟින් ආදායම් උපයා අරමුදල ගොඩ නගා ඇත. එකමුතු ගොවි සංවිධානය වැවේ නෙළුම් මල් බදුදීම, වැවේ මාළු බදු දීම, සියඹලා, දිවුල් ගස් බදු දීම, අලෙවිසැල්වල බදු ආදයම්, ණය මුදල් සඳහා පොළී, උපකරණ කුලියට දීම, සලාරිස් ලැබීම්, අධ්‍යාපන වැඩසටහන්, කොන්ත්‍රාත්, සංවිධානයට ඇතුළුවීමේ ගාස්තු යනා දී වශයෙන් ආදායම් මාර්ග රාශියකින් අරමුදල් උපයා ගනී. දහදියමල් ගොවි සංවිධානය උපකරණ කුලියට සැපයීම, කොන්ත්‍රාත් කිරීම මඟින් අරමුදලක් ගොඩ නගාගෙන ඇත. නැෂනල්වැව ගොවි සංවිධානය විවිධ වර්ගයේ ණය සැපයීම මඟින් හා උපකරණ කුලියට දීම මගින් සංවිධානයේ අරමුදල ශක්තිමත් කරගෙන ඇත. ණය අරාව ගොවි සංවිධානයේ ශක්තිමත් ලෙස ගොඩනගා ගත් අරමුදලක් නො පවතී. සුළංකපොල්ල ගොවි සංවිධානයේ ද ශක්තිමත් අරමුදලක් නැත. සේනානි ගොවි සංවිධානයේ ද ශක්තිමත් අරමුදලක් ඇති කරගෙන නැත. පල්ලේපැල ගොවි සංවිධානය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කොන්ත්‍රාත් කිරීමෙන් මුදල් ඉපැයීම, සෙවිලි ගෙය, තෙල් ඉසින යන්ත්‍ර යනා දී උපකරණ කුලියට සැපයීම මඟින් අරමුදල් උපයාගෙන තිබේ. සෙවන ගොවි සංවිධානය ණය සැපයීමෙන් පොලිය, උපකරණ කුලියට දීම, ගොඩනැගිල්ල කුලියට දීම, අධ්‍යාපන වැඩසටහන් වැනි ක්‍රම ඔස්සේ අරමුදල ශක්තිමත් කරගෙන සිටී. පාළුවැව ගොවි සංවිධානය කොන්ත්‍රාත් කිරීම, වැවේ නෙළුම් මල් බදු දීම හා මාළු බදු දීම, පොහොර ණය හා සලාරිස්වලින් ආදායම් උපයා අරමුදල ශක්තිමත් කරගෙන තිබේ. කොටපොල උතුර, දැරංගල, වැල්ලාන හා මොදරවාන දකුණ යන ගොවි සංවිධානවල අරමුදල් පැවතිය ද, ශක්තිමත් අරමුදලක් ගොඩනගාගෙන නැත. ශක්තිමත් අරමුදල් ඇති ගොවි සංවිධාන ලෙස අරුණ, එකමුතු, නැෂනල්වැව, සෙවන, යන ගොවි සංවිධාන හතර (29%) කැපී පෙනේ. එය ප්‍රස්තාර සටහන් අංක 4.2.25 මඟින් දැක් වේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.25: අරමුදල් ගොඩනැංවීම**




මූලාශ්‍රයː ගොවි සංවිධාන වාර්තා


**ශක්තිමත් අරමුදල් ගොඩනගා ගෙන ඇති ගොවි සංවිධාන**

විවිධ ආදායම් ඉපයීම් මාර්ග ඔස්සේ අරමුදල් ගොඩ නගාගෙන පැවතීම - 4/14(29%)

### 4.2.27 ගොවිහඬ ජාතික තලය දක්වා ගෙනයාම

ගොවි ජනතාවට මුහුණපෑමට සිදුවන විවිධ ප්‍රශ්න හමුවේ ගොවීන් සංවිධානය වී තම ප්‍රශ්න විසඳා ගැනීම සඳහා එම ප්‍රශ්න අදාළ අමාත්‍යාංශ ලේකම්, ඇමතිවරයා වෙත ඉදිරිපත් කිරීම, පුවත්පත්වලට සාකච්ඡා ලබාදීම, පුවත්පත් ලිපි පළ කිරීම, රැස්වීම් පැවැත්වීම හා අවසාන ප්‍රයත්නය වශයෙන් පෙළපාලි උද්ඝෝෂණ පැවැත්වීම මඟින් ජාතික වශයෙන් දැනුවත් කිරීම් කිරීම මෙමඟින් අදහස් වේ. අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන අතුරින් පල්ලේපැල ගොවි සංවිධානය පමණක් (7%)මෙවැනි කාර්යයන් ඉටු කර ඇති බව හෙළි විය. එය ප්‍රස්තාර සටහන් අංක 4.2.26 මඟින් දැක් වේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.26: ගොවි හඬ ජාතික තලයට ගෙනයාම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ගොවි හඬ ජාතික තලයට ගෙන යාම**

- ලිපි ලිවීම මඟින් බලපෑම් කිරීම, විරෝධතා ව්‍යාපාර පැවැත්වීම, උද්ඝෝෂණයන් සංවිධානය කිරීම - 1/14 (7%)

### 4.2.28 කෘෂි බෝග සැකසුම් කර්මාන්තය

ප්‍රාථමික කෘෂි බෝග වශයෙන් අස්වනු නෙළාගත් පසු ඒවා සැකසීමක් කර වටිනාකම් එකතු කළ නිෂ්පාදන ලෙස වෙළඳපොළට යැවීමට ගොවි සංවිධානය පියවර ගෙන ඇත්නම් ගොවීන්ට ඉහළ මිලක් ලබාගැනීමට හැකි වේ. එසේ ම, විවෘත වෙළෙඳපළේ තරඟ කිරීමට ද හැකියාව ලැබේ. එසේ වුව ද, එවැනි කාර්යයන් සඳහා අතගසා ඇති එකම ගොවි සංවිධානයක් වත් අධ්‍යයනයේ දී හමුවූයේ නැත.

ප්‍රාථමික කෘෂිබෝග සකස් කරන ලද කෘෂි නිෂ්පාදන බවට පත් කිරීමේ කාර්යයන්ට ගොවි සංවිධාන උර දී සිටී ද යන වග විමසීම


**කෘෂි නිෂ්පාදනවලට වටිනාකම එකතු කිරීම**

එවැන්නක් සිදු නො කෙරේ. 0/14

**4.2.29 පාංශු සංරක්ෂණය සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම**

ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ඉඩම්වල කෘෂි බෝගවල ඵලදායීතාවය ආරක්ෂා කර ගැනීම සඳහා පාංශු සංරක්ෂණය වැදගත් වන අතර එය ගොවි සංවිධානවලට පැවරී ඇති වගකීමක් ද වේ. අධ්‍යයනයට ලක් කරන ලද ගොවි සංවිධාන අතුරෙන් පල්ලේපැල හා සෙවන යන ගොවි සංවිධාන පාංශු සංරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කරවීම ආරම්භ කොට ඇත. අරුණ, එකමුතු, නැෂනල්වැව, දහදියමල්, පාළුවැව, යන ගොවි සංවිධාන හයේ ගොවීන්ට (50%) පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම් සිදු කර ඇත. සෙසු ගොවි සංවිධානවල එවැනි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වී නැත.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.27: පාංශු සංරක්ෂණය පිළිබඳ උපදෙස් ලබාදීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**තම බල ප්‍රදේශයන් හි ගොවීන් විසින් බෝග වගාවේ දී පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කිරීමට පෙළඹවීම සඳහා යම් කිසි ක්‍රියාමාර්ගයක් ගෙන තිබේ ද යන බව**

**පාංශු සංරක්ෂණයට උපදෙස් ලබාදීම**


- පාංශු සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2/14 (14%)
- උපදෙස් පමණක් ලබාදීම - 5/14 (36%)

**4.2.30 ප්‍රාදේශීය මට්ටමේ කෘෂිකාර්මික කමිටුවලට සහභාගීවීම**

කෘෂිකර්මය හා ගොවිජන ජීවිතය සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තිවලින් පැන නැඟී ඇති ගැටලු හා යටිතල පහසුකම් සම්බන්ධයෙන් වන ගැටලු ගොවීන් විසින් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවලට ඉදිරිපත් කිරීම මගින් ඒවාට විසඳුම් ලබාගැනීමට හා ගොවීන්ට අහිතකර රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් කරවා ගැනීමට උත්සාහ දැරීමට ගොවි සංවිධානවලට හැකියාවක් පවතී. ඒ අනුව, අධ්‍යයනයට ලක් කරන ලද ගොවි සංවිධාන අතුරෙන් අරුණ, එකමුතු, නැෂනල්වැව, පල්ලේපැල හා මොදරවාන දකුණ යන ගොවි සංවිධාන පහ (36%) දිස්ත්‍රික්

කෘෂිකර්ම කමිටුවලට සහභාගී වී සිය අදහස් ප්‍රකාශ කරන බව හෙළි විය. එය ප්‍රස්තාර සටහන් අංක 4.2.28 මගින් දැක් වේ.

**ප්‍රස්තාර සටහන් අංක 4.2.28: කෘෂිකාර්මික කමිටුවලට සහභාගීවීම**




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**ගොවි ජනතාවට හිතකර වන ආකාරයට රාජ්‍ය ප්‍රතිපත්තියක් සැකසීමට ගොවි සංවිධාන සහභාගීත්වය ලබා දෙන්නේ ද යන බව**

**ගොවි සංවිධානවල අදහස් හා යෝජනා කෘෂිකර්ම කමිටුවලට ඉදිරිපත් කිරීම**

- දිස්ත්‍රික්ක කෘෂිකර්ම කමිටුවලට සහභාගී වී අදහස් ප්‍රකාශ කිරීම - 5/14 (36%)

**4.2.31 විධිමත් ආකාරයට රැස්වීම් පැවැත්වීම**

මිරිහන්පිටිගම අරුණ ගොවි සංවිධානය විධිමත් ආකාරයට රැස්වීම් පවත්වයි. මහා සභා රැස්වීම් සෑම මාසයක ම 15 වන දින දී පැවැත්වෙන අතර කාරක සභාව සෑම මසක ම 5 වන දින පැවැත් වේ. මෙයට අමතරව, අත්‍යවශ්‍ය කරුණක් සම්බන්ධයෙන් අවශ්‍ය වූ අවස්ථාවක දී ද ගොවි සංවිධානයේ මහ සභා රැස්වීම් පැවැත්වීමට පුළුවන. කන්න රැස්වීම් පැවැත්වීම සෑම කන්නයක ම ආරම්භයේ දී සිදු කරයි. වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්වීම දෙසැම්බර් මාසයේ දී පැවැත් වේ.

ගලඅඹගස්වැව එකමුතු ගොවි සංවිධානය ද විධිමත් ආකාරයට රැස්වීම් පවත්වයි. මෙහි මහ සභා රැස්වීම් සෑම මසකම 13 වන දින පැවැත්වෙන අතර කාරක සභා රැස්වීම් 15 දින පැවැත්වෙයි. හදිසි අවශ්‍යතාවයක් සඳහා ද මහ සභා රැස්වීම් කැඳවනු ලබයි. කන්න රැස්වීම් සෑම වගා කන්නයකම ආරම්භයේ දී පැවැත්වෙන අතර වාර්ෂික මහා සභා රැස්වීම සෑම වසරක ම ජනවාරි මස පැවැත් වේ.

නාරම්මල ගිනිගත්පිටිය ගොවි සංවිධානයේ රැස්වීම් පැවැත්වීමේ පිළිවෙත වන්නේ කන්න රැස්වීම් දෙක මහ සභා රැස්වීම් ලෙසින් පැවැත්වීමයි. මෙම රැස්වීම් දෙකට අමතරව අවශ්‍ය

මහ සභා රැස්වීම් කැඳවීමට හැකියාව පවතී. වැව් පාලක කමිටු රැස්වීම නමින් වැව සම්බන්ධව රැස්වීමක් ද කන්නයට පෙර පැවැත්වෙන අතර මෙහි දී ගොවි සංවිධානයේ කාරකසභාව ද රැස් වේ.

ඉබ්බාගමුව තැෂතල්වැව ගොවි සංවිධානය මහ සභා රැස්වීම මාසයකට වරක් මාසයේ 10 වන දින රැස් වේ. මාස 06කට වරක් කන්න රැස්වීම පැවැත්වෙන අතර වසරකට කන්න රැස්වීම් දෙකක් පැවැත් වේ. ණය අණු කමිටුව නමින් ඉතිරි කිරීම් හා ණය සැපයීම සඳහා අවශ්‍ය සාකච්ඡා හා තීරණ ගැනීම සඳහා සතියකට වරක් රැස් වේ. වාර්ෂික මහ සභා රැස්වීම සෑම වසරක ම දෙසැම්බර් මස පැවැත් වේ.


බදුල්ල දිස්ත්‍රික්කයේ ණයඅරාව ගොවි සංවිධානය මාසික හෝ තෛමාසික මහ සභ රැස්වීම් හෝ කාරක සභා රැස්වීම් නො පවත්වයි. මෙහි මහ සභා රැස්වීම වශයෙන් පැවැත්වෙන්නේ කන්න රැස්වීම් ය. සෑම වගා කන්නයක් ආරම්භයට පෙර කන්න රැස්වීම් පවත්වයි. මෙම කන්න රැස්වීම් දෙකට අමතරව වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්වෙන අතර එය ද මාස් කන්නයේ කන්න රැස්වීමේදී ම පවත්වනු ලබයි. මෙම ගොවි සංවිධානය සඳහා රැස්වීම්වලට සාමාජිකයන්ගේ පැමිණීම අඩුවීම නිසා කන්න රැස්වීමේ දී ම සෙසු සියලම කරුණු සාකච්ඡා කිරීමට යොදාගෙන තිබේ.

කැප්පෙටිපොළ සුලංකපොල්ල ගොවි සංවිධානය විධිමත් ආකාරයෙන් රැස්වීම් පැවැත්වීමේ ක්‍රමයක් අනුගමනය නො කරයි. අවශ්‍යතාවය පරිදි රැස්වීම් සංවිධානය කරනු ලබයි. එහි දී ද පූර්ණ සාමාජිකත්වයක් කැඳවාගැනීම පහසු කරුණකි. වාර්ෂික මහ සභා රැස්වීම් ද සභාපති, ලේකම් හා කෘ.ප.නි.ස ගේ තීරණය මත අවශ්‍ය අවස්ථාවල දී කැඳවීම වර්තමාන ක්‍රමය යි.

සොරණාතොට සේනානි ගොවි සංවිධානයේ මහ සභා රැස්වීම් පැවැත්වීම ලෙස පවත්වනු ලබන්නේ යල සහ මාස් කන්නය ආරම්භ කිරීමට පෙර පවත්වනු ලබන රැස්වීම් දෙක පමණි. සංවත්සර මහ සභා රැස්වීම ලෙස භාවිතයට ගන්නේ ද මාස් කන්නයේ කන්න රැස්වීමයි. එම නිසා, මෙම ගොවි සංවිධානය ද විධිමත් ආකාරයෙන් රැස්වීම් පවත්වන්නේ නොමැති බව පැහැදිලි වේ.

වංගියකුඹුර පල්ලේපැල ගොවි සංවිධානය මාසිකව රැස්වීම් පවත්වයි. ගොවි සංවිධානයේ ක්‍රියාකාරකම්, ගොවීන්ගේ අවශ්‍යතාවයන්, ගොවි බැංකු කොටස් හා ණය යනා දී කාර්යයන් පිළිබඳව මාසික මහා සභා රැස්වීමේ දී සාකච්ඡා කෙරේ. මෙයට අමතරව, ප්‍රධාන කන්න දෙක සඳහා රැස්වීම් දෙක වාර්ෂික මහ සභා රැස්වීම් ජනවාරි මාසයේ දී පවත්වනු ලබයි. ඇලයාපත්තුව සෙවන කාන්තා ගොවි සංවිධානය ක්‍රමානුකූල සැලැස්මක් මත රැස්වීම් පවත්වනු ලබයි. මාසික රැස්වීම සෑම මසක ම පළමුවන සතියේ ඉරිදා දින පැවැත් වේ. මෙම සමිතියේ දී ප්‍රදේශයේ පොදු අවශ්‍යතා ඉටුකිරීම, පිළිබඳව සාකච්ඡා කිරීම, කුඩා කණ්ඩායම් එකතුකොට සිදු කරන ලබන විවිධ ක්‍රියාකාරකම් පිළිබඳව සාකච්ඡා කිරීම, ණය සහ ඉතුරුම් ගැන සාකච්ඡා කිරීම මෙහි දී සිදු කරයි. සතියට වරක් කාරක සභා රැස්වීම් පැවැත්වීම සිදු කෙරෙන අතර මුදල් ඉතිරිය හා ණය සැපයීම සම්බන්ධව සාකච්ඡා කෙරේ. වාර්ෂික මහ සභා රැස්වීම සෑම වර්ෂයක ම මාර්තු මාසයේ 10 දින පැවැත් වේ. විධිමත් ආකාරයට මහා සභා රැස්වීම් සංවිධානය කරනු ලබන ගොවි සංවිධාන හමු වූ අතර එය 36%ක් විය.

ප්‍රස්තාර සටහන් අංක 4.2.29: විධිමත් ආකාරයට මාසික රැස්වීම් පැවැත්වීම




මූලාශ්‍රය: ගොවි සංවිධාන වාර්තා

**මාසිකව මහා සභා රැස්වීම් පැවැත්වීම**

අවම වශයෙන් සාමාජිකත්වයෙන් 75%ක් සහභාගීවන රැස්වීම් පැවැත්වීම – 5/14 (36%)

වගු අංක 4.1

ගොවි සංවිධානවල කාර්ය සාධනය මත ලකුණු ලබාදීම

නිර්ණායක භාවිතා කොට එක් එක් ගොවි සංවිධානයේ කාර්ය සාධනය මත ලකුණු ලබා දීම (එක් කාර්යයක් සඳහා එක ලකුණ බැගින් පිරිනමා ඇත)

| ගොවි සංවිධානය | මාසිකව රැස්වීම | සාමාජික වර්ධනය | පොහොර ප්‍රවාහනය | මුදල් ඉතිරි කිරීම | ණය සැපයීම | පොදු දේපල රැකීම | ජල කළමනාකරණය | කන්න රැස්වීම | පැළෑටි සැපයීම | නීතිරීති අවබෝධය | කෘෂි කර්මාන්ත | යෙදවුම් සැපයීම | බෝග අලෙවිය | කව සාමාජිකත්වය | දෙවන පෙළ සාමාජිකත්වය | නිසි පරිදි ගිණුම් තැබීම | කෘෂි උපකරණ සැපයීම | ආගමික හා සංස්කෘතික | ප්‍රමාණවත් ජලය | කොන්ත්‍රාත් කිරීම | ව්‍යාපාරික කටයුතු | ගොවිකැණිල්ලෙන් වැඩීම | අධ්‍යාපන වැඩසටහන් | කාබනික පොහොර | ගෙවතුවල ඵල බෝග | අරමුදල් ගොඩනැගීම | ගොවි පොළ | කෘෂි බෝග සැකසීම | පාංශු සංරක්ෂණය | කමිටුවලට සහභාගීවීම | දත්ත රැස්කිරීම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අරුණ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | x | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | x | x | √ | √ | √ | 28 |
| එකමුතු | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | x | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | x | x | √ | √ | √ | 29 |
| නැෂතල්වැව | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | x | x | √ | √ | √ | √ | √ | x | √ | √ | x | √ | √ | √ | x | x | √ | √ | √ | 25 |
| දහදියමල් | x | √ | √ | √ | √ | √ | √ | √ | x | x | √ | √ | x | x | x | √ | √ | √ | x | √ | √ | x | x | √ | √ | x | x | x | √ | x | x | 17 |
| සෙවන | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | x | √ | √ | x | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |  | √ | √ | √ | x | x | √ | x | √ | 25 |
| පාළුවැව | x | √ | √ | x | √ | √ | √ | √ | x | x | x | √ | x | √ | √ | √ | √ | √ | x | √ | √ | x | x | x | √ | x | x | x | √ | x | x | 15 |
| පල්ලේපැල | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | x | x | x | √ | √ | √ | √ | √ | √ | x | x | √ | √ | x | √ | x | √ | √ | x | 23 |
| ණය අරාව | x | x | √ | x | x | x | x | √ | x | x | x | √ | x | √ | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | 04 |
| සුළං කපොල්ල | x | x | x | √ | √ | √ | x | x | x | x | √ | x | x | x | x | x | x | x | √ | x | x | x | x | x | x | x | x | x | x | x | x | 06 |
| සේනානී | x | x | √ | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | x | 02 |
| කොටපොල උතුර | x | √ | √ | √ | x | √ | x | √ | x | x | x | √ | x | x | x | √ | √ | √ | √ | √ | √ | √ | x | x | √ | x | x | x | x | x | x | 13 |
| දැරංගල | x | x | √ | x | x | √ | x | √ | x | x | x | √ | x | x | x | √ | √ | x | x | x | x | x | x | x | √ | x | x | x | x | x | x | 07 |
| වැල්ලාත | x | x | √ | x | x | √ | x | √ | x | x | x | x | x | x | x | √ | √ | √ | x | x | x | x | x | x | √ | x | x | x | x | x | x | 06 |
| මොදරවාන | x | x | √ | x | x | √ | √ | √ | x | x | x | x | x | x | x | √ | √ | √ | x | √ | x | x | x | x | √ | x | x | x | x | √ | x | 10 |

√= නිර්ණායකයෙන් දැක්වෙන කාර්ය කරන

x= නිර්ණායකයෙන් දැක්වෙන කාර්ය නො කරන

## 4.3 ඇගයීම පදනම් කර ගනිමින් ගොවි සංවිධාන ශ්‍රේණිගත කිරීම

ගොවි සංවිධානයක් විසින් ගොවි ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු කාර්යභාරයන් ලෙස කාර්යයන් 29ක් හඳුනාගෙන, ඒවා නිර්ණායක ලෙස භාවිතා කරමින්, අධ්‍යයනය කළ එක් එක් ගොවි සංවිධානය, එම කාර්යයන්ගෙන් කොපමණ ප්‍රමාණයක් ඉටු කර තිබුනේ ද යන්න සලකා එක කාර්යයකට එක ලකුණ බැගින් ලබා දෙන ලදී. ඒ අනුව, ඉහත නිර්ණායකවල අඩංගු කර ඇති කාර්යයන්ගෙන් 20කට වැඩි ප්‍රමාණයක් ඉටු කර ඇති බව පෙන්නුම් කළ ගොවි සවිධාන උසස් ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන ලෙස ද, කාර්යයන්ගෙන් 19ට අඩු ප්‍රමාණයක් ඉටු කරනු ලැබූ ගොවි සංවිධාන සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් නැතහොත් අඩු ක්‍රියාකාරීත්වයක් පවතින ගොවි සංවිධාන ලෙස ද, ඒවායින් 9 හෝ ඊට අඩු කාර්යයන් කිහිපයක් පමණක් ඉටු කරමින් සංවිධානයක් ලෙස පවත්වාගෙන යන ඒවා දුර්වල ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන ලෙස ද ශ්‍රේණිගත කරන ලදී.

ඉහත ලකුණු අනුව ගොවි සංවිධාන 14 පහත සඳහන් ආකාරයට ශ්‍රේණිගත කළ හැකි වේ.

- උසස් ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන - 5/14 (36%)
- අඩු ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන - 4/14(28%)
- දුර්වල ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන - 5/14(36%)

## 4.4 උසස් ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන

උසස් ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන වශයෙන් අධ්‍යයන නියැදියේ ගොවි සංවිධාන 5ක් එනම්, මුළු නියැදියෙන් 36%ක් හඳුනා ගැනීමට හැකි වූ අතර ඒවා නම් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව නැෂනල්වැව ගොවි සංවිධානය, නාගොල්ලාගම අරුණ ගොවි සංවිධානය, ගලඅඹගස්වැව එකමුතු ගොවි සංවිධානය, අනුරාධපුරයේ සෙවන කාන්තා ගොවි සංවිධානය, බදුල්ල දිස්ත්‍රිකකයේ පල්ලේපැල වංගියකුඹුර ගොවි සංවිධානය යන ඒවා ය. භාවිතා කරන ලද නිර්ණායකවලටට අනුව උසස් කාර්ය සාධනයක් සහිත ගොවි සංවිධාන යන වර්ගීකරණයට අයත් ගොවි සංවිධාන පහ විසින් සිදු කරමින් සිටින කාර්යයන් පහත සඳහන් වේ.

- ජාත්‍යන්තර රාජ්‍ය නොවන (IFAD, Plan Sri Lanka, ADB) ආයතන සමඟ සබඳතා ඇතිකර ගනිමින් ඒවායේ මූල්‍ය ආධාර ලබා ගනිමින් කෘෂි යටිතල පහසුකම් පද්ධතිය දියුණු කිරීම (වාරි මාර්ග, කෘෂි මාර්ග, ගොවි සංවිධානය සඳහා ගොඩනැගිලි ආදිය)
- ගොවි සංවිධානය ක්‍රියාත්මක වන ග්‍රාම නිලධාරී වසමේ ගොවි පවුල් සංඛ්‍යාවෙන් 2/3 (67%) පමණ සංවිධානයේ සාමාජිකත්වය ලබා සිටීම.
- වැව, භූමිය, ගොඩනැගිල්ල, අධ්‍යාපන කටයුතු, කොන්ත්‍රාත් ආදී ඉපැයීමේ මාර්ග රාශියක් හෙළි කර ගැනීම මඟින් අරමුදල් ගොඩනංවා ගනිමින් සිටීම.
- කුඩා කණ්ඩායම් ඇති කිරීම හා ඒ හරහා ගොවි සංවිධානය තුළ හෝ ගොවි බැංකුවේ හෝ එම ක්‍රම දෙකෙන්ම ගොවීන් ඉතිරි කිරීමට පෙළඹවීම.
- කෘෂි උපකරණ මිලට ගැනීම, බීජ, පැළ, කෘෂි ළිං ඉදි කිරීම, කෘෂි රසායන ද්‍රව්‍ය සතුන් මිල දී ගැනීම, ස්වයංරකියා, කෘෂි පාදක කර්මාන්ත වැනි විවිධ ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා ණය සපයා දීම හා සාමාන්‍ය වගා ණය සැපයීම.

- ජල පාලකවරුන් පත් කොට වාරි ජලය කාර්යක්ෂම හා පිරිමැසුම්දායක ලෙස ගොවීන්ට ලබාදීම.
- සංවිධානය මගින් ගොවීන්ට පුළුල් සේවයක් සැලසීම සඳහා ණය අනුකම්ටු, සුබසාධන අනු කම්ටුව වැනි කම්ටු පත්කර සංවිධානයේ වගකීම් විමධ්‍යගත කරමින් සාමාජිකයින් බහුතරයකට වගකීම් පවරාදෙමින් නිලධාරී මණ්ඩලය පමණක් නොව සමස්ත සාමාජිකත්වය ද ක්‍රියාකාරී තත්ත්වයේ තැබීම.
- කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඉදි කිරීමේ කොන්ත්‍රාත් භාරගෙන සංවිධානය විසින් ම සිදු කිරීම හෝ ගමේ වෙනත් පුද්ගලයෙකු හට පවරා දෙමින් සංවිධානයේ සාමාජිකයන් අතර කැමති පුද්ගලයන්ට ද කුලීකරුවන් වශයෙන් වැඩ කිරීමේ අවස්ථාව සලසා දීම.
- ගම් මට්ටමේ ගොවීන්ට සමීප නිලධාරීන් වන ගොවි ජන සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම උපදේශක, කෘ.ප.නි.ස. වැනි නිලධාරීන් ද සහභාගී කරමින් කන්න රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ කන්න සැලසුම් සැකසීම.
- කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ද සහාය ලබාගනිමින් ගොවි සංවිධාන බල ප්‍රදේශයේ කෘෂිකාර්මික සංවර්ධන, සමාජ සංවර්ධන, සංස්කෘතික සංවර්ධන යන ක්ෂේත්‍ර ආවරණය වන සේ ක්‍රියාකාරකම්, අපේක්ෂිත අරමුණු, ඉලක්ක සංඛ්‍යාව හා වගකීම් ඇතුළත් කරමින් වසරේ ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා ගොවි සංවිධානය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන සැලසුම් සකස් කිරීම.
- කෘමිනාශක ඉසීමේ යන්ත්‍ර, ගොයම් කපන යන්ත්‍ර, ට්‍රැක්ටර්, වී ශුද්ධ කරන යන්ත්‍ර, වතුර මැෂින් හා වතුර නල යනා දී කෘෂිකර්මාන්තයේ දී අවශ්‍ය යන්ත්‍ර උපකරණ ගොවි සංවිධානය සතුව පවතින අතර පහසු අයකිරීම් මත ගොවීන්ට සැපයීම.
- ගොවීන්ගේ කෘෂිකාර්මික අවශ්‍යතාවයන් වන තෙල් ඉසින යන්ත්‍ර, අත් ට්‍රැක්ටර්, ගොයම් කපන හා පාගන යන්ත්‍ර, බිංදු ජල සම්පාදන වැනි දේ සංවිධානය විසින් අදාළ වෙළෙඳ ආයතන සමඟ සම්බන්ධ වෙමින් අඩුමිලට ලබාදීමට කටයුතු කිරීම.
- ගොවීන් සඳහා කෘෂි තාක්ෂණය ලබාදීම සඳහා ආදර්ශන ඇති කිරීම, ක්ෂේත්‍ර දින සංවිධානය, ගොවි හමු සංවිධානය හා ගොවීන් ක්ෂේත්‍ර චාරිකාවලට සහභාගී කරවීම.
- ගෙවතු වගාවට පෙළඹවීම සඳහා ගෙවතු වගාවේ වැදගත්කම පිළිබඳ දේශන පැවැත්වීම, අවශ්‍ය බීජ හා පැළ ලබාදීම, තාක්ෂණ ක්‍රමවේද පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම, ගෙවතු වගා තරඟ පැවැත්වීම හා ආදර්ශ ගෙවත්ත සැකසීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවීමේ ගමේ ප්‍රධාන සංවිධානය වශයෙන් දායකත්වය සැපයීමෙන් දිවි නැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ගොවි පවුල් තෝරාදීම, කොම්පෝස්ට් පොහොර සැකසීමේ තාක්ෂණය ලබාදීම.
- පිදුරු පිච්චීමේ ගොවීන්ගේ පුරුද්දෙන් ඔවුන් බැහැර කරවා පිදුරු කුඹුරට යෙදීමේ සාම්ප්‍රදාය ගොවීන් අතර ප්‍රචලිත කිරීම.
- කුඩා කණ්ඩායම් සංවිධානය කොට ගොවි බැංකුවේ කොටස් මිල දී ගැනීමට ඔවුන් පෙළඹවීම හා ගොවි බැංකු ගනු දෙනු කරුවන් බවට ගොවීන් පත් කිරීම.

- සුබ සාධන අංශයක් පවත්වාගෙන යාම මඟින් අවමංගල්‍යාධාර මුදලින් සැපයීම, පුටු ලබාදීම, ටකරන් මඩු ලබාදීම, ජල ටැංකි ලබාදීම, ආහාර-පාන ලබාදීම හා ජන සහභාගීත්වයෙන් ආධාර සැපයීම.
- සුබ සාධන අංශය මඟින් බරපතල ලෙස අසනීප වූ සාමාජිකයන්ට මුදල් ආධාර ලබාදීම, ආර්ථික අපහසුකම් සහිත පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන්ට අධ්‍යාපනය සඳහා ආධාර ලබාදීම, ලෙඩ දුක් අවස්ථාවල දී අස්වනු නෙළීම වැනි කාර්‍යයක නම් එවැනි කාර්යයන් ඉටුකරදීම වැනි පවුලේ ආර්ථික බර අඩු කිරීමට දායකවීම වැනි ක්‍රියා පිළිවෙත් අනුගමනය කිරීම.
- සාමාජිකයන්ගේ හා පවුල්වල සෙසු අයට ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සංචාරය කිරීම හා පුණ්‍ය කටයුතුවල යෙදීමට අවස්ථා ලබාදීම සඳහා වන්දනා හා විනෝද චාරිකා සංවිධානය කිරීම.
- සාමාජික පවුල්වල ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සිට්ටු ක්‍රම සංවිධානය කිරීම
- සංස්කෘතිකමය වශයෙන් වැදගත් සහ ප්‍රදේශයට හා ජනතාවට සෙත් ශාන්තියක් සිදුවන ආකාරයේ පිරිත් දේශනා, සාංඝික දාන, මුට්ටි නැමීම, කිරි ඉතිරවීම, කොහොඹ කංකාරිය වැනි ශාන්ති කර්ම පැවැත්වීම මඟින් පැරණි සංස්කෘතිකාංග රැක ගැනීමට මැදිහත් වී කටයුතු කිරීම.
- ප්‍රාථමික කෘෂි නිෂ්පාදන වටිනාකම් එකතු කළ නිෂ්පාදන බවට පත් කිරීම සඳහා වී තැම්බීම, සහල් මෝල් අරඹීම, සහල් හා වෙනත් ධාන්‍ය පිටි නිෂ්පාදනය, බීජ වී සැකසීම වැනි කාර්යයන් පවත්වාගෙන යාම.
- ප්‍රදේශයේ පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යාම සහ එහි වටිනාකම පිළිබඳ අවබෝධයක් සමාජයට ලබාදීම සඳහා පාසල් දරුවන්ට කොළ කැඳ ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඩෙංගු මර්ධනය, මී උනෙත් වැළැක්ම වැනි සෞඛ්‍යාරක්ෂිත කරුණු සම්බන්ධව සාමාජිකයන් දැනුවත් කිරීම මාර්ගයෙන් ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම.
- සාර්ථක ගොවි සංවිධානයක් බවට පත්වීමේ දී ගොවි සංවිධානය විසින් අනුගමනය කරන ලද ගමන්මග හා එහි දී ලබාගත් අත්දැකීම් සම්බන්ධ අධ්‍යාපනික වැඩසටහන් රටේ වෙනත් ගොවි සංවිධාන සඳහා පැවැත්වීම හා අදහස් හුවමාරු කර ගැනීම.
- ප්‍රදේශයේ තරුණ පිරිස් සඳහා වෘත්තීය පුහුණුවක් ලබාදීමට වෘත්තීය පුහුණු ආයතන වෙත යොමු කිරීම.
- ප්‍රදේශයේ වෙනත් ප්‍රජා සංවිධාන සමඟ සහයෝගයෙන් ප්‍රදේශයේ යටිතල පහසුකම් නැංවීම සඳහා ශ්‍රමදාන සංවිධානය කිරීම හා වෙනත් සංවිධාන විසින් මෙහෙයවනු ලබන ශ්‍රමදානවලට සාමාජිකත්වය සහභාගී කරවීම.
- ප්‍රදේශයේ පාසල්වල, විහාරස්ථානවල, රෝහල් වැනි පොදු ජන ආයතනවල උන්නතිය වෙනුවෙන් මුදල් ආධාර ලබාදීම.
- කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් ගොවීන් අතර සිදුවන සුළු පරිමාණ ගොවි ආරවුල් ගොවි සංවිධානය මැදිහත් වී විසඳීම.
- පොදුවේ ගොවීන්ට බලපාන ප්‍රශ්න පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමක් කරනු පිණිස එවැනි ගැටලු සම්බන්ධයෙන් පුවත්පත්වල ලිපි පල කිරීම හා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ ගොවීන් වෙනුවෙන් අදහස් ප්‍රකාශ කිරීම යන එවා වේ.

### 4.4.1 උසස් ක්‍රියාකාරීත්වයකින් යුත් ගොවි සංවිධානවල දැකිය හැකි ගුණාංග

උසස් ක්‍රියාකාරීත්වයකින් යුතු ගොවි සංවිධාන ලෙස තෝරා ගන්නා ලද ගොවි සංවිධාන පහ පහත සඳහන් ගුණාංගවලින් සමන්විතය විය.

#### 4.4.1.1 සංවිධානය වෙනුවෙන් කැප වූ අවංක නායකත්වය

ගොවි සංවිධානයක කාර්යභාරය මැනවින් තේරුම්ගත් ගොවි සංවිධානයෙන් පුළුල් සේවාවක් සලසාදීම සඳහා ම තම කාලය හා කායික මානසික ශ්‍රමය කැප කිරීමේ ආකල්පයක් සහිත සභාපතිවරයෙකු ඇතුළු නිලධාරී මණ්ඩලයක් විසින් ගොවි සංවිධාන මෙහෙයවීම මෙම ගොවි සංවිධානවල දැකිය හැකි ලක්ෂණයකි. උදාහරණ වශයෙන් නැෂනල් වැව ගොවි සංවිධානය, අරුණ හා එකමුතු ගොවි සංවිධානය, සෙවන කාන්තා ගොවි සංවිධානය හා වංගියකුඹුර ගොවි සංවිධානයේ නිලධාරී මණ්ඩලය දවසින් වැඩි කොටසක් ගත කරන්නේ ගොවි සංවිධානයෙන් ඉටු විය යුතු වගකීම් පරිපූර්ණ ලෙස ගොවීන්ට ඉටු කිරීම සඳහා ය. තම වටිනා කාලය ධනය වැය කරමින් රැස්වීම්වල දී ගොවි සංවිධානය නියෝජනය කරමින් අදහස් ප්‍රකාශ කිරීම, ගැටලු සඳහා විසඳුම් ලබා ගැනීමට නිලධාරීන් හමුවීම, සම්පත් වෙන් කරවා ගැනීම ආදී කාර්යයන් හී මොවුන් නිරත වෙයි. විශේෂයෙන් ම, සභාපතිවරයාගේ අවංක හා කැපවීමේ ස්වභාවය මත සංවිධානයේ සෙසු නිලධාරී මණ්ඩලයට ද සංවිධානය වෙනුවෙන් කැප වී සේවය කිරීමේ මානසික හුරුව ලැබී තිබේ. තම ගොවි සංවිධානයෙන් ගොවීන් වෙනුවෙන් තවත් කළ යුතු කාර්යයන් මොනවා දැ යි සෑම උදෑසනක ම පැය 1/2ක් පමණ මෙනෙහි කළ යුතු බවට අරුණ ගොවි සංවිධානයේ නායකයින් හා සාමාජිකයින් අතර පුරුද්දක් පවතී. මෙමඟින් පෙනී යන්නේ සංවිධානය වෙනුවෙන් කැපවීමේ ස්වභාවයයි. මෙම සංකල්පය අනුව ගොවි ජනතාවගේ හඬට කන් දී ප්‍රදේශයේ කෘෂි යටිතල පහසුකම්වල අඩුපාඩු අවබෝධ කර ගැනීම මඟින් ඒවාට විසඳුම් ලබාදීමේ හැකියාව ලබාගෙන තිබේ. කායික හා මානසිකව මෙවැනි කැපකිරීම් කළ හැකි තත්ත්වයට පුද්ගලයන් පත්වීම පුහුණුවකින් කළ හැක්කක් නොව, එය මිනිසා තුළ සහජයෙන් ම පිහිටා ඇති ගුණාංගයක් වන අතර එම ගුණාංගය ඔවුන් සමාජ සේවයේ යෙදවීමට මානසික පිටුවහලක් සපයයි.

#### 4.4.1.2 පනතේ විධිවිධාන පිළිබඳ අවබෝධයෙන් යුතුව ගොවි සංවිධානය මෙහෙයවීම

වර්ෂ 2000 අංක 46 දරන ගොවි ජන සංවර්ධන පනත මඟින් ගොවි සංවිධාන විසින් ගොවීන් වෙනුවෙන් මෙන් ම පොදුවේ කෘෂිකර්මයේ දියුණුව වෙනුවෙන් කළයුතු යැයි දක්වා ඇති විධි විධාන, (අංක 23 සිට අංක 86 දක්වා) පිළිබඳව සභාපති ඇතුළු නිලධාරී මණ්ඩලය දැනුවත් වීමක් ලබා ඇත. උසස් ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන විසින් වෙනත් ගොවි සංවිධාන වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීමේ දී මෙම පනත් පිළිබඳව ඔවුන් දැනුවත් කරයි. එම නිසා, පනත් මඟින් ගොවි සංවිධාන වලට පැවරී ඇති බලතල පිළිබඳව අවබෝධයක් පවතින නිසා එම බලතල නිසි පරිදි ක්‍රියාත්මක කරමින් පුළුල් සේවයක් සැලසීමට හැකි වී තිබේ. මිරිහන්පිටිගම අරුණ ගොවි සංවිධානය, ගලඅඹගස්වැව එකමුතු ගොවි සංවිධානය, ඇලයාපත්තුව සමඟි කාන්තා, නැෂනල්වැව හා වංගියකුඹුර ගොවි සංවිධාන ඊට උදාහරණ වේ.

### 4.4.1.3 ප්‍රදේශයේ කෘෂිකාර්මික අවශ්‍යතා ඉටු කරලීමට විවිධ මාර්ගවලින් මුදල් සපයා ගැනීම

කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ විවිධාකාර යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ සමීප සම්බන්දතා පැවැත්වීම හා IFAD, CARE, Plan Sri Lanka වැනි රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධතා පවත්වමින් එම ආයතනවලට තම ගොවි සංවිධාන සම්බන්ධ ව්‍යාපෘති වාර්තා පිළියෙළ කොට ඉදිරිපත් කර මුදල් ප්‍රතිපාදන සපයා ගෙන ගොවීන්ගේ අවශ්‍යතා ඉටු කරදීමෙන් සාමාජික ගොවීන් තෘප්තිමත් භාවයට පත් කරයි. උදාහරණ වශයෙන් සෙවණ කාන්තා ගොවි සංවිධානය Plan Sri Lanka ආයතනය සමගත්, අරුණ ගොවි සංවිධානය IFAD සංවිධානය සමඟින්, ගලඅඹගස්වැව එකමුතු ගොවි සංවිධානය IFAD, CARE සංවිධාන සමඟ ද වංගියකුඹුර ගොවි සංවිධානය IFAD සංවිධානය සමඟ ද, ඉබ්බාගමුව නැෂනල් වැව ගොවි සංවිධානය ජාතිය ගොඩනගන්නන්ගේ සංවිධානය ද සමඟ සම්බන්ධතා ගොඩනඟා ගනිමින් එම ආයතනවලින් මුදල් සපයා ගනිමින් කෘෂි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ නියැලී සිටී. සංවිධානයට විවිධ මාර්ග ඔස්සේ ලැබෙන ආදායම් ගොවි සංවිධානයේ සාමාජිකයන් සඳහා අඩු පොලී යටතේ පහසු ණය සැපයීමට යොදා ගැනෙයි. නැෂනල් වැව ගොවි සංවිධානය රු. 75,000 දක්වා ණය සපයයි. අරුණ ගොවි සංවිධානය, සත්ත්ව පාලන ණය, කෘෂි උපකරණ ණය, ව්‍යාපෘති ණය, විශේෂ ණය ආදී වශයෙන් ණය වර්ග රැසක් සපයයි. ව්‍යාපෘති ණය වශයෙන් එක් අයදුම් කරුවකුට උපරිම වශයෙන් රු. 100,000.00 දක්වා ණය මුදල් සපයයි. එකමුතු ගොවි සංවිධානය කෘෂි ළිං තනා ගැනීමට ණය සැපයීම හා බිංදු ජල සම්පාදන කට්ටල් සඳහා IFAD ආයතනය සම්බන්ධ කර ණය සපයා දෙයි. සෙවණ කාන්තා ගොවි සංවිධානය විසින් සාමාන්‍ය ණය, දිරිය ණය, විශේෂ ණය, ව්‍යාපෘති ණය වශයෙන් ණය වර්ග හතරක් ක්‍රියාත්මක කරයි. සාමාන්‍ය ණය වශයෙන් රු. 20,000.00ක් ද දිරිය ශක්ති ණය වශයෙන් රු.50,000.00ක් ද සපයයි. ඒ හැර, කුඩා කණ්ඩායම් ඇති කොට ගොවිජන බැංකුවේ කොටස් මුදල් තැන්පත් කර ගොවිජන බැංකුව හරහා ණය පහසුකම් සලසා දී තිබේ. වංගිය කුඹුර ගොවි සංවිධානය ද කුඩා කණ්ඩායම් සංවිධානය කර ගොවිජන බැංකුවේ කොටස් මිලට ගෙන ගොවිජන බැංකු ණය ලබා ගැනීමට පහසුකම් සලසා ඇත. මෙම සෑම ගොවි සංවිධානයක් ම ණය මුදල් සපයනවා මෙන් ම සාමාජික ඉතුරුම් කිරීමට ද පහසුකම් සලසා තිබේ. ගොවීන්ට බැංකු වෙත ගොස් අපහසුතා විඳ ණය මුදල් ලබා ගැනීමේ දුෂ්කරතාවයෙන් තම සාමාජිකයන් මුදවා ඔවුන්ට ඉතා පහසුවෙන් තම සංවිධානය තුළින් ඔවුන්ගේ ම මුදලින් ණය ලබා ගැනීමට ඉඩ සැලසීම සාමාජිකයින්ට ඉමහත් සේවයක් සැලසීමක් බව සාකච්ඡාවල දී අනාවරණය විය.

### 4.4.1.4 සාමාජිකයන් සඳහා සුභසාධන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම

ගොවි සංවිධානවල සාමාජිකයන් කෘෂිකාර්මිකයන් වශයෙන් එදිනෙදා මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳව අවබෝධයක් ගොවි සංවිධානයට ඇති නිසා ඔවුන්ගේ පවුල්වලට යම් කිසි මානසික සහනයක් සලසා දීම වෙනුවෙන් විවිධාකාර සුබ සාධන වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක වන බව දැකගත හැකි විය. උදාහරණ වශයෙන් නැෂනල් වැව ගොවි සංවිධානය සාමාජික අවමංගල්‍යයක දී රු. 2,000.00ක ආධාර මුදලක් ලබා දීම හා අවසාන දිනයට පෙර දින රාත්‍රී ආහාර සැපයීම, හත් දවසේ දානය සඳහා සහල් පොල් පරිත්‍යාග කිරීම, සාමාජික දූ පුතුන් ගේ අධ්‍යාපන කටයුතු සඳහා

මුදල් පරිත්‍යාග කිරීම, ශිෂ්‍යත්ව මුදල් පිරිනැමීම, වාර්ෂිකව වන්දනා හෝ විනෝද චාරිකාවකට සාමාජිකයන් සහභාගි කර වීම වැනි කටයුතු සිදු කරයි. අරුණ ගොවි සංවිධානය ද තම සාමාජික අවමංගල්‍යයක දී රු.1000 ආධාර මුදලක් දීම, පුටු සහ තහඩු ගෙය ලබා දීම, අවශ්‍ය ජනතා සහභාගීත්වය ලබා දීම සිදු කරයි. වැඩිහිටි උපහාර උළෙලවල් සංවිධානය කොට සංවිධානයේ වයෝවෘද්ධ සාමාජිකයන්ගේ සේවය ඇගයීමකට ලක් කරයි. එකමුතු ගොවි සංවිධානය තම සාමාජිකයකුගේ මරණයක දී රු. 3000ක ආධාර මුදලක් ලබා දීම, පුටු සහ තහඩු ගෙවල් ලබා දීම, වතුර සපයා දීම හා අවශ්‍ය ජනතා සහාය ද ලබා දේ. ඊට අමතරව වාර්ෂිකව පිරිත් හා දානමය කටයුතු ද සිදු කරයි. සෙවණ කාන්තා ගොවි සංවිධානය ද සාමාජික මරණයක දී රු.6000 ක ආධාර මුදලක් ගෙවීම, සාමාජික පවුලේ පුද්ගලයකුගේ අවමංගල්‍යයක දී රු.2000 ක ආධාර මුදලක් ගෙවීම, සාමාජිකයකු දින 4කට වඩා අසනීප වී පසු වුවහොත් රු. 5000ක ආධාර ලබා දීම, සාමාජික දරු ප්‍රසූතියක දී රු.500ක ආධාර මුදලක් ලබා දීම, වාර්ෂික වන්දනා විනෝද චාරිකා සංවිධානය හා වාර්ෂික පිරිත් හා සාංඝික දානමය පුණ්‍යකර්ම සංවිධානය ආදිය සිදු කිරීමෙන් සාමාජිකයන්ගේ සුබ සාධන කටයුතු ඉටු කිරීමට වැඩපිළිවෙළක් සකසා තිබේ. මේ නිසා ගොවි සංවිධානයට අංග සම්පූර්ණ බවක් ආරෝපණය වීම පමණක් නොව, එහි සමතුලිත බව ද ආරක්ෂා වී ඇත. එම තත්ත්වය තුළ සාමාජික මානසික තෘප්තිය ඇති කර තිබෙන බව ප්‍රකට විය.

### 4.4.1.5 සමාජයේ ගෞරවයට පාත්‍ර වී ඇති සංස්කෘතිකමය වශයෙන් වැදගත් චාරිත්‍ර ඉටු කිරීම

කෘෂි කර්මාන්තයේ බෝග වගාවට, සත්ත්ව පාලනයට හා සමාජයට සෙත් පැතීම සඳහා සිංහල ජන සමාජය අතීතයේ සිට ම අනුගමනය කරන ලද චාරිත්‍ර රාශියක් විය. එවැනි චාරිත්‍ර ඉටු කිරීමට තනි තනි පුද්ගලයන්ට පෞද්ගලිකව කළ නොහැකි ය. එම නිසා, එවැනි චාරිත්‍ර ඉටු කිරීම සෑම ගොවි සංවිධානයකින් ම සිදු වේ. මේ චාරිත්‍ර ඉටු කිරීම මඟින් සත්ත්ව පාලනය හා බෝග වගා සාර්ථක වී සෞභාග්‍යය උදා වන බවට ඇති විශ්වාසය නිසා පුළුල් ජනතා සහභාගිත්වයක් ලැබෙන අතර ඒවා ඉටු කිරීමට නායකත්වය ගන්නා ප්‍රජා සංවිධානයක් ලෙස ගොවි සංවිධානය කෙරෙහි බැඳීමක් සාමාජිකයන් තුළ ඇති වේ. මෙම පුද පූජා විධි අතර කිරි ඉතිරවීම, මුට්ටි නැමීම, දේව දානය, කොහොඹා කංකාරිය ආදිය ප්‍රධාන වන අතර ජනතාවට ශාන්තියක් මෙන් ම නැරඹීමෙන් වින්දනයක් ද ලැබේ.

### 4.4.1.6 සහභාගිත්වය සඳහා සාමාජිකත්වය උනන්දු කිරීමේ උපාය මාර්ග අනුගමනය කිරීම

සංවිධාන මඟින් කැඳවනු ලබන සියලුම රැස්වීම්වලට සාමාජිකයින් වැඩි ප්‍රමාණයක් සහභාගී කරවා ගැනීම සඳහා ගොවි සංවිධාන විසින් විවිධ ක්‍රියාමාර්ගයන් අනුගමනය කරන බව පෙනේ. උදාහරණ වශයෙන් සෙවණ කාන්තා ගොවි සංවිධානය රැස්වීම් වාර 12ට ම පැමිණෙන සාමාජිකයන්ගේ ලැයිස්තුවක් පිළියෙළ කොට ඒ පිරිස සඳහා තෑගි පිරිනමයි. එසේ පිරිනමන්නේ නිවසේ පරිහරණය සඳහා අත්‍යාවශ්‍ය වන භාණ්ඩයකි. තෑෂතල් වැව ගොවි සංවිධානයේ රැස්වීම්වලට අඛණ්ඩ ලෙස සහභාගි වීම ණය ලබා ගැනීමේ දී සපුරාලිය යුතු සුදුසුකමක් ලෙස සලකයි. අරුණ ගොවි සංවිධානය ද ණය ලබාදීමේ දී සාමාජිකයන් රැස්වීම්වලට සහභාගීවීම පිළිබඳව සලකා බලයි. ගලඅඹගස්වැව එකමුතු ගොවි සංවිධානය ද එම සංවිධානයට පිටතින් ලැබෙන ආධාර සාමාජිකයන් අතර බෙදීම සඳහා ප්‍රමුඛතා ලේඛන සකස් කිරීමේ දී නිර්ණායකයක් සේ සලකන්නේ වසරේ පැවැත් වූ රැස්වීම් සඳහා සාමාජිකයන් සහභාගී වී ඇති වාර ගණනයි. මෙවැනි උපාය මාර්ග අනුගමනය කිරීමේ හැකියාව ඉහත දැක් වූ ගොවි සංවිධාන සතුව පවතින අතර එම නිසා, මෙම

ගොවි සංවිධානවල රැස්වීම් වාර සඳහා සාමාජිකයන්ගේ සහභාගීත්වය ඉහළ මට්ටමක පවතින බව පෙනේ.

### 4.4.1.7 සාමාජිකයන්ගේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා සෘජු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම

ගොවි සංවිධාන සාමාජිකයන් තෘප්තිමත්ව තබා ගැනීමට නම් ඔවුන්ගේ ආර්ථිකය ඉහළ මට්ටමක පැවතිය යුතු වේ. මේ නිසා, සාමාජිකයින්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම සඳහා උපකාරී වන බොහෝ කාර්යයන් ගොවි සංවිධාන විසින් ඉටු කරනු ලබයි. උදාහරණ වශයෙන් අරුණ ගොවි සංවිධානය විසින් වී වගාව සඳහා අවශ්‍ය යෙදවුම් තොග මිලට සපයා දීම මඟින් නිෂ්පාදන වියදම අඩු කිරීම, වැඩි වටිනාකමක් සහිත බෝග වගා ලෙස සැලකෙන නව ප්‍රභේදයන් හී ගස් ලබු, අන්නාසි, වැල්දොඩම්, පැණි කොමඩු වැනි ගොඩ බෝග වගාවන්ට විශේෂ ආධාර ක්‍රම ද මිරිස්, බඩඉරිඟු වැනි බෝග යල් කන්නයේ කුඹුරුවල වගාවට ගොවීන් පෙළඹවීම ද, ගලඅඹගස්වැව එකමුතු ගොවි සංවිධානය විසින් සිදු කරයි. වගා ළිං ඉදි කිරීම හා බිංදු ජල සම්පාදන පද්ධති මිල දී ගැනීමේ ණය පහසුකම් ගොවි සංවිධානය මාර්ගයෙන් ලබා දීමට ද පියවර ගෙන තිබේ. බදුල්ල ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික වගාවන් වන අර්තාපල් වගාවේ බීජ සැපයීම හා පොහොර සැපයීම වංගියකුඹුර ගොවි සංවිධානය මඟින් සිදු කෙරේ. අත්තම් සහ කණ්ඩායම් ක්‍රමය හඳුන්වා දෙමින් කෘෂි කර්මයේ බිම් සැකසීම, ඇට සහ පැළ සිටුවීම, වල් මර්දනය සහ පොහොර යෙදීම මෙන් ම අස්වනු නෙලීම යන කාර්යයන්, මේ කණ්ඩායම් ක්‍රමය යොදවා සිදු කිරීම මගින් බෝග වගාවේ නිෂ්පාදන වියදම අඩු කොට ලාභය වැඩි කිරීම, සෙවණ කාන්තා ගොවි සංවිධානයට අනුගමනය කරන ක්‍රියා මාර්ගය වේ. මේ ක්‍රියාමාර්ගවලින් තම සාමාජිකත්වයේ ආර්ථිකය වර්ධනය වීමක් සිදු වන බව සාකච්ඡාවලින් හෙළි විය.

### 4.4.1.8 වාර්ෂික සැලසුම් සකස් කිරීම හා අරමුණු සපුරා ගැනීම පිළිබඳ පසු විපරම් කිරීම

ගොවි ජනතාවගේ පොදු අවශ්‍යතා ඉටු කිරීම හා ගොවි ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම අරමුණු කරමින් ගොවි සංවිධාන නායකත්වය, කාරක සභාව හා සාමාජිකයන්ගේ ද සහභාගිත්වය සහිතව වාර්ෂිකව සැලසුම් සකස් කිරීමක් සිදු වේ. සැලසුම අනුව, ඒ ඒ කාලවකවානුවල ඒවා ක්‍රියාත්මකවීම හා මසකට වරක් පසු විපරම් කිරීම මගින් එම සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න සොයා බැලීම ද සිදු වේ. එකමුතු ගොවි සංවිධානය, අරුණ ගොවි සංවිධානය, සෙවණ කාන්තා ගොවි සංවිධානය, නැෂනල් වැව ගොවි සංවිධානය හා වංගියකුඹුර ගොවි සංවිධානය මෙම කාර්යය අනුගමනය කරයි. ඒ අනුව වර්ෂය මුල දී ප්‍රදේශයේ සංවර්ධනය උදෙසා සැලසුම් සැකසීම, එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් සොයා ගැනීම නිසා ඒවා ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබේ. සැලසුම් සැකසීමේ ක්‍රමවේදය තුළින් භෞතික හා මානව සංවර්ධනය නිවැරදි ආකාරයෙන් සංවර්ධනය කොට ගැනීමට හැකියාව ලැබේ. එවැනි වැඩපිළිවෙළවල් තුළින් ගොවි සංවිධානයේ සංවර්ධනාභිමුඛ උසස් ක්‍රියාකාරීත්වය පිළිබඳ විශ්වාසය සාමාජිකයන් තුළ තහවුරු වී තිබුණි.

උසස් ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධානවල දැකිය හැකි වූ ලක්ෂණ පහත සඳහන් ආකාරයට සාරාංශ ගත කොට දැක් වේ.

### 4.4.2 ගොවි සංවිධාන උසස් ක්‍රියාකාරිත්වයකින් යුක්ත වීමට හේතු

- අවංක හා කැප වූ නායකත්වයේ උත්සාහවන්තභාවය.
- ගොවි සංවිධානයට නීතියෙන් හිමි වී ඇති බලතල පිළිබඳ පැහැදිළි අවබෝධයකින් යුතු වීම.
- විනිවිද භාවයෙන් යුතුව කටයුතු කිරීම.
- ගිණුම් නිවැරදිව පවත්වා ගැනීමේ හැකියාව හා පිටස්තර ආයතන ලවා විගණනය කිරීමේ පටිපාටිය අනුගමනය කිරීම.
- නිර්මාණශීලී හැකියාවෙන් යුත් නායකත්වය ඇතුළු නිලධාරී මණ්ඩලය.
- නිතර-නිතර මාසිකව රැස්වීම හා සාකච්ඡා කිරීම.
- අධ්‍යාපන දැනුම හා සමාජානුයෝජනය පිළිබඳ දැනුමෙන් යුක්ත වීම.
- තීරණ ගැනීමේ දී කමිටු වල මත විමසීම හා ප්‍රජාතන්ත්‍රික වීම.
- සෑම කාර්යයක දී ම විනිවිදභාවය ආරක්ෂා කිරීමට ප්‍රමුඛත්වය ලබාදීම.
- බිම් මට්ටමේ සංවිධානයන් හි කටයුතු කිරීමෙන් ලබා ඇති අත්දැකීම්
- ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන් අතර සහයෝගය ඇතිකර ගැනීමට ඇති හැකියාව
- සාමාජිකත්වයට සවන්දීම, සාමාජිකත්වයේ අවශ්‍යතා ඉටු කිරීමට කැප වී ක්‍රියා කිරීම.
- කෘෂිකාර්මික ක්ෂේත්‍රය ප්‍රමුඛ ග්‍රාමීය සංවර්ධනය සඳහා කාර්යයන් රාශියක් ඉටු කිරීම.
- සංවිධානයේ අරමුණු හා එහි දැක්ම පිළිබඳ අවබෝධයක් සහිත හික්මීමක් සහිත සාමාජිකත්වය.
- පෞද්ගලික ආර්ථික වැඩපිළිවෙළකට වඩා සාමූහික වැඩපිළිවෙළ අගය කිරීමට සාමාජිකයන් පෙළඹී සිටීම.
- ස්ව ශක්තිය පිළිබඳව පවතින දැඩි විශ්වාසය.
- සාමාජිකයන් සැබෑ ගොවි කාරකයන් වීම.
- වැඩිහිටි උපහාර උළෙල වැනි උපහාර උත්සව සංවිධානය කරමින් ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් ඇගයීමට ලක් කිරීම.

## 4.5 සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන

### 4.5.1 සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධානවල දැකිය හැකි ලක්ෂණ

අධ්‍යයනයට ලක් කරන ලද ගොවි සංවිධාන 14න් 3ක් (21%)ක් අඩු ක්‍රියාකාරීත්වයක් එනම්, සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් පෙන්වන බව හෙළි විය. සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන ලෙස හඳුනාගත් ඒවායේ ක්‍රියාකාරීත්වය පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය. ඒවා නම්,

- මාස කිහිපයකට වරක් පමණක් මහා සභා රැස්වීම් පැවැත්වීම
- එම රැස්වීම්වලට සාමාජිකත්වයෙන් 1/3කට වඩා සහභාගී වීම.
- කන්න රැස්වීම් පැවැත්වීම.

- කාරක සභා රැස්වීම් පැවැත්වීම
- පොත්පත් නිසි ලෙස නඩත්තු කිරීම හා අයවැය වාර්තා ඉදිරිපත් කිරීම.
- සාමාජිකයන්ට සේවාවන් ගණනාවක් (සීමාසහිත) පමණක් සිදු කිරීම

ඉහත නිර්ණායක මත ලකුණු ලැබීම මත සාමාන්‍ය මට්ටමේ ක්‍රියාකාරීත්වයක් සහිත සංවිධාන ලෙස දහදියමල්, පාළුවැව හා කොටපොල උතුර යන ඒවා නම් කළ හැකි ය.

අධ්‍යයනයට ලක් කරන ලද ගොවි සංවිධාන 14න් 6ක් ඉහත නිර්ණායක අනුව සලකා බලනවිට සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් පමණක් පෙන්වයි. මහා සභා රැස්වීම, කන්න රැස්වීම් පැවැත්වීම හා අයවැය වාර්තා ඉදිරිපත් කිරීම හා සමාජිකයන් සඳහා සේවාවන් කිහිපයක් පමණක් ඉටු කිරීම මඟින් එම සංවිධාන යම් තරමකින් තම සාමාජිකයන්ට සේවාවක් සලසයි. එම නිසා, ගොවි සංවිධානය ක්‍රියාකාරීව පවත්වාගෙන යාමක් දක්නට ලැබේ. මෙහි නිලධාරී මණ්ඩලය සාමාන්‍ය ගොවින් වන අතර ඔවුන්ට ගොවි සංවිධාන සංකල්පය පිළිබඳව තරමක අවබෝධයක් පමණක් පවතී. එම අවබෝධය මත ඔවුන් යම් තරමක වැඩ කොටසක් කිරීමට පෙළඹී ඇත. එම නිසා, එම සංවිධාන සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් පමණක් ඇතැයි සඳහන් කිරීමට පුළුවන. සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන විසින් ඉටු කරන කාර්යයන් හා එවැනි ක්‍රියාකාරීත්වයක් පැවතීමට හේතු පහත සඳහන් ආකාරයට දැක්වීමට හැකි ය.

#### 4.5.2 සාමාන්‍ය ක්‍රියාකාරීත්වක් පවතින ගොවි සංවිධානවල කාර්යයන්

- ගමේ ගොවි පවුල් සංඛ්‍යාවෙන් 1/3කට වැඩි සංඛ්‍යාවක් සාමාජිකත්වය ලබා සිටීම.
- වැව හා වාරිමාර්ග පද්ධතිය ඇතුළු කෘෂි යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව.
- විධිමත් කාල සටහනකට අනුව රැස්වීම් නො පවත්වන අතර අවශ්‍යතාවය මත පමණක් රැස්වීම් පැවැත්වීම.
- වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීම.
- කන්න රැස්වීම් පැවැත්වීම.
- අරමුදල් ගොඩ නංවා තිබීම.
- ජල පාලන කටයුතු කිරීම.
- ගොවි කාරක සභාව නියෝජනය කිරීම.
- ගෙවතු වගා සංවිධානය හා යෙදවුම් ලබා දීම.
- ගොවි ආරවුල් විසඳීම.
- වාර්ෂික අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම.
- සංවිධානය සතු ගොවි උපකරණ ගොවීන්ට පහසු මිලට ලබා දීම.
- කොන්ත්‍රාත් කිරීම.
- වාර්ෂිකව සංස්කෘතික කටයුතු සංවිධානය කිරීම (කිරි ඉතිර වීමේ මංගල්‍යය, මුට්ටි තැබීමේ මංගල්‍යය)

### 4.5.3 සාමාන්‍ය ක්‍රියාකාරීත්වයක් පැවතීමට හේතු

- වර්ෂ 2000 අංක 46 දරන පනතේ නෛතික විධි විධාන පිළිබඳ අඩු අවබෝධය
- පෞද්ගලික වැඩවලට වැඩි කාලයක් යොදවමින් ගොවි සංවිධානයේ පොදු වැඩවලට සුළු කාලයක් පමණක් යෙදවීම
- නායකත්වය, නිර්මාණශීලී නොවන හා සාම්ප්‍රදායික අදහස්වලින් සමන්විත පුද්ගලයන්ගෙන් සැදුම්ලත් එකක් වීම
- කොන්ත්‍රාත් භාර ගැනීම හා පොහොර සහනාධාරය කන්න රැස්වීම් පැවැත්වීම සඳහා කටයුතු කිරීම පමණක් ප්‍රමාණවත් යැයි කල්පනා කිරීම
- ආයාසයෙන් හා කාර්යක්ෂම ලෙස වැඩ කිරීමට දක්වන මන්දෝත්සාහීභාවය
- කෘෂිකර්මයට අදාළ ලෝක ප්‍රවණතාවයන් පිළිබඳ ගොවි සංවිධානවල අඩු දැනුම
- ගොවි සංවිධාන පිළිබඳ සමාජය තුළ පවතින ඇල්මැරුණු ආකල්පමය ස්වභාවය
- ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන් සමඟ සමීප සබඳතාවයක් ඇති කර ගැනීමට තරම් උද්යෝගීමත්භාවයක් නිලධාරී මණ්ඩල තුළ නොමැතිකම
- මුදල් පරිපාලනය පිළිබඳ අඩු දැනුම හා එම කාර්යයන් පිළිබඳ විනිවිදභාවයක් නොමැති වීම

**දුර්වල ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධානයන් හි සාමාජිකයන් මෙම ගොවි සංවිධානවලට එකරාශී වී සිටින්නේ ගොවි සංවිධානවලින් ලැබිය හැකි ඵල ප්‍රයෝජන පිළිබඳව පුළුල් අවබෝධයකින් තොරව වන අතර හුදෙක් පොහොර සහනාධාරය ලබා ගැනීම සඳහා පමණි. මේවායේ නායකත්වයෙන් හා සාමාජිකයන්ගෙන් පහත සඳහන් ලක්ෂණ ප්‍රකට කෙරේ. එනම්,**

- ගොවි සංවිධානයකින් ලද හැකි ප්‍රතිලාභ පිළිබඳ අඩු අවබෝධය
- ගොවි සංවිධානයෙන් විශාල කාර්යභාරයක් බලාපොරොත්තු නොවීම
- ප්‍රජා සංවිධාන කිහිපයකම සාමාජිකත්වය ලබා තිබීම
- පොදු කාර්යයන්ට වඩා පෞද්ගලික කාර්යයන් කෙරෙහි සැලකිලිමත්වීම
- ගොවිජන ජීවිතයේ අවශ්‍යතාවයන් පෞද්ගලික මට්ටමින් කරගෙන යාමේ ක්‍රමය සාමාජිකත්වය විසින් අනුගමනය කිරීම යන ලක්ෂණයන් ය.

## 4.6 දුර්වල ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන

### 4.6.1 දුර්වල ක්‍රියාකාරීත්වයක් සහිතවීමට හේතු

නිර්ණායක භාවිතය තුළින් ඉහත දී දැක් වූ ආකාරයට ශ්‍රේණිගත කිරීමෙන් අධ්‍යයනය කළ ගොවි සංවිධාන 14 අතුරින් හයක් (43%ක්) දුර්වල ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරන ගොවි සංවිධාන ලෙස හඳුනා ගන්නා ලදී. දුර්වල ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කිරීමට හේතු, සිද්ධි අධ්‍යයනයන් විමර්ශනය කිරීමේ දී එළි දැක්වුණු අතර පොදු වශයෙන් ඒවා පහත සඳහන් ආකාරයට විග්‍රහ කළ හැකි ය. ණය අරාව, සුළංකපොල්ල, සේනානී, දැරංගල, වැල්ලාන හා මොදරවාන දකුණ එම දුර්වල ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන වෙයි.

#### 4.6.1.1 නායකත්ව ගති ලක්ෂණවලින් තොර කැපවීම නොමැති පුද්ගලයන් නායකත්වය ඉසිලීම

නායකත්ව ගති ලක්ෂණවලින් හෙබි පුද්ගලයන් තුළින් දිස්වන කාර්ය ඉටු කිරීමෙහි ලා දක්වන කැපවීම, අවංක භාවය, විනිවිදභාවයෙන් යුක්තව කටයුතු කිරීම, සාමාජිකත්වයේ ඉල්ලීම්වලට සවන් දීම, ප්‍රියමනාප බව , ආදර්ශමත් චරිතයක් වීම, නිලධාරීන් සමඟ සුහදව කටයුතු කිරීම වැනි ගති ලක්ෂණවලින් යුතු පුද්ගලයන් මෙම ගොවි සංවිධානවල නායකත්වයේ නොමැති බව සිද්ධි අධ්‍යයනය මඟින් හෙළි විය. සුළංකපොල්ල ගොවි සංවිධානයේ නායකයන් ගොවි සංවිධානය කෙරෙහි කැපවීමකින් යුක්තව කටයුතු කරන බවක් නො පෙනෙන අතර ඔවුන් අඛණ්ඩව ම නියැළී සිටින්නේ ව්‍යාපාරික හා එළවළු වගා කටයුතුවලය. බොරලන්ද ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ණයඅරාව ගොවි සංවිධානයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන ප්‍රධාන නිලධාරීන් එකිනෙකට මුණගැසෙන්නේ ද නැති අතර 2011/2012 මාස් කන්නය ඇරඹීමට පෙර කන්න රැස්වීම් පවා පවත්වා නැති බව හෙළි විය. සොරණාතොට ගොවිජන සේවා බලප්‍රදේශයේ සේනානි ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික මුදල් වංචා කිරීම නිසා ගොවි සංවිධානයට පැමිණීම ද නවතා ඇති බව දැන ගන්නට ලැබුණි. මේ නිසා, ගිණුම් කටයුතු පවත්වා ගැනීම හා අය වැය ඉදිරිපත් කිරීමේ ගැටලුවකට සංවිධානය මුහුණ පා ඇත. මේ නිසා ගොවි සංවිධානය දුර්වල වී අක්‍රිය වී පවතී. සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන ප්‍රධාන නිල තල දරන්නන් ගොවි සංවිධානයේ දියුණුවට හා සේවයට එම නිල තල භාවිතා කිරීමට වඩා නමින් පමණක් නායකත්වයේ පෙනී සිටීම හේතුවෙන් මුළු ගොවි සංවිධාය ම අක්‍රිය වී ඇත. මෙයට හේතුව නායකත්ව ගති ලක්ෂණ නොමැති අකාර්යක්ෂම පුද්ගලයන් නායකත්වයට පත් කොට ගොවි සංවිධානයේ වගකීම් පැවරීමයි.

#### 4.6.1.2 සාමාජිකත්වයේ අනවබෝධය

ගොවි සංවිධාන නායකත්වය මෙන් ම සාමාජිකත්වය ද, තම ගොවි සංවිධානයෙන් ප්‍රතිලාභ අත්විය යුතු බවට අවබෝධයක් නො තිබෙන බව පෙනේ. ගොවි සංවිධානයේ කාර්ය වන්නේ පොහොර සහනාධාර ලබාදීමට අවශ්‍ය මූලික කටයුතු කිරීම පමණක් යයි වැරදි වැටහීමකින් යුක්තව ඔවුහු සිටින බව පෙනේ. එයට හේතුව, මෙම ගොවි සංවිධාන සංකල්පය හා ඉන් අත් කරගත හැකි ප්‍රතිලාභ පිළිබඳව නිවැරදි අවබෝධයක් නොමැතිකම වේ. එනම්, 1979 අංක 58 , 1991 අංක 4, 2000 අංක 46 වැනි පනත්වල ගොවි සංවිධාන සංකල්පය හා ඒ සම්බන්ධයෙන් දක්වා ඇති විධිවිධාන පිළිබඳව මෙම ගොවි සංවිධාන දැනුවත්වීමක් සිදු වී නොමැති බව සාකච්ඡාවල දී ද පැහැදිළි විය. එම තත්ත්වය නිසා, නායකත්වය මෙන් ම ගොවි සංවිධාන සාමාජිකත්වය ද ගොවි සංවිධානය කෙරෙහි උදාසීන මානසිකත්වයකින් පසුවීම හේතුවෙන් සංවිධානයේ ඉදිරි ගමන්මඟ පිළිබඳව නායකත්වය හා සාමාජිකත්වය යන දෙපිරිස තුළ ම පැහැදිළි අවබෝධයක් නොමැති බව පෙනේ.

#### 4.6.1.3 සම්පත් සීමිත බව

අධ්‍යයනයට ලක් කළ සාර්ථක ගොවි සංවිධාන සතුව ස්වභාවික සම්පත් මෙන් ම ගොවි සංවිධානයේ ක්‍රියාකාරීත්වය විසින් උපයා ගන්නා ලද සම්පත් පැවතුණි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ එකමුතු, අරුණ වැනි ගොවි සංවිධානවලට වැව සහ ගොවි සංවිධාන ගොඩනැගිල්ල විසින් ආදායම් ලබා දී ඇති බව හෙළි විය. සෙවන කාන්තා වැනි ගොවි සංවිධාන ණය සැපයීම මඟින් යම්කිසි අමතර ආදායමක් උපයමින් සිටී. එම මුදල් හා උපකරණ ගොවි සංවිධානයේ අවශ්‍යතා ඉටුකිරීමට යොදවයි. මෙම තත්ත්වය සුළංකපොල්ල, සේනානි හා

ණය අරාව ගොවි සංවිධාන පිළිබඳව විමසා බලන විට ඒවා කිසිම ආදායමක් නො ලබන බව හෙළි විය. එක ම ආදායම සාමාජික මුදල පමණි. එම නිසා, මෙම ගොවි සංවිධාන යැපුම් මානසිකත්වයෙන් කටයුතු කිරීමට පෙළඹී ඇත. තම සාමාජිකත්වයට ප්‍රතිලාභ ලබා දීමට තරම් සම්පත් සංවිධානය තුළ නොමැති බැවින් සංවිධානය පිටස්තර ආධාර බලාපොරොත්තු වෙයි. සංවිධානයේ පවතින දුර්වලතාවය නිසා පිටස්තර සම්පත් ගොවි සංවිධානය තුළට ලබා ගැනීමේ හැකියාව ද අඩු ය. මෙම අරමුදල් ප්‍රමාණවත් තරම් නොමැති තත්ත්වය නිසා සංවිධානය අක්‍රිය තත්ත්යට පත්වීමට හේතු වී තිබේ.

### 4.6.1.4 සාමාජිකයන් සිය පෞද්ගලික ක්‍රියාකාරිත්වය තුළින් ආර්ථික දියුණුව අපේක්ෂා කිරීම

ප්‍රජා සංවිධානයක් ප්‍රජාව වෙත ඒකරාශි වන්නේ සාමූහික ක්‍රියාකාරීත්වය තුළින් ආර්ථික දියුණුවක් ඇතිකර ගැනීම සඳහා ය. එසේ වුව ද, ගොවි සංවිධාන සාමාජිකත්වය තුළ රැස් වී ගන්නා සාමූහික තීරණ මත, සකස් කරන සැලසුම් ඔස්සේ බෝග වගාව, සත්ත්ව පාලනය වැනි කාර්යයන්හි නියැලීමට උත්සාහ නො ගෙන තනි තනිව පෞද්ගලිකව ගන්නා තීරණ මත කෘෂිකාර්මික කටයුතුවල නියැලීමට කැමැත්තක් දක්වන්නේ නම් සංවිධානය තුළ ශක්තිමත් භාවයක් ඇති නොවේ. සුළංකපොල්ල, ණය අරාව හා සේනානි යන ගොවි සංවිධාන තුනම එම තත්ත්වයට පත් වී තිබේ. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ ගොවි සංවිධාන නායකත්වය විසින් ගොවි සංවිධානය නිසි පරිදි මෙහෙය විමක් නොමැතිකම නිසා අතීතයේ දී සාමාජිකත්වයට ප්‍රතිලාභ නො ලැබී ඇති බැවින් සාමාජිකත්වය තනි තනිව ආර්ථික ක්‍රියාකාරකම් හි නියැලීමයි. මේ නිසා, එක් පසකින් ගොවි සංවිධානයේ ශක්තිමත්භාවය පිරිහී යයි. අනෙක් පසින් සාමාජිකත්වයට ලැබිය යුතු ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථාව ගිලිහී යයි. මෙවැනි තත්ත්වයක් මෙම ගොවි සංවිධාන තුනෙ හි ම දක්නට ලැබේ.

### 4.6.1.5 ආයතනික සම්බන්ධතා අවම මට්ටමක පැවතීම

අධ්‍යයනයට ලක් කරන ලද ගොවි සංවිධානවලින් බහුතර සංඛ්‍යාවක් (86%)ක් ගොවි සංවිධාන, නිලධාරි මණ්ඩලය හා පොදුවේ සාමාජිකත්වය ආයතනික සම්බන්ධතාවය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යයි. සෑම වැදගත් අවස්ථාවකට ම කෘ.ප.නි.ස, ගොවිජන සංවර්ධන නිලධාරි , ඇතැම් අවස්ථාවල දී, ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කොමසාරිස් ඇතුළු නිලධාරින් සම්බන්ධ කරගැනීමේ පුරුද්දක් පවතින බව අනාවරණය විය. එම නිසා, ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරින්ගේ සහයෝගය මෙම ගොවි සංවිධානවලට නිතැතින්ම හිමි වි තිබේ. එවැනි ගොවි සංවිධාන විසින් තම ගොවි ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් කරන ඉල්ලීම් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අවධානයට ලක් වේ. එසේ වුව ද, සිද්ධි අධ්‍යයනය අනුව, සුළංකපොල්ල ගොවි සංවිධානය, ණයඅරාව ගොවි සංවිධානය හා සොරණාතොට සේනානි ගොවි සංවිධානය යන තුනෙ හි නිලධාරින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවි සංවිධානවලට සමීපතම නිලධාරින් වන ගොවිජන සංවර්ධන නිලධාරින් සමගවත් සමීප සබඳතාවක් දක්වන බවක් නො පෙනේ. මෙම දුරස්ථභාවය නිසා මෙකී ගොවි සංවිධාන සඳහා එම දෙපාර්තමේන්තුවේ සම්පත් ගලා ඒම හා අවශ්‍යතා ඉටුකරදීමට දක්වන උනන්දුව දුර්වල මට්ටමක පවතී. එය සංවිධානයේ සාමාජිකයන්ගේ බලාපොරොත්තුව ඉටු කරදීමට ප්‍රබල බාධකයක් බැවින් සංවිධානයේ ක්‍රියාකාරීත්වය අඩපන කරයි.

## 4.7 අධ්‍යයනය කළ ගොවි සංවිධාන අතුරින් දුර්වල ගොවි සංවිධානවල දැකිය හැකි ලක්ෂණ

මෙම දුර්වල ගොවි සංවිධානවලට අයත්වන සංවිධාන වූ බදුල්ල දිස්ත්‍රික්කයේ සුලංකපොල්ල ගොවි සංවිධානය මාසික රැස්වීම් පැවැත්වීමක් සිදු කරන්නේ නැත. එසේ ම, කාරක සභා රැස්වීම් පැවැත්වීමක් ද නැත. පොත් පත් නිසි ලෙස නඩත්තු කිරීමක් ද දක්නට නොලැබේ. එවැනි තත්ත්වයක් පැවැතීමට ප්‍රධාන හේතුව, සාමාජිකත්වයට වග කියන නිලධාරී මණ්ඩලයක් නොමැති වීමයි. නිලධාරී මණ්ඩලයක් සිටිය ද, ඒ නාමික වශයෙන් පමණි. එම නිලධාරී මණ්ඩලයට ගොවි සංවිධානයේ සාමාජිකත්වයට සේවයක් සැලසීමට අවශ්‍යතාවයක් ඇති බවක් හැඟෙන්නේ නැත. එයට හේතුව, නායකත්වය කැපවීමකින් යුක්තව ඉටු කිරීමට නායකයින්ගේ සූදානමක් නොමැති වීමයි. ගොවි සංවිධානයේ තනතුරු උසුලමින් ගොවි සංවිධානයේ වගකීම් භාර ගත්ත ද, දැනුමක් හා උවමනාවක් නොමැතිකමෙන් ගොවි සංවිධානය පසෙකලා තමන්ගේ වෙනත් පෞද්ගලික ජීවන මාර්ගයන් හී යෙදෙමින් කාලය ගත කරයි. සුලංකපොල්ල ගොවි සංවිධානයේ සාමාජිකයින් පූර්ණ කාලීන ගොවීන් ද නොවන අතර ගොවිතැන දෙවන රැකියාව වශයෙන් ජීවන මාර්ගයට එකතුවක් කරයි. මෙම ගොවි සංවිධානයේ සෙසු සාමාජිකයන් ද එවැනි ආකාරයක් ගනී. එම නිසා, මෙම නායකයින්ගේ සහ සාමාජිකයින්ගේ කෘෂිකාර්මික ජීවිතයට සංවිධානයෙන් යම් කිසි සේවයක් සැලසෙන්නේ යැයි බලාපොරොත්තුවක් නොමැති බව අනාවරණය විය.

අනෙක් ප්‍රධාන කරුණක් වන්නේ, මෙම ගොවීන් ගොඩ ඉඩම්වල එළවළු වගා කරන්නන් වන අතර ඔවුන්ට පොහොර සහනාධාරය අදාළ වන්නේ නැත. එම නිසා, ගොවි සංවිධානයෙන් සැලසෙන සේවයක් පිළිබඳව සාමාජිකයන් බලාපොරොත්තු තබා ගැනීමක් නැති අතර ඒවා ගොවි සංවිධානයෙන් ඉටු කරවා ගැනීමක් පිළිබඳ අවශ්‍යතාවයක් පැන නඟින්නේ ද නැත.

සුලංකපොල්ල ගොවි සංවිධානයේ සාමාජික ප්‍රජාව මුස්ලිම් ප්‍රජාවක් වන අතර මුස්ලිම් ආගමික නීතිරීති අනුව මුදල් ණයටදීම පොලී අයකර ගැනීම ආදිය අකැප දේවල් ලෙස සැලකෙන බැවින් ගොවි සංවිධානය විසින් සලසන සේවා ලෙස මුදල් ණයටදීමක් අවශ්‍ය වන්නේ නැත. එවැනි සේවයක් සාමාජිකත්වය විසින් බලාපොරොත්තු වන්නේ ද නැත.

එසේ වූවත්, ගොවි සංවිධානය විසින් තම සාමාජිකත්වය සඳහා සේවා රාශියක් ඉටු කර දිය යුතුව තිබේ. එනම්, එළවළු පොහොර තොග මිලට ගෙනවුත් දීම, එළවළු බීජ තොග මිලට ගෙනවුත් දීම, කෘෂි රසායනික ද්‍රව්‍ය තොග මිලට දීම, මුස්ලිම් ආගමික නීතිරීතිවලට පටහැනි නොවන ආකාරයට ආර්ථික අපහසුතා සහිත එළවළු ගොවීන්ට අරමුදල් සැපයීම ආදී යෙදවුම් ලබාදීමට හැකියාව ඇතත් එවැනි සේවයක් සිදු නො කරයි. එසේ ම, කෘෂි රසායනික ද්‍රව්‍ය ඉසීම සඳහා දියර ඉසින යන්ත්‍ර තොග මිලට සැපයීම වැනි සේවා සැපයීම, රසායනික පොහොර භාවිතය ක්‍රමයෙන් අඩු කරමින් කාබනික පොහොර යෙදවීමට ගොවීන් උනන්දු කරවීම හා කාබනික පොහොර ගොවීන් විසින් ම නිෂ්පාදනය කිරීමට දැනුමක් ලබාදීම, එළවළු අලෙවිය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම එනම්, ප්ලාස්ටික් ඇසුරුම් ගොවීන්ට සැපයීම හා ඒවායේ අසුරා ප්‍රවාහනය සඳහා සූදානම් කිරීම, එළවළු ශ්‍රේණිගත කිරීම හා ඉහළ මිලක් සහිත සුපිරි වෙළෙඳසැල් ජාලයට ගොවීන් සම්බන්ධ කරවීම වැනි සේවා රැසක් ඉටු කිරීම ගොවි සංවිධානයෙන් සිදු කළ යුතු වූවත්, එවැනි කිසිම සේවාවක් ඉටු කිරීමක් දක්නට නො ලැබේ. ගොවි සංවිධාන කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැංවීම ගොවි සංවිධාන දියුණු කිරීමට අදාළ දේ සිදු කිරීම කෘ.ප.නි.ස. වරයාගේ කාර්යභාරය වූවත්, ඔහුගෙන් ද එවැනි කාර්යයන් ඉටු වන බවක් නො පෙනේ.

ගොවි සංවිධානය කොන්ත්‍රාත් භාර ගැනීම පමණක් සිදු කරයි. මෙහි දී, සිදු කරන්නේ ගොවි සංවිධානය කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කොට 5%ක කොමිස් මුදලකට කොන්ත්‍රාත්තුව වෙනත් පුද්ගලයෙකුට ලබා දීමයි. මෙය දේශපාලන සම්බන්ධතා හා බැඳුණු ක්‍රියාවලියකි. ප්‍රාදේශීය දේශපාලකයින්ට කොන්ත්‍රාත් කිරීමට ගොවි සංවිධානය භාවිතා කිරීමට අවස්ථාව ලබාදීමක් මෙයින් සිදු වී ඇති බව පැහැදිළි වේ.

### 4.7.1 ගොවි සංවිධාන දුර්වල ක්‍රියාකාරීත්වයක් ප්‍රකට කිරීමට හේතු

- උදාසීන හා දුර්වල නායකත්වය, නායකයන් අතර අසමගිය හා දිගු කාලයක් නායකත්වයේ රැඳී සිටීමේ කැමැත්ත. කැපවීමක් නැතිකම හා දැක්මක් නැති නමට පමණක් සීමා වූ නායකත්වය හා සෙසු නිලධාරී මණ්ඩලය
- මූල්‍ය පරිපාලනය විනිවිදභාවයෙන් අඩුබව, වංක පුද්ගල ගති ලක්ෂණ, තනි තීරණ ගැනීම
- සාමාජිකත්වය සජීවීකරණයට භාජනය වී නොමැතිවීම
- ප්‍රතිලාභ ලබාදීමට තරම් අවබෝධයක් සහිත නො පැවතීම
- සීමිත සම්පත් ප්‍රමාණයක් පැවතීම
- පූර්ණකාලීන ගොවීන් නොව, වෙනත් ජීවන මාර්ග ප්‍රධාන ආදායම් මාර්ග ලෙස භාවිතා කිරීම හා ගොවිතැන ද්විතියික ආදායම් මාර්ගයවීම.
- පෞද්ගලික ක්‍රියාකාරීත්වය තුළින් ආර්ථික දියුණුව අපේක්ෂා කිරීම
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමග සමීප සම්බන්ධතාවයක් පවත්වා නො ගැනීම
- ගොවි සංවිධාන සංකල්පය හා ගොවි සංවිධාන කාර්යයන් පිළිබඳ පනත්වලින් දක්වා ඇති විධි විධාන පිළිබඳ නො දැනුවත්කම, කන්න රැස්වීම්, වාර්ෂික මහා සභා රැස්වීම් හැර වෙනත් රැස්වීමක් වෙනුවෙන් සාමාජිකයන් එකතු නොවීම යන ඒවා ය.

## 4.8 සාර්ථක ලෙස ගොවි සංවිධාන පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වෙනත් විද්වතුන් විසින් දක්වා ඇති අදහස්

### 4.8.1 ගොවි සංවිධාන ගොවීන්ට දැනෙන ආර්ථික ප්‍රතිලාභ ලබාදීම

ගොවි සංවිධානවල තිරසරභාවය ඇති කිරීමට නම් ගොවි සංවිධානවලින් ගොවීන්ට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ නිශ්චය විය යුතු අතර ඒවා වර්ග කර නම් කර දැක්විය යුතු ය. ගොවීන්ට ලැබෙන ප්‍රතිලාභ අඩුවන්නේ නම් සංවිධානය ද අඩපණ වී යයි. ප්‍රශ්න පවතින විට ජනතාව සංවිධානය වී ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට උත්සුක වන අතර ප්‍රශ්න විසඳුනු පසු සංවිධානවලින් සාමාජිකයන් ක්‍රමයෙන් ඉවත්වන බව ගල්ඔය ගොවි සංවිධාන ආරම්භය සහ පැවැත්ම පිළිබඳව උදාහරණ ගෙන හැර දක්වන රණසිංහ පෙරේරා පෙන්වා දෙයි. කල් පවත්නා ගොවි සංවිධාන ඇති කිරීමට නම් ප්‍රතිලාභ අඛණ්ඩව ලැබෙන සැලැස්මක් සංවිධානය සතුව පැවතිය යුතු අතර එක් ප්‍රතිලාභයකින් වෙනත් ප්‍රතිලාභයකට මාරුවන පරිදි හෝ ගොවියා නිරන්තරයෙන් සංවිධානයට බැඳ ගැනීමට තරම් වැඩසටහන් සමත් විය යුතු බව ඔහු පවසයි. ගොවි සංවිධාන මගින් ඇති වේ යැයි අපේක්ෂිත ප්‍රතිලාභ සම්බන්ධයෙන් කතා කරන විට ප්‍රතිලාභ ලෙස නිර්වචනය කරන්නේ සංවිධානය මගින් ගොවියාට පුද්ගලිකව ප්‍රතිලාභ අත් නොවුවත් පොදුවේ ප්‍රදේශයට, වාරි පද්ධතියට හෝ රටට

ආදී වශයෙන් හිමිවන ප්‍රතිලාභයන් ය. එවැනි ප්‍රතිලාභ මත ගොවීන් සංවිධානය කළ හැකිය. ඒවා දිගුකල් පවත්වාගෙන ද යා හැකිය. වර්තමානයේ ගොවි ජනතාව මුහුණ දෙන ගැටලු අතර වැදගත්වන ප්‍රමාණවත් පරිදි ජලය සපයාගැනීම, වී වගාවේ දී අධික නිෂ්පාදන වියදම, බිම් සැකසීමේ සිට අස්වැන්න සුද්ධ කිරීම දක්වා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සපයා ගැනීම, වෙළෙඳපොල අතිරික්තය, අලෙවිය සඳහා මාර්ග, කෘමිනාශක හා බීජ වී සපයා ගැනීම, රෝග කාරක අවස්ථාවල දී උපදෙස් හා යෙදිය යුතු ප්‍රතිකර්ම නිශ්චය කර ගැනීම යනා දී ගැටලුවලට විසඳුම් සපයා දිය යුතු වේ.

ප්‍රතිලාභ පිළිබඳව සැලකීමේ දී වැදගත්වන තවත් කරුණක් නම් සංවිධාන නිසා ගොවියාට ලැබෙන ආත්තික වාසි ප්‍රමාණාත්මක වශයෙන් වැදගත් ද යන්නයි. වෙනත් වචනවලින් සඳහන් කළොත් ගොවි සංවිධාන කටයුතුවල නියැලීම සඳහා ඔහු මිඩංගු කරන කාලය ඔහුගේ එදිනෙදා කටයුතුවලට යොදවන්නේ නම් ඔහුට වඩා වාසිදායක වන්නේ කුමක් ද යන්නයි. ගොවියා වගාකරුවෙකු මෙන් ම බොහෝවිට පවුලේ ප්‍රධානියා ද වෙයි. මේ නිසා, පොහොර යෙදීම්, කෘමි නාශක ද්‍රව්‍ය යෙදීම්, පැළ සිටුවීම් වැනි ගොවිතැනට සම්බන්ධ කරුණුවලට අමතරව පවුලේ වෙනත් අවශ්‍යතා එනම්, දූ දරුවන් පිළිබඳව කටයුතු, අවස්ථාවක් ලද විට වෙනත් දෛනික ආදායම් ලබාදෙන කුලී වැඩ ආදියෙ හි යෙදීම ද ඔහුගේ දෛනික ජීවිතයට අඩංගු කරුණු ය. මේ නිසා, ගොවි සංවිධාන රැස්වීමකට, සාකච්ඡාවකට, පුහුණුවකට සහභාගීවීමට පෙර ඔහු ඊට සහභාගී වනවා ද, වෙනත් කටයුත්තක යෙදෙනවා ද යන්න තීරණය කරන්නේ එම කාර්යයන් දෙකෙන් ඔහුට වඩා වැදගත් දෙය මැන බැලීමෙනි. එම නිසා, ගොවි සංවිධාන කාර්යයන් ගොවියාට හෝ ගොවි ප්‍රජාවට සෙතක් සැලසෙන බව පෙනී යා යුතු ය.

### 4.8.2 ගොවි සංවිධාන නායකත්වය හා කම්වු දිරිමත් කිරීම

ගොවීන් සංවිධානය කිරීම හා පවතින ගොවි සංවිධාන උසස් ක්‍රියාකාරී හා ගොවීන්ට වඩා හිතකර අන්දමින් ක්‍රියාත්මක කිරීමට නිලධාරීන්ට මැනවින් හැකියාව තිබේ. වර්තමානයේ මේ ආකාරයට ක්‍රියාත්මක වන නිලධාරීන් සුළු පිරිසක් සිටින අතර සෑම දෙනා අනිත්ම එවැනි කාර්යයන් මැනවින් ඉටු නොවන බව පෙනේ. මෙයට හේතුව වශයෙන් මේ පිළිබඳව අධ්‍යයනවල නිරතවූවන් පෙන්වා දී ඇත්තේ ගොවීන් වෙනුවෙන් සංවිධාන ගොඩනගමින් ගොවිජන ජීවිතයේ ගුණාත්මක තත්ත්වය පවත්වාගෙන යාමට කැප වී ක්‍රියාකරන නිලධාරියාත්, රැකියාව සඳහා පමණක් කටයුතු කරන නිලධාරියාත් වෙන්කර හඳුනාගැනීමට ක්‍රමයක් හා එවැන්නක් අගය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතු බවයි. උසස්වීම්, ශිෂ්‍යත්ව ආදී සියලු වරප්‍රසාද නිලධාරියාට ලගාවන්නේ වෙනත් දෘශ්‍ය හා අදෘශ්‍ය සාධක මත මිස ඔහුගේ කැපවීම හා වෙනත් ගුණාංග මත නොවේ. මේ නිසා, නිලධාරියාගේ කාර්යක්ෂමතාවය මැනීමට ඉවහල් කරගනු නො ලබන මිනුම් දඬු යටතට ඒවා ගැනේ. ගොවි සංවිධාන කටයුතු ආදියෙ හි යෙදීම හුදෙක් ඇතැම් නිලධාරීන් තුළ තිබෙන කැපවීම හා මිනිස්කම විදහාපාන ලක්ෂණයක් විනා පවතින පරිපාලන රටාව විසින් ඔවුන් පෙළඹවීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් නොවේ. එබැවින්, කල් පවතින ගොවි සංවිධාන බිහිවීමට නම් පවතින නිලධාරී ඇගයුම් ක්‍රමය, ගොවීන් වෙනුවෙන් හා ගොවි සංවිධාන වෙනුවෙන් කැප වී ක්‍රියාකරන නිලධාරීන් හඳුනාගෙන ඔවුන් ඇගයීමේ ක්‍රමයක් ලෙසට කාලානුරූපීව වෙනස් කිරීමට කාලය එළඹ ඇතැයි රණසිංහ පෙරේරා 1990 දී පෙන්වා දී ඇති අතර වර්තමානයට ද එම තත්ත්වය එලෙසම වලංගු බව මෙම අධ්‍යයනය අනුව ද පෙන්වා දිය හැකි ය.

### 4.8.3 ගොවීන්ගේ සමීපතම සහායක ආයතනය ගොවි සංවිධානය බවට විශ්වාසයක් ගොවි ප්‍රජාව තුළ ගොඩනැඟී පැවතීම

බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වා සිය බල ප්‍රදේශයේ ගොවි ජනතාවට අවශ්‍ය යෙදවුම් වන කෘෂි ණය, බීජ වී, පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය ඊට අමතරව බිම් සකස් කිරීම් සඳහා ට්‍රැක්ටර නොමැති ගොවීන්ට ට්‍රැක්ටර් සපයා දීම, අස්වනු නෙළන යන්ත්‍ර සහ අස්වනු පිරිසිදු කිරීමේ යන්ත්‍ර සපයාදීම යන කාර්යයන් ගොවි සංවිධානය විසින් ඉටු කළ යුතු වේ.

වගාවට වැළදෙන රෝග පිළිබඳ ගොවීන්ට අවබෝධයක් නොමැති අතර උපදෙස් ලබාගන්නේ පොහොර හා කෘමිනාශක වෙළෙඳුන් ගෙනි. එම නිසා, එවැනි අවස්ථාවක දී රෝග හා පළිබෝධ පිළිබඳ අවබෝධයෙන් අවශ්‍ය ප්‍රතිකාර ලබාදීම සම්බන්ධව දැනුම සහිත පුද්ගලයෙකු ගොවි සංවිධානය විසින් පුරුදු පුහුණු කොට සේවයේ යොදවා සිටිය යුතු වෙයි. එසේ නැතහොත් අන්තර්ජාලය මඟින් පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධ වී අවශ්‍ය ප්‍රතිකාර නියම කිරීමට හැකිවිය යුතු ය. ඒ ක්‍රමයෙන් ගොවීන්ගේ අනවශ්‍ය වියදම් අඩුවන අතර අනවශ්‍ය ලෙස කෘෂි රසායන වගාවට යෙදීමෙන් වන පරිසර හානිය ද අවම වේ. අස්වනු නෙළු වගාවට (අතිරික්ත අස්වනු සාධාරණ මිලකට අලෙවිකර ගැනීමට) අවස්ථාව නො ලැබෙන බව වර්තමාන ස්වභාවයයි. මේ අවස්ථාවේ දී සාධාරණ මිලකට අස්වනු මිල දී ගැනීමට හා ඒවා පසුව සහල් කර අලෙවි කිරීමට ක්‍රමවේදයක් ඇත්තේ නම් අදාළ ප්‍රදේශයේ ගොවි ප්‍රජාව කෘෂිකර්මය පාඩු ගෙනදෙන ජීවනෝපායයක් ලෙස නො සලකනු ඇත. එසේ නොමැති නම් විවෘත වෙළෙඳපළේ වී මිල ඉහළ යන තුරු පහසු පොළී යටතේ ණය මුදලක් ගොවීන්ට ලබාදීමට ගොවි සංවිධානය ක්‍රියාකරන්නේ නම් ගොවීන්ට සහනයකි.

ගොවීන්ගේ මුදල් ඉතිරි කිරීමේ හා එම ඉතිරි කරනු ලබන මුදල් ණය වශයෙන් සැපයීමේ ග්‍රාමීය මූල්‍ය ආයතනයක් ලෙස ක්‍රියාකරන්නේ නම් ගොවීන් හා ගොවි සංවිධානය තිබඳව ම ක්‍රියාකාරී මට්ටමේ පවතී. ඉතිරි කිරීමේ මුදල් සඳහා පොළිය හා ණය මුදල් සඳහා පොළිය අතර වෙනසින් යම් කිසි ප්‍රතිශතයක් පරිපාලන වියදම් හා ගොවි සංවිධානයේ ආදායම් වශයෙන් ලබාගැනීමට ද හැකි ය.

ඊට අමතරව, ප්‍රදේශයේ දේශගුණික තත්ත්වය අනුව වගාවට සුදුසු ගොඩ බෝග වගාවට අවශ්‍ය පහසුකම් සලසාදීම මඟින් ගොවීන්ගේ ගෙවතු හා උස් බිම් වගාවන් දියුණු කිරීමට හැකියාව පවතී. ජලය සපයා ගැනීමට අවශ්‍ය කෘෂි ළිං ඉදිකර ගැනීමට අවශ්‍ය ණය පහසුකම් සැලසීම, වතුර මෝටර් හා අවශ්‍ය ජලනල සපයා ගැනීමට හෝ බිංදු ජල හෝ විසිරුම් ජල සම්පාදන කට්ටල මිල දී ගැනීමට සූර්ය බලශක්ති උපකරණ මිල දී ගැනීමට පහසුකම් සැලසීමට හැකි වේ.

කෘෂි සහායක සේවා විධිමත් කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් ගොවි සංවිධානය ක්‍රියා කළ හැකි ය. පොල් වගාව සම්බන්ධ ව්‍යාප්ති නිලධාරීන්, අපනයන බෝග ව්‍යාප්ති නිලධාරී, පශු සම්පත් සංවර්ධන උපදේශක වැනි තාක්ෂණ සේවාවන් සම්බන්ධීකරණය සහ ඒවා ගොවීන් වෙත බෙදාහැරීමේ මධ්‍යස්ථාන වශයෙන් ගොවි සංවිධානයට ක්‍රියා කිරීමට හැකි ය. කෘෂිකාර්මික කටයුතු සහ වෙනත් සමාජ ආර්ථිකමය කාර්යයන් සඳහා භාවිතයට ගත හැකි ආකාරයට තම සාමාජික ගොවි ප්‍රජාව, කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය කොට මුදල් වියදම් නො කොට ශ්‍රමදාන මඟින් බොහෝ කාර්යයන් ඉටු කරගැනීමට පුරුද්ද ඇති කළ හැකි ය. ඊටත් අමතරව, කාබනික පොහොර භාවිතයෙන් වී සහ වෙනත් බෝග වගාව,

සාම්ප්‍රදායික වර්ගවලට අයත් වී වගාව හා බීජ වී නිෂ්පාදනය යන වර්තමානයේ ඉහළ වෙළෙඳපළ මිලක් ඇති කෘෂිකාර්මික කටයුතු කෙරෙහි ගොවීන් යෙදවීමට පුළුවන. මෙම සියලුම කාර්යයන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරී, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරී වැනි තාක්ෂණ නිලධාරීන්ගේ සේවය සාමාන්‍ය සේවයට වඩා ලබාගැනීමට අවශ්‍ය වන්නේ නම් ගොවි සංවිධානයේ ආදායමින් යම් කිසි ගාස්තුවක් ගෙවා එම සේවය වඩාත් ප්‍රබල ලෙස ලබාගැනීමට හැකියාව පවතී. පාරිභෝජන කෘෂිකර්මයේ යෙදුණු සුළු ගොවීන් ව්‍යාපාරික ගොවීන් බවට පත් කිරීමටත්, ව්‍යාපාරික ගොවීන් අපනයන සඳහා කෘෂි බෝග සකස් කරන ගොවීන් බවට පත් කිරීමටත් අවශ්‍ය මඟපෙන්වීම සහ මූල්‍ය ශක්තිය සැපයීම ගොවි සංවිධානවල වර්තමාන වෙනස්වන කාර්යභාරය ලෙස සඳහන් කළ හැකි ය.

ගොවි සංවිධාන හුදෙකලා ගොවි සංවිධාන නොවිය යුතු අතර ඒවා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි උපදේශක, සත්ත්ව සංවර්ධන දෙපාර්තමේන්තුවේ සත්ත්ව සංවර්ධන උපදේශක, පශු වෛද්‍ය, ගොවිජන සංවිර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරී, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරී, වාරි ඉංජිනේරු, පර්යේෂණ මධ්‍යස්ථානවල පර්යේෂණ නිලධාරී මහතුන් සහ පරිපාලන නිලධාරීන් වශයෙන් දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් යනා දී නිලධාරීන් සමඟ අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වාගෙන යා යුතු ය. ඒ ක්‍රමවේදය තුළින් ගොවි සංවිධාන කාර්යයන් ඉහත නිලධාරීන් හරහා එම ආයතනවලට ද, ආයතන කාර්යයන් හා තීරණ ප්‍රතිපත්ති ගොවි ජනතාවට ද ගලා එන සම්බන්ධතාවයක් බිහි වේ. එය රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේ දී ගොවිජන සහභාගීත්වය ලබාගැනීමේ ප්‍රතිඵලදායී ක්‍රමයක් ද වන්නේ ය. ගොවි ජනතාව මුහුණ දෙන බොහෝ ගැටලු ගොවි සංවිධාන මට්ටමේ දී ම විසඳා ගැනීමට ද හැකි වන්නේ ය.

ගොවිජන සංවර්ධන පනතේ 43-12 යටතේ ලියාපදිංචි කිරීමේ දී ගොවිජන සේවා, මහා වාරි මහවැලි වශයෙන් ගොවි සංවිධාන වෙන් කොට තිබේ. සුළු වාරි හා වර්ෂාපෝෂිත ගොවි සංවිධාන නිලධාරීන් පත් කරනු ලබන්නේ ඒ ප්‍රදේශයේ සියලුම ගොවි මහතුන් කැඳවා මහ සභාවක් තුළිණි. මහා වාරි/මහවැලි ගොවි සංවිධාන පිහිටවනු ලබන්නේ කෙත් ඇළ නියෝජිතයන් විසිනි.

## 4.9 සාර්ථක ගොවි සංවිධාන බිහි කිරීමේ කාර්යයේ දී මෙම ගොවි සංවිධාන තුළ ම දැකිය හැකි වූ බාධක

ගොවි සංවිධානවල අරමුණ විය යුත්තේ එම සංවිධානවල සාමාජිකයන්ගේ ආර්ථික සාමාජික සංස්කෘතික දියුණුවක් ඇති කිරීමයි. එම අරමුණ කරා ළඟාවීමට ගොවි සංවිධාන කටයුතු කරනවා ද යන්න වර්තමානයේ ඇති වී ඇති ප්‍රධාන ප්‍රශ්නයකි. ඒ සඳහා පාදක වන කරුණු ගොවි සංවිධාන තුළ ම අන්තර්ගත වී ඇති බව පෙනේ. ඒ පිළිබඳ විමසුමක් මෙතැන් සිට සිදු කෙරේ.

### 4.9.1 එකම නායකත්වය යටතේ වසර ගණනාවක් සංවිධානය පවත්වාගෙන යාම

ගොවි සංවිධාන නායකත්වයන් වෙනස් නොවී දිගු කාලයක් රැඳී සිටීමට ගොවි සංවිධානයේ දියුණුවට බාධකයකි. අධ්‍යයනයට ලක් කරන ලද ගොවි සංවිධාන අතුරින් නාරම්මල දකදියමල් ගොවි සංවිධානයේ සභාපතිවරයා වසර 17ක් අඛණ්ඩව සභාපති ලෙස ක්‍රියාකරයි.

හම්බන්තොට, මොදරවාන දකුණ ගොවි සංවිධානයේ සභාපතිවරයා ද වසර 17ක් ම සභාපති තනතුර දරමින් සිටී. සුළංකපොල්ල ගොවි සංවිධානයේ ද නායකත්වය වසර 8ක් එකම පුද්ගලයා විසින් දරනු ලබයි. මේ නිසා මෙම ගොවි සංවිධාන නවතාවයකින් යුක්තව ගොවිජන පනතේ ආර්ථික සමාජිකත්වය නඟා සිටුවීම සඳහා ක්‍රියාත්මක වීමක් දක්නට නැත. දහදියමල් ගොවි සංවිධානයේ සැබෑ නායකත්වය දරන්නේ ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරයා නිසා පොහොර සහනාධාරය, පැළ හා රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීම සම්බන්ධයෙන් ගැටලු පැන නැඟී ඇති බවක් වාර්තා වී නැත. එසේ වුවත්, දෙවන පෙළ නායකත්වයක් පුරුදු කිරීමක් ද සිදු නොවන බව පැහැදිලි විය. කොන්ත්‍රාත් කිරීම මෙම ගොවි සංවිධාන දෙකෙහිම ඉතා විශාල වශයෙන් දක්නට ලැබෙන අතර කොන්ත්‍රාත් හා සංවිධාන නායකත්වය අතර සබඳතාවයක් ද දක්නට ලැබේ. ඒ හැර සමාජයීය වශයෙන් ගරුබුහුමන් ලැබීමට ඇති කැමැත්ත, ගොවි සංවිධානය වෙනුවෙන් වෙනත් සභාවක් නියෝජනය කිරීමට අවස්ථාව ලැබීම, ඇතැම් ගොවි සංවිධානවල සලාරිස්වලින් යම් කිසි ප්‍රතිශතයක් දීමනාවක් වශයෙන් ලබීම ද දක්නට ලැබේ. උදාහරණ වශයෙන් පාළු වැව ගොවි සංවිධානයේ එවැනි ආර්ථික ප්‍රතිලාභයක් සභාපති ලේකම්වරුන්ට ලැබේ. මේ නිසා ද නායකත්ව තනතුරු වෙනස් කිරීමට අපහසු කරුණකි. ගොවි සංවිධානයන් හී සභාපතිවරයා හා රටේ පාලන බලය හිමි දේශපාලන පක්ෂය අතර ද සබඳතාවක් පවතී. එමෙන් ම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ ද ඉතා කිට්ටු සබඳතාවයක් පවතී. මේ නිසා, නායකත්වය ඉවත් කිරීම අපහසු කරුණක් බවට පත් වී තිබේ. එහි ප්‍රතිඵලය වන්නේ දිගු කාලීන වශයෙන් ගොවි සංවිධානයේ නායකත්වයේ රැඳී සිටීම නිසා ගොවි සංවිධානයෙන් ඉටුවිය යුතු සේවය නිසි ලෙස ඉටුකිරීමට මෙම නායකත්වයට කැපවීමක් හා උවමනාවක් නැති මානසිකත්වය මෙන්ම වෙනත් ප්‍රතිලාභවලට පමණක් යොමු වීම නිසා කැපවීම අඩුවීම හේතුවෙන් ය. සංවිධාන සම්ප්‍රදායිකව සිදු කරනු ලබන කාර්යයන් කිහිපයකට පමණක් සීමා වී පවතී. එම නිසා, පුළුල් පරමාර්ථ ඉටුකර ගැනීමට නායකත්වයේ දිගු කලක් රැඳී සිටීම බාධකයක් ලෙස හඳුනාගත හැකි ය.

### 4.9.2 සාමාජික බහුතරය වගකීම් දැරීමට පසුබටවීම

ගොවි සංවිධාන සාමාජිකයන්ට සංවිධානයේ ඇති නීතිමය බලතල හා කාර්යයන් පිළිබඳ නිසි අවබෝධයක් ලබා නොදී ගොවි සංවිධාන පිහිටුවා ඇති නිසා සාමාජිකයෝ ගොවි සංවිධානයකින් ඉටු විය යුතු කාර්යයන් පිළිබඳව පැහැදිලි අවබෝධයක නොසිටියහ. එම අවබෝධය මත නිලධාරීන් පත් කිරීමේ දී ඒ සඳහා සුදුසු පුද්ගලයන් පත් කිරීමට පෙළඹෙන්නේ නැති බව පැහැදිලි විය. ඇතැම් විට, ඒ පිළිබඳ සුදුසු පුද්ගලයන් සිටිය දී දේශපාලනයේ ඉහළ සබඳතා පැවැත්වීම, වෙනත් ප්‍රජා සංවිධානවල නිලතල දැරීම, ධනය, බලය වැනි හේතු මත හා ඇතැම්විට ගොවිජන සංවර්ධන නිලධාරීන්ගේ බලපෑම් මත නුසුදුසු පුද්ගලයින් ගොවි සංවිධානවල ප්‍රධාන නිලතලවලට පත් කිරීමක් සිදු වී ඇති බව පෙනේ. එවැනි පුද්ගලයන් අවබෝධයකින් තොරව ගොවි සංවිධානය ක්‍රියාත්මක කිරීම නිසා ගොවි සංවිධානයේ අරමුණු ඉටු කරගැනීමට මුල් තැන දී කටයුතු නො කරන තත්ත්වයක් දැකිය හැකි ය. එවැනි ගොවි සංවිධාන ලෙස සුළංකපොල්ල, ණය අරාව, සේනානි යන ගොවි සංවිධාන දැක්විය හැකි ය. මෙවැනි පුද්ගලයින් ඊළඟ වර්ෂයේ දී නායකත්වයෙන් ඉවත් වී වෙනත් පුද්ගලයෙකුට අවස්ථාව ලබා දීමට ද අකැමැත්තක් දක්වනු ලබයි. විවිධ ක්‍රමවේද භාවිතා කොට නායකත්වයේ දිගටම රැඳී සිටීමට උත්සාහ දරයි. එමෙන් ම, තවත් දැකිය හැකි තත්ත්වයක් වූයේ, ගොවි සංවිධානයේ සාමාජිකයන්ට ද ගොවි සංවිධාන නීතිරීති ගොවි සංවිධාන පිහිටුවීමේ අරමුණු ආදිය පිළිබඳ අවබෝධයක් නොමැතිකම නිසා නායකයන් පත් කිරීමේ දී සිටින සභාපතිවරයාම යළිත් පත් කර වගකීම් දැරීමට පසුබට

වෙමින් ඇඟ බේරාගැනීම හෝ කවුරුන් හෝ පත් කොට බහුතර සාමාජිකත්වය එම වගකීම් දැරීමෙන් වැළකී සිටීමට කටයුතු කිරීමේ ප්‍රවණතාවයක් පැවතීමයි. ගොවි සංවිධාන සාමාජිකයෙකු වශයෙන් තම වගකීම් හා යුතුකම් පිළිබඳව නිසි අවබෝධයකින් යුක්ත සාමාජිකයින් නොවීම නිසා මෙවැනි තත්ත්වයක් ණය අරාව, සුළංකපොල්ල, සේනානි, මොදරවාන දකුණ, කොටපොළ උතුර, කතංකේ, දැරංගල යන ගොවි සංවිධානවල දක්නට ඇති අතර සාමාජිකයන් ක්‍රියාත්මක වන්නේ අවබෝධයකින් නොව අනුකරණය කිරීමෙන් බව පෙනේ. මේ නිසා, ගොවි සංවිධානවලින් අපේක්ෂිත සේවය නායකත්වය වෙතින් ඉටු නොවන අතර එය ඉටු කරවා ගැනීමට සාමාජිකත්වයට උවමනාවක් ද නැති බව පෙනේ. ඒ නිසා ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන අභිවෘද්ධිය වෙනුවෙන් ඉටුවිය යුතු වැඩකොටස ඉටුකර කෘෂිකාර්මික දිවිපැවැත්ම නගා සිටුවීම පිණිස ප්‍රබල වැඩ කොටසක් ඉටුකරන බව දක්නට නොලැබේ.

### 4.9.3 විවිධ ආයතන නියෝජනය කරමින් සංවිධාන ගණනාවක් ගම්වල පිහිටුවීම නිසා ගොවි සංවිධාන නො වැදගත් සංවිධාන බවට පත් වීම.

මෙම අධ්‍යයනයේ දී හෙළි වූයේ ගම් තුළ ප්‍රජා සංවිධාන ගණනාවක් පිහිටුවා තිබෙන බවයි. ගොවි සංවිධාන අණ පනත් මඟින් බලතල ලබා දී ඇති සංවිධානයක් වශයෙන් සමාජයේ අනෙකුත් රාජ්‍ය ආයතන පිළිගැනීමට අකමැත්තක් දක්වයි. මේ නිසා, ගොවි සංවිධානවලින් කළ යුතු කාර්යභාරය ඉටු කිරීමට වෙනත් ආයතන පෙළඹී සිටී. ඒ අනුව, විවිධ දෙපාර්තමේන්තු හා ආයතන විසින් තම කාර්යයන් ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය මත ගම්වල, ඒ හා සම්බන්ධ ප්‍රජා සංවිධාන ගොඩනංවා තිබේ. උදාහරණ ලෙස කිරිගව සමිතිය, සමෘද්ධි ගොවි සමිතිය, පොල් වගා කරන්නන්ගේ සමිතිය, ලොකු ළූණු වගා කරන්නන්ගේ සමිතිය, කාබනික පොහොර නිෂ්පාදකයන්ගේ සංවිධානය ආදී වශයෙනි. මෙම සියලු කාර්යයන් ගොවි සංවිධාන විසින් ඉටු කරගත හැකිව තිබිය දී ඉහත ආකාරයට වෙනත් සංවිධාන පිහිටුවීම නිසා ගොවි සංවිධානය පිළිනොගන්නා ආයතනයක් බවට පත් කර ඇති බව පෙනේ. මෙම සියලුම සංවිධානවල සාමාජිකත්වය දරන්නේ ගමේ එකම ප්‍රජාව වන බැවින් මෙම සියලුම කාර්යයන් ගොවි සංවිධාන තුළින් ඉටු කර ගැනීමට හැකි ය. එසේ වුව ද, පවතින තත්ත්වය වන්නේ ගොවි සංවිධාන පිළිබඳව තැකීමක් සිදු නොකර විවිධ ආයතන ගම තුළ විවිධ සංවිධාන පිහිටුවීම නිසා ජනතාවට සංවිධාන ගණනාවක රැස්වීම් සඳහා සහභාගීවීමට සිදුවීම, සාමාජික මුදල් ගෙවීමට සිදුවීම ආදිය යි. මෙම පසුබිම තුළ ගොවි සංවිධානය කාර්යයන් කිහිපයකට පමණක් සීමා වූ කුඩා සංවිධානයක් බවට පත් වී තිබේ.

### 4.9.4 කොන්ත්‍රාත් කිරීම

රජයේ කෘෂිකර්ම අංශයේ කොන්ත්‍රාත් ගොවි සංවිධානවලට ලබා දී, අදාළ ඉදිකිරීම් සිදු කරවාගෙන 5% කොමිස් මුදලක් ගොවි සංවිධානවලට ලබාගැනීම මඟින් සංවිධානයේ මුදල් තත්ත්වය වර්ධනය කරගැනීමට අවස්ථාව සලසාදීම කොන්ත්‍රාත් කිරීමට ඉඩ ලබාදීමේ අරමුණ වේ. එනමුත් මෙම ක්‍රමය මඟින් බලාපොරොත්තු වූ යහපත් ප්‍රතිඵල අත්වීමක් අධ්‍යයනය කළ ගොවි සංවිධානවලින් දැකගත නො හැකි ය. අධ්‍යයනයේ දී නැෂනල්වැව, ණය අරාව, සේනානි යන ගොවි සංවිධාන හැරුණු විට සෙසු සංවිධාන කොන්ත්‍රාත් කරමින් පැවතුණි. කොන්ත්‍රාත් කිරීමේ ව්‍යාපාරය දේශපාලනය සමඟ බැඳී පවතී. වර්තමානයේ සිදු වී ඇත්තේ ප්‍රදේශයේ දේශපාලනඥයන්, ගොවි සංවිධාන ආශ්‍රයෙන් කොන්ත්‍රාත් භාරගැනීම හා දේශපාලනඥයින්ගේ හිතවතුන් මාර්ගයෙන් කොන්ත්‍රාත්තුව කර ලාභ ඉපැයීම යි.

පලලේපැල ගොවි සංවිධානය පමණක් කොන්ත්‍රාත් වැඩකරන අතර සෙසු සංවිධාන කොන්ත්‍රාත් කරන්නේ 5% කොමිස් සඳහා ය. ඒ වෙනත් පුද්ගලයෙකුට කොන්ත්‍රාත්තු ලබාදීම මඟිනි. ඒ නිසා, ගොවි සංවිධානවල ස්වකීයත්වයට ද බලපෑම් එල්ල වී ඇත. සභාපතිවරු දිගු කාලීන වශයෙන් තබාගැනීමට මෙම කොන්ත්‍රාත්කරුවන් ද යම් කිසි බලපෑමක් කරයි. කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීම පසෙක තබා කොන්ත්‍රාත් මඟින් මුදල් ඉපැයීමට වැඩි ප්‍රවණතාවයක් දක්වයි. දඹදියමල් ගොවි සංවිධානය , සුළං කපොල්ල ගොවි සංවිධානය මොදරවාන එලෙස ප්‍රාදේශීය දේශපාලනඥයින් සම්බන්ධ කරගෙන කොන්ත්‍රාත් කටයුතුවල නියැලෙන ගොවි සංවිධාන වේ. එම නිසා, බලාපොරොත්තු නොවූ වෙනත් පැත්තක් සංවර්ධනය වීමක් දක්නට හැකි ය. මෙමඟින් ගොවි සංවිධානයේ අපේක්ෂිත පරමාර්ථ ඉටුකරගැනීම දෙවැනි ස්ථානයට තල්ලු වී, නායකත්වය කොන්ත්‍රාත් මානසිකත්වයෙන් කටයුතු කිරීමේ ප්‍රවණතාවයක් වර්ධනය වන්නට පටන් ගෙන ඇති බව පෙනේ. එහි අනෙක් ප්‍රතිඵලය, එවැනි පුද්ගලයන් නායකත්වයේ දිගින් දිගටම රැඳී සිටීමට උත්සාහ දැරීම විනා ගොවි ජනතාවට ඉටු විය යුතු වෙනත් යුතුකම් ඉටු නොවීම ය.

### 4.9.5 ගොවි සංවිධානයට ඇති නෛතික බලතල පිළිබඳ දැනුවත්කමක් නොමැතිබව

අධ්‍යයනය කළ ගොවි සංවිධානවලින් බහුතරයක නිලධාරීන් මෙන් ම සාමාජිකයන් ද ගොවි සංවිධානයකට නීතියෙන් හිමි වී ඇති නෛතික බලතල පිළිබඳ අවබෝධයක් නැති බව පැහැදිළි විය. එම නිසා, ගොවි සංවිධානවල කාර්යසාධනය පහළ මට්ටමක පැවතිණි. තම ශක්තිය පිළිබඳව නිසි අවබෝධයක් නොමැති නිසා සංවිධානය විසින් කළ යුතු කාර්යයන් පිළිබඳව පැහැදිළි අවබෝධයක් නොමැත. කලින් සිටි නිලධාරීන් විසින් කරගෙන ගිය වැඩ පමණක් කිරීමට ඊළඟ නිලධාරී මණ්ඩලය ද උත්සාහ කරනවා හැර යමක් අලුතින් කිරීමට උත්සාහ නො ගන්නා තත්ත්වයක් දක්නට ලැබුණි.

### 4.10 ගොවි සංවිධාන මුහුණ දී සිටින පොදු ගැටලු

- නිසි නායකත්වයක් නොවීම:
- මූල්‍යමය කටයුතු හා මුදල් පරිපාලනය සඳහා හැකියාවක් ඇති පුද්ගලයන් ගොවි සංවිධාන සාමාජිකත්වය තුළින් සොයා ගැනීමේ ගැටලුව.
- ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන් සහභාගි කරවා ගැනීමේ අපහසුතාවය.
- ගොවි ජන සංවර්ධන පනතේ නෛතිකමය විධිවිධාන පිළිබඳව පවතින නො දැනුවත්භාවය.
- රැස්වීම් සඳහා සාමාජිකයින් සහභාගි කර ගැනීමේ අපහසුව
- අරමුදල් රැස්කිරීමේ ගැටලුව.
- විනිවිද භාවයක් නොමැති වීම.
- ගොවි සංවිධාන කාර්යයන් සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික හා කම්ටුවලට සීමා වීම.
- යැපුම් මානසිකත්වය
- ගොවි සංවිධාන බල ප්‍රදේශ තුළ පවතින කාර්යයන් ඉටු කරගැනීමේ ක්‍රමෝපායයන් පිළිබඳව ගොවීන් බල ගැන් වී නොසිටීම.
- උගත් තරුණ කොටස් ගොවි සංවිධානයේ නායකත්වය නො දැරීම.

- ගොවිජන ක්ෂේත්‍රයේ පවතින යටිතල පහසුකම් හා වෙනත් ක්ෂේත්‍ර සම්බන්ධ අඩුපාඩු පිළිබඳ ඉල්ලීම් සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂණික අවධානයට ලක් නොවීම.
- ගොවීන් පොදු අරමුණක් වෙනුවෙන් ඒකරාශී කිරීමට පවතින නො හැකියාව.

## 4.11 පොහොර සහනාධාරය 25%කින් අඩුකිරීම සම්බන්ධ රජයේ උත්සාහයේ දී ගොවි සංවිධානවල කාර්යභාරය

පොහොර සහනාධාරය 25%කින් අඩු කර ලබාගැනීමට ඉදිරිපත්වන ගොවීන්ට වෙනත් ගොවීන්ට වඩා අවාසි සහගත තත්ත්වයක් ඇතිවන බව සාකච්ඡාවල දී ගොවීන් විසින් පෙන්වා දෙන ලදී. එනම්,

1. පොහොර තොගය 25%කින් නො ලැබී යාම.
2. මෙම 25%කින් පොහොර නො ගත් අයට කාබනික පොහොර නො ලැබීම.
3. මෙම ගොවීන්ට අනෙකුත් ගොවීන්ට වඩා විශේෂිත ප්‍රතිලාභයක් නො ලැබීම. මේ නිසා, මෙම වැඩසටහන අසාර්ථක වීම යන ප්‍රධාන කරුණු ය.

පොහොර සහනාධාරය 25% අඩු කිරීමට නම් පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කළ යුතු බව ගොවි සංවිධාන සමඟ කරන ලද සාකච්ඡාවල දී අනාවරණය විය.

- මුල් අවදියේ දී 25%කින් පොහොර සහනාධාරය අඩු කොට එම අඩු කළ වටිනාකමට වෙනත් ප්‍රතිලාභයක් ලබාදීමට පියවර ගැනීම. එනම්, කෘෂි උපකරණ හා කෘෂි රසායනික ද්‍රව්‍ය ලබා දීම.
- පොහොර සහනාධාරය 25% ක් අඩුවෙන් ලබාගන්නා පුද්ගලයන් තෝරාගෙන ඔවුන් විශේෂ ඇගයීමකට ලක් කිරීම.
- එවැනි පුද්ගලයින් නිපදවන කෘෂි නිෂ්පාදන වැඩි මිලට ගැනීමේ වැඩ පිළිවෙළක් ඇරඹීම.
- රසායනික පොහොර දිගුකාලීනව භාවිතා කිරීම නිසා පසට, වාතයට, ජලයට සිදුවන විනාශයන් පිළිබඳව ගොවි සංවිධාන විසින් සිය සාමාජිකයින් දැනුවත් කිරීම.
- ගම් මට්ටමේ පිහිටුවා ඇති කාබනික පොහොර නිෂ්පාදන සමිති ගොවි සංවිධාන යටතට ගැනීම.
- ගොවි සංවිධාන නිර්දේශ මත රාජ්‍ය නිලධාරී අවම මැදිහත් වීම මත එවැනි ගොවීන් එතෙර සංචාර සඳහා තෝරා ගැනීම යනා දී කරුණු ය.

අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධාන අතුරින් කිහිපයක දැකිය හැකි ලක්ෂණය වූයේ, එම ගොවි සංවිධාන සාමාජිකයින් පොහොර සහනාධාරය ලබාගැනීමට ම ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා සිටින බවයි. එසේ වුවත්, රසායනික පොහොර භාවිතය අඛණ්ඩව කරගෙන යාම තුළ පසට, ජලයට සිදුවන විනාශය හා මිනිස් සෞඛ්‍යයට සිදුවන හානිය පිළිබඳව දැනුවත් කිරීම මඟින් රසායනික පොහොර යෙදීම අඩුකිරීමට ගොවි සංවිධාන සාමාජිකයින් පොළඹවා ගැනීමට හැකියාව ලැබේ. එසේ ම, ඒ වෙනුවට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය වැඩිකර භාවිතයට ගැනීමට ද හැකියාව පවතී. පරිසර සංරක්ෂිත මෙන් ම සෞඛ්‍යයට හිතකර කෘෂි කර්මාන්තයක් ස්ථාපිත කර ගැනීමේ උත්සාහය ගොවි සංවිධාන ඔස්සේ සිදු කළ හැකි බව ද සඳහන් කළ යුතු ය. පළාත් පාලන ආයතනවල විශාල වශයෙන් එකතුවන කුණු කසල පරිසර හිතකාමී

කෘෂිකර්මාන්තයක් බිහිකර ගැනීම සඳහා ගොවි සංවිධාන මාර්ගයෙන් සහයෝගයක් ලබාගත හැකි ය.

## 4.12 වර්තමානයට ගැළපෙන පරිදි ගොවි සංවිධාන ප්‍රතිසංවිධානය කිරීමේ දී ඒවායේ අරමුණු කාර්යභාරය සහ සිදුවිය යුතු වෙනස්කම්

- මහා වාරි, සුළු වාරි, අභස්දිය, මහවැලි වශයෙන් ගොවි සංවිධාන වර්ග කිරීමකින් හෝ බෙදීමකින් තොරව පොදුවේ සලකා නීතිරීති සකස් කිරීම. එසේ ම, ගොවි සංවිධාන පරමාර්ථ හා අරමුණු සියලුම ගොවි සංවිධානවලට පොදු වීම.
- ගොවි සංවිධානවලට නායකයන් පත් කිරීම, මුදල් ප්‍රතිපාදන ලබාදීම, කොන්ත්‍රාත් ලබාදීම ආදිය සියල්ලම දේශපාලනීකරණයෙන් තොරවිය යුතු අතර සියල්ලට ම පොදුවේ සැලකිය යුතු වේ.
- ගොවි සංවිධාන සඳහා නීතිරීති සකස් කිරීම ඉහළින් පටන්ගෙන පහළ ග්‍රාමීය මට්ටමේ සිට නීති කෙටුම්පත් ලබාගෙන ඒවා සැලකිල්ලට භාජනය කොට ඉහළ තලයෙන් තීරණ ගත යුතු ය.
- සෑම ගමක් ම නිෂ්පාදන ඒකකයක් සේ සලකා එහි ග්‍රාමීය නිෂ්පාදන කළමනාකරණ ඒකකය ලෙස ගොවි සංවිධානයට පුළුල් කාර්යභාරයක් පැවරීම මඟින් ගොවි සංවිධාන ක්‍රියාත්මක ආයතන වශයෙන් පවත්වාගෙන යාමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. ඒ අනුව, එක් එක් ග්‍රාම නිලධාරී වසමේ කෘෂි ව්‍යාප්ත සේවා විධිමත් කිරීමේ මධ්‍යස්ථාන බවට ගොවි සංවිධාන පත් කරලීමට කටයුතු කළ යුතු වේ.

## 4.13 ග්‍රාමීය නිෂ්පාදන කළමනාකරණ ඒකකයක් වශයෙන් ගොවි සංවිධානය ක්‍රියාත්මක කරවීමට ඇති හැකියාව

ශ්‍රී ලංකාවේ සෑම ගම්මානයක් ම කෘෂි නිෂ්පාදන ඒකකයක් ලෙස ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණය යටතේ එහි නිෂ්පාදන කළමනාකරණ ඒකකය වශයෙන් ගොවි සංවිධානය යොදා ගැනීම පිළිබඳ යෝජනාවක් සම්බන්ධයෙන් මෙහි දී සාකච්ඡා කරනු ලබයි.

ගොවි සංවිධානයේ සභාපති, ලේකම් හා කාරක සභාව ගමේ කෘෂි නිෂ්පාදන කළමනාකරණ ඒකකය ලෙස සැලකේ. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මෙහි පහසුකම් සලසන්නා ලෙස යෙදවිය යුතු ය. කෘෂිකර්ම උපදේශක, ගොවිජන සංවර්ධන නිලධාරී, පොල් සංවර්ධන නිලධාරී, සුළු අපනයනය බෝග සංවර්ධන නිලධාරී, රබර් සංවර්ධන නිලධාරී, තේ සංවර්ධන නිලධාරී, කජු සංවර්ධන නිලධාරී, සත්ත්ව සංවර්ධන නිලධාරී යන ගම් මට්ටමේ ව්‍යාප්ති නිලධාරීන් ගොවි සංවිධානය සමඟ ඒකාබද්ධව තම ව්‍යාප්ති සේවා කටයුතු කළ යුතු වේ. ගම නිෂ්පාදන ඒකකයක් ලෙස සලකා පවතිනා සියලුම කුඹුරු ප්‍රමාණය වගා කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය අඩුපාඩු සපුරාදීම හා ඵලදායීතාවය ඉහළ නැංවීම, ගොඩබෝග වශයෙන් තෙත් කලාපයේ හා වියළි කලාපයේ වගා කළ හැකි බෝග වගාව සඳහා සැලසුමක් සකස් කොට එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් සැපයීම, බීජ, කෘෂි රසායනික ද්‍රව්‍ය, රෝග මර්දනය පිළිබඳව අවශ්‍ය උපදෙස් සැපයීම අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ගොවි සංවිධානයට ලබාදිය යුතු ය. වී වගාව හා අනෙකුත් ක්ෂේත්‍ර බෝග වැඩි බිම් ප්‍රමාණයක් වගා කරවීමෙන් උපරිම ඵලදාවක් ලබාගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු වේ. ගොවීන්ගේ කෘෂි බෝග නිෂ්පාදන ගොවි සංවිධාන සම්බන්ධීකරණය යටතේ හෝ සංවිධානය විසින් ම මිල දී ගැනීම කළ යුතු ය. තේ, රබර්, පොල්, සුළු අපනයනය බෝග ද ඒ

ආකාරයටම සැලසුම් සකස් කර යළි වගා හා අලුතින් වගා කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය හා පවතින වගාවලින් උපරිම ඵලදාවක් ලබාගැනීමට ක්‍රියාකිරීම මඟින් ග්‍රාමීය නිෂ්පාදන ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබේ. ගොවීන්ගේ මුදල් ඉතිරි කිරීම හා අවශ්‍ය ණය පහසුකම් ලබාදීම සඳහා ද ගොවි සංවිධානය ක්‍රියා කළ යුතු වේ. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් අවශ්‍ය සම්පත් ගොවි සංවිධානයට ලබා කරගැනීම මඟින් යටිතල පහසුකම් සංවර්ධනය, අවශ්‍ය ට්‍රැක්ටර්, තෙල් ඉසින යන්ත්‍ර, ගොයම් කපන යන්ත්‍ර ආදිය සැපයීම කළ යුතු වේ. සත්ත්ව පාලනය දියුණු කිරීම, සත්ත්ව සෞඛ්‍ය ආරක්ෂා කරදීම හා සත්ත්ව නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු අතර කිරි එකතු කිරීම හා අලෙවිය ආදී කාර්යයයන් සිදු කිරීම මඟින් ගොවීන්ගේ බෝග වගාව දියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. පරිසර සංරක්ෂිත කෘෂිකර්මාන්තයකට ගොවීන් යොමු කිරීම සඳහා රසායනික පොහොර භාවිතය අඩු කොට කාබනික පොහොර භාවිතයට අවබෝධය තුළින් ගොවීන් හුරුකිරීම මඟින් වගා බිම්, ජලය සහ පොදුවේ පරිසරය ආරක්ෂා කිරීමට පියවර ගත යුතු වේ. කෘමිනාශක හා පොහොර ඌණ භාවිතය, අධි භාවිතය සහ අවිධිමත් භාවිතයෙන් ගොවීන් මුදවා ඔවුන්ගේ නිෂ්පාදන වියදම අඩුකිරීම හා ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීමට ද පියවර ගත යුතු වන්නේ ය. ගොවි සංවිධානය විසින් ඉහත ආකාරයෙන් ගොවීන්ගේ නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩිකිරීම ඔස්සේ යැපුම් නිෂ්පාදන මට්ටමක පසුවන ග්‍රාමීය ජනතාව ව්‍යාපාරික ගොවි ජනතාවක් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු ද සැලසිය යුතු වෙයි.

මෙය භාරදූර කාර්යයක් වන අතර අදාළ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයේ සංවර්ධන නිලධාරී හා අදාළ කෘෂි උපදේශක හා වසමේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර විසින් මෙම වැඩපිළිවෙළ වසරේ එක් එක් කාර්තුවේ දී අධීක්ෂණය කළ යුතු වෙයි. මෙම වැඩපිළිවෙළ ඔස්සේ සෑම ගොවි සංවිධානයක් ම ව්‍යාපාරික කටයුතුවල නිරතවන නිසා ආදායමක් ඉපැයීමට හැකිවන බැවින් එම ආදායමින් යම් කිසි ප්‍රතිශතයක් සභාපති, ලේකම්, භාණ්ඩාගාරික හා කාරක සභාව ඔවුන් ඉහත කාර්යයන් වෙනුවෙන් සිදු කරනු ලබන කැපකිරීම වෙනුවෙන් ගෙවිය යුතු වන්නේ ය. ගොවි සංවිධානයේ නායකත්වය වර්ෂ තුනකට වරක් වෙනස් විය යුතු අතර අලුතෙන් පුද්ගලයන් නිලතලවලට පත් කිරීමේ ක්‍රමවේදයක් ද හඳුන්වාදිය යුතු වේ. ආගමික හා සංස්කෘතික කටයුතු, සුබසාධන කටයුතු ආදී සියල්ල ද සංවිධානය තුළ ක්‍රියාත්මක වීමෙන් පූර්ණ සේවයක් ගොවි ජනතාවට සැලසීමට හැකි වන්නේ ය. කෘෂිකර්මයෙන් ඈත් වෙමින් සිටින තරුණ පරපුර කෘෂිකර්මය කෙරෙහි වැඩි නැඹුරුවක් ඇතිකරවා ගැනීමට ද ගොවි සංවිධාන මෙලෙස ශක්තිමත් කිරීම තුළින් හැකියාව ලැබෙන්නේ ය. එම ක්‍රමය තුළින් ගොවි සංවිධාන වසරේ දින 365ම ක්‍රියාත්මක තත්ත්වයේ තබාගත හැකි අතර රටේ ජාතික නිෂ්පාදනය වර්ධනය කර ගැනීමේ ක්‍රමෝපායයක් ලෙස ද මෙය හැඳින්විය හැකි ය.

# පස් වැනි පරිච්ඡේදය

# සොයා ගැනීම්, නිගමන හා නිර්දේශ

## 5.1 අධ්‍යනයේ සොයා ගැනීම්

- වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත මගින් ගොවි සංවිධාන වෙත පවරා දී ඇති බලතල පිළිබඳව ගොවි සංවිධාන බහුතරයකට අවබෝධයක් පැවතියේ නැත. සුළු අවබෝධයක් හෝ පැවතියේ අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධානවලින් 5 කට පමණි.

- සහනාධාර පොහොර වී වගාව සඳහා ලබාගැනීමට අවශ්‍ය මූලික කාර්යයන් ඉටු කිරීම ගොවි සංවිධාන විසින් ඉතා උනන්දුවෙන් සිදු කරනු ලබන කාර්යයක් ලෙස අධ්‍යයනය කළ සියළුම ගොවි සංවිධානවලින් දැකගත හැකි විය.

- සංවිධානය තුළ සාමාජික ඉතිරි කිරීම් දිරිගන්වා අරමුදල් ස්ථාපිත කර ඒවා යොදාගනිමින් ගොවි ජනතාව වෙත පහසු ණය සපයන ගොවි සංවිධාන ඉතා සීමිත සංඛ්‍යාවක් විය. එවැනි වැඩ පිළිවෙලක් පැවතියේ අධ්‍යයට ලක් කළ ගොවි සංවිධාන අතුරින් 5 ක පමණි.

- ඇල්පත්, වැව, වාරිමාර්ග පද්ධති වැනි ජල මූලාශ්‍ර සහ කෘෂිමාර්ග ඇතුළු කෘෂිකාර්මික පොදු දේපළ සුරකීමට හා ශ්‍රමදාන මගින් ඒවා ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීමේ කාර්යය ගොවි සංවිධාන විසින් කාර්යක්ෂම අයුරින් ඉටු කිරීමක් දක්නට ලැබුණි. මෙවැනි ගොවි සංවිධාන 7 ක් අධ්‍යයන තියැදිය තුළින් හමුවිය.

- වාරි ජලය යොදාගනිමින් කෘෂිකාර්මික කටයුතු සිදු කරන ප්‍රදේශවල ජල කළමනාකරණ කාර්යය ද ගොවි සංවිධාන විසින්ම ඉටු කරනු ලැබිය.

- ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ගොවි සාමාජිකයන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය නංවාලීම සඳහා ගොවීන්ගේ සහයෝගයෙන් වාර්ෂික සංවර්ධන සැලැස්මක් සකස් කර එය ක්‍රියාවට නැංවීම සිදු කර තිබුනේ ඉතා අඩුවෙනි. අධ්‍යයනය කළ ගොවි සංවිධාන අතුරින් 4 ක පමණ එය සිදු කර තිබුණි.

- කෘෂි බෝග අලෙවිය සඳහා මැදිහත්වීම, සැකසුම් කිරීම මගින් වටිනාකම් එකතු කිරීම වැනි කෘෂි ව්‍යවසායක කාර්යයන් සඳහා මැදිහත්වීම ද ගොවි සංවිධාන විසින් සිදු කර නොතිබුණි.

- වර්තමාන නව ප්‍රවණතා හඳුනාගනිමින් කාබනික බෝග වගාව, රසායනික ද්‍රව්‍ය අවභාවිතය වැනි ක්ෂේත්‍ර සඳහා ගොවීන් යොමු කරවීමක් ගොවි සංවිධානවලින් ප්‍රදර්ශනය වූයේ නැත.

- ගොවි සංවිධානවල ගණන් තැබීම, මූල්‍ය කළමනාකරණය, ආයතනික රාමුව නිසි පරිදි පවත්වාගැනීම වැනි උසස් කළමනාකරණ රටා අනුගමනය කිරීම සහ තම

අදහස් නිලධාරීන් ඉදිරියේ ව්‍යක්ත ලෙස ඉදිරිපත් කිරීමට හැකියාව ඇති ගොවි නායකයන් බිහි කිරීම වැනි යහපත් ප්‍රවණතාවයන් ගොවි සංවිධාන බහුතරයක දක්නට හැකි විය. නියැදියට අයත් ගොවි සංවිධාන 11 ක ම මෙම යහපත් ලක්ෂණය දැකිය හැකි විය.

❖ කිරි ඉතිරි වීමේ මංගල්‍යය පැවැත්වීම, කොහොඹා කංකාරි ශාන්තිකර්ම පැවැත්වීම, මුට්ටි නැමීම, දේව දාන වැනි ශාන්තිකර්ම හා වාර්ෂික පිරිත් පින්කම් වැනි කෘෂිකර්මය හා බැඳී පවතින සංස්කෘතිකමය හා ආගමික කාර්යයන් නිසි අයුරින් පැවැත්වීම සඳහා කැපවීමක් ගොවි සංවිධාන 9 ක නිත්‍ය කාර්යයන් අතර දක්නට ලැබුණි.

❖ අවමංගල්‍යාධාර සේවා පවත්වාගෙනයාම, වන්දනා හා විනෝද චාරිකා සංවිධානය කිරීම, විපත් අවස්ථාවන් හි දී අන්‍යෝන්‍ය උපකාර සිදු කිරීම, ශ්‍රමදාන පැවැත්වීම වැනි සමාජ ප්‍රාග්ධන නඩත්තු කාර්යයන් ද කෘෂිකාර්මික කටයුතු හා සමගාමීව සිදු කිරීම අධ්‍යයන ලක් කළ ගොවි සංවිධාන 6 ක් වැනි අඩු ප්‍රමාණයකින් දක්නට ලැබුණි.

❖ ගොවි සංවිධානයන් හි සාමාජිකත්වය ලැබීමෙන් ගොවීන්ට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව ගොවි ජනතාව දැනුවත් කිරීම සඳහා විශේෂිත වැඩසටහන් පවත්වමින් එහි සාමාජිකත්වය වර්ධනය කරගැනීමට ගොවීන් සොයාගෙන යාමේ තත්ත්වයක් නියැදියේ සංවිධාන 5 ක් වැනි අඩු ප්‍රමාණයකින් දැක ගත හැකි විය.

## 5.2 නිගමනය

විමසුමට භාජනය කළ ගොවි සංවිධාන 14අතුරින් ඉහළ ම ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධාන වශයෙන් ශ්‍රේණිගත කළ ඒවා අනෙක් සංවිධාන අභිබවා ඉදිරියට ගොස් තිබුණේ සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා සිදු කරමින් සිටි කාර්යයන් හේතුවෙනි. එනම්, සංවිධානය වෙනුවෙන් සාමාජිකයන්ගේ කැපවීම ඉහළ නංවාගැනීම, ක්‍රියාශීලී නායකත්වයක් බිහිකර ගැනීම, සාමාජික සහභාගීත්වය උපරිම වශයෙන් ලබා ගැනීම, සංවිධානය තුළ මුදල් ඉතිරි කිරීම හා ණය ලබාදීම, කෘෂිකාර්මික උපකරණ කුලියට සැපයීම, වාරිමාර්ග ප්‍රතිසංස්කරණය, නඩත්තුව හා ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම, කෘෂිකාර්මික යටිතල පහසුකම් සම්බන්ධ කොන්ත්‍රාත් භාරගැනීම හා ඒවා වෙනත් පුද්ගලයන්ට ලබා දී ඒවායින් 5% ක කොමිස් මුදලක් සංවිධානයට ලබාගැනීම, කන්න රැස්වීම සංවිධානය කිරීම හා අවශ්‍ය තීරණ ගැනීම, ගොවීන් නව තාක්ෂණය පිළිබඳ පුහුණු කිරීම හා දැනුවත් කිරීම, වාර්ෂික සැලසුම් සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම, සාමාජිකයන් සඳහා සුබසාධක කාර්යයන් සිදු කිරීම, සාමාජිකයන්ගේ පවුල්වල ආදායම් වැඩි කිරීම සඳහා කෘෂි ව්‍යාපෘති හඳුන්වාදීම, ගොවි සංවිධානයේ අනාගත දියුණුව සඳහා සියලු සාමාජිකයන්ගේ අදහස් ලබාගැනීම, ආදායම් වියදම් ලේඛන නිවැරදි හා නිසි පරිදි පවත්වාගෙනයාම හා සංවිධානයේ විනිවිදභාවය ආරක්ෂාකරගැනීම වැනි සම්ප්‍රදායික කාර්යයන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම නිසාවෙනි. එහෙත් වර්තමාන ගොවි සංවිධාන මීට වඩා ඉදිරියට ගිය කාලීන වශයෙන් වැදගත් කාර්යයන් ගණනාවක් ඉටු කරන ග්‍රාමීය මට්ටමේ ප්‍රධානතම සංවිධානය ලෙසින් ක්‍රියාත්මකවීමේ පසුබිමක් නිර්මාණය විය යුතුය.

වර්තමානයේ දේශීය කෘෂිකර්මාන්තය බොහෝ වෙනස්වීම්වලට භාජනය වෙමින් නව්‍යකරණයට ලක් වී තිබේ. එසේ ම, ගොවීන්ගේ ද, පාරිභෝගිකයින්ගේ ද ආකල්ප රුචි අරුචිකම් හා වියදම් රටා වෙනස්කම්වලට භාජනය වී ඇත. එබැවින් මෙවැනි කාලීන අවශ්‍යතා හා නව ප්‍රවණතාවයන් නිවැරදිව හඳුනාගැනීමේ හැකියාව සහ ඊට අනුව තම කාර්යයන් හැඩගස්වාගැනීමේ හැකියාව ඇතිකර ගැනීම වර්තමාන ගොවි සංවිධානවල ප්‍රමුක අවශ්‍යතාවයක් වේ. නමුත් විමර්ශනයට භාජනය කරන ලද ගොවි සංවිධාන එලෙස කාලීන අවශ්‍යතාවයන් හා ප්‍රවණතාවන් හඳුනාගෙන ඒවාට අනුව තම ක්‍රියාමාර්ගයන් හැඩගස්වාගෙන තිබූ ආකාරයක් හෙළි නොවූ තරම් ය. ගොවි සංවිධාන කෘෂිකාර්මික සංවර්ධනයේ හා ග්‍රාමීය සංවර්ධනයේ ප්‍රබල කොටස්කරුවෙකු බවට පත් කරගැනීමේ අපේක්ෂාවෙන් වර්ෂ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් නීතමය බලතල හා විශේෂ වගකීම් රැසක් ඒවාට පවරා දී ඇතත් ගොවි සංවිධාන සංකල්පය හා නීතියෙන් පවරා දී ඇති බලතල පිළිබඳව පැහැදිලි අවබෝධයකින් තම ක්‍රියාමාර්ග හසුරුවාගැනීම ද කාලීන අවශ්‍යතාවයක් වූවත් විමසුමට ලක් කළ ගොවි සංවිධානවලට ඒ පිළිබඳව පැවතියේ ඉතා අඩු අවබෝධයකි.

වර්තමාන පාරිභෝගික සමාජයේ වර්ධනය වන ප්‍රවණතාවයක් වන්නේ, කෘෂි රසායනික ද්‍රව්‍යවලින් තොරව ස්වභාවික ලෙස වගා කරන ලද හෝ කාබනික පොහොර යොදා වගා කරන ලද කෘෂි භෝග පරිභෝජනයට වැඩි නැඹුරුවක් දැක්වීමයි. එම නිසා මෙම කාලීන නව ප්‍රවණතා හඳුනාගනිමින් එවැනි ඉහළ ඉල්ලුමක් සහිත ලාභදායී ක්ෂේත්‍රයේ කෘෂිභෝග වගාවට තම ගොවීන් උනන්දු කිරීමක් අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධානයන් හි දක්නට නොලැබිණි. පැහැදිලිව දක්නට හැකි එක් ගති හැසිරීමක් වූයේ, රසායනික පොහොර භාවිතය 25% ක් අඩුවෙන් යොදා භෝග වගාවට ගොවීන් යොමු කිරීම නොව රසායනික පොහොර උපරිම අයුරින් යොදමින් භෝග වගාවට ගොවීන් යොමු කිරීමේ පසුබිමකි. ගොවි සංවිධානවල ප්‍රධාන පරමාර්ථ බවට පත් ව තිබුණේ වී සහ වෙනත් භෝග සඳහා රජයේ පොහොර සහනාධාරය උපරිම අයුරින් ලබාගැනීම සඳහා තම සංවිධාන ශක්තිය යොදා ගැනීම යි. කන්නයක අස්වනු නෙළා අවසන් වූ පසු පිදුරු ගිනි තැබීමේ පුරුද්දෙන් පවා තම ගොවීන් මුදාගැනීම ගොවි සංවිධානවලට අපහසු කාර්යයක් සේ විමර්ශනය කිරීමට හැකි විය. ගොවි සාමාජිකයන්ගේ පවුල්වල ආදායම ඉහළ නැංවීම සහ රටේ විදේශ විනිමය ඉපැයීමේ මාර්ග පුළුල් කරමින් ගොවි සාමාජිකයන් විදේශ වෙළෙඳපොළෙහි ඉහළ ඉල්ලුමක් පවතින භෝග වගාව කෙරෙහි යොමු කිරීම ද දක්නට නොලැබුණු තරම් ය. දේශීය පාරම්පරික වී, එළවළු හා පලතුරු කාබනික වගා ක්‍රමය යටතේ වගා කිරීම

වර්තමානයේ දියුණු වෙමින් පවතින අපනයන අභිමුඛ කෘෂිකර්මාන්තයකි. එහෙත් මෙම තත්ත්වය පිළිබඳ දැනුවත්ව ඒ සඳහා ගොවීන් සූදානම් කිරීම සම්බන්ධයෙන් ද සතුටුදායක තත්ත්වයක් දක්නට නොලැබුණි.

ගොවීන් විසින් කරනු ලබන නිෂ්පාදන ප්‍රාථමික තත්ත්වයෙන් ම වෙළඳපොළ වෙත ඉදිරිපත් කිරීමේ ගතානුගතික ක්‍රමය මෙම ගොවි සංවිධාන සියල්ලෙහි ම පැවති අතර එවායින් යම් කිසි කොටසක් සකස් කළ හා වටිනාකම් එකතු කළ නිෂ්පාදන ලෙස ඉදිරිපත් කිරීමේ සූදානමක් ද දැකිය නොහැකි විය.

අස්වනු නෙළන සමයේ ගොවි ද්‍රව්‍ය මිල පහළ බැසීම සුලබ දසුනකි. ගොවියාට පාඩු සහගත තත්ත්වය මඟහරවා ගැනීමේ උපක්‍රම අනුගමනය කිරීමට ගොවි සංවිධානවලට ගත හැකි ක්‍රියාමාර්ග රැසක් හඳුන්වා දී ඇතත් ඒවා අනුගමනය කරමින් අස්වනු ගබඩා කිරීම සඳහා ගොවීන් පෙළඹවීම වැනි ක්‍රියාමාර්ගවලට ද එළඹුනු අවස්ථා දැකගත නොහැකි විය.

ගොවීන්ගේ යෙදවුම් අවශ්‍යතා වට්ටම් සහිතව අලෙවි කිරීමෙත් යෙදවුම් වෙළඳපොළ ගොවියාට වාසි සහගත ලෙස පාලනය කිරීම මඟින් ගොවීන්ගේ නිෂ්පාදන වියදම අඩුකිරීමට සහාය වීම සහ ගොවි ද්‍රව්‍ය සාධාරණ මිලට මිල දී ගැනීමේ හැකියාව ගොවි සංවිධානවලට පැවතිය ද එම කාර්යයන් දෙක දුෂ්කර කාර්යයන් සේ සලකා ඒ සඳහා කැපවීමක් සිදු කර නොතිබුණි.

කුඹුරුවල හා ගොඩ ඉඩම්වල පාංශු ඛාදනය, කෘෂිකර්මය සම්බන්ධයෙන් අහිතකර බලපෑම් සිදු කරන අතර එය ගොවියාගේ ආදායම අඩු කිරීමට ඍජුවම හේතුවන බවත් අවබෝධ කරවීම හා ඒවා වළක්වාගැනීමේ ක්‍රියාමාර්ගවලට ගොවීන් යොමු කිරීම ගොවි සංවිධානවල වගකීමක් වූවත් ඒ පිළිබඳව ද අවධානය යොමු වී තිබූ බවක් දක්නට නොලැබුණි.

අධ්‍යයනයට ලක් කළ ගොවි සංවිධානවලින් කිහිපයක පමණක් නායකත්වයේ දක්ෂතාවය හා කැපවීම මත තම සාමාජික ගොවීන්ගේ ජීවන තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒමේ ක්‍රියාමාර්ගයන්හි නියැලී සිටි බව පැහැදිලි වුවද ගොවි සංවිධාන බහුතරය කෘෂි යටිතල පහසුකම් නඩත්තු කිරීම, ශ්‍රමදාන පැවැත්වීම, රජයේ සහනාධාර හා වෙනත් වරප්‍රසාද ලබාගැනීමේ අපේක්ෂාව වැනි කාර්යයන් කිහිපයකට පමණක් සීමා වී පැවතිණි. මෙවැනි පසුබිමක් යටතේ වුවද මෙම ගොවි සංවිධානවල නායකයින් සහ සාමාජිකයින් තම ගොවි සංවිධාන ක්‍රියාකාරී බවින් ඉහළ සාර්ථක ගොවි සංවිධාන ලෙසින් ක්‍රියාත්මක වන්නේ ය යන වැරදි ස්ථාවරයක පසු වේ.

වෙනස්වන සමාජ-ආර්ථික තත්ත්වය මත, සමාජයේ අවශ්‍යතා හඳුනාගෙන කෘෂිකාර්මික භාණ්ඩ සැපයීමේ අවශ්‍යතා ඉටුකිරීමට දැනුවත්කමක් සහිත ගොවි ප්‍රජාවක් බිහිකර ගැනීමේ අවශ්‍යතාවය ඉදිරියට පැමිණ ඇත. ගොවි සංවිධානවල දැනුම පුළුල් කර ආකල්පමය වශයෙන් වෙනසකට භාජනය කිරීම මඟින් සාමාජික ගොවි ජනතාවගේ ආදායම් වැඩි කර ජීවන තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒමේ වගකීම ඉටුකිරීමේ හැකියාව ගොවි සංවිධානවලට ඇතිකිරීම සඳහා වගකිව යුතු පාර්ශවවලට බලවත් ප්‍රයත්නයක් දැරීමට සිදු වී ඇත.

### 5.3 නිර්දේශ

අධ්‍යයනය තුළින් හෙළි වූ කරුණු අනුව ගොවි සංවිධාන ඉහළ ක්‍රියාකාරීත්වයක් සහිත එවා බවට පත්කිරීම සඳහා පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කෙරේ.

- නිලධාරීන්ගේ හා ප්‍රාදේශීය දේශපාලනයේ බලපෑමෙන් තොරව ගොවි සංවිධානයට කැප වී වැඩ කළ හැකි කෘෂි කාර්මික ජීවිතයක් ගත කරන පුද්ගලයන් නායකත්වයට පත්කර ගැනීමේ පසුබිමක් ගොවි සංවිධාන තුළ ගොඩනගා ගැනීම අවශ්‍ය වන්නේ ය. මෙය කළ හැක්කේ ගොවි සංවිධානයක වැදගත්කම පිළිබඳව සාමාජිකත්වයේ පූර්ණ දැනුවත් කිරීමක් තුළිණි.

- ගොවි ජනතාවට ගොවි සංවිධානවල අරමුණු කාර්යභාරයන්, ගොවි සංවිධානවල වැදගත්කම, 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත මඟින් ගොවි සංවිධානවලට ලබා දී ඇති නෛතික බල තල පිළිබඳ දැනුවත්භාවය ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතු ය. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය යන ආයතනවලට මෙම කාර්යභාරය ඉටු කිරීමට හැකි වේ. සාර්ථක යැයි සඳහන් කරන ලද සෙවන, තැෂනල්වැව, අරුණ, පල්ලේපැල වැනි ගොවි සංවිධාන ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි අධ්‍යයනය කිරීමට අධ්‍යයන චාරිකාවලට යොමු කරවීම මඟින් සාර්ථක ගොවි සංවිධාන වල අත්දැකීම් වෙනත් ගොවි සංවිධානවලට ලබා දිය යුතු වේ.

- ගොවි සංවිධානවල නිලතල දැරීම යම් කිසි කාල පරිච්ඡේදයකට පමණක් සීමා කිරීම. ගොවි සංවිධාන පිහිටුවීම යම් බල ප්‍රදේශයකට පමණක් සීමා කිරීම, කොන්ත්‍රාත් අවශ්‍යතා මත හෝ දේශපාලන අවශ්‍යතා මත එකම ගම තුළ හෝ වසම තුළ ගොවි සංවිධාන කිහිපයක් පිහිටුවීමට ඉඩ ලබා නොදීම, ගොවි සංවිධාන ගමකට හෝ වසමකට සීමා කළ යුතු අතර ඒ සඳහා පොදු සම්පත් ලඟා කළ යුතු ය.

- ගොවි සංවිධානය ඉහත ක්‍රමෝපායයන් භාවිතා කිරීමෙන් ගොවීන්ට අවශ්‍ය සේවා සැපයීමේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීම හා ගොවීන්ට අවශ්‍ය සේවා සපයා දීමේ ප්‍රමුඛතම ප්‍රජා ආයතනය බවට පත් කළ යුතු ය.

- ගොවිජන ක්ෂේත්‍රයේ සෙසු පාර්ශවකරුවන් වන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පශු අස්වනු තාක්ෂණ ආයතනය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පොල් සංවර්ධන මණ්ඩලය වැනි ආයතන සමඟ ගොවි සංවිධාන සමීප ඇසුරක් පවත්වාගෙන යාමේ පසුබිමක් නිර්මාණය කළ යුතු ය.

- ග්‍රාමීය මට්ටමේ කෘෂි කාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ගොවි සංවිධානය හරහා එම සියලු කටයුතු කළ යුතු වන්නේ ය. එනම් ව්‍යාප්ති සේවා ලබා දීම, නව කෘෂි දැනුම ලබා දීම, වී, අතිරේක ආහාර බෝග, ඉහළ ආදායම් ලබා දෙන බෝග,

අපනයන බෝග, වාණිජ බෝග වගාවන් සඳහා ගොවි පවුල් තෝරා ගැනීම සත්ත්ව පාලනය හා යෙදවුම් සැපයීම යනාදිය ගොවි සංවිධාන මාර්ගයෙන් සිදු කළ යුතු ය.

දෙවන පෙළ නායකත්වයට පුද්ගලයන් පුහුණු කිරීමේ විවිධ ක්‍රමවේද පිළිබඳ ගොවි සංවිධානය දැනුවත් කිරීම මඟින් දෙවන පෙළ නායකත්වයක් පුහුණු කිරීමේ තත්ත්වයක් සෑම ගොවි සංවිධානයක ම ඇති කළ යුතු ය. මෙම සිද්ධි අධ්‍යයනයේ උසස් ක්‍රියාකාරීත්වයක් සහිත ගොවි සංවිධානවල දෙවන පෙළ නායකත්වයක් බිහි කිරීංම් ක්‍රමවේද ගණනාවක් අනුගමනය කෙරේ.

පහත සඳහන් දැනුවත් කිරීම් හා පුහුණු කිරීම් ගොවි සංවිධාන වෙත ලබා දිය යුත්තේ ය.

1. **නායකත්ව පුහුණුව:**
   නායකත්වයට සුදුසු පුද්ගලයන් තෝරා ගෙන ඔවුන් සඳහා පුහුණුව ලබා දීම අවශ්‍ය වේ.

2. **මුදල් පරිපාලනය හා ගිණුම් තැබීම සම්බන්ධ පුහුණුව:**
   භාණ්ඩාගාරික, මුදල් පරිපාලක නිලතල සඳහා පත්කිරීමට සුදුසු පුද්ගලයන් තෝරා ඔවුන්ට මෙම පුහුණුව ලබාදීම සුදුසු ය.

3. **වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳ පුහුණුව:**
   නායකත්වය ඇතුළු කමිටු සාමාජිකයන් සහ මේ පිළිබඳ උනන්දුවක් දක්වන සියල්ලන්ටම පුහුණුව ලබා දීම.

- අදාළ ආයතන විසින් ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ගොවීන්ගේ ගැටලු පිළිබඳව විමසිල්ලෙන් සිට එම ගැටලුවලට විසඳුම් ලබා දීම. සුළු වාරිමාර්ග සම්බන්ධ ගැටලු, කෘෂි පාරවල් සම්බන්ධ ගැටලු, කෘෂි නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමේ දී ගොවීන් මුහුණ දෙන ගැටලු ආදිය වේ.

- ගොවි සංවිධාන යනු ගොවීන්ට කෘෂි කාර්මික සේවා සපයන මධ්‍යස්ථානයක් පමණක් ම වීමට ඉඩ නො තබා ගොවි පවුල් සඳහා බහුකාර්ය සේවා සපයන ප්‍රජා මධ්‍යස්ථානයක් බවට ඒවා පත් කළ යුතු ය. මෙහි දී, සුබ සාධන සේවාවන් සපයා දීම මෙන් ම ගොවීන්ගේ කායික මානසික සමබරතාවය වර්ධනය කළ හැකි මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ප්‍රජා මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

- ගොවි සංවිධාන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඇගයීමේ ක්‍රියාවලියකට ලක්කිරීම මඟින් ගොවි සංවිධාන විසින් ගොවි ජනතාව වෙනුවෙන් සිදුකරන ස්වේච්ඡා සේවය ගෞරවයට පාත්‍ර කිරීම.

- ගොවි සංවිධාන නිලධාරීන් සමාජය පිළිගන්නා පුද්ගලයින් බවට රජය විසින් පත් කළ යුතු ය. උදාහරණ: ග්‍රාමෝදය මණ්ඩල සභාපති, සමථ මණ්ඩල සභාපතිට යම් කිසි ගෞරවයක් ලබාදෙන්නා සේ ගොවි සංවිධාන සභාපතිවරයාට බලයක් ලබාදිය යුතු ය.

- ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය පිළිබඳව සංවිධාන අතර තරඟ කලාප මට්ටමෙන් හා ජාතික මට්ටමෙන් පවත්වා ඉහළ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ජයග්‍රහණය කරනු ලබන සංවිධානවලට තෑගි ලබා දීම. කෘෂිකර්මය සඳහා අවශ්‍ය ට්‍රැක්ටර, සංයුක්ත කොළ මඩින යන්ත්‍ර, තෙල් ඉසීමේ යන්ත්‍ර වැනි කෘෂි උපකරණ තෑගි වශයෙන් ලබාදීම.

- කෘෂි කාර්මික ප්‍රතිපත්ති සම්පාදනයේ දී හා ගොවිජන පනත් සකස් කිරීමේ දී මෙන්ම ගොවීන්ට බලපාන තීරණවලට එළැඹීමේ දී ගොවි සංවිධාන සමඟ සාකච්ඡා කොට එම අදහස් අනුව ගොවිජන හිතකාමී අන්දමින් ප්‍රතිපත්ති සකස් කිරීම මගින් ගොවි සංවිධානවලට සමාජය තුළ ගෞරවනීය පිළිගැනීමක් ලබාදීම අවශ්‍ය වේ.

- ගොවිජන සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම උපදේශකවරුන්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ඇගයීමේ දී භාවිතයට ගනු ලබන නිර්ණායකයන් අතරට සාර්ථක ගොවි සංවිධානයක් ගොඩ නැංවීමේ කාර්ය භාරය ද ඇතුලත් කොට ඒ සඳහා කැප වී ක්‍රියාකළ උක්ත නිලධාරීන් සඳහා ශිෂ්‍යත්ව, විදේශ චාරිකා සහ වෙනත් රාජකාරිමය වරප්‍රසාද පිරිනැමීමට පියවර ගැනීම.

- ග්‍රාමීය මට්ටමේ කෘෂිකාර්මික බෝග වගාව, කෘෂි සැකසුම් කර්මාන්තය, අපනයන බෝග වගාව, සත්ත්ව පාලනය යන සියලු කෘෂිකාර්මික කටයුතු ගොවි සංවිධානයේ දැනුවත්භාවය හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීමෙන් ගොවි සංවිධානය ග්‍රාමීය මට්ටමේ වගකිව යුතු ප්‍රජා සංවිධානයක් බවට පරිවර්තනය කිරීම.

ඇමුණුම 1

## ගොවි සංවිධානයක් සතු නීතිමය බලතල

ඈත අතීතයේ දී ග්‍රාමීය මට්ටමේ සිදු වූ කෘෂිකාර්මික කටයුතු ගැමි නායකත්වය පදනම් කරගෙන (ගමරාළ, වෙදරාළ, වෙල් විදානේ, නැකැත්රාළ) ඉතා සාර්ථකව සිදු කෙරුණු අතර වර්තමානයේ ඉහළින් ඇගයුමට ලක් වේ. වැව් අමුණු ඉදිකිරීම, නඩත්තු කිරීම, පරිසර පද්ධතියය ආරක්ෂා කිරීම,(කට්ටකඩුව, කිවුල්හල, ගස්ගොම්මන, වැව් ඉස්මත්ත) ඔවුන්ගේ කෘෂිකර්මාන්තයේ අන්තර්ගත කාර්යයන් විය. මෙම තත්ත්වය 1505 න් පසු ක්‍රමයෙන් වෙනස් වී 1948 වනවිට ග්‍රාමීය කෘෂි ආර්ථිකයේ පැවති සමගිය (අපේක්ෂාව) සම්පූර්ණයෙන්ම හීන වී ගොස් තිබුණි. මෙම තත්ත්වය තුළ නිදහසින් පසු ගොවීන් කණ්ඩායම්ගත කිරීම හා ඔවුන් හරහා රටේ කෘෂිකාර්මික අරමුණු ඉටුකර ගැනීම සඳහා නීතිමය රාමුවක අවශ්‍යතාවය මතු විය. ඒ අනුව, 1950 දශකයේ සිට මෙරට ගොවි ජනතාව අරමුණු කරගත් නීති වරින්වර සම්පාදනය වන්නට විය.

- 1958 අංක 1 දරන කුඹුරු පනත
- 1964 අංක 11 දරන සංශෝධිත කුඹුරු පනත
- 1972 අංක 2 දරන එලදාවර්ධන පනත
- 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත
- 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත
- 1991 අංක 4 දරන ගොවිජන සේවා සංශෝධන පනත
- 2000 අංක 46 දරන ගොවිජන සේවා සංවර්ධන පනත

මෙම පනත් කෙටියෙන් විග්‍රහ කර බලනවිට 1958 අංක 1 දරන කුඹුරු පනත මගින් ග්‍රාමීය මට්ටමෙන් ගොවි කාරක සභා පිහිටුවා එමගින් ගොවීන්ගේ කටයුතු එනම් වාරිමාර්ග නඩත්තු කටයුතු පංගු ලැයිස්තු ක්‍රමයට ක්‍රියාත්මක කරවීම. කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීම, සුළු වාරිමාර්ග ඉදිකිරීම් කටයුතු යනා දී, නීතිමය බලතල ක්‍රියාත්මක කිරීමට මෙම ගොවි නායකයන් තේරී පත්වන කාරක සභාවට බලතල ලබාදෙන ලදී. ඉන්පසුව 1972 අංක 2 දරන එලදාවර්ධන පනතින් කාරක සභා කිහිපයක් සම්බන්ධ වන බලප්‍රදේශයක බලය ගොවි නායකයන්ට ලබාදෙන ලදී. එම පනතට අනුව ගොවිජන සේවා මධ්‍යස්ථාන (එලදාවර්ධන කමිටු) ඇතිකර එහි බලය තේරී පත් වූ ගොවි නායකයින් එනම් එලදාවර්ධන සභාවට පවරන ලදී. එම සභාවට කෘෂිකර්මයට අදාළ සියලුම නීති ක්‍රියාත්මක කිරීමේ බලතල ලබාදෙන ලදී.

1979 අංක 58 දරන ගොවිජන සේවා පනතින් එම බලතල ගොවීන්ට සෘජුව ලබා නොදී නිලධාරීන් අතට ගන්නා ලදී. එනම්, ග්‍රාමීය මට්ටමේ කටයුතු කරගෙන යෑමට ගොවි කාරක සභාව වෙනුවට එම පනතේ 55 වැනි වගන්තිය යටතේ වගා නිලධාරී තනතුර ඇති කරන ලදී. ඔහුට සහාය පිණිස එම පනතේ 42 (10) යටතේ යාය නියෝජිත (ගොවි නායකයකු) පත් කරන ලදී. එලදාවර්ධන සභාපතිධුරය වෙනුවෙන් මූලාසනාරූඪ නිලධාරියෙකු තෝරා එහි බලය විධායක ලේකම්/ගොවිජන සංවිධාන නිලධාරීන්ට පවරන ලදී.

1991 අංක 4 දරන ගොවිජන සේවා සංශෝධන පනත මඟින් 56 (අ), 56 (ආ) වගන්ති අනුව ගොවි සංවිධාන ඇති කරන ලදී. ගොවි සංවිධාන ආරම්භ කළ මුල් යුගයේ ගොවි සංවිධාන පිහිට වූ නිලධාරීන් හෝ තනතුරු භාරගත් ගොවි නායකයින් එම ආයතනයට (ගොවි සංවිධානයට) ඇති මේ නෛතික බලතල හෝ කාර්යයන් පිළිබඳ නිසි අවබෝධයක් නොමැතිව කටයුතු කළා යැයි පැවති සාධක අනුව කිව හැකි ය. එසේ වුව ද, පසුකාලීනව, මෙම අඩුපාඩුව පුහුණු වැඩසටහන් මඟින් දෙපිරිස ම නිවැරදි කර ගැනීමට හැකියාව ඇති විය.

2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් වර්තමානයේ ක්‍රියාත්මක වන ගොවි සංවිධානවල නියමිත ආකාරයෙන් නෛතික බලය ලැබී ඇති අතර පනතේ වගන්ති 101න් වගන්ති 35ක් පමණ සෘජුව ම ගොවි සංවිධාන සතු බලය හා ඒවාට නෛතිකව ක්‍රියාත්මක විය හැකි වපසරිය පැහැදිලිව දක්වා ඇත. පනත ප්‍රධාන කොටස් අටකින් යුක්ත වන අතර පනතේ පළමු කොටස් අද ගොවීන් සම්බන්ධ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉඩම් හිමියන්, අද ගොවීන් සිටින ඉඩම් විකිණීමේ දී මිල තීරණය කිරීමට මැදිහත්වීම, අද ගොවීන්ගේ අද අයිතිය ආපසු පැවරීමේ දී ප්‍රවේණි බද්ද නො ගෙවන අවස්ථාවල දී ප්‍රවේණි බද්ද නැවත ලබාගැනීම යන කරුණුවල දී ගොවි සංවිධානය ඉතාමත් වැදගත් වේ.

කෘෂිකාර්මික ඉඩම් කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අනුකූලව වගා නොකරන අවස්ථාවල දී 23 වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කිරීමේ නෛතික බලය පවතී.

තව ද, පනතේ 26 වන වගන්තිය අනුව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්තුමාගේ තීරණය අනුව අදාළ ඉඩම් වගා බිමේ බලය ගොවිජන සංවර්ධන සභාව මඟින් ගොවි සංවිධාන වෙත පැවරීමට නෛතිකව ඉඩකඩ ලබා දී ඇත. පනතේ 28, 29, 30, 31, 32, 33, 34 වගන්ති ක්‍රියාත්මක කිරීමේ දී ගොවි සංවිධානවල අදහස් ලබාගැනීම හා ක්‍රියාත්මක කිරීමට බලතල ලැබී තිබේ.

පනතේ 43, 44, 45, 46, 47, 48, 49, 50 වගන්තිවලින් ගොවි සංවිධාන පිහිටුවීම, ගොවි සංවිධාන ඇවර කිරීම පිළිබඳ නෛතික කටයුතු පිළිබඳව දක්වා ඇත. ඒ අනුව, ගොවි සංවිධානවලට ඇති නෛතික බලය වඩාත් පැහැදිලි වන්නේ මෙම පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සෑම ගොවි සංවිධානයක්ම අවිච්ින්න පැවැත්මක ඇති පොදු මුද්‍රාවක් යටතේ ඇති සංස්ථාවක් ලෙස පිළිගැනීම හා එය විසින් නඩු පැවරීම සහ එයට විරුද්ධව නඩු පවරනු ලැබීමට ඇති හැකියාව තුළිනි. තව ද, පනතේ 48 වගනතිය යටතේ සියලුම කෘෂිකාර්මික කටයුතු සැලසුම් කිරීම, දත්ත එකතු කිරීම, වගා නො කරන ඉඩම් පිළිබඳ දත්ත ලබාදීම, පස සංරක්ෂණය කිරීම, ජල පරිභෝජනය, නිර්දේශිත බෝග වගා කරවීම, සතුන් වර්ග ඇති කරවීම, කොම්පෝස්ට් පොහොර භාවිතයට ගොවීන් දිරි ගැන්වීම හා පාරිසරික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ බලය ගොවි සංවිධාන වෙත ලබා දී ඇත. තව ද මෙම කාර්යයන් ගොවි සංවිධාන ක්‍රියාත්මක නො කරන්නේ නම් 50 වන වගන්තිය අනුව ගොවි සංවිධාන ඇවර කිරීම ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ට කළ හැකි ය.

තව ද, මෙම පනතේ අංක 60-65 වගන්තිය අනුව ගොවි සංවිධානවලට දිස්ත්‍රික් මට්ටමේ ජාතික ගොවි බල මණ්ඩල දක්වා කටයුතු කිරීමේ බලතල ලබා දී තිබේ. පනතේ 69-70 දක්වා වගන්තිවලින් මුද්දර ගාස්තුවලින් නිදහස් කිරීම, ආදායම් බද්දෙන් ගොවි සංවිධාන නිදහස් කොට ඇත. තව ද, පනතේ 71-72 යන වගන්තිවලින් මෙම ගොවි සංවිධානවල නිලධාරීන් අල්ලස් පනතේ හා දණ්ඩ නීති සංග්‍රහයේ විධි විධාන අනුව රාජ්‍ය සේවකයෙකු

සේ සලකා කටයුතු කරන බවත් පනතේ 73 වගන්තිය අනුව සත්භාවයෙන් යම් කටයුත්තක් ඉටු කර ඇත්නම් ඊට පෞද්ගලික නඩු පැවරිය නො හැකි බවත් සඳහන්ව තිබේ.

පනතේ 81, 82, 83, 84, 85, 86, 87, 88 යන වගන්තිවලින් වාරිමාර්ග කටයුතු පිළිබඳ යම් යම් බලතල ගොවි සංවිධානයට ලබා දී ඇත. 81 වගන්තිය අනුව වාරිමාර්ග කටයුතුවල අධීක්ෂණ කටයුතු එනම් ඒවා රැකබලා ගැනීමේ වගකීම පවරා තිබේ. 82 වගන්තිය අනුව, ගොවි සංවිධානවල කැමැත්ත පරිදි ප්‍රදේශයේ කෘෂිකාර්මික වාරිමාර්ග කටයුතු කළ යුතු බව සඳහන් ය. 83, 84, 85 වගන්තිවලින් වාරිමාර්ග වැරදි සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ට පැමිණිලි කිරීම හා සාක්ෂි ලබාදීමට ඉඩකඩ සලසා තිබේ. පනතේ 80 වගන්තිය අනුව, කන්න රැස්වීම් පැවැත්වීමේ සම්පූර්ණ බලය ගොවි සංවිධානවලට ලබා දී ඇත. මෙම නීති ක්‍රියාත්මක කළ යුතු ආකාරය 87 වගන්තියෙන් පැහැදිලි කෙරේ.

තව ද, පනතේ 92 වගන්තිය අනුව කෘෂිකාර්මික ඉඩම් හා වාරිමාර්ගවල අයාලේ යන සතුන් බැඳ තබා ගැනීමට බලය පවරා ඇත. එමෙන් ම, එම වගාවල හානි තක්සේරුවේ දී ගොවි සංවිධාන මැදිහත්වීම ඉතා වැදගත් ය. පනතේ 93 වගන්තිය අනුව යම් අයෙකුගෙන් යම් පරිශ්‍රමයක් අය කර ගැනීම නිත්‍යානුකූල කර ඇත.

2000 අංක 46 දරන ගොවිජන සංවිධාන පනතින් ඉහත සඳහන් බලතල ලබා දී ඇති අතර ම එම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීමට ගොවි සංවිධානයට නෛතිකව බලතල ලැබී ඇත. එම අතුරු ව්‍යවස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ඒ ඒ අවස්ථාවල දී මහ සභාවේ 3/4 ක ඝනපූර්ණය සහිතව ඉන් අඩකට වැඩි පිරිසකගේ කැමැත්ත පරිදි තීන්දු වාර්තා ගත කර ක්‍රියාත්මක කිරීමට මහ සභාව වගබලා ගත යුතු ය (ඩී.බී.එම්.ආර්. දිසානායක).

ඇමුණුම 02

අරුණ ගොවි සංවිධානයේ 2011.12.31 දිනට ආදායම් වියදම් ගිණුම

| විෂයය | වියදම රු. | විෂයය | ආදායම රු. |
|---|---|---|---|
| ගමන් වියදම් | 2,830.00 | සත්ත්ව පාලන ණය පොලිය | 33,406.00 |
| කාරක සභා දීමනා | 11,600.00 | කෘෂි උපකරණ ණය පොලිය | 38,120.50 |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 8,942.00 | ව්‍යාපෘති ණය පොලිය | 60,091.00 |
| පරිත්‍යාග | 1,800.00 | සුළු කෘෂි ණය හා මධ්‍ය පරිමාණ කෘෂි ණය | 16,862.50 |
| සමරු සිහිවටන | 3,200.00 | ඇතුළත් වීමේ ගාස්තු හා දඩ | 7295.00 |
| උත්සව වියදම් | 4,719.00 | සහනාධාර පොහොර මෙහෙයුම් ආදායම | 11,560.25 |
| දින දර්ශන වියදම් | 4,250.00 | බැංකු තැන්පත් සඳහා ලැබූ පොලිය | 18,084.58 |
| භාණ්ඩාගාරික ලේකම් දීමනා | 24,000.00 | ලිපි ද්‍රව්‍ය ආදායම | 2,100.00 |
| ගොවිජන සේවා වැය පියවීම | 16,239.50 | ගොඩ බෝග වැය පොලිය | 615.00 |
| බැංකු අඩුවීම | 765.00 | ලංකා බැංකු තැන්පත් සඳහා පොලිය | 5798.45 |
| සාමාජික ඉතිරි කිරීම් සඳහා පොලී ගෙවීම | 32,529.75 | සාමාජික වාර මුදල් | 16,457.00 |
| සුරකුම් තැන්පත් සඳහා පොලී ගෙවීම | 5,442.35 | | |
| අතිරික්තය (ලාභය) | 94,072.68 | | |
| | 2,10,390.28 | | 2,10,390.28 |

**References**

*Baron,* A Robert, 2002, Social Psychology, New Delhi, Pearson Education (Singapore) Ltd.

*Bernard,* J. (1981), "The Good Provider Role Its Rise and Fall", *American psychologist*_vol, 36 no. 1 pp. 1-12.

*Esham* M, Usami K, 2007, Evaluating the Performance of Farmer Companies in Sri Lanka: A case study of Ridi Bendi Ela farmer company, Hector Kobbekaduwa Agrarian Research and Training Institute, Colombo 07.

*Giragama* W M G B, *Sanker* M S, *Samarakoon* S M A, 1999. Development and strengthening of Farmer Organizations through Farmer Conventions, Final Evaluation Report on the Impact of Farmer Conventions held in Anuradhapura and Matale districts , Hector Kobbekaduwa Agrarian Research and Training Institute, Colombo 07.

*Gupta* V.K. 1989 Guide to Monitoring and Evaluation of Small farmer's Cooparatives in Asia, Rome: FAO.

*Henegadra* G.M. 1998 An Evaluation of the Group Approach to soiving Small Farmers problems, A case study of the Galgamuwa Small farmer Development Programme in Sri Lanka, Dissertation presented for master of science at the ATI, Bangkok.

Available at: http://www.fao.org/docrep/w5830E/w5830E00.html a ccessed 20rd march 2011

Improving Agricultural Extension : A reference manual, 1997.

Promoting women's Leadership in Farmer's and Rural Producer's Organizations ; the farmer forum in conjunction with the thirty third session of IFAD, government council, 2010.

*Seetharaman*, S P, *Shingi,* R M, 1992. Agri Business Cooperatives, p 210, ICA domust trust, New Delhi: Oxford and IBH publishing company.

*Widanapathirana* A.S. and Brewer, J.D. 1985 Gal Oya Water Management Project: Mide Term Impact Assessment, HARTI. Colombo.

*Wijerathna* C M. 1997. Role of Farmer Companies in the Sri Lankan Rural Economy, *Sri Lankan Journal of Agrarian Studies*, 1997, volume 9 (1 and 2), Hector Kobbekaduwa Agrarian Research and Training Institute, Colombo 07.

පතිරණ, ආර්. කේ. 1980, ගැමි සංවිධාන හා කෘෂිකාර්මික සංවර්ධනය, ගල් ගමුව සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය ගැන විමර්ශනයක්, *ගොවි කටයුතු අධ්‍යයනය 1 (11),* 1984, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, කොළඹ 07.

පතිරණ, ආර්. කේ. 1980. සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය, ගොවි කටයුතු අධ්‍යයනය 1 (11), 1986, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, කොළඹ 07.

සේනානායක, එම්. එස්. 1998. කෘෂි ද්‍රව්‍ය අලෙවිකරණය සඳහා ගොවි සංවිධාන, පුත්තලම හා මොණරාගල දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මක කෘෂි ද්‍රව්‍ය අලෙවිකරණය පිළිබඳ ක්‍රියාකාරී පර්යේෂණයේ අත්දැකීම්, *ගොවි ජනතා,* හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, කොළඹ 07.

ගොවි සංවිධාන සතු නීතිමය බලතල අත් පත්‍රිකාව, දිසානායක, ඩී.බී.එම්.ආර්., උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අනුරාධපුරය 2011

තැ.පෙ. 1522
කොළඹ,
ශ්‍රී ලංකාව.

දු.අ. 94112696981
94112696437

ෆැක්ස් 94112692423

විද්‍යුත් තැපැල්:library@harti.lk

වෙබ් : www.harti.gov.lk

ISBN 978-955-612-150-6
9789556121506

Rs 420/-

Digital Government PRESS

National Digitization Project

*National Science Foundation*

Institute : National Science Foundation

1. Place of Scanning : Sanje (Private) Ltd, Hokandara

2. Date Scanned : 02/06/2017

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : Angelo Melvin Luwis

Signature : A. M. [signature]

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Information Officer

Name : Renuka Sugathadasa

Signature : K. P. Sugathadasa

Date : 02/06/2017

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*